# උසස් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති යෝජනා

2019 දෙසැම්බර්

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
126, නාවල පාර, නුගේගොඩ
ශ්‍රී ලංකාව.

# උසස් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති යෝජනා

# 2019 දෙසැම්බර්

කර්තෘ : ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
126, නාවල පාර, නුගේගොඩ,
ශ්‍රී ලංකාව.

දුරකථන : +94 11 281 5703

ෆැක්ස් : +94 11 281 6178

විද්‍යුත් තැපැල : chnec2018@gmail.com, secnec@slt.lk

වෙබ් අඩවිය : www.nec.gov.lk

මාතෘකාව : **උසස් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති යෝජනා**

ISBN : 978-955-9448-54-9

තීරු කේතය :

# පටුන


| | | |
|---|---|---|
| පෙරවදන | | ix |
| 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ උපුටනයන් | | v |
| විධායක සාරාංශය | | vii |
| 1 පරිච්ඡේදය | හැඳින්වීම | 1 |
| 2 පරිච්ඡේදය | පාලනය, මූල්‍ය, සම්පත් කළමනාකරණය | 7 |
| 3 පරිච්ඡේදය | උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය, ශිෂ්‍ය ඇතුළත්වීම හා නව විෂයයන් හා විෂය ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම | 19 |
| 4 පරිච්ඡේදය | වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය | 31 |
| 5 පරිච්ඡේදය | ශිෂ්‍ය සුභසාධනය සහ විනය | 42 |
| 6 පරිච්ඡේදය | පශ්චාද්-උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ | 51 |
| 7 පරිච්ඡේදය | රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල ගුණාත්මකභාවය සහතිකකරණය හා ප්‍රතීතනය | 61 |
| 8 පරිච්ඡේදය | අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සංවර්ධනය | 71 |
| 9 පරිච්ඡේදය | පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන හා රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය | 78 |
| උසස් අධ්‍යාපන පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීමේ ක්‍රියාවලිය | | 89 |
| පර්යේෂණ කණ්ඩායම් සාමාජිකයන් | | 91 |
| පර්යේෂණ ඇගයීම් කමිටුවේ, සංස්කරණ මණ්ඩලයේ සහ සම්බන්ධීකරණ කමිටුවේ සාමාජිකයින් | | 92 |
| කොමිෂන් සභාවේ සාමාජිකයන් | | 93 |
| උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුවේ සාමාජිකයන් | | 94 |

# පෙරවදන

1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත මගින් ස්ථාපිත කර ඇති ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ සෑම අංශයක් පිළිබඳව ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය කිරීමේ බලය පවරා ඇත.

උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා ඉදිරිපත් කිරීමේ වගකීම් ඉටු කිරීම පිණිස කොමිෂන් සභාව 1991 වසරේ පටන්ම වරින්වර ප්‍රතිපත්ති යෝජනා සකස් කර ඇත. 1995 වසරේදී, ජාතික උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳව වැඩමුළුවක් පවත්වන ලද අතර, ඉන් පසුව සිදු කරන ලද සාකච්ඡා මාලාවකින් පසුව ''විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය'' නමින් සකස් කරන ලද ලේඛනයක් අතිගරු ජනාධිපතිතුමියට 1996 ජුනි වසරේදී ඉදිරිපත් කරන ලදී. කොමිෂන් සභාව විසින් 2000 වසරේ මැයි මාසයේ දී, ''විශ්වවිද්‍යාල සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා වූ ප්‍රතිපත්තිය'' නම් ලේඛනයක්ද සම්පාදනය කර, ඉදිරිපත් කර ඇත.

ඉන් පසුව, 2009 ජුනි මාසයේදී, කාර්මික සහ වෘත්තීය අධ්‍යාපනය ද ඇතුළුව උසස් අධ්‍යාපනය පිළිබඳ පරිපූර්ණ ජාතික ප්‍රතිපත්ති රාමුව සකස් කර අතිගරු ජනාධිපතිතුමා වෙත පිළිගන්වන ලදී.

අවුරුදු දහයකට පසුව, මෙම ලේඛනය යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාව පැන නැගී තිබේ. ඒ අනුව, ප්‍රතිපත්ති ලේඛන දෙකක් සම්පාදනය කිරීමට කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී. ඉන් එකක් තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය පිළිබඳවය. අනෙක රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශවල උසස් අධ්‍යාපනය පිළිබඳවය. පළමුවැන්න 2018 වසර අවසානයේදී ප්‍රකාශයට පත් කරන ලද අතර, 2019 මැයි මාසයේදී අතිගරු ජනාධිපතිතුමාට එය පිළිගන්වනු ලැබිණ.

මෙම උසස් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය කිරීමේදී, 2017 වසරේ පටන්, අදියර ගණනාවකදීම අදාළ සියලු පාර්ශ්වකරුවන්ගෙන් අදහස් විමසන ලදී. පාර්ශ්වකරුවන් ඉදිරිපත් කළ සමහර අදහස් එකිනෙක සමග ගැටෙන සුළු ඒවා විය. එසේ වුවත්, උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුවේත්, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේත් සංශෝධන මත, ඔවුන්ගේ අදහස් සහ යෝජනා මෙම ලේඛනයට ඇතුළත් කර ඇත.

ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය, මේ ලේඛනය අවසානයේදී කාලානුක්‍රමිකව දක්වා ඇත.

ප්‍රතිපත්ති ලේඛනයේ අවසන් පිටපත, උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුවේ රැස්වීම් තුනකදීත්, කොමිෂන් සභාවේ රැස්වීම් දෙකකදීත් සාකච්ඡා කර අනුමත කරනු ලැබිණ.

මෙම ලේඛනය අතිගරු ජනාධිපතිතුමාට යථා කාලයේදී පිළිගැන්වෙනු ඇත.

මෙම ප්‍රයත්නය සාර්ථක කර ගැනීමට දායක වූ සියලු දෙනාටම මගේ කෘතඥතාව පළ කරන්නෙමි.

**මහාචාර්ය ඩබ්. අයි. සිරිවීර**
සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

## 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ උපුටනයන්.

## ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව හා එහි කාර්ය භාරය

(1) කොමිෂන් සභාවේ කර්තව්‍ය

(අ) අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලසුම හෝ සැලසුම් වහා සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව, අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වාගෙන යාම සහතික කිරීමේ සහ සමාජයේ වෙනස් වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලතාව දක්වීම හැකි කිරීමේ අදහස ඇතිව, අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලුම අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ආ) ක්‍රියාත්මක වෙමින් පවතින ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලැස්ම හෝ සැලසුම් කලින් කල සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ද අවශ්‍ය විටක ඒ ප්‍රතිපත්තියේ, සැලැස්මේ හෝ සැලසුම්වල ඇති කළ යුතු වෙනස්කම් ජනාධිපතිවරයාට නිර්දේශ කිරීම;

(ඇ) කොමිෂන් සභාවේ උපදෙස් සඳහා ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි, අධ්‍යාපනයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට උපදෙස් දීම.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය හැක්කේ යම් කාරණා සම්බන්ධයෙන් ද, ඒ කාරණාවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, කොමිෂන් සභාව විසින් පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය හැකියඃ-

(අ) සේවා නියුක්තිවලට, කර්මාන්තවලට හා සාමාජික අවශ්‍යතාවලට සරිලන පරිදි අධ්‍යාපනය සකස් කිරීමෙහිලා අවශ්‍ය වන, අධ්‍යාපනික ආයතනවල විෂයමාලාව හා ඉගැන්වීම් ක්‍රමවල ඇති කළයුතු වෙනස්කම්;

(ආ) අධ්‍යාපනික ආයතනවල ශිෂ්‍යයන්ට ඔවුන්ගේ ස්වශක්තිය පූර්ණාකාරයෙන් වැඩි දියුණු කරගැනීමට හැකිවන පරිදි, ලබාදිය යුතු මාර්ගෝපදේශකත්වයේ හා උපදේශ සේවාවල ප්‍රමාණවත් භාවය;

(ඇ) අධ්‍යාපනික ආයතන හා ප්‍රජාව අතර සම්බන්ධතා ශක්තිමත් කිරීමෙහි ලා අවශ්‍ය වැඩ පිළිවෙළවල්;

(ඈ) ප්‍රජාවේ සමස්ත මානුෂික සංවර්ධනය උදෙසා අධ්‍යාපනික ආයතන, සම්පත් මධ්‍යස්ථාන වශයෙන් වැඩි දියුණු කිරීම;

(ඉ) ප්‍රාදේශීය වශයෙන් පාසල් අතර පවත්නා අතුල්‍යතා අඩු කිරීමෙහි ලා ගැනීමට අවශ්‍ය පියවර;

(ඊ) ගුරුවරුන් සහ අධ්‍යාපන සේවා කාර්ය මණ්ඩලයේ වෘත්තීය තත්ත්වය නගා සිටුවීම සඳහා අවශ්‍ය පියවර;

(ඌ) ප්‍රාථමික හා ද්විතීයික පාසල් නියමිත කාලයට පෙර හැර යන ළමයින්ට, ඔවුන්ගේ ශක්‍යතාව පූර්ණාකාරයෙන් වැඩි දියුණු කර ගැනීමට හැකිවන පරිදි ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා සැලැස්විය හැකි විකල්ප වැඩසටහන්;

(ඍ) සියලු ජන කොටස්වල සහ ආගම්වල ශිෂ්‍යයන්ගේ සංස්කෘතික හා ආගමික අපේක්ෂාවන් පෝෂණය කිරීමෙහි ලා අවශ්‍ය වන විෂයමාලාවල ඇති කළ යුතු වෙනස්කම්;

(එ) එවැනි යම් නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය නීතිමය වෙනස්කම්.

**ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට පහත දැක්වෙන කාරණා ඇතුළත් වේ.**

අධ්‍යාපනයේ පරමාර්ථ හා නිෂ්ඨාවන්; පෙර පාසල්, ප්‍රාථමික, ද්විතීයික, තෘතීයික, උසස්, නොවිධිමත්, අවිධිමත්, වැඩිහිටි, විශේෂ, වෘත්තීය හා ආගමික යන අධ්‍යාපන ක්‍රමයේ ව්‍යුහය; ශිෂ්‍යයන් ඇතුළත් කරගැනීම හා ගුරුවරුන් බඳවා ගැනීම සඳහා වූ ක්‍රම හා නිර්නායක ඇතුළුව අධ්‍යාපන ආයතනවල පිහිටීම සහ ඒවායේ ව්‍යාප්තිය; ඉගැන්වීමේ මාධ්‍යය, විෂයමාලා විවිධාංගීකරණය, පෙළ පොත් සහ ඉගෙනුම් උපකරණ, ආගමික දැනුම, පිළිපැදීම හා පරිචය ලබන ස්ථානය, තක්සේරු කිරීම හා ඇගයීම, විභාග ක්‍රමය, සහතික, අභිඥන පත්‍ර සහ ශාස්ත්‍රීය ප්‍රදාන හා සුදුසුකම් පිළිගැනීම, ගුරුවරුන් උපකාරක අධ්‍යාපන කාර්ය මණ්ඩලය, අධීක්ෂකයන් සහ පරිපාලකයන් ඇතුළුව අධ්‍යාපන සේවා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, ස්ථාපනය කිරීම, ඔවුන්ගේ විනය පාලනය සහ වෘත්තීය වර්ධනය; ප්‍රජා සහභාගීත්වය උපයෝගී කර ගැනීමද ඇතුළුව අධ්‍යාපනය සඳහා වූ සම්පත්; සහ දිවා ආහාරය, සෞඛ්‍ය හා දන්ත සේවා, ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා ඇතුළුව ඉගෙනීම සඳහා වූ උපකාරක සේවා.

**කොමිෂන් සභාවේ සංයුතිය**

කොමිෂන් සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය:-

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ආ) 1990 අංක 20 දරන තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන පනතින් පිහිටුවන ලද තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ඇ) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඈ) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඉ) පළාත් සභා විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඊ) අධ්‍යාපනය, පරිපාලනය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍රවල, හැකියාවක් දක්වා ඇත්තා වූ හෝ යම් වෘත්තියක විශිෂ්ඨත්වයක් ලබා ඇත්තා වූ තැනැත්තන් අතුරින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු වෙනත් සමාජිකයන් දහ දෙනෙක්. 5 වන වගන්තිය යටතේ පත්කරනු ලබන සභාපතිවරයා, උප සභාපතිවරයා (ප්‍රතිපත්ති) සහ උප සභාපතිවරයා (සැලසුම්) කොමිෂන් සභාවට පූර්ණ කාලීනව සේවය කළ යුතුය.

## විධායක සාරාංශය

උසස් අධ්‍යාපන පිළිබඳ මෙම ප්‍රතිපත්ති යෝජනාවලිය ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2009 දී ඉදිරිපත් කරන ලද යෝජනාවලියට පසුව ඉදිරිපත් කෙරෙන පළමුවැන්නයි. මෙම ප්‍රතිපත්ති යෝජනා සකස් කිරීමේ දී 2017-2020 වසර සඳහා රජය ඉදිරිපත් කර ඇති මහජන ආයෝජන වැඩසටහන සහ තිරසාර සංවර්ධන අරමුණු සැලකිල්ලට ගනු ලැබිණ. මෙම ලියවිල්ලේ එක් එක් කොටසකින් ඉදිරිපත් කෙරෙන්නේ යෝජිත ප්‍රතිපත්ති සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගයි. ප්‍රතිපත්ති මාලාව සකස් කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාවලිය ලේඛනය අවසානයේ ලුහුඬින් දක්වා ඇත.

### පරිපාලනය, මූල්‍ය සහ සම්පත් කළමනාකරණය

විශ්වවිද්‍යාලවල සිදුවන ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල සංඛ්‍යාවන් හි ශීඝ්‍ර ව්‍යාප්තිය පරිපාලනය, මූල්‍ය සහ සීමිත සම්පත් කළමනාකරණය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයටත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට මෙන්ම විශ්වවිද්‍යාලවලටත් බලපෑමක් ඇති කරන සාධක වෙති. මේවා, උසස් අධ්‍යාපනයේ පාර්ශ්වකරුවන් අතර සාකච්ඡා වී ඇති තේමා ද වෙති. මෙම කරුණු සහ විවාද ද, ඒවායේ ප්‍රතිපත්තිමය ඇඟවීම් පිළිබඳව ද සමාලෝචනයක් ඉදිරිපත් කෙරෙන මෙම පරිච්ඡේදයෙන් පහත සඳහන් තේමා පිළිබඳව ප්‍රතිපත්ති නිර්දේශ යෝජනා කෙරේ. (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්වායත්තතාව (ii) විශ්වවිද්‍යාලවල ස්වායත්තතාව සහ වගවීම, (iii) විශ්වවිද්‍යාලවලට අවශ්‍ය ප්‍රමාණවත් අරමුදල් සොයා ගැනීම (iv) රාජ්‍ය විශ්වවිද්‍යාලවලට අරමුදල් සැපයීම (v) උප කුලපතිවරුන් පත් කිරීම පිළිබඳ ක්‍රියාපටිපාටිය, (vi) විශ්වවිද්‍යාල පාලක සභාවේ කාර්ය භාරය, (vii) ආචාර්ය මණ්ඩලයට චර්යා ධර්ම සංග්‍රහයක් සැකසීම, (viii) අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම, (ix) අනධ්‍යයන කාර්ය මණ්ඩලයට කාර්ය උපමාන, (x) විශ්වවිද්‍යාල පරිපාලනයේ ශිෂ්‍ය සහභාගිත්වය සහ (xi) කළමනාකරණ තොරතුරු පද්ධතියක් පිහිටුවීම.

යෝජිත නිර්දේශ සකස් වී තිබෙන්නේ පහත සඳහන් ප්‍රතිපත්තිමය උපකල්පන පිළිගැනීම වටාය. විශ්වවිද්‍යාල පරිපාලනය තුළ නිර්දේශපාලනීයකරණය, විනිවිද පෙනෙන සහ කාර්යක්ෂම පරිපාලනය සඳහා නව උපමාන සහ භාවිත ආරම්භ කිරීම, විශ්වවිද්‍යාලවලට රාජ්‍ය-නොවන මූලාශ්‍ර වලින් අරමුදල් සපයා ගැනීමේ මාර්ග සොයා බලන අතරම රජය මගින් ලබා දෙන අරමුදල් වැඩි කිරීම, සහ අරමුදල් කළමනාකරණය කිරීමේ භාවිත නවීකරණයට පාත්‍ර කිරීම.

### උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය, ශිෂ්‍ය ඇතුළත්වීම් හා නව විෂයයන් හා විෂය ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම.

උසස් අධ්‍යාපනය සඳහා ඇති ඉල්ලුම ඉහළ යද්දී, හේතු ගණනාවක් නිසා උසස් අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ ඉඩ ප්‍රස්ථා සීමා වී තිබේ. මෙම ගැටලුව විසඳීම සඳහා සිදු කරනු ලැබූ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සාර්ථක වී තිබෙන්නේ අර්ධ වශයෙනි. උසස් අධ්‍යාපනයට ප්‍රවේශ වීමට ඇති අවකාශ පුළුල් කිරීමේ අරමුණෙන්, උසස් අධ්‍යාපනයේ දොරටු පුද්ගලික අංශයට විවෘත කිරීම මෑතදී ක්‍රියාත්මක වූ නව ප්‍රතිපත්ති අතරින් එකකි. උසස් අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවකාශ පුළුල් කිරීමේ අවශ්‍යතාව ද සමග අධ්‍යයන ශික්ෂණ, විෂය ධාරා සහ පාඨමාලා ද, උසස් අධ්‍යාපනයේ සහ පුහුණුවේ අරමුණු සහ අන්තර්ගතය නව-දිසාවන්ට යොමු කිරීම ඉලක්ක කරගෙන විවිධාංගකරණයට පාත්‍ර කිරීමේ අවශ්‍යතාව ද සමාන්තරව පැන නැඟ තිබේ.

යෝජනාවලියේ මෙම කොටසින්, පහත සඳහන් උප-මාතෘකා යටතේ සාකච්ඡා වන්නේ මෙකී නව අභියෝගයන්ය. (i) සිසුන් බඳවා ගැනීම, (ii) දැනට පවත්නා කෝටා ක්‍රමය, (iii) ශිෂ්‍යයින් ඇතුළත් කිරීමේ දී ඇතිවන ප්‍රමාදවීම්, (iv) ශිෂ්‍යයින් බඳවා ගැනීමේදී ඇතිවන ස්ත්‍රී-පුරුෂ විවිධතා, (v) ස්ත්‍රී-පුරුෂ සමතාව, (vi) බාහිර උපාධි පාඨමාලා, (vii) යටිතල පහසුකම්, (viii) නව පාඨමාලා සහ වැඩසටහන්, (ix) නිපුණතා, සහ (x) ආකල්පමය පරතරය.

ඊට අමතරව මෙම කොටසින් පහත සඳහන් ප්‍රතිපත්තිමය කරුණු අට සම්බන්ධ නිර්දේශ යෝජනා වේ; (i) දිස්ත්‍රික් කෝටා ක්‍රමය සමාලෝචනය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම, (ii) ඉඩකඩ සහ යටිතල පහසුකම් සම්බන්ධ සීමා ජය ගැනීම, (iii) පාඨමාලා නවීකරණයේ සහ හවුල්කාර සහයෝගතාවයේ අවශ්‍යතාව, (iv) උසස් අධ්‍යාපන ආයතන පිටපළාත්වල පිහිටුවීමේ අවශ්‍යතාව, (v) උසස් අධ්‍යාපනයේ පාඨමාලා ණයවර හුවමාරු කිරීමේ (credit transfer) නව ක්‍රමයක් හඳුන්වා දීම, (vi) මෘදු කුසලතාවල පරිමාව ශක්තිමත් සහ පුළුල් කිරීම, (vii) ඵලදායී ඉගෙනීමේ වටපිටාවක් ගොඩ නැගීම, සහ (viii) බාහිර උපාධි වැඩසටහන් සංශෝධනය කර ශක්තිමත් කිරීම.

### වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය

විශේෂයෙන් කලා, සමාජීය විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨවල උපාධිධාරීන් වෙතින් ප්‍රකාශයට පත්වන උසස් අධ්‍යාපනය සහ සේවා වියුක්තිය සම්බන්ධ විෂමතාව ජය ගැනීමට දක්වන ප්‍රතිපත්තිමය ප්‍රතිචාරයක් වශයෙන් රාජ්‍ය විශ්වවිද්‍යාලවල සියලුම උපාධි අපේක්ෂකයින්ට වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය හඳුන්වා දී තිබේ. ඇතැම් පෞද්ගලික විශ්වවිද්‍යාල තම වැඩසටහන්වලට වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය සම්බන්ධ කරගෙන තිබේ. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල විසින් ගනු ලැබූ විවිධ ප්‍රයත්න තිබියදී පවා, ප්‍රථම උපාධි අධ්‍යාපනයට සහ පුහුණුවට අත්‍යවශ්‍ය මෙම වැදගත් වැඩසටහන එය වඩාත්ම අවශ්‍ය පීඨවල පවතින්නේ ආන්තිකකරණයට ලක් වෙමිනි.

වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය ප්‍රථම උපාධි පුහුණුවේ අනිවාර්ය අංගයක් ලෙස ඒකාග්‍රකර ගැනීමේ අභියෝගය සාකච්ඡා කරන මෙම කොටස, ඒ සඳහා ප්‍රතිපත්ති නිර්දේශ ද යෝජනා කරයි. මෙහි සාකච්ඡාව සංවිධානය වී තිබෙන්නේ පහත සඳහන් උප-තේමා වටාය. (i) වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ප්‍රතිපත්තිය, (ii) වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනට පවත්නා තත්ත්වය, (iii) වෘත්තීය මාර්ගෝපදේශනය සහ බාහිර උපාධිධාරීන්, (iv) වෘත්තීය මාර්ගෝපදේශනය සහ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන, සහ (v) වෘත්තීය උපදේශනය.

යෝජිත ප්‍රතිපත්ති නිර්දේශ ඉදිරිපත් කර ඇත්තේ පහත සඳහන් කරුණු සඳහාය; (i) වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය, (ii) විදේශයන්හි යොදා ගන්නා මාදිලි සහ මෙවලම් ප්‍රයෝජනවත් ද නැද්ද යන වග (iii) වෘත්තීය මාර්ගෝපදේශනය ආයතනගත කිරීම, (iv) වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා වෘත්තීය මට්ටමේ පුහුණුව, (v) දැනට තිබෙන වැඩසටහන් යාවත්කාලීන කිරීම, (vi) ආචාර්යවරුන් අතර තිබෙන විවිධ අදහස් සමෝධානය කිරීම, (vii) අංග සම්පූර්ණ වැඩසටහන් ආරම්භ කිරීම, (viii) විශ්වවිද්‍යාල මට්ටමේ ඉගැන්වීමේ විධි ක්‍රමය පරිවර්තනය කිරීම, සහ (ix) බාහිර උපාධි අපේක්ෂකයින්ගේ කුසලතා සංවර්ධනය.

මේ පරිච්ඡේදයේ ඇති සමස්ත විග්‍රහය අවධාරණය කරන්නේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල, වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය සඳහා අංග සම්පූර්ණ සහ ප්‍රතිඵල ගෙන දෙන ප්‍රවේශයක් යොදාගත යුතුය යන කරුණුයි.

### ශිෂ්‍ය සුභසාධනය සහ විනය

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ශිෂ්‍ය සුභසාධනය සහ විනය යනු එකිනෙක සමග බැඳුණු තේමාවන් වන අතර ඒවා වඩාත් ප්‍රමුඛව මතු වන්නේ රාජ්‍ය විශ්වවිද්‍යාලවලය. ශිෂ්‍ය සුභසාධනය දියුණු කිරීමටත්, ශිෂ්‍යයන් අතර ඇති ප්‍රචණ්ඩත්වය මෙන්ම විනය බිඳවැටීම යන නිරතුරුව මතුවන සඳාකාලික ප්‍රශ්න විසඳීමටත් ආණ්ඩුව සහ විශ්වවිද්‍යාල බලධාරීන් ගෙන ඇති ප්‍රයත්නවලින් තිරසාර ප්‍රතිඵල තවමත් ලැබී නැත.

රාජ්‍ය විශ්වවිද්‍යාල වල ඇති මෙම සංකීර්ණ ප්‍රශ්නය පිළිබඳව මෙම කොටසින් සාකච්ඡා වන අතර, සෑම පාර්ශ්වයකම සැලකිල්ල යොමු විය යුතු ප්‍රතිපත්ති විකල්ප කිහිපයක් ද එයින් යෝජනා වේ. පරිච්ඡේදයේ එන සාකච්ඡාව පහත සඳහන් තේමා මත ගොඩ නැගී ඇත. (i) සුභසාධනය, (ii) අවිනය සහ ප්‍රචණ්ඩත්වය, (iii) ප්‍රචණ්තා, (iv) නවක වදය, (v) ප්‍රචණ්ඩත්වය සහ නවක වදය දේශපාලන වශයෙන් මෙහෙයවීම, සහ (vi) සිසුන් සහ විශ්වවිද්‍යාල පරිපාලනය.

පහත සඳහන් කරුණු වටා ප්‍රතිපත්ති නිර්දේශ හයක් මෙම කොටසින් යෝජනා වේ. (i) ශිෂ්‍ය සුභසාධනය සහ විනය සම්බන්ධයෙන් දිගටම පවත්නා අර්බුදය, (ii) නවක වදය සහ විනය, (iii) වඩා යෝග්‍ය ප්‍රතිපත්තිමය ප්‍රතිචාරවල අවශ්‍යතාව, (iv) සිසුන් සහ විශ්වවිද්‍යාල පරිපාලනය, (v) ශිෂ්‍ය සංගම්වල නියෝජනයේ බහුත්වවාදයේ අවශ්‍යතාව, (vi) ආචාර්ය මණ්ඩලය සහ සිසුන් අතර සමීප අන්තර්-සම්බන්ධතා පැවතීමේ අවශ්‍යතාව.

මෙම සාකච්ඡාවෙන් මතු කෙරෙන ප්‍රධාන තර්කය නම් ශිෂ්‍ය සුභසාධනය සහ විනය පිළිබඳ ගැටලුව දෙස නව දෘෂ්ටියකින් බැලිය යුතු බව සහ නවක වදය සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ගැටළුවට ආමන්ත්‍රණය කරනු සඳහා, නීතිය හා සාමය පිළිබඳ කරුණුවලට සීමා නොවී, ඒ සඳහා අංග සම්පූර්ණ ප්‍රවේශයක් යොදාගත යුතු බවත්ය.

### පශ්චාද්-උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ

දැනට ශ්‍රී ලංකාවේ තිබෙන විශ්වවිද්‍යාල ක්‍රමය පශ්චාද්-උපාධි පුහුණුව සහ පර්යේෂණ සඳහා සකස් කර ඇති බව නොපෙනේ. එහෙත්, 1980 ගණන්වල පටන් පශ්චාද්-උපාධි අධ්‍යාපනය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ඇති අතර, මේ වන විට එය විශ්වවිද්‍යාලවල අධ්‍යාපනයේ සහ පුහුණුවේ අනිවාර්ය අංගයක් වී තිබේ. එවැනි ව්‍යාප්ත වීමක් සිදුවී තිබෙන නමුදු, ශ්‍රී ලංකාවේ පශ්චාද්-උපාධි අධ්‍යාපනය තවමත් පවතින්නේ පරිණාමයවන ක්‍රියාවලියක් තුළ, බොහෝ අභියෝග සහ ගැටලුවට මුහුණ දෙමිනි. ප්‍රමාණාත්මක වශයෙන් ඇති වී තිබෙන ව්‍යාප්තිය නිසා පශ්චාද්-උපාධි ක්ෂේත්‍රයේ ද ගුණාත්මක තත්ත්වය සහ ගැටලු පිළිබඳ ගැටළු මතු වී තිබේ.

මෙම කොටසින් එම ගැටලු විමර්ශනයට භාජනය කරමින්, ඒවා විසඳීම සඳහා ප්‍රතිපත්ති ද යෝජනා කෙරේ. මෙහි ගොඩ නැගෙන විග්‍රහය පහත සඳහන් උප-තේමා යටතේ සකස් වී ඇත. (i) රාජ්‍ය විශ්ව විද්‍යාලවල පවත්නා පශ්චාද්-උපාධි අධ්‍යාපනය : සමස්ත චිත්‍රය, (ii) ඉගැන්වීමේ පාඨමාලා සහිත පශ්චාද්-උපාධි පාඨමාලා සම්බන්ධ ගැටලු, සහ (iii) පශ්චාද්-උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ පිළිබඳ පවත්නා තත්ත්වය සහ අභියෝග.

යෝජනා කර ඇති ප්‍රතිපත්ති නිර්දේශ පහත සඳහන් තේමා යටතේ ඉදිරිපත් කෙරේ. (i) ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව, (ii) පොදු නෛතික රාමුවක අවශ්‍යතාව (iii) ගුණාත්මක තත්ත්වය සහ ප්‍රමිතීන්, (iv) පූර්ණ-කාලීන පශ්චාද්-උපාධි පුහුණුව සහ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, (v) පශ්චාද්-උපාධි අධ්‍යාපනය ජාත්‍යන්තර කිරීමේ අවශ්‍යතාව, (vi) අන්තර්-ආයතනික සහයෝගිතාව, (vii) ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව ලබාගත යුතු විශිෂ්ටත්වය, සහ (viii) ආචාර්ය මණ්ඩලයේ ගුණාත්මක තත්ත්වය.

මෙම කොටසින් ඉදිරිපත් කෙරෙන මූලික තර්කය නම්, දැනට තිබෙන පශ්චාද්-උපාධි ඉගැන්වීම් පුහුණු කිරීම් සහ පර්යේෂණ වැඩසටහන් අංග සම්පූර්ණ සමාලෝචනයකට සහ ප්‍රතිසංස්කරණයකට පාත්‍ර කළ යුතු බව සහ එහි අරමුණ විය යුත්තේ මෙම ව්‍යාප්තවන විශ්වවිද්‍යාල අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ගුණාත්මක තත්ත්වය සහ ප්‍රමිතීන් ගෝලීය මට්ටමට ගෙන එමින්, එය ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ජීවිතයේ ප්‍රධාන ධාරාවේ සුජාත අංගයක් බවට පත් කළ යුතුය යන්නයි.

## රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල ගුණාත්මකභාවය සහතිකකරණය හා ප්‍රතීතනය

ගුණාත්මක තත්ත්ව සහතිකකරණය උසස් අධ්‍යාපනය පත් වී ඇති මෑත කාලීන සහ අතිශයින්ම තීරණාත්මක පරිවර්තනයකි. ගුණාත්මක තත්ත්ව සහතිකකරණය එක් එක් රටකට සුවිශේෂී වන අතර, එය පදනම් විය යුත්තේ රටෙහි නිශ්චිත අත්දැකීම් මතය. එමෙන්ම තත්ත්ව සහතිකකරණයේ මූලික උපාංග තෝරා ගැනීම, ප්‍රවේශය, ඇගයීම් විධික්‍රම, සහ තත්ත්ව සහතිකකරණයේ මූලික ක්ෂේත්‍ර ලෙස සැළකෙන්නේ පහත සඳහන් ඒවාය. (i) පාඨමාලාව (ii) ඉගැන්වීමේ සහ ඉගෙනීමේ ක්‍රියාවලිය, (iii) විශ්වවිද්‍යාල භාවිත කරන ඇගයීම් ක්‍රම, (iv) ගුරුවරුන්ගේ ගුණාත්මක තත්ත්වය, (v) පර්යේෂණ සහ නව නිපැයුම්, සහ (vi) ජාතික සහ ජාත්‍යන්තර උපමානවලට අනුගත වීම.

තත්ත්ව සහතිකකරණය ක්‍රියාත්මක කෙරෙන්නේ අභ්‍යන්තර සහ බාහිර තත්ත්ව සහතිකකරණ ක්‍රියාවලියක් තුළිනි. සෑම විශ්වවිද්‍යාලයකම ඇති අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ ඒකකය තුළින් සිදුවන්නේ, එක් එක් විශ්වවිද්‍යාලයක පවත්නා ඉගැන්වීම, පර්යේෂණ සහ සේවා සැපයීම යන කාර්යයන් තුනෙහි ගුණාත්මක තත්ත්වය සහතික කිරීමයි. මේ අතර රජය (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව) කරන්නේ, නිර්දේශිත තත්ත්ව සහතිකකරණ රාමුවට අනුකූලව බාහිර තත්ත්ව සහතිකකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමයි. එමෙන්ම ජාත්‍යන්තරකරණය සහ ජාත්‍යන්තර සහයෝගිතාව උසස් අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය නැංවීමේ ඵලදායී මාධ්‍යයක් විය හැකිය. උසස් අධ්‍යාපන ආයතනවල තිබෙන ජාත්‍යන්තර වැඩසටහන්වල ගුණාත්මක තත්ත්වය සහ ප්‍රමිතීන් සහතික කිරීමේ ප්‍රතිෂ්ඨාපිත මාර්ගෝපදේශන තිබේ.

විශේෂයෙන් කලා, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨවලට සිසුන් බඳවා ගැනීම විශාල ලෙස ව්‍යාප්ත වීම, බාහිර උපාධි පාඨමාලා ව්‍යාප්ත වීම සහ පුද්ගලික උසස් අධ්‍යාපන ආයතන බිහිවීම නිසා ශ්‍රී ලංකාවේ ගුණාත්මක තත්ත්ව සහතිකකරණයේ න්‍යාය පත්‍රයට නව අභියෝග ඉදිරිපත් වී තිබේ. පාඨමාලාවල අදාළතාව, සීමිත සම්පත්, ගුණාත්මක වශයෙන් ඉහළ කාර්ය මණ්ඩලවල අවශ්‍යතාව, වැඩිහිටි අධ්‍යාපන ක්‍රමවේදය හඳුන්වා දීම සහ ඵලදායී ඇගයීමේ ක්‍රමවේද හඳුන්වාදීම යන මේවා, ඉහළ ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ආමන්ත්‍රණය කළ යුතු කරුණුය.

## අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සංවර්ධනය

කාර්ය මණ්ඩල සංවර්ධනයේ අරමුණ වන්නේ, ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තමන්ට නියමිත කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය කාර්යක්ෂමතාව සහ ඵලදායිත්වය වැඩි දියුණු කිරීමයි. ආයතනයේ සහ එහි වැඩසටහන්වල ගුණාත්මක තත්ත්වය සහතික කිරීම සඳහා කාර්ය මණ්ඩල සංවර්ධනය අනිවාර්යවේ.

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්වල පහත සඳහන් ලක්ෂණ නිරීක්ෂණය කළ හැකිය : (i) පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන සමග සසඳා බලන විට රාජ්‍ය විශ්වවිද්‍යාල, සාපේක්ෂ වශයෙන් වඩා හොඳින් සංවිධානාත්මකව, තම කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරති; (ii) පවත්නා

කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් අධ්‍යයන කාර්ය මණ්ඩලයට වැඩි අවධානයක් යොමු කරන නමුදු, අනධ්‍යයන කාර්ය මණ්ඩලයට දක්වන්නේ අඩු අවධානයකි; (iii) මෙම වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙන්නේ අක්‍රමවත්ව වන අතර ඒවා ආයතනගතවීමට හෝ වෘත්තීකකරණයට හෝ ලක් කර නැත. (iv) ආධුනික ආචාර්යවරුන්ට හැර අනෙකුත් ආචාර්යවරුන්ට කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්වලට සහභාගි වීම අනිවාර්ය කර නැති අතර එය උසස් වීම්වලට සම්බන්ධ කර නැත. (v) පුහුණු වැඩසටහන් වැඩිපුර අවධානය යොමු කරන්නේ සාම්ප්‍රදායික ඉගෙනීමේ විධික්‍රම වලටය; වෘත්තික කුසලතා සංවර්ධනයට සහ සාධනීය වැඩ දැක්මක් ගොඩනැගීමට ඒවා දක්වන්නේ අඩු අවධානයකි.

ඉගැන්වීමේ නව විධික්‍රම සහ නිර්මාණාත්මක ඇගයීම්ක්‍රම පිළිබඳව කාර්ය මණ්ඩලය පුහුණු කිරීම, ඔවුන්ගේ පර්යේෂණ හැකියාවන් ශක්තිමත් කිරීම සහ පශ්චාද්-උපාධි පුහුණුව ඇතුළු ක්‍රියාමාර්ග තුළින් ඉහත දැක්වූ ගැටලුවලට ආමන්ත්‍රණය කිරීම සඳහා, මේ සම්බන්ධව ඉදිරිපත් කෙරෙන ප්‍රතිපත්ති යෝජනාවලින් උත්සාහ කෙරේ.

**පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන හා පෞද්ගලික ආයතන සහ රජය අතර සම්බන්ධතාව**

ශ්‍රී ලංකාවේ දැනට පවතින අධ්‍යාපන සිතියම, අවුරුදු දශකයකට පෙර පැවතුණු තත්ත්වයෙන් තව දුරටත් පවතින්නේ නැත. ප්‍රථම උපාධි, පශ්චාද්-උපාධි, ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා පවත්වන පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන බිහිවීමත් සමග එය වෙනස් වී තිබේ. පෞද්ගලික අංශයේ ව්‍යාප්තිය සිදුවෙමින් පවතින්නේ, ලංකාවේ උසස් අධ්‍යාපනය වෙනුවෙන් නිරන්තරයෙන් ඉහළ යන ඉල්ලුමට මුහුණ දීමට උසස් අධ්‍යාපනයේ රාජ්‍ය අංශය අපොහොසත් වීමේ පසුබිම තුළය. උසස් අධ්‍යාපනයට පෞද්ගලික අංශය සහභාගී වීම ගැන තිබුණ දේශපාලන විරුද්ධත්වය සහ සමාජ විරෝධය දැන් බොහෝ දුරට අඩු වී තිබේ.

උසස් අධ්‍යාපනය සැපයීමට පෞද්ගලික අංශය සහභාගි වීමත් සමග නව ගැටලු පැන නැගී තිබේ. ඒ සඳහා ප්‍රතිපත්තිමය ප්‍රතිචාර අවශ්‍යය. මේ කොටසින් මෙම උප-තේමා ආශ්‍රයෙන් එම කරුණ සාකච්ඡා කෙරේ. (i) දැනට පවත්නා තත්ත්වය, (ii) ගැටලු, සහ (iii) රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය.

මෙම පරිච්ඡේදය ඉදිරිපත් කරන විග්‍රහය වෙතින් පැන නගින ප්‍රතිපත්ති නිර්දේශ පහත සඳහන් මාතෘකා යටතේ යෝජනා කර ඇත. (i) පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලට නියාමන රාමුවක් ඇති කිරීම (ii) පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන පිටපළාත් වලට පුළුල් කිරීම, (iii) දත්ත එකතු කිරීම සඳහා ප්‍රවේශයක් (iv) තත්ත්ව සහතිකකරණය, (v) හවුල්කාරිත්වය, (vi) ගුණාත්මක තත්ත්වය දියුණු කිරීමට බාහිර සහාය ලබා ගැනීම, (vii) විද්‍යා සහ තාක්ෂණික ක්ෂේත්‍රවල රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය, (viii) විදේශ සිසුන්ට වීසා බලපත්‍ර පහසුවෙන් ලබා දීම, (ix) සදාචාරාත්මක වෙළඳ ප්‍රචාරණයේ අවශ්‍යතාව, සහ (x) රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය

# 1. පරිච්ඡේදය

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන පද්ධතිය පරිවර්තනීය අවධියකට එළඹ ඇත. එය නව අභියෝග මාලාවකට මුහුණ දෙමින් සිටී. මෙම අභියෝග දේශීය සහ ගෝලීය යන මූලාශ්‍ර දෙක වෙතින් පැන නැගෙන ඒවාය.

මෙම පරිවර්තන ක්‍රියාවලියේදී මුහුණ දෙන දේශීය අභියෝග, ශ්‍රී ලංකාවේම පාසල් සහ උසස් අධ්‍යාපන ක්‍රමවලට සුවිශේෂ සාධක වෙතින් පැන නැගෙන ඒවාය. උසස් අධ්‍යාපන ක්‍රමය මුහුණ දී සිටින එකිනෙක සමඟ ගැටෙන විවිධ බලපෑම්වල ඇති පරස්පරතා ලෙස හැඳින්වෙන මෙම අභියෝග කාලයක් තිස්සේ වර්ධනය වී ඇත. මෑත කාලයේ ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණවල අවධානය යොමු වී තිබෙන්නේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සහ උපාධිධාරීන්ගේ සේවා වියුක්තිය අතර ඇති විෂමතාව අවම කිරීමේ අරමුණ වෙතය. මේ අනුව, ප්‍රථම උපාධි අධ්‍යාපනයේදී කුසලතා පුහුණුව සහ වෘත්තීය නැඹුරුතාව අවධාරණය කිරීමත්, දේශීය සහ ගෝලීය ශ්‍රම වෙළඳපොළවල රැකියා ලැබීමේ නිශ්චිතතාව සහිත උපාධිධරයන් බිහි කරන නව අධ්‍යාපන පීඨ විශ්වවිද්‍යාලවල ආරම්භ කිරීමත් යන පියවරවලට වර්තමාන ප්‍රතිපත්ති චින්තනයේ ප්‍රමුඛත්වය ලැබී ඇත. මේ අතර, උසස් අධ්‍යාපන අවස්ථා තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා වූ සමාජ අවශ්‍යතාවත්, ඉල්ලුමත් වැඩිවෙමින් පවතී. ඒ මඟින් අප රට දැනට පවත්නා රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියෙහි ඇති ධාරිතාව සහ සම්පත්වල සීමිත බව යන කරුණද මතු කොට දැක්වේ.

බාහිර අභියෝග පැන නගින්නේ ගෝලීය දේශපාලන ආර්ථිකයේ සිදුවන පරිවර්තනයේ වර්තමාන ඓතිහාසික අවධිය පිළිබඳ සන්දර්භය වෙතිනි. තාක්ෂණික විප්ලව, ප්‍රාග්ධනය, තාක්ෂණය සහ ශ්‍රමය ලෝක මට්ටමෙන් ගලා යාම, ආර්ථික සහ සමාජ විපරියාස කළමනාකරණය කිරීමේදී රජයේ කාර්යභාරය අභිභවන වෙළඳපොළ සිදුකරන අනවරත මැදිහත්වීම, සහ ගෝලීය වශයෙනුත් දේශීය වශයෙනුත් ශ්‍රම වෙළඳපොළෙහි සිදු වන අති මූලික වෙනස්වීම් යනාදි සාධක ගණනාවක ප්‍රතිඵලයක් වශයෙන් ලෝක ආර්ථිකයේ සිදුවන ක්ෂණික වෙනස්වීම් ද සමඟ, සෑම මට්ටමකම අධ්‍යාපනයේ අරමුණු සහ ස්වභාවය කුමක්ද යන්න යළි සංකල්පගත කිරීමට ද භාජනය වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ, එවැනි ගෝලීය ප්‍රවණතා සමඟ ද බද්ධ වී තිබේ.

මේ අතර සාම්ප්‍රදායික මෙන්ම නව අධ්‍යයන සහ පුහුණු ක්ෂේත්‍රයන්හි උසස් අධ්‍යාපන අවස්ථාවල ව්‍යාප්තිය, පසුගිය අවුරුදු කිහිපය තුළ සීඝ්‍ර ලෙස වැඩි වී තිබේ. වෘත්තීන් ඉලක්ක කොට ගත් උපාධි සඳහා ඇති ඉල්ලුමට මුහුණ දෙනු පිණිස වෛද්‍ය, ඉංජිනේරු, තාක්ෂණික සහ සෞඛ්‍ය අධ්‍යයන පීඨ අලුතින් ආරම්භ කිරීම සඳහා විශ්වවිද්‍යාල උනන්දු කරවීමට රජය පියවර ගෙන ඇත. රාජ්‍ය විශ්වවිද්‍යාල තවදුරටත් ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සපයන එකම ආයතන පද්ධතිය නොවේ. පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල සංඛ්‍යාව වැඩි වෙමින් පවත්නා අතර, ඒවා උසස් අධ්‍යාපනයට බැඳෙන සිසුන්ගේ සංඛ්‍යාව වැඩි වීමට ද දායක වෙති. මේ වෙනස්කම්, ගෝලීය ආර්ථිකයේ නව ගතිකත්වයන්, නව තාක්ෂණයේ සහ සන්නිවේදනයේ සීඝ්‍ර සහ පෙර නොවූ වෙනස් වීම්, ගෝලීය සහ දේශීය රැකියා වෙළඳපොලවල්වල ඇතිවන වෙනස්වීම් සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳ අදහස වෙත එල්ලවන නව ඉල්ලීම් යන මේවාට ප්‍රතිචාර වශයෙන් සිදුවන බවට කිසිදු සැකයක් නැත.

රාජ්‍ය සහ රාජ්‍ය-නොවන අංශවල සිදුවන ප්‍රථම උපාධි අධ්‍යාපනයේ ව්‍යාප්තිය වෙතින් ක්ෂණික අවධානය යොමු විය යුතු ගැටලු දෙකක් මතු කරනු ලැබ තිබේ. ඒවා නම්, එම අධ්‍යාපනයේ සහ පුහුණුවේ ගුණාත්මක බවේ අදාළතාවයත්, ඉහළ යන උපාධිධාරී සංඛ්‍යාවන්ට රැකියා සැපයීමට රටේ ආර්ථිකයට ඇති නොහැකියාවත්ය. මේ අතර 2013 වසරේ පටන් සිදුව ඇති පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල ඇති සීඝ්‍ර ව්‍යාප්තිය මගින්, ඒවා ලියාපදිංචි කිරීම, ප්‍රතීතකරණය, අධීක්ෂණය හා වාර්තාකරණය, අධ්‍යාපන වැඩසටහන්වල සහ ඒවායින් ඉදිරිපත් කරන පාඨමාලාවල සහ

උපාධිධරයන්ගේ ගුණාත්මකභාවය, යටිතල පහසුකම්, සහ මානව සම්පත් යන මේවා විසින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට නව වගකීම් පවරුනු ලැබ තිබේ.

මේ අවශ්‍යතාවලට ප්‍රතිචාර වශයෙන්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල අංශයේ නව ප්‍රතිසංස්කරණ හඳුන්වා දී තිබේ. එසේ ආරම්භ කරන ලද ප්‍රතිසංස්කරණවල ප්‍රධාන අරමුණක් වී ඇත්තේ ප්‍රථම උපාධි අධ්‍යාපනයේ ඇති ගුණාත්මකභාවය සහ අදාළතාව වැඩි දියුණු කිරීමයි. ඇතැම් ක්ෂේත්‍රවල, විශේෂයෙන් කලා, මානව ශාස්ත්‍ර, වාණිජ විද්‍යාව සහ විද්‍යා ක්ෂේත්‍රවල පවත්නා විශ්වවිද්‍යාල අධ්‍යාපනය සහ රැකියා අවකාශ අතර ඇති පරස්පරතාව පිළිබඳ ගැටලුවට ආමන්ත්‍රණය කිරීම සඳහා පියවර ගැනීමට විශ්වවිද්‍යාල උනන්දු කිරීමද මේ අතර සිදුවී තිබේ. තත්ත්ව පාලනය හා සහතික කිරීම සහ ප්‍රතීතනය වැනි යාන්ත්‍රණයන් ආයතනගත කිරීම අවධාරණය කිරීම ද, මෙකී අභියෝගවලට මුහුණ දීම සඳහා ඉදිරිපත් කර ඇති ප්‍රධාන පෙළේ ප්‍රතිචාරයන්ය.

මෙවැනි නව ප්‍රතිපත්ති ක්‍රියාවට යොදා තිබීමේදීත්, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2009 වාර්තාවෙන් අවධාරණය කරන ලද ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති විෂමතා, නව විෂමතා ද සමඟ තවමත් පවතියි. සමස්ත උසස් අධ්‍යාපන ක්‍රමය තුළ පවත්නා එවැනි විෂමතා පහත සඳහන් පරිදි හඳුනාගත හැකිය.

උසස් අධ්‍යාපනය සඳහා ඇති ඉඩ ප්‍රස්ථා තවමත් පවතින්නේ බෙහෙවින් සීමිතවය. 2016/2017 වසර තුළදී ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගත හැකි වූයේ 169,517ක් වූ සුදුසුකම් ලත් අපේක්ෂකයින්ගෙන් 30,662ක් පමණි. එය වූ කලී 19.10% ක් වූ ඉතාම අල්ප ප්‍රමාණයකි. මෙලෙස උසස් අධ්‍යාපනය සඳහා ඇති අභිලාශ සහ උසස් අධ්‍යාපනය ලැබීමට ඇති සැබෑ අවකාශ අතර ඇති පරතරය පිළිබඳ අතිශය විෂමතාව බරපතල සමාජ ප්‍රශ්නයක් ද වෙයි.

ප්‍රාථමික මට්ටමේ සිට තෘතීයික මට්ටම දක්වා වූ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය ''නිදහස් අධ්‍යාපන'' ක්‍රමයකැයි දක්වන නමුදු, උසස් අධ්‍යාපනය ලබාගැනීම සඳහා තිබෙන සමස්ත මාර්ගය මිළ ගණන් අධික සහ වියදම් සහිත එකකි. එය සමාජමය වශයෙන් අගතිගාමී සහ නාගරික සමාජයට වාසිදායක එකකි. මෙයට හේතුව තම දරුවන් ඉතාම තරඟකාරී විභාගවලට මුහුණ දීමට සූදානම් කිරීම සඳහා දෙමව්පියන්, පෞද්ගලික උපකාරක (ටියුෂන්) පන්තිවල පිහිට සොයා යෑමයි. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ, 2009 වර්ෂයේ කොමිෂන් සභා වාර්තාවෙන් නිරීක්ෂණය කරන ලද, ''උසස් අධ්‍යාපනයට ඇතුල් වීමේදී අඩු ආදායම් ලබන පවුල්වල දරුවන් පත්වී ඇති අවාසිදායක තත්ත්වය'' (NEC,2019:15) දිගටම පැවතීමයි. දුගී සමාජ පසුබිමකින් එන දරුවන් උසස් අධ්‍යාපන අවස්ථාවලින් සමාජමය වශයෙන් බැහැර කිරීම් තව තවත් උග්‍රවන මෙම තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයේ විශේෂයෙනුත්, සමස්ත අධ්‍යාපන ක්‍රමයේ පොදුවේත් ඇති ගැඹුරු අර්බුදයක් ප්‍රකාශයට පත් වෙයි. එය උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රතිපත්තිමය ප්‍රශ්න ද මතු කරයි.

ඊට සමානව, විශ්වවිද්‍යාලවල සහ අනෙකුත් තෘතීයික අධ්‍යාපන ආයතනවල ඉගෙන ගන්නා ශිෂ්‍ය ප්‍රජාවගෙන් බහුතරය සමන්විතවන අඩු ආදායම් ලබන පවුල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට රජයෙන් ලැබෙන ආධාර, සෞඛ්‍ය සම්පන්න ජීවන තත්ත්වයක් පවත්වා ගැනීමට ප්‍රමාණවත් වන්නේ නැත. ටියුෂන් කර්මාන්තය හේතු කොට ගෙන පාසල් අධ්‍යාපනයේ වියදම ඉහළ යාමත්, රටේ සාර්ව ආර්ථික තත්ත්වයේ සමස්ත පරිහානියත් නිසා, මධ්‍යම ආදායම් ලබන පවුල්වල සිසුන්ට ද දරුවන්ට ද අමතර ආර්ථික උපකාර අවශ්‍යවී තිබේ.

රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීම සඳහා වන සිසු ඉල්ලුම කළමනාකරණය සඳහා භාවිත වන මූලික මිනුම් දණ්ඩ වශයෙන් තවමත් පවතින්නේ දිස්ත්‍රික් කෝටා ක්‍රමයයි. සමාජ සමානත්වය සහ සමාන

අවස්ථා සහතික කිරීම සඳහා වූ යාන්ත්‍රණයක් ලෙස එය වැදගත් සේවාවක් ඉටුකර ඇති නමුදු, එහි සමහර නිශේධනීය ප්‍රතිවිපාකවලට තවමත් පිලියම් යෙදී නැත.

ව්‍යුහාත්මක ධාරිතාව, ඉඩකඩ, සහ මානව සම්පත් පිළිබඳ බරපතළ සීමාකම් තිබියදීත්, රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ යාම නිසා, විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා ඇති අවකාශය ද පුළුල් වී තිබේ. උපාධි අපේක්ෂක සංඛ්‍යාව සීඝ්‍රයෙන් ඉහළ යාම නිසා, සමහර පීඨවලින් ලැබෙන අධ්‍යාපනයේ සහ පුහුණුවේ ගුණාත්මකබව පිළිබඳ ප්‍රශ්න ද මතුවී තිබේ. බාහිර උපාධි අපේක්ෂක සංඛ්‍යාව ඉහළ දැමීම සම්බන්ධව මෙමගින් විශේෂයෙන් ප්‍රකාශ වී තිබේ.

විදේශ ආධාර ප්‍රයෝජනයට ගනිමින් විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ගුණාත්මකබව ඉහළ නැංවීම අරමුණු කරගත් වැඩසටහන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය සහ අදාළතාව ඉහළ නැංවීම (IRQUE) සහ විසි එක්වන සියවස සඳහා උසස් අධ්‍යාපනය (HETC), වඩාත් මෑතකදී ආරම්භ වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය සහ සංවර්ධනය කඩිනම් කිරීම (AHEAD), සහ තත්ත්ව සහතික කිරීම සහ ප්‍රතීතන ක්‍රියාවලිය යන වැඩසටහන්, විශ්වවිද්‍යාලවල ඇති ඉගැන්වීමේ සහ පුහුණු වැඩසටහන්වල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඉලක්ක කර ගත් ඒවා වෙති.

ශිෂ්‍යයන් අතර පවත්නා හිංසනය, නවක වදය, සහ නිතර සිදුවන ශිෂ්‍ය විනය බිඳවැටීම් යන මේවා තිරසාර විසඳුම් නැති අභියෝග ලෙස දිගටම පවතියි. එමෙන්ම, ශිෂ්‍ය උද්ඝෝෂණ, විරෝධතා පෙළපාලි, සහ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සමඟ ඇතිවන ගැටුම්, විශ්වවිද්‍යාලවල ඇති දුක්ගැනවිලිවලට සම්බන්ධ වනවා මෙන්ම ඒවාට පමණක් සීමා වන්නේ ද නැත. එම ගැටළු මේ වන විට දැන් රටේ අගනුවර වන කොළඹ නගරයේ මහජන ජීවිතයේ දෛනික අංගයක් බවට පත්වී තිබේ.

**නව ප්‍රවණතා**

ශ්‍රී ලංකාව දිගින් දිගටම බිහි කරන්නේ ''රැකියාවලට නුසුදුසු'' උපාධිධරයන්ය යන නිමක් නැති විවේචනයට ප්‍රතිචාර වශයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, පියවර ගණනාවක්ම ගෙන ඇත. අලුතින් හෙද විද්‍යා, තාක්ෂණ, වෛද්‍ය, සහ ඉංජිනේරු පීඨ පිහිටුවීම, සහ වෘත්තීය මාර්ගෝපදේශනය සහ වෘත්තීය උපදේශනය ප්‍රථම උපාධි අපේක්ෂක අධ්‍යාපනය සමඟ ඒකාග්‍ර කිරීම, මේ සම්බන්ධව ගෙන ඇති ප්‍රධාන පියවර දෙකකි.

ප්‍රතිපත්තිමය නම්‍යශීලීත්වය සහ ලියාපදිංචි කිරීමේ කොන්දේසි ලිහිල් කිරීම මාධ්‍යයෙන් පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන පිහිටුවීමට පහසුකම් සැලසීම දැන් ප්‍රධාන පෙළේ ප්‍රතිපත්තිමය ප්‍රවණතාවක් වී තිබේ. රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුල්වීමට අවකාශ නොලැබෙන සුදුසුකම් ලත් සිසුන්ට සීමිත ප්‍රමාණයකින් හෝ අවකාශ ලබා දෙන ගමන්ම උසස් අධ්‍යාපනයට ඇතුල්වීමට ඇති අවස්ථා පුළුල් කිරීම ද ඒ වෙතින් අපේක්ෂා කෙරේ.

විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාව අතර ඇති ස්ත්‍රී-පුරුෂ තුලනය, ස්ත්‍රී පැත්තට බරවන පරිදි වෙනස් වෙමින් තිබේ. කලා, මානව ශාස්ත්‍ර සහ වාණිජ පීඨවල මෙම ප්‍රවණතාව වඩාත් පැහැදිලිව දක්නට ලැබේ. මේ අතර පීඨවලට ඇතුල්වන පිරිමි සිසුන්ගේ සංඛ්‍යාව සීඝ්‍ර ලෙස අඩුවෙමින් තිබේ. ශිෂ්‍ය සුභසාධනය සහ රැකියා අවකාශ පිළිබඳ දෘෂ්ටිකෝණවලින් බලා මෙම ප්‍රවණතාවෙහි ඇති මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන ප්‍රතිවිපාකවලට ප්‍රතිචාර, රජයෙන් හෝ විශ්වවිද්‍යාලවලින් හෝ තවමත් ලැබී නැත.

**නව සන්දර්භය**

ඉහත හඳුනාගත් වෙනස්වීම් සිදුවෙමින් පවතින්නේ හිස් අවකාශයක නොවේ. ඒවා ආර්ථික ගෝලීයකරණය, ශීඝ්‍ර තාක්ෂණික සහ කාර්මික විප්ලව සහ ඒවායේ ප්‍රතිඵලයක් ලෙස සිදුවන ශ්‍රම

වෙළඳපොළ ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ ලෝකය පුරා සිදුවන පරිවර්තනයන්ට ප්‍රතිචාර වශයෙන් මතුවී ඇති ගෝලීය ප්‍රවණතාවක අංගයකි.

ඒ අනුව, ලෝකය පුරා සිදුවෙමින් පවතින්නේ අධ්‍යාපනය, රැකියාවලට සුදුසු යනුවෙන් හැඳින්වෙන නව අවශ්‍යතා සපුරා ලීමේ සුදුසුකම් සහිත උපාධිධාරීන් බිහි කිරීමට කැපවූ වෙළඳපොළට යොමු වීමේ ප්‍රවණතාවක් ඇති වීමයි. ගෝලීයකරණය නිසා සිදුවී තිබෙන්නේ, වෙළඳපොළේ විකිණිය හැකි යන අර්ථයෙන් තරඟකාරී සහ ආකර්ශනීය වීමට තැත් කරන ක්‍රමයක් බවට උසස් අධ්‍යාපනය පත්වීමයි.

සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රයටම අදාළ ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම මගින්, මෙම ගෝලීය බලපෑම්වලට ප්‍රතිචාර දක්වන්නේ කෙසේද යන්න ගැන සාකච්ඡාවක් දැනට ශ්‍රී ලංකාවේ ද සිදුවෙමින් තිබේ. විශේෂයෙන් ප්‍රථම උපාධි පාඨමාලා ප්‍රතිසංස්කරණය කිරීම මගින්, උසස් අධ්‍යාපනය වෙතින් එම ගෝලීය ප්‍රවණතාවලට ප්‍රතිචාර දැක්වීම සඳහා රජය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නව ප්‍රතිපත්තිමය විකල්ප සකස් කිරීම ආරම්භ කර ඇත. විශ්වවිද්‍යාල උපාධිධාරීන් අතර, විශේෂයෙන් කලා සහ මානව ශාස්ත්‍ර උපාධිධාරීන් අතර, පවත්නා සේවා වියුක්තිය පිළිබඳ ගැටලුවේ බැරෑරුම්කම අවම කිරීම සඳහා පියවර ගැනීම, විශ්වවිද්‍යාලවල සිදුවන පාඨමාලා ප්‍රතිසංස්කරණවල ප්‍රමුඛතාවක් ද වී තිබේ.

විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය (STEM) යන විෂයයන්ට අලුතෙන් දක්වන අවධානය, ඉගැන්වීමේ, ඉගෙනීමේ සහ ඇගයීම් ක්‍රියාවලීන් සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම, වඩා හොඳ රැකියා අවස්ථා ලබා දෙන ක්ෂේත්‍රවලින් උපාධි පිරිනමන අලුත් පීඨ පිහිටුවමින් ඒවාට වැඩි වැඩියෙන් සිසුන් බඳවා ගැනීම, සියලුම උපාධි පාඨමාලාවල ගුණාත්මකභාවය සහ අදාළතාව දියුණු කිරීම, සහ තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා නව යාන්ත්‍රණ හඳුන්වා දීම යන මේවා රාජ්‍ය විශ්වවිද්‍යාලවල දැනටමත් ආරම්භ කර ඇති ප්‍රධාන ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයන්ට ඇතුළත්ය.

දැනට සිදුවන මෙවැනි ප්‍රතිසංස්කරණවලට ප්‍රතිචාර වශයෙන් ප්‍රතිතර්කයක් ද ගොඩනැගී තිබේ. විශ්වවිද්‍යාල ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට අවශ්‍ය භාෂණයේ නිදහසේ සහ විචාරාත්මක චින්තනයේ කේන්ද්‍රස්ථාන විය යුතුය යන ඒවායේ ආරම්භක මෙහෙවර ප්‍රකාශය සමග දිගටම සිටීමේ අවශ්‍යතාව පිළිගත යුතුය යන්න එයින් අවධාරණය කෙරේ.

නවීකරණය, සංවර්ධනය, අධ්‍යාපනය සහ සේවා නියුක්තිය සම්බන්ධව ඇති පරස්පර විරෝධී ප්‍රවණතා ගැන අනවබෝධයෙන් සිටීමේත්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජමය වස්තුවක් ලෙස අධ්‍යාපනයේ ඇති වැදගත්කම අමතක කර එහි උපයෝගීතාවාදී වටිනාකම පමණක් අවධාරණය කිරීමේත් අනිසි ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වන, රාජ්‍ය විශ්වවිද්‍යාල ඇද වැටෙමින් සිටින ගොඩ එන්නට බැරි උගුල ගැනද මේ පර්යාලෝකය අනතුරු හඟවයි.

මෙපරිදි ප්‍රධාන වශයෙන් ශිෂ්‍ය කණ්ඩායම් වෙතින් ද, සීමිත දුරකට ආචාර්යවරුන් අතරින් ද විසම්මුතික හඬක් මතු වී තිබේ. ඒවායින් ප්‍රකාශ වන්නේ, ලෝක ආර්ථිකයේ වෙළඳපොල අවශ්‍යතා වෙනුවෙන් අධ්‍යාපනයේ සියලු මට්ටමක ම ඇති සමාජමය අරමුණු අතහැර නොදැමිය යුතුය යන අදහසයි.

මෙම වෙනස් වන ගෝලීය සහ දේශීය පසුබිම් තුළ, ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ අරමුණු සහ අභිමතාර්ථ යාවත්කාලීන කිරීම අවශ්‍ය වී තිබේ. පර්යේෂණ අධ්‍යයන ගණනාවකිනුත්, පුළුල් පරාසයක පාර්ශ්වකරුවනුත් සමග අදහස් හුවමාරු වීමෙනුත් ලබා ගත් අදහස් සහ යෝජනා පදනම් කොට ගෙන ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව නිර්දේශ කරන උසස් අධ්‍යාපනයේ අරමුණු මෙසේය:

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ අරමුණු

I. උසස් අධ්‍යාපනයේ අරමුණු සහ අන්තර්ගතය පටු කිරීමකින් තොරව, රටේ සමාජ සහ සංස්කෘතික අවශ්‍යතා ද, වෙළඳපොල ඉල්ලුම අතර ද නිවැරදි තුල්‍යතාවක් පවත්වා ගැනීම.

II. ප්‍රජාතන්ත්‍රවාදී සහ වගකීම් සහගත පුරවැසියන් බිහිකිරීමේ අරමුණ ඇතිව, සියලුම උසස් අධ්‍යාපන ආයතනවල ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර සමාජාවබෝධය, විවිධත්වය, බහුවිධතාව, සමාජ සුසංයෝගය සහ මානව සහයෝගීතාව යන වටිනාකම්වලට සංවේදී වීමත් වැඩි දියුණු කිරීම.

III. සීඝ්‍රයෙන් වෙනස්වන මෙන්ම ඒකාග්‍රවන ලෝකයක මතුවන අභියෝගවලට මුහුණ දීම සඳහා නිපැයුම්ශීලි සහ නිර්මාණශීලී වීමට අවශ්‍ය ස්වාධීන හා විවේචනාත්මක චින්තනය, නිවැරදි ආකල්ප සහ නිපුණතා සඳහා අවශ්‍ය ශක්‍යතා ද ශිෂ්‍ය ශිෂ්‍යාවන් තුළ වර්ධනය කිරීම.

IV. ආසියාතික දැනුම් සම්භාරවල ඉහළම සම්ප්‍රදාය වෙතින් ද ඉගෙන ගැනීමට හැකියාව ලබා දෙන පරිදි නිර්මාණශීලී විශ්වවිද්‍යාල පාඨමාලා තුළින්, ලෝක මට්ටමින් වර්ධනය වී ඇති විද්‍යාව, තාක්ෂණය, සමාජීය විද්‍යා සහ අනෙකුත් දැනුම් ක්ෂේත්‍රවලින් ඉගෙනීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවස්ථා ලබා දීම.

V. මානව සංවර්ධනය සහ සමාජ ප්‍රගතිය ගැන අවධාරණයක්ද සහිතව උසස් අධ්‍යාපනය සහ රටේ ආර්ථික, විද්‍යාත්මක, සහ තාක්ෂණික අභිවෘද්ධින්ගේ වර්ධනය අතර සුසංගත සම්බන්ධතා ගොඩ නැගීම.

VI. ආර්ථික ගෝලීයකරණය, කාර්මික සහ තාක්ෂණික අභිවර්ධනය සහ එහි ප්‍රතිඵලයක් ලෙස සිදුවන ශ්‍රම වෙළඳපළවල් ප්‍රතිව්‍යුහගත කිරීමට ප්‍රතිචාර දැක්වීම සහ එයින් ඵල ලැබීම.

VII. විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නැංවීම මගින් උසස් අධ්‍යාපන අවස්ථා තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදී කිරීම සහ ඒ සමගම, එවැනි ව්‍යාප්තියක් නිසා සමාජයට සහ ආර්ථිකයට එල්ල වන නව අභියෝගවලට සාධනීය ලෙස ආමන්ත්‍රණය කිරීම.

VIII. අඩු ආදායම්ලාභී පවුල්වලට මෙන්ම අධ්‍යාපනික අතින් වරප්‍රසාද අඩු ප්‍රදේශවල සිසු සිසුවියන් ද ඇතුළුව සියලු සිසු සිසුවියන්ට ගුණාත්මක වශයෙන් ඉහළ අධ්‍යාපනයක් ලැබීමට ඇති අවස්ථා සහතික කිරීම.

IX. පවත්නා ක්‍රමයේ ඇති දැඩි ව්‍යුහාත්මක සීමාකම් නිසා රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට හැකියාව නොලැබෙන සුදුසුකම්ලත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට උසස් අධ්‍යාපනය සඳහා පුළුල් අවස්ථා ලබා දීම.

X. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ රාජ්‍ය-පෞද්ගලික හවුලකාරිත්වයට දිරි දීම සහ එවැනි හවුල්කාරිත්ව මඟින් ජාතික සංවර්ධනයට සිදු කෙරෙන දායකත්වය සුසංගත කිරීම.

XI. විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට අවස්ථා නොලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට උසස් අධ්‍යාපනය ලැබීම සඳහා විකල්ප අවස්ථා ලබා දීම.

XII. උසස් අධ්‍යාපනයේ පවතින කලාපීය විෂමතා අහෝසි කිරීම අරමුණු කරගත් නව ප්‍රතිපත්ති තීරණය කිරීම.

XIII. විශ්වවිද්‍යාලවලට ශිෂ්‍ය-ශිෂ්‍යාවන් ඇතුළත් කර ගැනීමේදී සහ පාඨමාලාවල ස්ත්‍රී-පුරුෂ සමබරතාව පවත්වා ගැනීම සහ ඒ සමගම උසස් අධ්‍යාපන සුදුසුකම් සහිත ශිෂ්‍යාවන් රැකියා ලබා ගැනීමේදී මුහුණ දෙන වෙනස්කම්වලට ලක්වීමේ ගැටලුවට ආමන්ත්‍රණය කිරීමේ අවශ්‍යතාව හඳුනා ගැනීම.

XIV. ශ්‍රී ලංකාව තුළ මෙන්ම ආසියාතික කලාපයේ උසස් අධ්‍යාපනය සඳහා ඇති අධික ඉල්ලුමට, රාජ්‍ය විශ්වවිද්‍යාල අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම සහ උසස් අධ්‍යාපනයට පුද්ගලික අංශයේ සහභාගීත්වය උනන්දු කරවීම මගින් මුහුණ දීම.

XV. ප්‍රමාණවත් සම්පත්, පහසුකම් සහ ගුණාත්මක වශයෙන් ඉහළ නැංවීම මගින් පර්යේෂණ සහ නව නිපැයුම් සොයා ගැනීම ප්‍රවර්ධනය කිරීම.

XVI. උසස් අධ්‍යාපන ආයතන, විෂය ක්ෂේත්‍ර, පාඨමාලා සහ වෘත්තීය මාර්ග තෝරා ගැනීමේදී සිදුවන සංකීර්ණ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට උදව් සැපයීම.

XVII. උසස් අධ්‍යාපන කළමනාකරණ ක්‍රමයන්හි වගවීම, පාරදෘශ්‍යතාව සහ වෘත්තීයත්වය උසස් අධ්‍යාපන කළමණාකරන පද්ධතිය තුළ ප්‍රවර්ධනය කිරීම.

XVIII. දැනුම නිර්මාණය කිරීමට සහ බෙදා හැරීමට, පර්යේෂණ සිදු කිරීමට සහ නව නිපැයුම්වලට ඉඩකඩ සළසන පරිදි උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ශාස්ත්‍රීය නිදහස සහ බුද්ධිමය ස්වාධීනත්වය සහතික කිරීම.

# 2 පරිච්ඡේදය

## පාලනය, මූල්‍ය, සම්පත් කළමනාකරණය

''මනා පාලනය'' යන සංකල්පයේ අර්ථය, ආයතනයක ක්‍රියාකාරිත්වය සඳහා නියෝග දෙමින් එහි කටයුතු අධීක්ෂණය කරනවාට වඩා වැඩි දෙයකි. පරිපාලන බලය හිමි පිරිස් වෙත ඇති අධිකාර බලය, ගනු ලැබූ තීරණ සම්බන්ධව වග කිවයුතු සහ වග උත්තර බැඳීමට බැඳී සිටිති. යහපත් පාලනයේ (Good Governance) ගුණාංග වශයෙන්, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙල (UNDP) පහත සඳහන් ලක්ෂණ හඳුනාගෙන ඇත. සහභාගිත්වය, පාරදෘශ්‍යතාව, නෛතික රාමුවක් ඇතුළත කටයුතු කිරීම, ප්‍රතිචාරාත්මක බව, විවිධ අභිලාෂ කණ්ඩායම් සමග ඇතිකර ගන්නා පොදු සම්මුතිය, සමතාව, කාර්යක්ෂමතාව සහ වගවීම යන මේවාය. වගවීම සැබෑ ලෙස පවතින්නට නම් මනා ලෙස නිර්ණය කරන ලද ප්‍රමිතීන් ද, ප්‍රමාණවත් තොරතුරු ද තිබිය යුතුය.

විශ්වවිද්‍යාලවල මනා පාලනය යන්නෙන් අපේක්ෂා කරන්නේ ස්වායත්තතාව (Autonomy) සහ වගවීම (Accountability) අතර සමතුලිතතාවක් ඇති කිරීමයි. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට මුළුමණින්ම රජය විසින් අරමුදල් සැපයෙන අතර, ඒවාට පූර්ණ ස්වායත්තතාව තිබේ. එහෙත් පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලට ඊට වඩා ස්වායත්තතාවක් පවතින අතර, ඒවා රජයේ පාලනයට යටත්වන්නේ අඩුවෙනි. එබැවින්, ජාතික උසස් අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා රජය විසින් පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන පිළිබඳ යම්කිසි දුරක පාලනයක් පවත්වා ගෙන යා යුතුව තිබේ.

මෙම පරිච්ඡේදය ස්වායත්තතාව, වගවීම, රාජ්‍ය අරමුදල් කළමනාකරණය, අභ්‍යන්තර හා බාහිර මනා පාලනය, සහභාගිත්වයේ ගුණාත්මක තත්ත්වය සහ තොරතුරු එකතු කිරීම හා පාවිච්චි කිරීම යන තේමා ගැන පුළුල් ලෙස සාකච්ඡා කරමින්, ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතනවල පරිපාලනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති යෝජනා ඉදිරිපත් කරයි.

### දැනට පවත්නා පරිපාලන ක්‍රමය

රාජ්‍ය විශ්වවිද්‍යාල පරිපාලනය සම්බන්ධව පැතිකඩ දෙකක් තිබේ. පළමුවැන්න බාහිර පාලනයයි. එහිදී සිදුවන්නේ ප්‍රතිපත්ති, සමස්ත මඟපෙන්වීම, මූල්‍ය ප්‍රතිපාදන, සිසුන් ඇතුළත් කර ගැනීම, අධීක්ෂණය, වගවීම යන කරුණු සම්බන්ධව විශ්වවිද්‍යාල ආණ්ඩුව සමග (එනම් ජනාධිපති කාර්යාලය, පාර්ලිමේන්තුව, අමාත්‍යාංශ, මහා භාණ්ඩාගාරය, සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව) සමග අන්තර් ක්‍රියාකාරීත්වයේ යෙදීමයි. විශ්වවිද්‍යාලවලට තම වරපත්‍රය සහ මූල්‍ය ප්‍රතිපාදන ලැබෙන්නේ රජයෙනි. විශ්වවිද්‍යාල සමග අන්තර් ක්‍රියාකරිත්වයේ සෘජුව යෙදෙන රජයේ ආයතනික හස්තය වන්නේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යි. විශ්වවිද්‍යාලවල උපකුලපතිධූරය සඳහා පත් කිරීම් සිදු කිරීම මගින් ජනාධිපතිතුමා නායකත්වය දරන කැබිනට් මණ්ඩලයට ද, නව විශ්වවිද්‍යාල, විශ්වවිද්‍යාලවල ඇති ආයතන, අධ්‍යයන පීඨ, අධ්‍යයන දෙපාර්තමේන්තු, මෙන්ම උපාධි පාඨමාලා ද අනුමත කිරීම මගින් වැදගත් කාර්ය භාරයක් ඉටු කිරීමට තිබේ. විශ්වවිද්‍යාලවලට වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන අනුමත කරන්නේ පාර්ලිමේන්තුව විසින්ය. රාජ්‍ය විශ්වවිද්‍යාල මහජන මුදල් භාවිතා කරන ආකාරය අධීක්ෂණය කිරීමේ කාර්යය සිදු කරන්නේ පොදු ව්‍යවසාය පිළිබඳ පාර්ලිමේන්තු කමිටුව (COPE) මගිනි.

දෙවැනි පැතිමානය අභ්‍යන්තර පරිපාලනයයි. විශ්වවිද්‍යාලයක ප්‍රධාන විධායක නිලධරයා වන්නේ උපකුලපතිවරයාය. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් ඇති කරන ලද මණ්ඩල හා ආයතන ගණනාවකින් සියලු විශ්වවිද්‍යාල පරිපාලනය කෙරේ. පාලක සභාව විශ්වවිද්‍යාලයේ ඉහළම පරිපාලක සභාව වන අතර, ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධ බලය තිබෙන ඉහළ ම බලධරයා වන්නේ සෙනෙට්

සභාවයි. ඉහත සඳහන් පනත විසින් අධ්‍යයන පීඨ, පීඨසභා සහ දෙපාර්තමේන්තු ද අභ්‍යන්තර පාලනය සඳහා පිහිටුවා තිබේ.

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**

විශ්වවිද්‍යාල පාලනයේ ඉහළින්ම තිබෙන ආයතනය වන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවයි. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල අතර ප්‍රධානතම පුරුක වශයෙන් ක්‍රියා කරන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවයි. 1978 විශ්වවිද්‍යාල පනතින් දක්වා ඇති කොමිෂන් සභාවේ අරමුණුවලින් පෙනී යන්නේ ජාතික ප්‍රතිපත්ති, සැලසුම්කරණය සහ සම්බන්ධීකරණය, අධ්‍යාපනයේ ප්‍රමිතීන් පවත්වාගෙන යාමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම, පරිපාලන නියාමනය සහ සිසුන් බඳවා ගැනීම යන මේවාට විශ්වවිද්‍යාල අනුගත වන බවට රජය කොමිෂන් සභාව මධ්‍යය කොටගෙන සහතික කර ගන්නා ආකාරයයි. එපරිදි, කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන සැලසුම්කරණය, සම්බන්ධීකරණය, සහ අධීක්ෂණය සම්බන්ධ ප්‍රමිතීන්ට විශ්වවිද්‍යාල අනුගතවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කොමිෂන් සභාව වසර පහක් සඳහා සංයුක්ත සැළැස්මක් සම්පාදනය කරයි. පළමුවැනි සංස්ථානික සැළැස්ම පිළියෙල කරන ලද්දේ 1984-1988 කාලය සඳහාය. පස් වසර සංස්ථානික සැළැස්ම අවසන් වරට සම්පාදනය කර ඇත්තේ 2013-2017 කාලය සඳහා ය.

**ශාස්ත්‍රාලීය ස්වායත්තතාව (Academic Autonomy) : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ බලපෑම**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 15 වැනි වගන්තියට අනුව, එක් එක් උසස් අධ්‍යාපන ආයතනයක පාලක මණ්ඩලයේ අදහස් විමසීම මගින්, උපාධි පාඨමාලා සහ ප්‍රදානය කරන උපාධි තීරණය කිරීමේ බලය ඇත්තේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ය. එක් එක් උසස් අධ්‍යාපන ආයතනයට වාර්ෂිකව ඇතුළත් කර ගන්නා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව තීරණය කිරීමේ බලය තිබෙන්නේ ද මෙම කොමිෂන් සභාවටය. රාජ්‍ය විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීම පාලනය කිරීම, කොමිෂන් සභාව සතු ප්‍රධාන කාර්යයකි.

ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධව බලන විට, විවිධ විෂය ක්ෂේත්‍රයන් සහ විෂයයන් සම්බන්ධව ස්ථාවර කමිටු, කොමිෂන් සභාව විසින් පිහිටවනු ලැබ තිබේ. විශ්වවිද්‍යාල මණ්ඩපවල අධ්‍යක්ෂකවරු සහ අධ්‍යයන පීඨවල පීඨාධිපතිවරු එක් එක් විෂය ධාරාවට නියමිත ස්ථාවර කමිටුවල සාමාජිකයෝ වෙති. ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධයෙන් ස්ථාවර කමිටු සතු ප්‍රධාන කාර්යයක් වන්නේ, ඉදිරිපත් කර ඇති එවැනි යෝජනාවලීන් පරීක්ෂාකොට කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා නිර්දේශ කිරීමයි. විශ්වවිද්‍යාල, නව පාඨමාලා ආරම්භ කිරීම සඳහා යෝජනාවලීන් කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන්නේ, ඒවා අදාල පීඨ සභාවල සහ සෙනෙට් සභාවලින් අනුමත කළාට පසුවය. ඉන් පසුව එම යෝජනා, කොමිෂන් සභාවේ කමිටු කිහිපයක්ම විසින් අධ්‍යයනය කරනු ලැබේ. මෙය සාමාන්‍යයෙන්, කල්ගත වන ක්‍රියාවලියකි. විශ්වවිද්‍යාලය තුළදී පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියකට ඒ වන විටත් පාත්‍ර කරන ලද යෝජනාවලීන් අනුමත කිරීම තවදුරටත් ප්‍රමාද වීම මේ මගින් සිදු වේ.

මේ පසුබිම තුළ ශාස්ත්‍රාලීය කටයුතු සම්බන්ධයෙන් මැදිහත් වීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දී ඇති අධික බලය විශ්වවිද්‍යාල තුළ සාකච්ඡාවට භාජනය වී තිබෙන කරුණකි. කොමිෂන් සභාවට ලබාදී ඇති මෙම බලය නිසා විශ්වවිද්‍යාලවල ශාස්ත්‍රීය ස්වාධීනත්වයට මැදිහත් වීමේ තත්ත්වයක් නිර්මාණය වී ඇතැයි සමහරු තර්ක කරති. ඊට අමතරව, විශ්වවිද්‍යාල පරිපාලන කටයුතු සම්බන්ධව, කොමිෂන් සභාව සිදු කරන නිරන්තර මැදිහත් වීම නිසා ප්‍රතිපත්ති සම්පාදනය, අධීක්ෂණය සහ විශ්වවිද්‍යාල පරිපාලනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා කොමිෂන් සභාව වෙත පැවරී ඇති මූලික කාර්යභාරයට නිෂේධනීය ලෙස බලපෑමටද හැකියාව තිබේ.

## මහා භාණ්ඩාගාරය සහ මූල්‍ය පාලනය

වාර්ෂික අයවැයෙන්, පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇතිව ඒකාබද්ධ අරමුදල වෙතින් විශ්වවිද්‍යාලවලට වෙන් කරන ලද රාජ්‍ය අරමුදල් ගෙවීම් කරනු ලබන්නේ මහාභාණ්ඩාගාරය විසිනි. විශ්වවිද්‍යාල ක්‍රියාත්මක වන්නේ මහජන මුදලිනි. එබැවින් විශ්වවිද්‍යාල ආණ්ඩුවේ මූල්‍ය රෙගුලාසි සහ අදාළ මහාභාණ්ඩාගාර චක්‍රලේඛන අනුගමනය කළ යුතුය. දැන් විශ්වවිද්‍යාලවල තිබෙන්නේ, ජාතික අයවැය සකස් කිරීමේදී මහාභාණ්ඩාගාරය ක්‍රියාත්මක කිරීමට පවත්වාගෙන ඇති භාවිතයට අනුකූලව වැඩසටහන් අයවැය (Programme Budget) ක්‍රමයයි. ඒ අනුව විශ්වවිද්‍යාලයක අයවැය චක්‍රය ආරම්භ වන්නේ රජයේ අයවැය වාර්තාව සකස් කිරීමට දස මාසයකට පෙර භාණ්ඩාගාරය විසින් ඇස්තමේන්තු එවන ලෙස කරන දැනුම්දීමත් සමගය.

රජය විශ්වවිද්‍යාලවලට අරමුදල් වෙන් කරන්නේ පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කරනු ලබන නිර්දේශ පදනම් කරගෙනය. එසේ වුවත්, රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා උපමානික අරමුදල් (Normative Funding) සූත්‍රයක් දැනට ක්‍රියාත්මක වන්නේ නැත. ලැබෙන අරමුදල් මට්ටම සහ විශ්වවිද්‍යාලවල ක්‍රියාත්මක වන අධ්‍යයන වැඩසටහන් අතර කිසියම් සම්බන්ධතාවක් තිබුණද එක් එක් විශ්වවිද්‍යාලවලට අරමුදල් වෙන් කිරීමේදී විශ්වවිද්‍යාල අතර ඇති අසමානතා, විශේෂයෙන් ප්‍රතිස්ථාපිත සහ මෑතදී ආරම්භ කරන ලද විශ්වවිද්‍යාල අතර ඇති අසමානතා, ගැන සැලකිල්ලක් දක්වෙන්නේ ද නැත. එබැවින් රජය විශ්වවිද්‍යාලවලට අරමුදල් වෙන් කිරීමේදී අසමානතා සමනය කරන වැඩපිළිවෙළක් පවතින්නේ ද නැත.

## අභ්‍යන්තර පාලනය

විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය සහ පරිපාලන ප්‍රධානියා ද, ප්‍රධාන විධායක නිලධාරියා ද වන්නේ උපකුලපතිවරයාය. උපකුලපතිවරයාගේ/වරියගේ ශාස්ත්‍රීය සුදුසුකම්, බුද්ධිමය නායකත්වය, පරිපාලනය සඳහා ඇති හැකියාව හා නිපුණතා, පෞරුෂය, මෙන්ම ඔහු/ඇය කෙරෙහි විශ්වවිද්‍යාල ප්‍රජාව අතර ඇති ගෞරවය සහ කීර්තිය, උපකුලපතිධුරයේ සාර්ථකත්වය සඳහා හේතුවන ප්‍රධාන සාධකයන් වන්නේය. එක් එක් උපකුලපතිවරයා/වරිය සතු පරිපාලන ශෛලිය ද විශ්වවිද්‍යාලවල සාර්ථක හෝ අසාර්ථක පරිපාලනයට තීරණාත්මකව බල පායි. එබැවින්, උපකුලපතිවරුන් පත් කිරීමේ ක්‍රියාවලිය විශ්වවිද්‍යාලවල පරිපාලනය සම්බන්ධව සෘජු බලපෑමක් ඇති කරයි.

වර්තමාන ව්‍යවහාරයට අනුව, උපකුලපතිවරයෙකු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන අතර, එසේ පත් කෙරෙන්නේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අදාළ විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් නිර්දේශ කරනු ලැබ ඇති නම් තුනකින්, කොමිෂන් සභාව විසින් කරනු ලබන නිර්දේශයනට අනුවය. මෙම භාවිතය ආරම්භ වූයේ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතට 1985 වසරේදී හඳුන්වා දෙන ලද සංශෝධනයට පසුවය. ඊට පෙර උපකුලපතිවරයා තෝරා පත් කිරීමේ බලය තිබුණේ විශ්වවිද්‍යාල උත්තරීතර සභාවටය (Univeristy Court). වර්තමානයේදී සිදු වන්නේ, විශ්වවිද්‍යාල විසින් ප්‍රසිද්ධ දැන්වීම් මඟින් උපකුලපති තනතුරට අයදුම්පත් කැඳවීමය. ඊට පසු විශ්වවිද්‍යාල පාලක සභාව ඡන්දයෙන් අපේක්ෂක නම් තුනක් තෝරා ගෙන, එම නම් කොමිෂන් සභාවට ඉදිරිපත් කරයි. එයින් කෙනෙකු උපකුලපති ධූරයට පත් කිරීමේ අධිකාරී බලය තිබෙන්නේ ජනාධිපතිතුමාට/තුමියට ය.

උපකුලපති තනතුර පිරවීමේදී ඇති සාමාන්‍ය භාවිතය නම්, විශ්වවිද්‍යාල පාලක සභාවේ වැඩිම ඡන්ද ප්‍රමාණය ලැබ නාමකරණය ලද අපේක්ෂකයා, ජනාධිපතිතුමා විසින් එම ධූරයට පත් කරනු ලැබීමයි. එහෙත් මෙම භාවිතය, සැම විටම ගරු කෙරෙන සම්ප්‍රදායක් බවට පත් වී නැත. ජනාධිපතිතුමා උපකුලපතිවරයා පත් කරන්නේ උසස් අධ්‍යාපන අමාත්‍යවරයාගේ ද අදහස විමසීමෙන් පසුව නිසා, විශ්වවිද්‍යාලය ස්වාධීනව පරිපාලනය කිරීමට උපකුලපතිවරයා/වරිය සතු අධිකාර බලය බරපතල ලෙස දුර්වල වූ අවස්ථා තිබේ. අතීතයේදී වූ එවැනි සිදුවීම් නිසා විශ්වවිද්‍යාලවල ස්වාධීනත්වයට ද හානි සිදු

විය. එමෙන්ම, උපකුලපති ධූරය අපේක්ෂා කරන්නන්, දේශපාලන අධිකාරිය වෙතට පුද්ගලිකව සහ දේශපාලන සම්බන්ධතා මත බලපෑම් කිරීමේ අයහපත් භාවිතාවල යෙදී තිබේ. ඒ මගින් සිදුවී තිබෙන්නේ විශ්වවිද්‍යාලවල ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට අවශ්‍ය මූලධර්ම සහ සම්ප්‍රදාය වර්ධනය වීම වැළැක්වීමයි. එවැනි බලපෑම් මත නුසුදුසු පුද්ගලයන් උපකුලපති ධූරයට පත් කිරීම නිසා සිදුවී තිබෙන්නේ විශ්වවිද්‍යාලවල කීර්තියටත්, විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ගුණාත්මක භාවයටත් හානි සිදුවීමයි.

**විශ්වවිද්‍යාල පාලක සභාව**

පාලක සභාව විශ්වවිද්‍යාලයේ ඇති ඉහළම පරිපාලන අධිකාරයයි. එය අභ්‍යන්තර සහ බාහිර යනුවෙන් සාමාජික ප්‍රභේද දෙකකින් සමන්විත වේ. පාලක සභාවේ සාමාජිකයෙකු වන උපකුලපතිවරයා, එහි සභාපතිවරයා ද වෙයි. අධ්‍යයන පීඨවල පීඨාධිපතිවරු, පාලක සභාවේ නිල සාමාජිකයෝ වෙති. විශ්වවිද්‍යාල සෙනෙට් සභාව විසින් තෝරා පත් කරගන්නා සාමාජිකයන් දෙදෙනෙකු ද පාලක සභාවේ සිටිති. බාහිර සාමාජිකයන් කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන අතර, ඔවුන්ගේ සාමාජික සංඛ්‍යාව අභ්‍යන්තර සාමාජික සංඛ්‍යාවට වඩා එකකින් වැඩි ය. මේ මගින් සමතුලිත පාලනයක් අපේක්ෂා කරන නමුදු, බාහිර සාමාජිකයින් විශ්වවිද්‍යාලයට පිටස්තර අභිලාෂ නියෝජනය කරන අවස්ථාවලදී නිෂේධනීය ප්‍රතිඵල ඇති වී තිබේ.

**මූල්‍ය ස්වායත්තතාව**

විශ්වවිද්‍යාලවල අරමුදල්වලින් 93%ක්ම ලැබෙන්නේ රජයෙනි. රජයෙන් ලැබෙන අරමුදල් කළමනාකරණය සඳහා විශ්වවිද්‍යාලවලට වෙනම ප්‍රසම්පාදන මඟපෙන්වීමේ උපදෙස් මාලාවක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සකස් කරනු ලැබ ඇත. මහජන මුදල් භාවිත කිරීම පිළිබඳ ලිහිල් බවක් විශ්වවිද්‍යාලවලට ලබාදී නැත. විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවලට අනුව උපශීර්ෂ වෙනස් කිරීමට විශ්වවිද්‍යාලවලට බලයක් ද පවරා නැත. නිශ්චිත වසරකට වෙන් කරන අරමුදල්වලින් පාවිච්චි නොකළ මුදල් තබා ගැනීමට බලයක් ද විශ්වවිද්‍යාලවලට නැත. ඊට අමතරව එවැනි අරමුදල් සොයා ගැනීම හෝ එසේ සොයා ගත් අරමුදල් විශ්වවිද්‍යාලයේ සංවර්ධන අරමුණුවලට නිදහසේ භාවිතා කිරීම ගැන පැහැදිලි ප්‍රතිපත්තියක් පවතින්නේ ද නැත.

**රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල පාලනය**

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන පහසුකම් සපයන ආයතන වර්ග දෙකක් තිබේ. ඒවා නම්, (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ පිහිටුවන ලද උපාධි ප්‍රදානය කරන ආයතන සහ (ii) ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි කර ඇති පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනයි. උපකුලපතිවරයා නැතහොත් විධායක ප්‍රධානීන් පත් කිරීම, කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, කාර්ය මණ්ඩල ප්‍රමාණය සහ ඔවුන්ගේ වැටුප් තීරණය කිරීම, අධ්‍යයන ව්‍යුහයන් තීරණය කිරීම, අරමුදල් සපයා ගැනීම සහ පාවිච්චි කිරීම, සහ ශිෂ්‍ය ප්‍රමාණය හා පාඨමාලා ගාස්තු තීරණය කිරීම යන කාර්යයන් පිළිබඳ සම්පූර්ණ ස්වායත්තතාව, උපාධි ප්‍රදානය කරන පෞද්ගලික ආයතන සතුව තිබේ.

ආයෝජන මණ්ඩලය යටතේ ඇති සමහර උසස් අධ්‍යාපන ආයතන විදේශීය විශ්වවිද්‍යාල/වෘත්තීය ආයතන සමඟ සහයෝගතා ගිවිසුම් ඇති කර ගෙන සිටියද, ඒවායේ සියලු උපාධි පාඨමාලා පවත්වනු ලබන්නේ ගාස්තු අය කිරීමේ පදනම යටතේය. මේ උපාධි පාඨමාලා, ඒවා සමඟ හවුල් වී ඇති විදේශ ආයතන මඟින් අධීක්ෂණය කෙරෙන නමුදු, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ කිසිදු අධීක්ෂණයක් සිදු වන්නේ නැත. එම විදේශ ආයතන පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සම්මේලනයේ හෝ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සම්මේලනයේ හෝ ලියාපදිංචිවී සිටින්නේ නම් පමණක්, ඒවාට අනුබද්ධ දේශීය උපාධි ආයතන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබේ.

ඊට අමතරව, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සිදු කරන කාර්යයක් නම් පවත්වන උපාධි පාඨමාලා, පහසුකම් සහ ශිෂ්‍ය සංඛ්‍යාව යන මේවා පිළිබඳව වාර්ෂික පදනමක් මත තොරතුරු ලබා ගනිමින්, දත්ත ගබඩාවක් පවත්වා ගැනීමයි. පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල ව්‍යාප්තිය නිසා ගැටලු ගණනාවක්ම මතු වී තිබේ. මූල්‍ය පරිපාලනයේ නිරවද්‍යතාව, ශිෂ්‍ය ප්‍රජාවන්ගේ සංයුතිය සමහර සමාජ ස්තරවලට අයුතු ලෙස බරවීම, පාඨමාලා ගාස්තු, පාඨමාලා අන්තර්ගතය ශ්‍රී ලංකා සන්දර්භයට ගැළපෙන්නේ ද යන වග, සහ පාඨමාලාවල ගුණාත්මකභාවය ඒ අතර ප්‍රධාන ඒවාය.

**පාලනය, මූල්‍ය, සම්පත් කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති යෝජනා**

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්වායත්තතාව**

***ප්‍රතිපත්ති කරුණ 1:***
දැනට තිබෙන පරිපාලනකරණ ව්‍යුහය තුළ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ රාජ්‍ය විශ්වවිද්‍යාල අතර සම්බන්ධීකරණ පුරුක වන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවයි. කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සියලු සාමාජිකයන් පත් කරනු ලබන්නේ, උසස් අධ්‍යාපන අමාත්‍යවරයාගේ අදහස් විමසමින් ජනාධිපතිතුමා විසිනි. එබැවින් තීරණ ගැනීමේදී කොමිෂන් සභාවේ ස්වාධීනත්වය පිළිබඳ ගැටලුවක් පැන නඟී.

***ප්‍රතිපත්තිය 1 :*** ස්වාධීන ලෙස ක්‍රියා කිරීමට ප්‍රමාණවත් බලතල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ලබාදිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ස්වාධීනව තීරණ ගැනීමේ බලය ලැබෙන පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම.

- දැනට තිබෙන මධ්‍යගත ක්‍රමය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට පවරා ඇති වැඩි බලතල වලින් සමහරක් විශ්වවිද්‍යාලවලට ලබා දිය හැකිවන පරිදි ප්‍රතිපාදන සැපයීම.

- කොමිෂන් සභාව සමන්විය යුත්තේ විශ්‍රාම ගිය උපකුලපතිවරුන්, වෘත්තීයමය සම්මේලනවල සභාපතිවරුන් වැනි උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශේෂඥයින්ගෙන් සහ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ප්‍රධානීන්ගෙනි.

**විශ්වවිද්‍යාල ස්වායත්තතාව සහ වගකීම**

***ප්‍රතිපත්ති කරුණ 2 :***

විශ්වවිද්‍යාල ස්වායත්තතාව සම්බන්ධයෙන් බලන විට ශ්‍රී ලංකාවේ ප්‍රවේශ තුනක් පවතී. ඒවා නම්; (i) ආණ්ඩුවේ අඩු මැදිහත් වීම සහිතව නැතහොත් කිසිදු මැදිහත්වීමකින් තොරව විශ්වවිද්‍යාලවලට ඉහළ ස්වායත්තතාවක් තිබිය යුතු යැයි විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ඉදිරිපත් කරන තර්කය. (ii) විශ්වවිද්‍යාල මූල්‍ය රජය සපයන හෙයින්, ඒවා ආණ්ඩුවට දැඩි ලෙස වගකීමේ ක්‍රමයකට යටත් විය යුතුය යන තර්කය, සහ (iii) ස්වායත්තතා මූලධර්මය පිළිගන්නා නමුදු, එම ස්වායත්තතාව ආරක්ෂා කර ගනිමින්, ඒ සඳහා කැපවීමට විශ්වවිද්‍යාලවලට ඇති හැකියාව පිළිබඳ සංශයවාදය.

මේ අතර, ස්වායත්තතාව යන සංකල්පය ද සමඟින්, වගවීම සහ පාරදෘශ්‍යතාව යන සංකල්ප පිළිබඳව ද බැරෑරුම් ලෙස අවධානය යොමු කළ යුතුව තිබේ. ස්වායත්තතාව වගකීමෙන් සහ පාරදෘශ්‍යතාවයෙන් වෙන් කළ නොහැකිය. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක නිදහස තිබිය යුත්තේ වගකීම සහ පාරදෘශ්‍යතාවය ද සහිතවය. මෙම සංකල්ප දෙක අතර තුල්‍යතාවක් පවත්වාගත යුතුව තිබේ.

මීට අමතරව, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සහභාගි වීමට පෞද්ගලික අංශය උනන්දු කරවීමේ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිය සහ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල ව්‍යාප්තිය නිසා රාජ්‍ය නොවන අංශයේ උසස් අධ්‍යාපන ආයතනවල ස්වායත්තතාව පිළිබඳ නව ගැටලු මතු වෙමින් තිබේ.

විශ්වවිද්‍යාලවල පත්වීම් සිදු කිරීමේ ක්‍රියාවලිය දේශපාලනීකරණය වීම ගැන ද ගැටලු මතු වී තිබේ. විශ්වවිද්‍යාල ආචාර්යවරුන් තමන්ට උපකුලපතිවරුන් ලෙස ඉහළ පත්වීම් ලබා ගැනීම වෙනුවෙන් දේශපාලකයින්ගේ මැදිහත්වීම සහ සහාය අපේක්ෂා කරන විට, එහි අනිවාර්ය ප්‍රතිඵලයක් වී තිබෙන්නේ විශ්වවිද්‍යාල ප්‍රජාවන් අතර කල්ලිවාදය මතුවීම සහ විශ්වවිද්‍යාලය තුළ යහපාලනයේ පදනම් බිඳ වැටෙන තරමට පවා, ස්වායත්තතාව දුර්වල වීමට තුඩු දීමයි.

*ප්‍රතිපත්තිය 2 :* ඉහළ කාර්යසාධන මට්ටමක් අත්පත් කර ගෙන ඇති විශ්වවිද්‍යාලවලට "දිනාගත් ස්වායත්තතාව" (Earned Autonomy) ප්‍රදානය කළ යුතු ය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- විශ්වවිද්‍යාලවලට, ඒවායේ කාර්ය සාධනය මත ස්වායත්තතාව ප්‍රදානය කිරීමේ පැහැදිලි යාන්ත්‍රණයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සකස් කිරීම.

- ස්වායත්තතාව, වගකීම් දැරීම සහ වගවීම සම්බන්ධ විවිධ පැතිකඩ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලවල කාර්ය සාධනය ඇස්තමේන්තු කිරීමේ විධික්‍රමයක් කොමිෂන් සභාව විසින් සකස් කිරීම.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල සමඟ සහයෝගයෙන් වගකීමත්, වගවීමත් සහිත ස්වායත්තතාව සහතික කිරීම සඳහා කාර්ය සාධන දර්ශක සකස් කිරීම.

- විශ්වවිද්‍යාලවලට ස්වායත්තතාව ප්‍රදානය කළ යුත්තේ නිශ්චිත අංශවල කාර්ය සාධනයේ විශිෂ්ටත්වය පදනම් කර ගෙනය. අඩු කාර්ය සාධන හැකියාවක් දක්වන විශ්වවිද්‍යාලවලට එම හැකියාවන් දියුණු කර ගැනීමට කොමිෂන් සභාව සහාය වීම.

- එක් එක් විශ්වවිද්‍යාලය කාර්ය සාධනය වැඩි දියුණු කර ගැනීම සඳහා, මිණුම් සළකුණු කිරීමේ (Bench Marking) විධික්‍රමයක් කොමිෂන් සභාව විසින් නිර්මාණය කිරීම.

- උපකුලපතිවරුන්, ආචාර්යවරුන්, මෙන්ම ශිෂ්‍ය ක්‍රියාකාරකයින් ද, විශ්වවිද්‍යාලවල ස්වායත්තතාව දුර්වල කරවන අනවශ්‍ය දේශපාලන ඇඟිලි ගැසීම්වලට ඉඩ සළසන කටයුතුවලින් සෑම අවස්ථාවකම වැළකී සිටීම.

- ඉහළ කාර්ය සාධනයක් වාර්තා කරන විශ්වවිද්‍යාල රජයේ අඩු පාලනයට යටත් විය යුතු අතර, සම්පත් කළමනාකරණය, ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධ තීරණ ගැනීම, රජයේ අරමුදල් භාවිත කිරීම සහ අරමුදල් ඉපයීම සම්බන්ධයෙන් ඉහළ මට්ටමේ ස්වායත්තතාවක් ඒවා වෙත ලබා දීම.

**රාජ්‍ය විශ්වවිද්‍යාලවලට අරමුදල් සැපයීම**

***ප්‍රතිපත්ති කරුණ 3 :***

රාජ්‍ය විශ්වවිද්‍යාලවලට අරමුදල් සැපයීමේ ප්‍රාමානික ක්‍රමයක් (Normative Funding System) දැනට නැත. ඒ වෙනුවට සිදු වන්නේ එක් එක් විශ්වවිද්‍යාලයක කීර්තිය මත ලැබෙන අරමුදල් ප්‍රමාණය තීරණය වීමයි. එසේ වුවත් විශ්වවිද්‍යාලයකට ලැබෙන මුදල් ප්‍රමාණය සහ ශිෂ්‍ය ප්‍රමාණයත්, තිබෙන අධ්‍යයන පාඨමාලාත් අතර සම්බන්ධයක් ද තිබේ. එහෙත් මේ ක්‍රමය නිසා සිදුව ඇත්තේ විශ්වවිද්‍යාල අතර අසමානතා ඇති වීමයි. විශේෂයෙන් පිටපළාත්වල මෑත කාලයේදී පිහිටුවන ලද විශ්වවිද්‍යාල අතර මෙය නිරීක්ෂණය කළ හැකි ය. එම විශ්වවිද්‍යාලවලට සමහර අවස්ථාවල ප්‍රමාණවත් අරමුදල් ලැබෙන්නේ ද නැත.

***ප්‍රතිපත්ති 3 :*** සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයකම අවශ්‍යතාව සහ කාර්ය සාධනය මත පදනම් වූ අරමුදල් සැපයීමේ විධි ක්‍රමයක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් හඳුන්වා දිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- එක් එක් විශ්වවිද්‍යාලය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අතර කාර්ය සාධක ගිවිසුම් ක්‍රමයක් හඳුන්වා දී, එය කාර්ය සාධනය මත පදනම් වූ ප්‍රමිතීන් දියුණු කිරීමට තුඩු දෙන දිරි ගැන්වීම් ක්‍රමයක් සඳහා යොදා ගැනීම.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල සමඟ හවුලේ සකස් කරන කාර්ය සාධන දර්ශක හඳුන්වා දීම.

- රාජ්‍ය සහ උපයා ගත් අරමුදල් පාවිච්චි කිරීමේදී වගවීම, පාරදෘශ්‍යතාව සහ කාර්යක්ෂමතාව පවත්වා ගත හැකි විධි ක්‍රමයක් දියුණු කිරීම.

- අරමුදල් පරිහරණය කිරීම පිළිබඳ තීරණ ගැනීමේදී විශ්වවිද්‍යාලවලට නම්‍යශීලී වීමට අවකාශ සැපයීම.

**අරමුදල් ස්වාධීනව සොයා ගැනීම**

***ප්‍රතිපත්ති කරුණ 4 :***

රටක උසස් අධ්‍යාපනයේ ශක්තියේ මිණුම් දණ්ඩ වන්නේ උසස් අධ්‍යාපනය සඳහා වියදම් කරනු ලබන දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයයි. උසස් අධ්‍යාපනය සමස්ත ආර්ථික වර්ධනයට දායක වන නිසා ඒ වෙනුවෙන් මහජන මුදල් වැය කිරීම සාධාරණය කළ හැකි ය. එහෙත්, අනෙක් රටවල් සමඟ සසඳන විට ශ්‍රී ලංකාව උසස් අධ්‍යාපනය සඳහා වැය කරන්නේ දළ දේශීය නිෂ්පාදිතයෙන් අඩු ප්‍රතිශතයකි. එයට හේතුව අයවැය අභියෝගයයි. එබැවින්, රාජ්‍ය විශ්වවිද්‍යාලවලට විකල්ප අරමුදල් මාර්ග සෙවිය යුතුව තිබේ.

*ප්‍රතිපත්තිය 4 :* කලාපයේ පිහිටි අනෙකුත් රටවලට සමාන වන පරිදි විශ්වවිද්‍යාලවලට සපයන රාජ්‍ය අරමුදල් වැඩි කළ යුතු අතර, ස්වයං-ජනිත ආදායම් සහ රාජ්‍ය-නොවන අංශයේ ආයෝජන ඇතුළු විකල්ප අරමුදල් සපයා ගැනීමේ මාර්ග ප්‍රවර්ධනය කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- විශ්වවිද්‍යාල විවිධ ක්‍රියාකාරකම් සහ මූලාශ්‍ර මාර්ගයෙන් වඩ වඩාත් අරමුදල් ඉපයීම.

- විශ්වවිද්‍යාල ස්වායත්තතාව ආරක්ෂා වන පරිදි විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ රාජ්‍ය-පෞද්ගලික සහයෝගතාව (PPP) හා පුද්ගලික ආයෝජන දිරි ගැන්වීම.

- රාජ්‍ය-පෞද්ගලික සහයෝගතාව වර්ධනය කිරීම සොයා බැලීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මධ්‍යස්ථානයක් ද, එක් එක් විශ්වවිද්‍යාලවල ඒකක ද පිහිටුවීම.

- රාජ්‍ය-පෞද්ගලික සහයෝගතාව ගොඩ නැඟීමේ හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මඟ පෙන්වීමේ උපදෙස් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කිරීම.

- රාජ්‍ය-පෞද්ගලික සහයෝගතාව විශ්වවිද්‍යාලවල කාර්ය සාධනයේ ප්‍රගතිය ඇගයීමේ මිණුම් දණ්ඩක් ලෙස සැලකීම.

**උපකුලපතිවරයා පත් කිරීම**

*ප්‍රතිපත්ති කරුණ 5 :*

උපකුලපතිවරයා යනු ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලයක ප්‍රධාන ශාස්ත්‍රීය සහ පරිපාලන නිලධරයා ද, ප්‍රධාන වගවීමේ නිලධාරියා ද (Accounting Officer) ද වෙයි. ඔහු/ඇය මුළු විශ්වවිද්‍යාලයටම නායකත්වය සපයන අතර, රට ඇතුළතදීත් පිටතදීත්, විශ්වවිද්‍යාලය නියෝජනය කරයි. විශ්වවිද්‍යාලයක මනා පැවැත්ම සහතික කරමින්, එහි මෙහෙවර, දැක්ම සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ශක්තිමත් මූල්‍ය පදනමක් ගොඩ නඟන්නේ ද උපකුලපතිවරයාය. එබැවින් මනා සුදුසුකම් හිමි මෙන්ම වෘත්තීයමය වශයෙන් දක්ෂතා සහිත පුද්ගලයෙකු උපකුලපති ධූරය සඳහා සොයා ගැනීම විශ්වවිද්‍යාලයේ දියුණුව සඳහා පමණක් නොව, ජාතිය ගොඩනැඟීමේ කර්තව්‍යය සඳහා ද අත්‍යවශ්‍ය වේ. එහෙත් උපකුලපතිවරුන් පත් කිරීම සඳහා දැනට භාවිත කෙරෙන විධික්‍රමය සහ ක්‍රියාපටිපාටිය, කුසලතා මට්ටමෙන් ඉහළින් ම සිටින සහ පාලක සභාවේ වැඩිම කැමැත්ත ලැබූ අපේක්ෂකයා විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයා ලෙස පත් කෙරෙනු ඇත යන්න සහතික කරන්නේ ද නැත.

*ප්‍රතිපත්තිය 5 :* විශ්වවිද්‍යාලයක උපකුලපති ධූරයට අපේක්ෂකයෙකු නම් කිරීමේ අවසාන තීරණය ගැනීමේ බලය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට හිමි කර දිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- උපකුලපති ධූරය සඳහා අපේක්ෂකයින් නම් කිරීමේදී වඩාත් වාස්තවික තීරණ ගැනීමට විශ්වවිද්‍යාල පාලක සභාවට ඉඩ ලැබෙන පරිදි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 04/2018 දරන චක්‍රලේඛනය සංශෝධනය කිරීම.

- විශ්වවිද්‍යාල පාලක සභාව උපකුලපති අපේක්ෂකයින් ඇගයීමට භාජනය කළ යුත්තේ ඔවුන්ගේ පර්යේෂණ, පරිපාලනමය විශිෂ්ටත්වය, ගුණාත්මක වශයෙන් ඉහළ ශාස්ත්‍රීය ප්‍රකාශන, වෘත්තීය අත්දැකීම්, ශාස්ත්‍රීය සහ පරිපාලන ක්ෂේත්‍රවල විශිෂ්ට අත්දැකීම්, මෙන් ම පුද්ගලික අවංකත්වය වැනි සුදුසු පරාමිතීන්ට අනුකූලවය. ඉන්පසු පාලක සභාවේ ඇගයීම් වාර්තාවක්, අපේක්ෂක නම් තුනක් සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යැවිය යුතුය.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විශ්වවිද්‍යාල පාලක සභාවෙන් එවන ලද වාර්තාව අධ්‍යයනය කර, එහි යෝජිත විශිෂ්ටත්ව පිළිවෙළත්, එක් එක් අපේක්ෂකයා ලබා ඇති පාලක සභා ඡන්ද ප්‍රමාණත් සලකා බලා, උපකුලපති ධූරයට පත් කිරීම සඳහා වඩාත් සුදුසු අපේක්ෂයා ජනාධිපතිතුමාට නිර්දේශ කරයි.

- උපකුලපති ධූරයට නම් කර ඇති කිසිදු අපේක්ෂකයෙකු කවර මට්ටමකින්වත් දේශපාලන පෙළඹවීම් (Lobbying) වල නොයෙදීම.

**විශ්වවිද්‍යාල පාලක සභාවේ කාර්ය භාරය**

***ප්‍රතිපත්ති කරුණ 6 :***

පාලක සභාව විශ්වවිද්‍යාලයේ ඇති ඉහළම පරිපාලන සභාවයි. විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීමේ වැදගත් කාර්ය භාරයක් එය සතුව තිබේ. එබැවින් පාලක සභා සාමාජිකයන් ඉටු කළ යුත්තේ ප්‍රතික්‍රියාමය නොව සක්‍රීය කාර්යභාරයකි. එසේ වුව ද පාලක සභා සාමාජිකයින්ගේ විශේෂඥ දැනුම සහ පළපුරුද්ද විශ්වවිද්‍යාලයේ සංවර්ධනය සඳහා පූර්ණ ලෙස ප්‍රයෝජනයට ගැනෙන්නේ නැත.

***ප්‍රතිපත්තිය 6 :*** විශ්වවිද්‍යාලයේ මෙහෙවර ප්‍රකාශය සකස් කිරීමත්, එහි ඉදිරි ගමන පිළිබඳ මූලෝපායික මඟපෙන්වීමත් පිළිබඳ ඍජු වගකීම පාලක සභාව තමන් වෙත පවරා ගත යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග**

- පාලක සභාව විසින් විශ්වවිද්‍යාල මෙහෙවර ප්‍රකාශනය වරින් වර ඇගයීමට ලක් කරමින් යාවත්කාලීන කිරීම.

- විශ්වවිද්‍යාලය සංවර්ධනය වීම, එකඟ වී ඇති මෙහෙවර ප්‍රකාශනයට අනුරූපව සිදු වන බව පාලක සභාව විසින් සහතික කිරීම.

- මනා පාලනයක් විශ්වවිද්‍යාලය තුළ සිදු වෙනු ඇතැයි සහතික කිරීම සඳහා එහි පරිපාලන ක්‍රියාවලිය පාලක සභාවෙන් අධීක්ෂණය වීම.

- පරිපාලන කාර්යයන් සඳහා පත් කෙරෙන කමිටුවල වගකීම් සහ අරමුණු පාලක සභාව විසින් පැහැදිලිව තීරණය කිරීම.

- පාලක සභාව විගණන සහ කළමනාකරණ කමිටුවේ කාර්යයන් ශක්තිමත් කිරීම.

- පාලක සභාව, පැහැදිලි වගකීම් භාරයක් සහිතව නෛතික කටයුතු පිළිබඳ කමිටුවක් පිහිටුවීම.

අධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා චර්යාධර්ම සංග්‍රහයක්

*ප්‍රතිපත්ති කරුණ 7 :*

සමහර විශ්වවිද්‍යාල ආචාර්යවරුන් තමන් සතු ආයතනික වගකීම් සහ ශිෂ්‍යයන් වෙනුවෙන් ඇති වගකීම සඳහා ලබා දෙන්නේ අඩු වැදගත්කමකි. ආචාර්යවරුන්ගේ කාර්ය තීර්ණායක හඳුන්වා දීමට පියවර ගෙන ඇතත්, ඒවා පුළුල්ව භාවිත වන්නේ නැත. මේ තත්ත්වය ඉගැන්වීම, පර්යේෂණ නිපැයුම්, ශාස්ත්‍රීය කටයුතු කළමනාකරණය, ආයතනික කැපවීම සහ චර්යාව යන මේවායේ අඩු වෘත්තීය ගුණාත්මකතාවයට තුඩුදී තිබේ.

*ප්‍රතිපත්තිය 7 :* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලවල ද විශ්වවිද්‍යාල ආචාර්ය සංගම්වල ද අදහස් විමසා, අධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා චර්යාධර්ම සංග්‍රහයක් සකස් කළ යුතු ය.

ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග

- දේශන, සාකච්ඡා, පන්ති, උපදේශනය සහ මුහුණට මුහුණලා මෙන්ම විද්‍යුත් මාධ්‍යය තුළින් සිසුන් සමග සිදු කරන අන්තර්ක්‍රියා සඳහා අවශ්‍ය කාල ප්‍රමාණ සඳහා උපමාන (Norms) සහ මගපෙන්වීමේ උපදෙස් සකස් කිරීම.

- පර්යේෂණ දායකත්වය ඇතුළුව ආචාර්යවරුන්ගේ කටයුතු පීඨ, පීඨාධිපතිවරුන් සහ අධ්‍යයන අංශාධිපතිවරුන් මාර්ගයෙන් අධීක්ෂණය කිරීමට අවශ්‍ය යාන්ත්‍රණ සකස් කිරීම සහ ඉහළ මට්ටමේ කාර්ය සාධන අගය කිරීම සහ ඒවාට ත්‍යාග පිරිනැමීම.

- විවෘත සහ දුරස්ථ ඉගැන්වීම්වල යෙදෙන ආචාර්ය මණ්ඩලවලට සුදුසු උපමාන සකස් කිරීම.

- බැඳුම්කර ආපසු නොගෙවා මග හරින ආචාර්යවරුන්ට විරුද්ධව දැඩි නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.

අනධ්‍යයන කාර්ය මණ්ඩලයට සේවා උපමාන (Work Norms)

*ප්‍රතිපත්ති කරුණ 8 :*

අනධ්‍යයන කාර්ය මණ්ඩලය තමන්ට පවරාදෙන කාර්යයන් උනන්දුවෙන් ද කාර්යක්ෂමව ද ඉටු කරන බව සහතික කිරීම අවශ්‍ය වී තිබේ.

*ප්‍රතිපත්තිය 8 :* විශ්වවිද්‍යාල පරිපාලනය, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ඔවුන් වෙනුවෙන් සේවා උපමාන (Work Norms) සකස් කළ යුතුය.

ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග

- එක් එක් කාර්ය මණ්ඩල ශ්‍රේණිය සඳහා චර්යාධර්ම පද්ධතියක් (Code of Conduct) සකස් කිරීම.

- ඔවුන්ගේ වාර්ෂික වැටුප් වැඩිවීම් සහ උසස් වීම් සඳහා සේවා ඇගයීම මත පදනම් වූ නව විධික්‍රමයක් සකස් කිරීම.

**විශ්වවිද්‍යාල පරිපාලනකරණයට ශිෂ්‍ය සහභාගිත්වය**

***ප්‍රතිපත්ති කරුණ 09 :***

ශිෂ්‍යයන් අතර විනය බිඳවැටීම, රාජ්‍ය විශ්වවිද්‍යාලවල ඇති නිශේධනීය අංගයක් බවට නිරතුරුවම හුවා දැක්වේ. එබැවින් ශිෂ්‍ය විනය බිඳවැටීම වැළැක්වීමේ පියවර ගැනීම වහාම කළ යුතුව තිබේ. එක් එක් විශ්වවිද්‍යාලයක විනය සම්බන්ධ අතුරු නීති වලට අමතරව, 1998 අංක 20 දරන අධ්‍යාපන ආයතනවල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත ද තිබේ. එහෙත් ශිෂ්‍ය විනය පවත්වා ගෙන යෑම සඳහා මෙම නෛතික ප්‍රතිපාදන යොදා ගත හැක්කේ සීමිත දුරකට පමණි. මේ අතර ශිෂ්‍යයින් අතර ප්‍රචණ්ඩ හැසිරීම් සහ විනය බිඳවැටීම් සිදුවීම පසුබිමෙහි තිබෙන නිරන්තර සාධකයක් වන්නේ ආචාර්යවරුන්ගේ, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සහ පුද්ගලිකත්වය ගරු කරන සංස්කෘතියක් විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාවන් අතර නොපැවතීමයි.

***ප්‍රතිපත්තිය 09 :*** පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සහ ඒවායේ අනුල්ලංඝණීයතාව ගරු කරන ආයතනික සංස්කෘතියක් විශ්වවිද්‍යාල විසින් ප්‍රවර්ධනය කළ යුතුව තිබේ.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- විශ්වවිද්‍යාලවල දැනට ක්‍රියාත්මක වන ආයතන සංග්‍රහය (Establishment Code) යාවත්කාලීන කර, ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලයට ආචාර ධර්ම සංග්‍රහයක් හඳුන්වා දීම.
- ශාස්ත්‍රීය සහ බාහිර ක්‍රියාකාරකම් තුළින් සිසුන් සහ ආචාර්ය මණ්ඩලය අතර ඇති සම්බන්ධතා ඉහළ නැංවීම.
- තමන්ගේත්, අන්‍යයින්ගේත් අයිතිවාසිකම් වලට ගරු කරන ඉවසීමේ සහ මනුෂ්‍ය ගරුත්වයේ සංස්කෘතියක් විශ්වවිද්‍යාල තුළ ප්‍රවර්ධනය කිරීම.

**කළමනාකරණ තොරතුරු පද්ධතියක්**

***ප්‍රතිපත්ති කරුණ 10 :***

ලංකාවේ විශ්වවිද්‍යාලවල මනා පාලනය සඳහා උසස් අධ්‍යාපනික කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) අත්‍යවශ්‍ය වේ. විශ්වවිද්‍යාලවල සියලු කාර්යයන් සැළසුම් කර සම්බන්ධීකරණය සඳහා එය ආධාර වනු ඇත. ප්‍රමාණවත් ලෙස දත්ත නොපවතින නිසා සිය අනාගත කටයුතු සැළසුම් කිරීමට විශ්වවිද්‍යාලවලට දැනට දුෂ්කරය. එමෙන්ම දත්ත හුවමාරු ජාලයක් නොමැතිකම නිසා කාර්ය සම්බන්ධීකරණය ද සිදු නොවේ. එබැවින් අංග සම්පූර්ණ කළමනාකරණ තොරතුරු පද්ධතියක් විශ්වවිද්‍යාල සඳහා අත්‍යවශ්‍යය වේ.

***ප්‍රතිපත්තිය 10 :*** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සතු විද්‍යුත් මාර්ගගත දත්ත ගබඩාව (Online Database) කොමිෂන් සභාව යටතේ පාලනය වන සියලු උසස් අධ්‍යාපන ආයතන සමග සම්බන්ධ වෙමින්, නිතිපතා යාවත්කාලීන වන ඒකාබද්ධ කළමනාකරණ තොරතුරු පද්ධතියක් කොමිෂන් සභාව විසින් පිහිටුවිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල අතර තොරතුරු හුවමාරුව පහසුවෙන් සිදු වන බව සහතික කරනු පිණිස උසස් අධ්‍යාපන ආයතන සමඟ සන්නිවේදනය සඳහා විද්‍යුත් මාර්ගගත සන්නිවේදන පද්ධතියක් (Online Communication System) ගොඩනඟා, එය ස්වයංක්‍රීය කිරීමට පියවර ගැනීම.

- සෑම උසස් අධ්‍යාපන ආයතනයක් ම, තම ආයතනය පිළිබඳ තොරතුරු නිරතුරුව යාවත්කාලීන කරන බව සහතික කිරීම.

- මාර්ගගත දත්තවලට අවසර නැතිව පිවිසීම වැළැක්වීමේ විධික්‍රම නිර්මාණය කිරීම.

- වඩාත් යෝග්‍ය සේවා පරිසරයක් ඇති කිරීම සඳහා භාවිත කිරීමට පහසු පද්ධතියක් සකස් කිරීම.

- ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරකම් සරල කිරීම සඳහා මෙම පද්ධතිය පියවර කිහිපයක් තුළින් ක්‍රියාත්මක කිරීම.

# 3 පරිච්ඡේදය

## උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය, ශිෂ්‍ය ඇතුළත්වීම හා නව විෂයයන් සහ විෂය ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම

උසස් අධ්‍යාපනයට ප්‍රවේශ වීමට ඇති අවකාශ සීමා වීම, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ දිගටම පවත්නා අභියෝගයකි. පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන පැවතිය ද, සෑම ක්ෂේත්‍රයකම උසස් අධ්‍යාපනය ප්‍රධාන වශයෙන් සපයනු ලබන්නේ රාජ්‍ය විශ්වවිද්‍යාල විසිනි. 2016/2017 අධ්‍යයන වර්ෂවලදී සිසුහු 160,517ක් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූහ. එහෙත් සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගනු ලැබුයේ ඔවුන්ගෙන් 30,662කි. එනම් 19.10%ක සුළු ප්‍රමාණයකි. 2015/16, 2014/15 සහ 2013/14 වසර සඳහා වූ ප්‍රතිශතයක් පිළිවෙළින් සියයට 18.68%, 17.14% සහ 17. 53%ක් විය. මෙලෙස විශ්වවිද්‍යාල අධ්‍යාපනය දුර්ලභ මහජන සම්පතක් වී තිබෙන අතර, එය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට අපේක්ෂා කරන සිසුන් අතර අතිමහත් තරඟයකට ද තුඩු දී ඇත. මේ සංඛ්‍යාවන්ට අමතරව, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට 2016 වසරේදී සිසුන් 40,230ක් ද, 2017 වසරේ දී සිසුන් 39,381ක් ද ඇතුළත් කර ගෙන ඇත. විවෘත විශ්වවිද්‍යාලය සිසුන් ඇතුළත් කර ගන්නේ අ.පො.ස. (උසස් පෙළ) සුදුසුකම් මතම නොව, වෙනත් සුදුසුකම් මත ද වන නිසා අදාළ ප්‍රතිශතය ගණනය කිරීම දුෂ්කර වේ.

ප්‍රථම උපාධි අධ්‍යාපනය සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාලවල ඇති අවකාශ දැඩි ලෙස සීමා වීම මෙම ගැටලුවට ආමන්ත්‍රණය කරනු සඳහා, බාහිර උපාධි අපේක්ෂකයන් බඳවා ගැනීම ඉහළ නැංවීමට රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. විවෘත සහ දුරස්ථ ඉගෙනීමේ විධික්‍රම මඟින් බාහිර උපාධි පාඨමාලා ක්‍රමානුකූල කිරීම 2010 වසරේදී ආරම්භ විය.

ඉන් පසුව, විශ්වවිද්‍යාල ගණනාවකම, බාහිර උපාධි පාඨමාලා පෙර නොවූ විරූ ලෙස ව්‍යාප්තවී තිබේ. මේ අතර, උසස් අධ්‍යාපනය පුළුල් වීම සමඟ නව ප්‍රතිපත්තිමය අභියෝග ද මතුවී ඇත.

උසස් අධ්‍යාපනය සඳහා ඉඩප්‍රස්ථා පුළුල් කිරීම ප්‍රධාන වශයෙන් සිදු වන්නේ රාජ්‍ය විශ්වවිද්‍යාල තුළය. එමඟින්, එම විශ්වවිද්‍යාලවල දැනට තිබෙන මූල්‍ය සහ යටිතල පහසුකම් මෙන්ම මානව සම්පත් හැකියාවන් ද වෙතට නව බලපෑම ගෙන එයි. විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා රජය 2015 වසරේදී රුපියල් මිලියන 40,583ක් ද, 2016 වසරේදී මිලියන 48,915ක් ද, 2017 වසරේ දී 51,395ක් ද, වැය කර තිබේ. (UGC, Sri Lanka University Statistics, 2017) මේ මුදල් මූලික වශයෙන්ම වැය කර තිබෙන්නේ ප්‍රථම උපාධි අධ්‍යාපනය සඳහායි.

විශ්වවිද්‍යාලවලට ප්‍රවේශ වීමේ අවස්ථා පුළුල් කරන අතරම, විශ්වවිද්‍යාලවලටත්, අනෙකුත් අධ්‍යාපන ආයතනවලටත් රජය වෙන් කරන ප්‍රතිපාදන ඉහළ දමන ලෙස ද කරන ඉල්ලීම් වැඩි වී තිබේ.

උසස් අධ්‍යාපනයට ඇතුල්වීමේ අවස්ථා වැඩි කිරීමත් සමඟම, අධ්‍යයන පාඨමාලාවල සාර්ථකත්වය සහ ගුණාත්මකභාවය පිළිබඳව ද ඇති තෙරපීම් ද වැඩි වේ. පසුගිය අවුරුදු කිහිපය තුළ, රාජ්‍ය විශ්වවිද්‍යාල මඟින් බිහි කරන උපාධිධරයින්ගේ ගුණාත්මකබව සහ ඔවුන් කවර ක්ෂේත්‍රවල උපාධිධරයන් ද යන කරුණ පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්, නිලධාරීන්, විදේශ ආධාර සපයන්නන් සහ සංවර්ධන විශේෂඥයන් අතර විවාදාත්මක තේමාවක් ඇත. මෙම විවාදය තුළින්, රජයට සහ පුද්ගලික අංශයට රැකියා සඳහා අවශ්‍ය කරන්නේ කවර ආකාරයේ උපාධිධරයන් ද සහ උසස් අධ්‍යාපන ආයතනවලින්, විශේෂයෙන් රාජ්‍ය අංශයේ විශ්වවිද්‍යාලවලින්, බිහිකරනු ලබන්නේ කවර උපාධිධරයන් ද යන කරුණු දෙක අතර ඇති තියුණු පරතරය අවධාරණය කර තිබේ.

මේ අතර, නිරන්තරයෙන් වෙනස් වන ශ්‍රම වෙළෙඳ පොළෙහි අවශ්‍යතා වලට දක්වන අඩු ප්‍රතිචාරය, විශ්වවිද්‍යාල අධ්‍යාපනය ප්‍රතිසංස්කරණය කරමින් නවීකරණය කරන ලෙස මතුවන ඉල්ලීම් වලට සමස්ත විශ්වවිද්‍යාල පද්ධතිය දක්වන මන්දගාමී ප්‍රතිචාරය, එක් එක් උසස් අධ්‍යාපන ආයතන අතර පවත්නා අධ්‍යාපනයේ ඇති ගුණාත්මක විෂමතා, සහ රාජ්‍ය විශ්වවිද්‍යාල සහ පෞද්ගලික අංශ අතර ඇති දුර්වල සම්බන්ධතා යන මේවා ද රටේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති අනෙක් ප්‍රධාන අභියෝග වෙයි.

මුදල් අය කරමින් උසස් අධ්‍යාපනය සපයන ආයතන සහ පෞද්ගලික විශ්වවිද්‍යාල හතු පිපෙන්නාක් මෙන් මතු වී තිබෙන්නේ මෙවැනි පසුබිමක් තුළ ය.

මේ අතර, පශ්චාද්-උපාධි පාඨමාලා සහ ශිෂ්‍ය සංඛ්‍යාවේ තියුණු වැඩි වීමක් ද දක්නට ලැබේ. ඒ සමඟම රටේ දැනට පවත්නා පශ්චාද්-උපාධි පාඨමාලාවලින් ජාතික සංවර්ධන අරමුණු සහ න්‍යාය පත්‍රවලට සේවයක් නොවන්නේය යන ගැටලුව ද මතු කෙරේ. අර්ධ-කාලීන පාඨමාලාවලින් ලැබෙන අධ්‍යාපනයේ සහ පුහුණුවේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් පිළිබඳව ද ප්‍රශ්න මතුවී තිබේ.

පසුගිය දශක දෙක තුළ සිදු වී ඇති තවත් වර්ධනයක් නම්, විදේශ රටවල උසස් අධ්‍යාපනය අපේක්ෂා කරන ශිෂ්‍ය සංඛ්‍යාව සීඝ්‍ර ලෙස ඉහළ යාමයි. එම සිසුන් ඉහළ ආදායම් ලබන හෝ ප්‍රභූ පවුල් පසුබිම්වලින් එන අයම නොවේ. එයින් බොහෝ දෙනා අයත් වන්නේ මධ්‍යම පාන්තික පවුල්වලටය. මේ අනුව ශ්‍රී ලංකාවේ මධ්‍යම පාන්තික පවුල්වලට සිදු වී තිබෙන්නේ තම රටේ උසස් අධ්‍යාපන ක්‍රමයේ ඇති දැඩි අවකාශ සීමාවන් නිසා තම පවුල්වලටත්, රටටත් විශාල වියදමක් සිදු කරමින් තම දරුවන්ට උසස් අධ්‍යාපනය විදේශයන්හි ලබා දීමටය.

**සිසුන් බඳවා ගැනීම**

විවෘත විශ්වවිද්‍යාලය හැර අනෙකුත් සියලු ම රාජ්‍ය විශ්වවිද්‍යාලයන්හි සිසුන් අති බහුතරය ඇතුළත් කර ගනු ලබන්නේ අතිශය තරඟකාරී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ප්‍රතිපල මත ය. එය විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන පරීක්ෂණයකි. රාජ්‍යතාන්ත්‍රික සේවයේ සහ රාජ්‍ය සේවයේ නියුතු දෙමව්පියන්ගේ දරුවන් ඉතා සුළු සංඛ්‍යාවක් ද විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගනු ලබයි. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශේෂ දක්ෂතා ඇති 'විශේෂ' යන ප්‍රභේදයට ගැනෙන සිසුන් කුඩා සංඛ්‍යාවකට ද, විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට අවකාශ ලැබේ. මේ අතර ශාරීරික වශයෙන් වෙනස් හැකියාවන් සහිත සිසුන් සීමිත ප්‍රමාණයකට ද රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට අවකාශ ලබා දීම, වැදගත් ඉදිරිගාමී පියවරකි.

කලා සහ මානව ශාස්ත්‍ර පාඨමාලාවලට සිසුන් ඇතුළත් කර ගනු ලබන්නේ සමස්ත ලංකා කුසලතා මට්ටම අනුව ය.

අනෙක් සියලු විෂය ධාරාවන්ට සිසුන් තෝරා ගනු ලබන්නේ, සමස්ත ලංකා කුසලතා මත 40%ක් ද දිස්ත්‍රික් කෝටා ක්‍රමයට අනුව 55%ක් ද වශයෙනි. ඉතිරි 5% වෙන් වන්නේ පහසුකම් අඩු දිස්ත්‍රික්ක 16කට ය. රටේ දිස්ත්‍රික්ක 25කින් මෙම දිස්ත්‍රික්ක 16 තෝරාගෙන ඇත්තේ කවර පදනමක් මත ද යන්න පැහැදිලි නැත.

**කෝටා ක්‍රමය**

දිස්ත්‍රික් කෝටා පදනම යටතේ විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගැනීමේ ඇති අත්දැකීම් හොඳ සහ නරක වශයෙන් මිශ්‍ර එකකි. එය සාධනීය ප්‍රතිපත්තිමය පියවරක් වන හෙයින් එහි මුල් අරමුණ වූයේ, සමාජ සාධාරණත්වය සහ සමානාත්මතාව යන මූලධර්ම මත, වරප්‍රසාද රහිත දිස්ත්‍රික්කවල සිසුන්ට සමාන

උසස් අධ්‍යාපන අවස්ථා ලබාදීමයි. වරප්‍රසාද අඩු පළාත්, සමාජ සහ පවුල් පසුබිම්වලින් පැමිණෙන සිසුන්ට විශ්වවිද්‍යාලවල දොරටු එමගින් සැහෙන දුරකට විවෘත කර දී ඇත. එය වූ කලී ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්තිවල ඇති සමාජ සුභසාධනවාදී නැඹුරුවේම දිගුවක් ද වෙයි. ඒ සමඟම සිදු වී ඇති දෙයක් නම්, විශ්වවිද්‍යාලවලට කුසලතා මත ඇතුල් වන ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වීමයි.

දිස්ත්‍රික් කෝටා ක්‍රමය ගැන මතු වී ඇති අනෙක් විවේචනය නම්, ඒ මඟින් තමන්ගේ වාර්ගික පසුබිම කුමක් වුවත්, කුසලතා සහිත සිසුන් වෙනස්කම්වලට භාජනය කෙරෙන බවයි. විශේෂයෙන් මෙය සිදු වන්නේ වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් බව ද එම විවේචනයෙන් කියැවේ. වෛද්‍ය අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබන බොහෝ සිසුන්ට සිදු වන්නේ දන්ත වෛද්‍ය විද්‍යාව, පශු වෛද්‍ය විද්‍යාව, කෘෂිකර්මය, ජෛව විද්‍යාව සහ සම සෞඛ්‍ය විද්‍යාව යන ක්ෂේත්‍රවලට ඇතුල් වීමට බල කිරීමයි.

මෙවැනි විවේචන තිබියදීත් දිස්ත්‍රික් කෝටා ක්‍රමය වෙනස් කිරීමට භාජනය නොවී, අවුරුදු 40ක් තරම් කාලයක් දිගටම පවතී. ඇති විය හැකි නිෂේධනීය ප්‍රතිපත්තිමය සහ දේශපාලනික ඵල විපාක නිසා එම ක්‍රමය සමාලෝචනයකට හෝ ප්‍රතිසංස්කරණයකට හෝ භාජනය කිරීමට ප්‍රතිපත්ති සම්පාදනයක් දක්වන්නේ මඳ උනන්දුවකි.

### බඳවා ගැනීම

විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගැනීම පසුගිය දශක කිහිපය තුළදී දක්වා ඇත්තේ ඉහළ නැඟීමේ ප්‍රවණතාවකි. එසේ, දළ බඳවා ගැනීමේ අනුපාතය (Gross Enrolment Ratio) ඉහළ නැඟ ඇතත්, එම අනුපාතය ප්‍රමාණවත් නැත. නිදසුනක් ලෙස, අවුරුදු 19-23 අතර වයස් කාණ්ඩයේ තරුණ තරුණියන් 1000කගෙන් විශ්වවිද්‍යාල අධ්‍යාපනයට ඇතුළත් වීමට හැකියාව ලැබී ඇත්තේ 65කට පමණි. මෙම දළ බඳවා ගැනීමේ අනුපාතය ශිෂ්‍යාවන් අතර ඉහළ ගොස් තිබේ. උසස් අධ්‍යාපන සුදුසුකම් ලබනවාට වඩා රැකියා සොයා ගැනීමට පිරිමි ශිෂ්‍යයන් වඩා කැමැත්තක් දැක්වීමේ ප්‍රවණතාව එයින් ප්‍රකාශවේ.

### සිසුන් ඇතුළත් කර ගැනීමේ ප්‍රමාද වීම්

සිසුන් කුඩා ප්‍රමාණයක් විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට තෝරා ගනු ලැබුව ද විශ්වවිද්‍යාලයට ඇතුළත් නොවීම නිසා, විශ්වවිද්‍යාලවල සිසුන් බඳවා ගැනීමේ ඇබැර්තු පිරවීම සඳහා දැනට ඇති විධි ක්‍රමයේ අඩු පාඩුවක් තිබේ. සාමාන්‍යයෙන්, වෛද්‍ය සහ ඉංජිනේරු ක්ෂේත්‍රවල මෙවැනි ඇබැර්තු ඇති නොවේ. විද්‍යා, කෘෂිකර්මය, සම සෞඛ්‍ය විද්‍යාව, භෞතික විද්‍යා, සාමාජීය විද්‍යා සහ මානව ශාස්ත්‍ර ක්ෂේත්‍රවල මෙය ගැටලුවක් වී තිබේ. මෙම ඇබැර්තු පිරවීමට යොදා ගන්නා විධික්‍රමය වන්නේ දිස්ත්‍රික්ක සහ Z ලකුණු මත විශ්වවිද්‍යාලවලට තෝරාගෙන නැති සිසුන් ඉහළට තල්ලු කිරීමයි. ඇබැර්තු පිරවීම සඳහා යොදා ගන්නා මෙම තේරීම් ක්‍රමය අනවශ්‍ය ලෙස කල් ගන්නා එකකි. එය විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේ සාමාන්‍ය ක්‍රමයේ අවුල් ඇති කරයි. සෑම පාඨමාලාවකට ම සියයට සියයක් සිසුන් බැඳෙන බවට සහතික කිරීමට නම්, මෙම ක්‍රමය සංශෝධනය කළ යුතුය.

### ප්‍රථම උපාධි විෂය ධාරා

අධ්‍යයන ක්ෂේත්‍රවලට අනුව උපාධි අපේක්ෂකයින් පැතිරී ඇති ආකාරය දෙස බලන විට, වැඩි පිරිස අයත් වන්නේ කලා, කළමනාකරණ සහ වාණිජ්‍යය යන ක්ෂේත්‍රවලටයි. ඔවුහු 2016 වන වසරේ දී 52.4%ක් වූහ. ඒ අතර උසස් රැකියා අවකාශ පවතින වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, සහ පරිගණක විද්‍යා ක්ෂේත්‍රවල ප්‍රතිශතය වූයේ 27.7%කි. අධ්‍යාපනයේ ගුණාත්මකභාවයත් රැකියා ලබා ගැනීමේ අවකාශත් ඉහළ නංවන ගමන් ම, උසස් අධ්‍යාපනය සඳහා ඇති ඉඩ ප්‍රස්ථා ද පුළුල් කිරීම, ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා ඵලදායී ලෙස දායක වන උපාධිධරයන් බිහි කිරීම සඳහා අවශ්‍යය. ප්‍රථම උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ ගුණාත්මකබව සහ අදාළත්වය වර්ධනය කිරීම අරමුණු කරගෙන

විදේශ ආධාර ද සහිතව රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ සිදුකර ඇති අත්හදා බැලීම් කිහිපයකම ප්‍රධාන තේමාව වූයේ මෙම කරුණයි.

**ස්ත්‍රී-පුරුෂ අනුපාතයේ වෙනස් වීම්**

පසුගිය දශකය තුළ නිරීක්ෂණය කළ හැකි ප්‍රවණතාවන් නම්, විශ්වවිද්‍යාලවල හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රථම උපාධි අපේක්ෂකයින් ලෙස ඇතුළත් වී ඇති සිසුන්ගෙන් පිරිමි සිසුන්ට වඩා සිසුවියන් සිටින බවයි. 2015/16 වසරේ රාජ්‍ය විශ්වවිද්‍යාලවලට සහ උසස් අධ්‍යාපන ආයතන වලට තෝරා ගන්නා ලද සියලු ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ගේ මුළු සංඛ්‍යාව වූ 29,083 න් 63%ක් වූයේ ගැහැණු සිසුන්ය. 2016/17 වසරේ දී 30,068 ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 19,107ක්, එනම් 69.10%ක්, සිසුවියෝ වූහ.

නොයෙකුත් උපාධි අපේක්ෂක පාඨමාලාවලට ඇතුළත්වී සිටින සිසුන්ගේ ස්ත්‍රී-පුරුෂ අනුපාතයේ ද වැදගත් වෙනස්කම් සිදු වී තිබේ. කලා සහ මානව ශාස්ත්‍ර පීඨවල සිසුවියන්ගේ ඇතුලත් වීමේ ප්‍රතිශතය 82.4%ක් වූ අතර නීති පීඨවල එය 85.9%ක් ද, කළමනාකරණ ක්ෂේත්‍රයේ, වෛද්‍ය විද්‍යා, දන්ත වෛද්‍ය, පශු වෛද්‍ය විද්‍යා, කෘෂිකර්ම, සම සෞඛ්‍ය විද්‍යා, වාණිජ්‍ය සහ පරිගණක විද්‍යා ක්ෂේත්‍රවල එය 50%-70%ක් අතර විය. ස්වාභාවික විද්‍යා ක්ෂේත්‍රයේ සිසුවියන්ගේ ප්‍රතිශතය 48.7%ක් ද, ගෘහනිර්මාණ ශිල්පය/ ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ 42.3%ක් ද, තාක්ෂණ විද්‍යා ක්ෂේත්‍රයේ 45.6%ක් ද විය. අවම ගැහැණු සිසු අනුපාතය වාර්තාවී ඇත්තේ, ඉංජිනේරු පීඨයෙනි, එය 22.2%ක් පමණි. තාක්ෂණික පාඨමාලාවල ඇති අඩු ශිෂ්‍ය නියෝජනය නිසා, උසස් අධ්‍යාපනයේ ඇති ස්ත්‍රී-පුරුෂ තුල්‍යතාව දුර්වල වී තිබේ.

2013 වසරේදී, සිවිල් තාක්ෂණය පිළිබඳ ජාතික සහතික පත්‍ර පාඨමාලාවට බැඳී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවන් අතර සිසුවියන් වූයේ 15.2%කි. ඔවුන්ගේ 31.4%ක් ප්‍රමාණ සමීක්ෂණ (Quantity Surveying) සහතික පත්‍රයට ද, 0.8%ක් විදුලි සහ විද්‍යුත් තාක්ෂණ පාඨමාලාවලට ද ලියාපදිංචි වී සිටි සිසුවියන්ය. එම වසරේ වෘත්තීය පුහුණු පාඨමාලාවලට බැඳී ඇති සිසු සිසුවියන් ප්‍රමාණය දෙස බලන විට විදුලි කාර්මික පාඨමාලාවට ඇතුළත් වූ සිසුවියන්ගේ අනුපාතය 2.4%කි. ඉදිකිරීම් යාන්ත්‍රික පාඨමාලාවලට 9.5%කි. 95%ක් ම ලියාපදිංචි වී සිටියේ ඇඳුම් නිර්මාණ පාඨමාලාවටය. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) ව්‍යාපාර සම්බන්ධ ආධුනිකත්ව පුහුණුවට 23.7%ක් සිසුවියන් ද, කර්මාන්ත වැඩපල ආශ්‍රිතව ආධුනිකත්ව පුහුණුවට සිසුවියන් 41.3%ක් ද ලියාපදිංචි වී සිටියහ. සමස්තයක් ලෙස බැලූ විට, ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ) ලැබූ සිසුවියන්ගේ අනුපාතය 23.5%-56.9% අතර විය.

මෙහි දී අවධානයට යොමු විය යුතු කරුණ නම්, ''සිසුවියන්ගේ අඩු නියෝජනයක් ඇති පාඨමාලා, ශ්‍රම වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති පාඨමාලා වන්නේ ය'' යන්නයි. ජාතික ප්‍රතිපත්තිය දැනට යොමු වී තිබෙන්නේ "දැනුම් ආර්ථිකය" කෙරෙහි ය. තාක්ෂණයට සම්බන්ධ පාඨමාලාවලට සහභාගි වන ගැහැණු-පිරිමි සිසුන්ගේ ප්‍රමාණයේ ඇති අසමතුලිතතාව ස්ත්‍රීන් බොහෝ ප්‍රමාණයක් "දැනුම් ආර්ථිකයට" සහභාගි වීමෙන් බැහැර කිරීමට තුඩු දෙනු ඇත.

**ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය හා සමානත්වය**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි උසස් අධ්‍යාපනයට අදාළව ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය /සමානාත්මතාව පිළිබඳ ස්ථාවර කමිටුවක් ස්ථාපිත කර ඇත. එහි අරමුණ, ස්ත්‍රී-පුරුෂ සමභාවයට සංවේදී විශ්වවිද්‍යාල සංස්කෘතීන් සහ පරිසර නිර්මාණය කරනු පිණිස ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය හා සමානාත්මතාව විශ්වවිද්‍යාලවල ප්‍රවර්ධනය කිරීමයි. මෙම ස්ථාවර කමිටුව පිළිගෙන ක්‍රියාත්මක කරන උපාය මාර්ගවලින් අපේක්ෂා කෙරෙන්නේ, විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහ ශාස්ත්‍රීය, පරිපාලන සහ

සහායක කාර්ය මණ්ඩලවලට පීඩාකාරී තත්ත්වයන්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවී ප්‍රචණ්ඩත්වය සහ වෙනස්කම් කරනු ලැබීමෙන් තොරව තම කටයුතු කරගෙන යාමට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීමයි.

ශ්‍රී ලංකාවේ බොහෝ විශ්වවිද්‍යාලවල දැනට දක්නට ලැබෙන ප්‍රවණතාව වන්නේ, ප්‍රථම උපාධි පාඨමාලාවලට සහභාගි වන සිසුන් සංඛ්‍යාවෙන් බහුතරය සිසුවියන් වීමයි. සමහර පාඨමාලාවල, සිසුන්ගෙන් අති බහුතරය වන්නේ ස්ත්‍රීන්ය. නිදසුනක් ලෙස, හෙද විද්‍යාව සහ සම සෞඛ්‍ය සේවා විද්‍යාවේදී උපාධි පාඨමාලාවන් හදාරන සිසුන්ගෙන් 90%ක්ම ස්ත්‍රීන් ය. සාම්ප්‍රදායිකව පිරිමි සිසුන් බහුතරයක් පැවති වෛද්‍ය විද්‍යාව, නීතිය, පශු වෛද්‍ය විද්‍යාව, දන්ත ශල්‍යවේදය, කෘෂිකර්මය සහ තාක්ෂණය යන ක්ෂේත්‍රවල ද ස්ත්‍රී සිසුන්ගේ සංඛ්‍යාව වේගයෙන් ඉහළ යමින් තිබේ. විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේදී ස්ත්‍රී-පුරුෂ සමානත්වය සඳහා වූ ප්‍රතිපත්ති සාධනීය ක්‍රියාමර්ග (Affirmative Action) තවදුරටත් අනවශ්‍ය බව පෙනුනත්, ඒ වෙතින් නව ප්‍රතිපත්තිමය අභියෝග පැන නැගේ. නිදසුනක් ලෙස, උසස් අධ්‍යාපන සුදුසුකම් සහිත ස්ත්‍රීන්ට වඩ වඩා රැකියා උසස් වීම්, සහ වෘත්තීය ප්‍රවර්ධනය සඳහා අවස්ථා සැපයීමට ශ්‍රම වෙළෙඳ පොළ සූදානම් විය යුතුය.

බාහිර උපාධි පාඨමාලා

2010 වසරේ සිට බාහිර උපාධි පාඨමාලා පුළුල් වීම නිසා, ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ නව පරස්පරතාවක් ගොඩනැගී තිබේ. එක් අතකින්, අ.පො.ස. උසස් පෙළ විභාගය සමත් වුවත්, උසස් අධ්‍යාපනය ලැබීමට විශ්වවිද්‍යාලවලට ඇතුලු වීමට ඇති ඉතා තියුණු තරගය නිසා, අභ්‍යන්තර ශිෂ්‍යයන් ලෙස විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට අවස්ථා නොලැබෙන බොහෝ පිරිසකට ඒ මගින් දොරටු විවෘත වී තිබේ. ඒ සමගාම විවෘත සහ දුරස්ථ අධ්‍යාපන විධික්‍රම තුළින් සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා පාඨමාලා සඳහා සිසුන්ට දොර විවෘත කිරීම නිසා එහි විශ්වවිද්‍යාල අධ්‍යාපනයට ඇතුල් වීමට ඇති අවකාශය තවදුරටත් පුළුල් වී තිබේ. මෙහි ඉතාම යහපත් ප්‍රතිඵලය වී තිබෙන්නේ අතිශයින් ම මධ්‍යගත වුත්, ඉහළ ඉල්ලුමක් තිබෙන්නා වූත්, බොහෝදුරට ප්‍රභුවාදී වූත් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ප්‍රජාතාන්ත්‍රීකරණයට තරමක් හෝ සමීප වීමයි.

එසේ වුවත්, විශ්වවිද්‍යාලවල බාහිර පාඨමාලාවල ඇති ගුණාත්මකභාවය පිළිබඳ ගැටලු මතු වී තිබේ. විශ්වවිද්‍යාලවල ඇති සෑම බාහිර අධ්‍යාපන පාඨමාලාවක ම පාහේ අභ්‍යන්තර සිසුන් සඳහා ඇති පාඨමාලාවල ඇති ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් පවත්වා ගැනීමට අසමත් වී තිබේ. මෙම පාඨමාලා, දැන් රාජ්‍ය විශ්වවිද්‍යාලවල ඇති සීමිත මානව සම්පත් සහ යටිතල පහසුකම්වලට ඇති අමතර බරක් ද වී ඇත. බාහිර පාඨමාලාවල ඉගැන්වීමට වෙනම ආචාර්ය මණ්ඩලයක් බඳවා නොගැනීම නිසා සිදු වී තිබෙන්නේ, අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂකයින්ට සහ පශ්චාද්-උපාධි පාඨමාලාවල උගන්වන ආචාර්යවරුන්ට, බාහිර පාඨමාලාවල ඉගැන්වීම සහ විභාග කටයුතු ද සති අන්තවලදී කිරීමට සිදුවීමයි. කාර්ය බහුල ආචාර්ය මණ්ඩලය සති අන්ත බාහිර පාඨමාලාවල ඉගැන්වීමට නැඹුරු වීමේ ප්‍රධාන හේතුවී තිබෙන්නේ එයින් ලැබෙන මූල්‍ය ප්‍රතිලාභයයි.

ඊට අමතරව, බාහිර ශිෂ්‍යයන්ට, අභ්‍යන්තර ශිෂ්‍යයින්ට මෙන් ආචාර්යවරුන්ගෙන් ලැබෙන අවධානය ලැබෙන්නේ ද නැත. ඔවුන්ට ලැබෙන විෂය දැනුම සහ මෘදු කුසලතා ද නිපුණතා ද අල්ප ය. මෙම බාහිර සිසුන්ගෙන් විශාල ප්‍රමාණයක් විශ්වවිද්‍යාල පරිසරයට අනාවරණය වීමක් සිදු වන්නේ ද නැත. එබැවින්, රැකියා, සම්මුඛ පරීක්ෂණවලදී, ඔවුන්ගේ සාර්ථකත්වය අවම වීමට මෙම කරුණ බලපායි. "බාහිර උපාධි පාඨමාලා සහ විවෘත හා දුරස්ථ අධ්‍යාපන ක්‍රමය තුළින් බිහි වන උපාධිධරයන් මෙන් ම සහතික පත්‍ර සහ ඩිප්ලෝමා ලාභීන් රැකියා සඳහා ඉහළ සුදුසුකම් ලබති." යනුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 932 චක්‍රලේඛයෙන් පළකර ඇති අපේක්ෂාවට මෙම යථාර්ථය පටහැනි වේ. සත්‍ය වශයෙන්ම සිදුවන්නේ මෙම බාහිර උපාධිධරයන් රැකියා විරහිත වීම සහ ඔවුන්ගේ අපේක්ෂාභංගත්වය සහ දුක් ගැනවිලි ප්‍රසිද්ධියේ මහ හඬින් ප්‍රකාශ වීමයි.

**යටිතල පහසුකම්**

උසස් අධ්‍යාපනයට ඇති අවකාශ පුළුල් කිරීමේ තවත් ප්‍රධාන පෙළේ ප්‍රහේලිකාවක් වී තිබෙන්නේ, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේත්, අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලවලත් ජීවන තත්ත්වයේ සීඝ්‍ර පරිහානියයි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල බොහෝමයක ශිෂ්‍ය ජනගහනය තම උපාධි අපේක්ෂක වසර තුළදී අත් විඳින පහළ මට්ටමේ පවතින්නා වූත්, දියුණුවක් නොලැබෙන්නා වූත්, ජීවන මට්ටම නිසා, එම විශ්වවිද්‍යාලවලින් ලැබෙන අධ්‍යාපනයේ ගුණාත්මකභාවයට ද හානි සිදු වී තිබේ. විශ්වවිද්‍යාල සිසුන්ගේ අති බහුතරය පැමිණෙන්නේ අඩු ආදායම් ලබන පවුල් වලිනි. තම ජීවිතයේ ඉතාම තීරණාත්මක වසර කිහිපය තුළදී ඔවුන්ට වඩා හොඳ ජීවන මට්ටමක් ලබා දීමට ඔවුන්ගේ විශ්වවිද්‍යාල ජීවිතයට නොහැකි වී තිබේ.

විශ්වවිද්‍යාල යටිතල පහසුකම්වල වර්ධනයක් තිබුණ ද, ඒවා ප්‍රමාණවත් නැත. එම පහසුකම් නූතන උසස් අධ්‍යාපන ආයතනවල තිබිය යුතු යැයි අපේක්ෂා කළ හැකි ප්‍රමිතීන්ට සමීප වන්නේ ද නැත. ප්‍රමාණවත් ඉඩ කඩ, පහසුකම් සහ පිරිසිදුකම ඇති නේවාසිකාගාර මෙන්ම දැනුම සහ තොරතුරු ලබා ගැනීමේ දියුණු මාර්ග, නූතන ඉගෙනුම්-ඉගැන්වීම් සඳහා මනා පහසුකම් ඇති පන්ති කාමර, දියුණු පුස්තකාල පහසුකම්, පාඩම් කිරීමේ පොදු අවකාශ, ක්‍රීඩා පහසුකම්, යෝග්‍ය වැසිකිළි සහ ආපනශාලා, ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම්, දියුණු මට්ටමේ පෝෂණය, සෞඛ්‍යය සහ පිරිසිදුකම යන මේවා නොතිබීම, විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂක ප්‍රජාව අතර පවතින පහළ මට්ටමේ ජීවන මට්ටමට දායක වී ඇති සාධකයන්ය.

**නව පාඨමාලා හා වැඩසටහන්**

දැනට තිබෙන පාඨමාලා ප්‍රතිසංස්කරණය කරන ලෙසත්, අලුතෙන් ඉදිරිපත් කරන පාඨමාලා (i) උසස් අධ්‍යාපනයේ ගෝලීය ප්‍රවණතාවලට අනුරූප වීම (ii) ශ්‍රම වෙළෙඳපොළේ දේශීය සහ ගෝලීය වශයෙන් සිදු වෙමින් පවත්නා වෙනස්වීම්වලට උපාධිධරයන් සූදානම් කිරීම, සහ (iii) ශිෂ්‍ය-ශිෂ්‍යාවන් රැකියාවක් ලබා ගැනීම සඳහා දීර්ඝ කාලයක් බලා සිටින්නේ නැතිව ඔවුන් ප්‍රයෝජනවත් රැකියාවලට සූදානම් කිරීම යන අංග ලක්ෂණවලින් සමන්විත විය යුතු බව අවධාරණය කිරීමේ විශාල බලපෑමක් වර්තමානයේදී රාජ්‍ය විශ්වවිද්‍යාලවලට එල්ල වෙමින් තිබේ.

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, තාක්ෂණය සහ හෙද විද්‍යාව යන නව අධ්‍යයන පීඨ පිහිටුවීමට පියවර ගෙන ඇත්තේ, එම ක්ෂේත්‍රවලට දේශීය සහ ජාත්‍යන්තර රැකියා වෙළඳපොලේ ඇති ඉල්ලුමට මුහුණ දීම පිණිසය.

කෙසේ වුව ද, නව අධ්‍යාපන පාඨමාලා ආරම්භ කර, ඒවා නිසිලෙස දිගටම පවත්වා ගැනීමට විශ්වවිද්‍යාලවලට අවශ්‍ය සම්පත් නොමැතිවීම ගැන සිසුන් සිටින්නේ කළකිරීමකිනි. ඔවුන්ගේ අදහස නම් අලුත් පාඨමාලා සඳහා ප්‍රමාණවත් ගොඩනැඟිලි, ගෘහ භාණ්ඩ උපකරණ, විද්‍යාගාර, සහ මානව සම්පත් තිබීම ද වැදගත් ය යන්නයි. නව පාඨමාලා ආරම්භ කිරීමට පෙර මෙම පහසුකම් තිබිය යුතු බව ද ඔවුහු අවධාරණය කරති.

ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තමන්ගේ රැකියා අවස්ථා පුළුල් කර ගැනීමට සහ වෘත්තීය ඉදිරි ගමන වඩාත් සාර්ථක වීමට තුඩුදෙන පරිදි විශ්වවිද්‍යාල පාඨමාලා බහු-විෂයික සහ අන්තර්-විෂයීක වන පරිදි නම්‍යශීලී විය යුතුය යන අදහසට ද වර්ධනය වන පිළිගැනීමක් දැන් ලැබී තිබේ. මෙයින් අවධාරණය කරන්නේ විද්‍යාව, තාක්ෂණය, වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, වාණිජය සහ කළමනාකරණය, නීතිය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර, සහ සෞන්දර්ය අධ්‍යයන යන විවිධ පාඨමාලා එකිනෙකට සම්බන්ධ කරන අලුත් පාඨමාලා සහ විෂය හඳුන්වා දීමේ අවශ්‍යතාවයි.

පවත්නා අධ්‍යයන පාඨමාලාවලට ඉහත කී ආකාරයේ විවිධත්වය හඳුන්වා දීමට ඇති එක විධි ක්‍රමයක් වන්නේ පාඨමාලා අයවර මාරු කිරීමට (Credit Transfer) ඉඩ ලබා දීමයි. එමෙන්ම අන්තර්-පීඨ සහ විෂයාන්තර පාඨමාලා හඳුන්වා දීම ද, දැනට තිබෙන විෂයයන් එකිනෙකින් දැඩි ලෙස වෙන් කිරීමේ ක්‍රමය විසින් ඇති කරනු ලබන දැනුම පිළිබඳ හිදැස් පිරවීමට භාවිත කළ හැකි විසඳුමකි.

**කුසලතා**

සමහර අධ්‍යාපන පීඨවලින් සමත් වන උපාධිධාරීන්ට රැකියා ලබා ගැනීමට ඇති සීමිත රැකියා අවස්ථා පිළිබඳ ගැටලුව නිසා උසස් අධ්‍යාපනයට ඇතුල්වීම පිළිබඳ ගැටලුව තවත් සංකීර්ණ වී තිබේ. උසස් අධ්‍යාපනයට ඇති ප්‍රවේශ අවස්ථා පුළුල් කිරීම හේතු කොට ගෙන, රැකියා විරහිත උපාධිධාරීන්, විශාල සංඛ්‍යාවක් බිහි කිරීම මඟින්, උසස් අධ්‍යාපන ප්‍රවේශ ව්‍යාප්තිය විසින් තවත් සමාජ ප්‍රශ්නයක් නිර්මාණය කරනු ලැබ ඇත යන තර්කයට මෙම තත්ත්වය තුඩුදී තිබේ.

රැකියාවලට සුදුසු උපාධිධාරීන් බිහි කිරීම ගැන දැනට තිබෙන අවධාරණය නිසා රාජ්‍ය විශ්වවිද්‍යාලවල සමාජීය විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨ දැඩි පීඩනයට ලක්වී තිබේ. එම පීඨවල උපාධිධාරීන්ට ශාස්ත්‍රීය දැනුම පමණක් නොව, ශ්‍රම වෙළඳපොල ඉල්ලා සිටින කුසලතා සහ ආකල්ප පිළිබඳ පුහුණුවක් ද ලබා දිය යුතුය යන්න අවධාරණය කිරීම එයට හේතුවයි. මෙම ක්ෂේත්‍රවල උපාධිධාරීන්ට ලැබෙන රාජ්‍ය අංශයේ රැකියා ප්‍රමාණය බෙහෙවින් සීමා වීම නිසා මෙම අභියෝගය වඩාත් තියුණු වී තිබේ. ප්‍රථම උපාධි පාඨමාලාවලට මෘදු කුසලතා වර්ධනය කිරීමේ පාඨමාලාත්, තොරතුරු තාක්ෂණය සහ ඉංග්‍රීසි භාෂාවට වැඩි අවධානය යොමු කිරීමත්, මෙම නව ප්‍රවණතාවයේ ප්‍රතිඵලයකි. කළමනාකරණ සහ ව්‍යාපාරික කුසලතා ද සෑම ක්ෂේත්‍රයක ම උපාධි අපේක්ෂකයන් වෙත ලබා දීම අවශ්‍ය යැයි සැලකීම ද මෙම පසුබිම තුළ මතු වී ඇති තවත් අදහසකි. මෙපරිදි, සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක් ම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මග පෙන්වීම යටතේ, වෘත්තීය මග පෙන්වීම සහ මෘදු කුසලතා පුහුණුව ප්‍රථම උපාධි අධ්‍යයනයට සම්බන්ධ කිරීමට පියවර ගෙන ඇත.

උපාධිධාරීන්ට රැකියා ලබා ගැනීමේ ගැටලුව විශේෂයෙන්ම අභියෝගාත්මක වන සමාජීය විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨවලට, මෘදු කුසලතා සඳහා දැනට පවත්නා අවධානය එතරම් ප්‍රමාණවත් විකල්පයක් නොවනු ඇත. මෘදු කුසලතාවලට අමතරව ඔවුන්ට අවශ්‍ය වන්නේ කළමනාකරණ මට්ටමේ රැකියා සඳහා ඔවුන්ට සුදුසුකම් ලබා දෙන "වෘත්තීය කුසලතා" (Professional Skills) වේ.

**ආකල්ප පරතරය**

අනාගත සේවාදායකයින් අපේක්ෂා කරන ආකාරයේ වටිනාකම් සහ ආකල්ප ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල උපාධිධාරීන් සතුව නැත යන පොදු මතයක් රටේ පවතින අතර, එය තදින්ම ඉදිරිපත් කරන්නේ පෞද්ගලික අංශයයි. මෙම උපාධිධරයන් සතු ශාස්ත්‍රීය දැනුම සහ ආකල්පත්, සැබෑ ජීවන කුසලතාත් අතර ඇති පරතරය, පෞද්ගලික අංශය විසින් නිරන්තරයෙන් අවධාරණය කරනු ලැබේ.

විශ්වවිද්‍යාල මෙම කරුණ ගැන අවබෝධයෙන් සිටිති. උපාධි අපේක්ෂකයින්ට කුසලතා පුහුණුව ලබා දීම මඟින් එයට ආමන්ත්‍රණය කිරීම සඳහා ගෙන ඇති පියවරවලට වඩා කිට්ටු අවධානයක් දැක්වීමත්, ඒවා සමාලෝචනයට සහ වැඩි දියුණු කිරීමට පාත්‍ර කිරීමත්, අවශ්‍ය වේ.

## උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය, ශිෂ්‍ය ඇතුළත්වීම හා නව විෂයයන් හා විෂය ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා

**දිස්ත්‍රික් කෝටා ක්‍රමය**

***ප්‍රතිපත්ති කරුණ 11 :***

විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීමට දැනට යොදා ගන්නා දිස්ත්‍රික් කෝටා ක්‍රමය සමාලෝචනයට ලක් කිරීමේ දැඩි අවශ්‍යතාවක් තිබේ. එවැනි සමාලෝචනයක අරමුණ විය යුත්තේ, 1970 ගණන්වල සිට ශ්‍රී ලංකාවේ සිදුවී ඇති සමාජ-ආර්ථික වෙනස්වීම් පිළිබඳ සන්දර්භය තුළ සමතාව (Equity) සහ කුසලතාව (Merit) අතර වඩා හොඳ සමබරතාවක් ඇති කිරීමයි. දිස්ත්‍රික් කෝටා ක්‍රමයට අනුව විශ්වවිද්‍යාලවල ඇබෑර්තු ගණනය කිරීමේ දී අභ්‍යන්තර සංක්‍රමික ප්‍රජාවන් ගැන සැලකිල්ලට ගෙන ඇත්තේ ද නැත.

***ප්‍රතිපත්තිය 11:*** විශ්වවිද්‍යාලවලට සිසුන් තෝරා ගැනීම සඳහා සමතාව සහ කුසලතාව අතර සමබරතාවක් ඇති කරන ක්‍රමයක් හඳුන්වා දිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කරගන්නා නව ක්‍රමයක් සකස් කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කිරීම.
- විශ්වවිද්‍යාලවලට සිසුන් තෝරා ගැනීමට ඇති දිස්ත්‍රික් කෝටා ක්‍රමය සමාලෝචනයට සහ ප්‍රතිසංස්කරණයට භාජනය කිරීම.

**ඉඩකඩ සහ යටිතල පහසුකම්වල සීමා**

***ප්‍රතිපත්ති කරුණ 12 :***

ප්‍රථම උපාධි අපේක්ෂකයන් බඳවා ගැනීම ඉහළ යාමත්, පශ්චාද්-උපාධි සහ සේවා පාඨමාලා ව්‍යාප්ත වීමත් නිසා විශ්වවිද්‍යාලවල ඉඩකඩ සහ යටිතල පහසුකම් සීමිත වීම සියලු විශ්වවිද්‍යාල මුහුණ දෙන ප්‍රධාන පෙළේ අභියෝගයක් වී තිබේ.

***ප්‍රතිපත්තිය 12 :*** දැනට පවත්නා සහ අලුතින් ආරම්භ කරන පාඨමාලාවලට බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාවේ ව්‍යාප්තියට සමගාමීව විශ්වවිද්‍යාලවල යටිතල පහසුකම් දියුණු කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- දැනට පවත්නා ඉඩකඩ සහ යටිතල පහසුකම් යාවත්කාලීන කර, පුළුල් කිරීම සඳහා අවශ්‍ය අරමුදල් වැඩි කිරීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය පියවර ගැනීම.
- උපාධි පාඨමාලාවල ගුණාත්මක බවට හානි සිදු නොවන පරිදි, විශ්වවිද්‍යාල මඟින් දැනට පවත්නා ඉඩකඩ සහ යටිතල පහසුකම් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම.
- දේශන ශාලා සහ පන්ති කාමර කාර්යක්ෂම ලෙස වෙන්කර දීම සඳහා මෘදුකාංග වර්ධනය කිරීම.

- යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා නව පියවර ගැනීමට පෙර සියලු අදාළ පාර්ශ්වයන්ගේ අදහස් විමසීම.

**පාඨමාලා නවීකරණයේ සහ අන්තර්පීඨ සහයෝගතාවයේ අවශ්‍යතාව**

***ප්‍රතිපත්ති කරුණ 13:***

වැඩ ලෝකය වෙනස් වෙද්දී, උසස් අධ්‍යාපනය සඳහා ඇති ඉල්ලුම වැඩි වී තිබෙන නමුදු, ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල එයට ප්‍රතිචාර දක්වන්නේ සෙමින්ය. බහු-විෂයීක සහ කුසලතා පාදක ප්‍රථම උපාධි පාඨමාලා හඳුන්වා දීම උදෙසා අන්තර්-පීඨ සහයෝගතාව ගොඩ නැගීමට විශ්වවිද්‍යාල අධ්‍යයන පීඨ දක්වන්නේ මැලිකමකි.

***ප්‍රතිපත්තිය 13 :*** සෑම පීඨයකම ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගේ රැකියා, වෘත්තීය සහ සෞන්දර්ය හැකියාවන් ශක්තිමත් කිරීමට තුඩු දෙන බහු - විෂයීක සහ මිශ්‍ර- විෂයීක පාඨමාලා ආරම්භ කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- දැනුම, කුසලතා සහ වටිනාකම් අතර සුදුසු සමබරතාවක් සහිතව තම ප්‍රථම උපාධි පාඨමාලා නවීකරණය කිරීමට විශ්වවිද්‍යාල විසින් කඩිනම් පියවර ගනු ලැබීම.

- පීඨාන්තර සහයෝගිතාවත්, කර්මාන්ත අංශයේ (Industry) සහභාගිත්වයත් අවශ්‍ය කරන ආකාරයේ නිර්මාණශීලී පාඨමාලා ආරම්භ කිරීම මඟින් සියලුම ප්‍රථම උපාධි අපේක්ෂකයින්ට ගැළපෙන සුදුසු වෘත්තීය කුසලතා ගොඩනැගීම සඳහා අවධානය යොමු කිරීමට රාජ්‍ය සහ රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල කටයුතු ආරම්භ කිරීම.

- ප්‍රථම උපාධි මෙන්ම පශ්චාද්-උපාධි අපේක්ෂකයින්ගේ ද වෘත්තීය කුසලතා අවශ්‍යතාවලට විශේෂයෙන් ආමන්ත්‍රණය කළ හැකි ආකාරයේ අන්තර්-විෂයීක සහ මිශ්‍ර-විෂයීක පාඨමාලා ආරම්භ කරනු සඳහා අන්තර්-පීඨ සහයෝගිතාව ගොඩ නැගීමට පියවර ගැනීම.

**පිට පළාත්වල පිහිටුවන පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන**

***ප්‍රතිපත්ති කරුණ 14 :***

උසස් අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබන ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගේ සංඛ්‍යාව දිගින් දිගටම වැඩි වුවත්, දැනට පවත්නා විශ්වවිද්‍යාල ව්‍යුහයට එම ඉල්ලීමට ප්‍රමාණවත් ලෙස ප්‍රතිචාර දැක්වීමට නොහැකිය. එබැවින්, සුදුසුකම් ලැබූ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් විශාල පිරිසකට උසස් අධ්‍යාපනය සඳහා අවස්ථා ලැබෙන්නේ නැත. මෙම තත්ත්වය ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අර්බුදයේ ඇති එක් ප්‍රධාන අංගයක් වන අතර, ඒ සඳහා ප්‍රතිපත්තිමය ප්‍රතිචාරයක් අප්‍රමාදව අවශ්‍යවේ.

***ප්‍රතිපත්තිය 14 :*** රාජ්‍ය-නොවන අංශයේ උසස් අධ්‍යාපන ආයතන පිට පළාත් වලට ද ව්‍යාප්ත කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය**

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ සහයෝගිතාවයෙන් විශ්වවිද්‍යාලවල මෙන්ම ව්‍යාපාරික ප්‍රජාවගෙන් අදහස් විමසා, ග්‍රාමීය පළාත්වල දරුවන්ට උසස් අධ්‍යාපනයට සහභාගි වීමේ අවකාශ පුළුල් කිරීම සඳහා මුලෝපායයක් සකස් කරන අතර තුර උසස් අධ්‍යාපනයට ඇතුල්වීමට ඇති අවකාශය, ගුණාත්මකභාවය සහ සමතාව පුළුල් කිරීම සහතික කළ යුතුය.

පාඨමාලා අයවර මාරු කිරීම (Credit Transfer)

*ප්‍රතිපත්ති කරුණ 15 :*

දැනට පවත්නා උසස් අධ්‍යාපන ක්‍රමය තුළ පවත්නා දැඩි ආයතනික අනම්‍යතාව නිසා, ආයතන අතර මාරුවීම සඳහා සිසුන්ට අවකාශ නොලැබේ. විද්‍යා, කලා, මානව ශාස්ත්‍ර, නීතිය සහ වාණිජ්‍යය ආදී වශයෙන් සිදු වන එකිනෙකින් දැඩි ලෙස වෙන් කර තබන සාම්ප්‍රදායික විෂයමාලා ක්‍රමය එහි සීමා ඉක්මවා යාමට සිසුන්ට ඉඩ නොතබමින්, ඔවුන්ගේ නිර්මාණශිලීත්වයට සහ අභිලාෂයන්ට බාධකයක්වී ඇත. රාජ්‍ය මෙන්ම රාජ්‍ය-නොවන උසස් අධ්‍යාපන ආයතනවල, අධ්‍යාපන අවස්ථා ලබා ගැනිමේ සංචලතාවක් හෝ පාඨමාලා අයවර මාරු කිරීමේ ක්‍රමවේදයක් හෝ පවතින්නේ ද නැත.

*ප්‍රතිපත්තිය 15:* උසස් අධ්‍යාපන ආයතන අතර සංචලතාව සඳහා සිසුන් උනන්දු කරවිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය**

- අන්තර්-පීය සහ අන්තර් විශ්වවිද්‍යාල පාඨමාලා අයවර මාරු කිරීමේ විධි ක්‍රමයක්, රාජ්‍ය සහ රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලවල අදහස් ද විමසා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සකස් කරනු ලැබීම.

**මෘදු කුසලතා**

*ප්‍රතිපත්ති කරුණ 16 :*

දැනුම ලබා ගැනීමේදී කුසලතා වර්ධනය කර ගැනීමේ අවකාශ සිසුන්ට නොලැබීම විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ අරමුණ සම්බන්ධව ඇති විවාදයේ පවත්නා ප්‍රධාන ප්‍රශ්නයකි. ඒ සඳහා යෝජනා වී ඇති විසඳුම වන්නේ මෘදු කුසලතා වර්ධනයයි. මේ අතර වෘත්තීක කුසලතා පුහුණුවක් සිසුන්ට නොලැබීම නිසා, එම උපාධි සුදුසුකම්වලට ගැළපෙන රැකියා ලබා ගැනීම සඳහා ඔවුන්ට ඇති අවකාශයන්ට බාධා පැමිණේ. මානව ශාස්ත්‍ර සහ සාමාජීය විද්‍යා පීඨවල මෙම අභියෝගය විශේෂයෙන්ම දක්නට ලැබේ.

*ප්‍රතිපත්තිය 16 :* උපාධි අපේක්ෂකයින්ගේ මෘදු කුසලතා ගොඩනැඟීම ඉලක්ක කරගෙන දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග, එම සිසුන්ගේ වෘත්තීක කුසලතා ද ගොඩ නැගීමේ වැඩ පිළිවෙළවල් සමඟ සම්බන්ධ කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- කර්මාන්ත අංශයේ අදහස් විමසා, විශ්වවිද්‍යාලවල විවිධ පීඨවල උපාධිධාරීන්ගේ අනාගත සේවා නියුක්තිය සඳහා අවශ්‍ය වෘත්තීක කුසලතා පුහුණුව අවශ්‍ය වන ක්ෂේත්‍ර කවරේදැයි හඳුනා ගැනීමට එම විශ්වවිද්‍යාල පීඨ පියවර ගැනීම.

- එවැනි වැඩසටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම සඳහා අන්තර්-පීඨ සහයෝගීතාවට පහසුකම් සැලසීම සඳහා වෘත්තීයමය කුසලතා පුහුණු ඒකකයක් සෑම විශ්වවිද්‍යාලයකම ආරම්භ කිරීම සහ එය ආරම්භයේදී උපකුලපතිවරයා/වරිය යටතේ පාලනය වීම.

**සිසුන් සඳහා තෘප්තිමත් ඉගෙනුම් පරිසර නිර්මාණය කිරීම.**

***ප්‍රතිපත්ති කරුණ 17 :***

තෘප්තිමත් ඉගෙනුම් පරිසරයක් මෙන් ම ඒ සඳහා හේතු වන නේවාසිකාගාර, පුස්තකාල, ඉගැන්වීමේ සහ ඉගෙන ගැනීමේ පහසුකම්, පොදු අධ්‍යයන කලාප, ක්‍රීඩාගාර, ආපනශාලා සහ සෞඛ්‍යය පහසුකම්, පිරිසිදුකම, සෞඛ්‍යය සහ සෞන්දර්යාත්මක ආකර්ශණය සහිත යටිතල පහසුකම්ද රහිත වූ විට, උසස් අධ්‍යාපනයට පිවිසීමට ඇති ප්‍රවේශ පුළුල් වීම සම්පූර්ණ වන්නේ නැත.

***ප්‍රතිපත්තිය 17:*** උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල ප්‍රජාව වඩා ඵලදායී ඉගෙනුම් පරිසරයක් රාජ්‍ය විශ්වවිද්‍යාල තුළ නිර්මාණය කිරීමට පියවර ගැනීම.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- රාජ්‍ය විශ්වවිද්‍යාලවල තෘප්තිමත් ඉගෙනුම් පරිසරයක් ගොඩ නගා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල ප්‍රජාව අතර සංවාදයක් ආරම්භ කිරීම, වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්, පීඨාධිපතිවරුන්, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය අනුශාසකවරුන් සහ ජ්‍යෙෂ්ඨ ආචාර්ය මණ්ඩලය සුදුසු පියවර ගැනීම.

- මනෝ සමාජීය උපදේශනය පිළිබඳ වෘත්තීය සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලයක්, ස්ථිර හෝ තාවකාලික පදනම් මත සැපයීම මඟින් ශිෂ්‍ය උපදේශන සේවය ශක්තිමත් කිරීම.

**බාහිර උපාධි පාඨමාලා**

***ප්‍රතිපත්ති කරුණ 18 :***

කලා, මානව ශාස්ත්‍ර, වාණිජ්‍යය සහ කළමනාකරණ, ජනමාධ්‍ය සහ සන්නිවේදනය. සහ තොරතුරු තාක්ෂණය, යන ක්ෂේත්‍රවල බාහිර උපාධි පාඨමලා මෑත කාලයේදී පුළුල් කරනු ලැබීම නිසා, විශ්වවිද්‍යාල අධ්‍යාපනයට ප්‍රවේශවීම පුළුල් වී තිබේ. එහෙත්, ඒ මඟින් නව පරස්පරතා ගණනාවක් බිහි කරනු ලැබ තිබේ. වැඩි වැඩියෙන් බඳවා ගනු ලබන අභ්‍යන්තර සහ බාහිර උපාධි අපේක්ෂකයින්ට ප්‍රමාණවත් මානව සම්පත් සහ යටිතල පහසුකම් නොමැති වීම, බාහිර උපාධි අපේක්ෂකයන්ට ලැබෙන දැනුමේ සහ පුහුණුවේ අඩු ගුණාත්මක බව, කුසලතා ගොඩ නගා ගැනීම සඳහා මෙන් ම විශ්වවිද්‍යාල පරිසරයට අනාවරණය වීමටද සිසුන්ට ලැබෙන සීමිත ඉඩ ප්‍රස්තා සහ රැකියා අවස්ථා නොලැබීම ඒ අතර ප්‍රධාන වේ.

*ප්‍රතිපත්තිය 18 :* බාහිර උපාධි පාඨමාලා සහ විවෘත දුරස්තර ඉගෙනීමේ මාධ්‍යය මාර්ගයෙන් 2010 වසරේ සිට ක්‍රියාත්මක කරනු ලබන දැනට තිබෙන බාහිර අධ්‍යයන පාඨමාලාවල ගුණාත්මකභාවය දියුණු කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- දැනට පවත්නා සියලු බාහිර උපාධි සහ විවෘත දුරස්ථ අධ්‍යයන පාඨමාලා, එම පාඨමාලාවලට සම්බන්ධ නැති සාමාජිකයන්ගෙන් සමන්විත කමිටුවක් මඟින්, බාහිර උපාධි පාඨමාලා සහ ව්‍යාප්ති පාඨමාලාවල තත්ත්ව සහතික කිරීමේ අත් පොතෙහි ඇති නිර්දේශවලට දැඩි ලෙස අනුකූලව විමර්ශනයට ලක් කිරීම.

- බාහිර සහ විවෘත-දුරස්ථ අධ්‍යයන පාඨමාලා පවත්වා ගෙන යන විශ්වවිද්‍යාල, එම පාඨමාලාවල ඉගැන්වීම සඳහා තම පශ්චාද්-උපාධි අපේක්ෂක සිසුන්ගේ සේවය අධ්‍යයන සහායක (Teaching Assistants) ක්‍රමයක් මත ලබා ගැනීම.

- බාහිර උපාධි අපේක්ෂකයින්, තමන් ගෙවන ගාස්තුවලට ප්‍රමාණවත් වන පරිදි ඉගෙනීමේ අවස්ථා, අභ්‍යාස පන්ති, ප්‍රායෝගික පුහුණුව, කුසලතා සහ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සමඟ ප්‍රමාණවත් අන්තර් ක්‍රියාකාරීත්වයක් ලබන බවට සහතික කිරීමට විශ්වවිද්‍යාල පියවර ගැනීම.

- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය දැනට යොදා ගන්නා දුරස්ථ අධ්‍යාපන විධික්‍රම බාහිර උපාධි පාඨමාලාවලට යොදා ගත හැකි දැයි විශ්වවිද්‍යාල විසින් සොයා බලා පියවර ගැනීම.

- දීර්ඝ කාලීන පියවරක් ලෙස, දැනට තිබෙන බාහිර අධ්‍යයන පාඨමාලා විශ්වවිද්‍යාලවලට සම්බන්ධ බාහිර විද්‍යාල (Colleges) ක්‍රමයක් බිහි කිරීම මඟින් වඩාත් ක්‍රමානුකූලව ආයතනගත කිරීම සහ ඒවා සඳහා විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩල සාමාජිකයින් පශ්චාද්-උපාධි අපේක්ෂකයන් සහ සුදුසුකම්ලත් බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීම.

# 4. පරිච්ඡේදය

## වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය

වෘත්තීය මාර්ගෝපදේශනයේ අරමුණ උපාධි අපේක්ෂකයින්ට, උපාධි ලබා ගැනීමෙන් පසුව රැකියාවක් ලබා ගැනීම සඳහා ආධාර කිරීමයි. දැනට පවත්නා උසස් අධ්‍යාපන ක්‍රමය යටතේ වෘත්තීය මාර්ගෝපදේශනය සහ වෘත්තීය උපදේශනය යන සංකල්ප යොදාගෙන තිබෙන්නේ, උපාධි අපේක්ෂකයින්ට අධ්‍යාපනය, පුහුණුව, වෘත්තීය සහ ජීවන මාර්ගයක් තෝරා ගැනීමට ආධාරවන තේමා සහ ක්‍රියාකාරකම් සැපයීම යන වඩාත් පුළුල් පර්යාලෝකයෙනි. ජීවිතය අවකාශවලත්, රැකියා වෙළඳ පොළෙත් ඇතිවිය හැකි වෙනස් වීම් නිසා, එය ජීවිතය පුරා දිවෙන ක්‍රියාවලියක් ලෙස සැලකේ.

ශ්‍රී ලංකාවේ වෘත්තීය මාර්ගෝපදේශනය සහ වෘත්තීය උපදේශනය සංකල්පගත කර තිබෙන්නේ බටහිර පර්යාලෝකනයට අනුවය. එබැවින් එම තේමා අප රටේ වාස්තවික තත්ත්වයට ගැළපීමේ අවශ්‍යතාව මතු වී තිබේ. මේ අතර, මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා විෂයයන්ගේ අන්තර්ගතය වැඩ ලෝකය සමග සම්බන්ධ කළ නොහැකිය යන මිථ්‍යාව ද විශ්වවිද්‍යාල අචාර්යවරුන් අතර තිබේ. වෘත්තීය මාර්ගෝපදේශනය සහ වෘත්තීය උපදේශන වැඩසටහන් පිළිබඳව ඔවුන් අතර වෙනස් අදහස් පවතින අතර, විශ්වවිද්‍යාලයේ එදිනෙදා කාර්ය සම්භාරය සමග ඒවා බද්ධකළ හැකි ද යන්න ගැන ඔවුහු සැක පළ කරති. එමෙන්ම, විශ්වවිද්‍යාලවල දැනට තිබෙන වෘත්තීය මාර්ගෝපදේශන සහ වෘත්තීය උපදේශන සේවා නිසිලෙස වෘත්තීයකරණයට හෝ ආයතනගත කිරීමකට හෝ භාජනය කර නැත.

විශ්වවිද්‍යාල උපාධිධාරීන් අතර පවත්නා සේවා වියුක්තිය, 1970 ගණන්වල පටන් උසස් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානයට යොමු වූ ප්‍රධාන තේමාවකි. මෑත කාලයේදී සිදුවී තිබෙන්නේ එම සාකච්ඡාව, විශ්වවිද්‍යාල අධ්‍යාපනය සහ රැකියා ඉඩ ප්‍රස්ථා අතර ඇති විෂමතාවය යන තේමාව යටතේ යළි මතු වීමයි. එය සන්දර්භ දෙකක් යටතේ සිදු වී තිබේ. ඒවා නම්, උගත් තරුණ තරුණියන්ට උසස් අධ්‍යාපනය අවකාශ වඩ වඩාත් විවෘත කිරීමේ අවශ්‍යතාව සහ රැකියා වෙළෙඳ පොළේ මතුවී තිබෙන නව ප්‍රවණතායි.

ශ්‍රී ලංකාවේ නිරීක්ෂණය කළ හැකි පරිදි, සෑම ක්ෂේත්‍රයකින්ම සහ සෑම විෂය ධාරාවකින්ම පැමිණෙන උපාධිධරයන්ට රාජ්‍ය අංශයේ රැකියා සපයන්නා වශයෙන් රාජ්‍යය සතු වූ කාර්ය භාරය දැන් දැඩි ලෙස සීමා වී තිබේ. එමෙන්ම විශ්වවිද්‍යාලවලින් පිටවෙන දිගින් දිගටම වර්ධනය වන උපාධිධාරීන්ගේ සංඛ්‍යාවට ප්‍රමාණවත් නව රැකියා අවකාශ නිර්මාණය කිරීම සඳහා පුද්ගලික අංශය සතුව තිබෙන්නේ මඳ හැකියාවකි. මේ අතර රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුල්වීමට අවකාශ නොලැබෙන උසස් පෙළ සමත් සිසු සිසුවියන් සඳහා වෙන් වූ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන සීඝ්‍රයෙන් පැතිරීම නිසා සිදු වන්නේ, සීමිත රැකියා වෙළෙඳ පොළ තුළ රාජ්‍ය විශ්වවිද්‍යාල උපාධිධාරීන් සමග තරග කරන නව උපාධිධාරීන් පිරිසක් බිහි කිරීම ආරම්භ කිරීමයි. ඒ සමගම, දේශීය සහ ජාත්‍යන්තර ශ්‍රම වෙළෙඳ පොළවල් මඟින් නව කුසලතා සඳහා ඉදිරිපත් වන ඉල්ලුම නිසා සිදු වී තිබෙන්නේ, විශ්වවිද්‍යාල වෙතින් ලැබෙන සාම්ප්‍රදායික දැනුම-කේන්ද්‍රීය අධ්‍යාපනය තවදුරටත් අවශ්‍ය නොවන තත්ත්වයකට පත් කිරීමයි.

මෙම අභියෝගවලට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල නව පියවර ගණනාවක් ආරම්භ කර තිබේ. මේ අනුව උපාංග තුනකින් සමන්විත නව ප්‍රතිපත්තිමය නැඹුරුවක් ගොඩනැගී ඇත. පළමුවැන්න, දේශීය සහ ජාත්‍යන්තර ශ්‍රම වෙළෙඳ පොළවල්හි රැකියා ලබා ගැනීමට උපාධිධාරීන්ට ඉඩ ප්‍රස්ථා සපයන අධ්‍යයන ක්ෂේත්‍ර සඳහා නව අධ්‍යයන පීඨ ආරම්භ කිරීමයි. දෙවැන්න, සෑම පීඨයකම

මෘදු කුසලතා පුහුණුව අධ්‍යයන පාඨමාලා සමග ඒකාබද්ධ කිරීමයි. තුන්වැන්න, උපාධි අපේක්ෂකයින්ට විශ්වවිද්‍යාල අධ්‍යාපනයේදී වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය සැපයීම ආරම්භ කිරීමයි.

දැනට රාජ්‍ය විශ්වවිද්‍යාලවල ක්‍රියාත්මක වන වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශන පාඨමාලා පහත සඳහන් සේවා සැපයීම අරමුණු කොට ක්‍රියාත්මක කරනු ලැබේ. (අ) තම වෘත්තීය කුමක්දැයි තෝරා ගැනීමටත් ඒ අනුව තම වෘත්තිය මාවත තීරණය කිරීමටත් උපාධි අපේක්ෂකයින්ට උදව් කිරීම (ආ) විශ්වවිද්‍යාල අධ්‍යාපනය සහ රැකියා ලබා ගැනීම අතර ඇති විෂමතාව වෙතින් පැන නැගී ඇති සමාජ ප්‍රශ්නයේ බරපතල බව ලිහිල් කිරීම අරමුණු කරගෙන, රැකියා ලබා ගත හැකි උපාධිධරයන් බිහි කිරීමට විශ්වවිද්‍යාලවලට සහාය වීම, සහ (ඇ) විශ්වවිද්‍යාල උපාධිධරයන් වැඩ ලෝකය සඳහා සූදානම් කිරීම, එම සේවාවන් වේ.

**වෘත්තීය මාර්ගෝපදේශනය සම්බන්ධ ප්‍රතිපත්තිය**

ලංකාවේ විශ්වවිද්‍යාලවල වෘත්තීය මාර්ගෝපදේශනය (Career Guidance) පිළිබඳව දැනට ඇති ප්‍රතිපත්තිය අවස්ථා දෙකකදී විකාශනය වී ඇත්තකි. එහි මුල් අවධියේදී වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා වූ අවශ්‍යතාවය ප්‍රකාශ කෙරෙනු ලැබුණේ, මූලික වශයෙන්ම, පාසැල් සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සහ උගත් තරුණ තරුණියන්ට ඇති රැකියා ඉඩප්‍රස්ථා අතර තිබූ විෂමතාවට ප්‍රතිචාර වශයෙනි. දෙවැනි අවධියේදී වෘත්තීය මාර්ගෝපදේශනය යළි සංකල්ප ගත කරනු ලැබුවේ, ආර්ථික ගෝලීයකරණය යටතේ ලෝක මට්ටමෙන් සිදු වූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ සන්දර්භය තුළය.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ වර්තමාන ප්‍රතිපත්තිමය උනන්දුව ආරම්භ වූයේ 1990 මැද භාගයේදීය. 1997 වසරේදී විශ්වවිද්‍යාල අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් විශ්වවිද්‍යාලවල වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ආරම්භ කරන ලෙස යෝජනා කරන ලදී. වෘත්තීය මාර්ගෝපදේශනයේ ප්‍රධාන අරමුණු වශයෙන් "රැකියාවලට සුදුසුකම් ලැබීම" යන්න පිළිගනිමින් මෙම යෝජනා වලින් අපේක්ෂා කරන ලද්දේ "රැකියා ඉඩ ප්‍රස්ථා වලට අදාළ කුසලතා උපාධිධාරීන් තුළ වර්ධනය කිරීම'' සඳහා විශ්වවිද්‍යාල විසින් පියවර ගනු ඇතැයි යන්නයි. මේ අනුව සකස් කරන ලද නව පියවරවලට පහත සඳහන් අංග ඇතුළත් විය. (අ) කුසලතා සංවර්ධනයට ගැළපෙන ලෙස ඉංග්‍රීසි, පරිගණක සහ සන්නිවේදනය යන ක්ෂේත්‍රවල පාඨමාලා දියුණු කිරීම (ආ) උපාධි අපේක්ෂකයින්ට හැකිතාක් දුරට පරිගණක පහසුකම් ලබා දීම, සහ (ඇ) සෑම විශ්වවිද්‍යාලයකම ශිෂ්‍ය සේවා මධ්‍යස්ථාන පිහිටුවීම.

එම වාර්තාවේ තවත් ප්‍රතිඵලයක් වූයේ විශ්වවිද්‍යාලවල වෘත්තීය මාර්ගෝපදේශන ඒකක පිහිටුවීමයි. පවත්නා රැකියා ඇබෑර්තු පිළිබඳ ලබා ගත හැකි තොරතුරු පදනම් කරගෙන සේවා නියුක්ති දත්ත බැංකු පවත්වාගෙන යාමට එක් එක් ඒකකයෙන් අපේක්ෂා කෙරිණි.

ඊට පසුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, වෘත්තීය මාර්ගෝපදේශන සේවා ආයතනගත කිරීමට පියවර ගන්නා ලදී. එය සිදු වූයේ 2003 පෙබරවාරි 06 දින අංක 819 දරන චක්‍රලේඛය සහ 2010 ඔක්තෝබර් 21 දින අංක 934 දරන චක්‍රලේඛය මඟිනි. 2003 අංක 819 දරන චක්‍රලේඛය මඟින් "වෘත්තීය උපදේශනය, තොරතුරු සේවා, ජාලගත කිරීම්, වැඩ පුහුණුව, උපාධිධාරීන්ට රැකියා සොයා දීම, සහ රැකියා සමඟ සම්බන්ධ කිරීම'' යන අදාළ ක්ෂේත්‍රවල වැඩ කටයුතු ආරම්භ කරන ලෙසත්, "වෘත්තීය උපදේශන කමිටු" වැනි යාන්ත්‍රණයන්ට පාර්ශ්වකරුවන් සහභාගි කර ගන්නා ලෙසත් උපකුලපතිවරුන්ට උපදෙස් දෙන ලදී. තොරතුරු සේවාවේම කොටසක් වශයෙන් සිසුන් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත ගබඩා පවත්වාගෙන යන ලෙසත්, ස්වයං-රැකියා සහ ව්‍යවසායික කටයුතු සඳහා සහාය ලබා දෙන ලෙසත් විශ්වවිද්‍යාලවලට තවදුරටත් උපදෙස් දෙනු ලැබිණි.

විශ්වවිද්‍යාලවල වෘත්තීය මාර්ගෝපදේශන සේවා නිල වශයෙන් පිළිගැනීමෙත්, ඒවායේ තත්ත්වය ස්ථාවර කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීමත් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග රාමුවක් යෝජනා කිරීමත් නිසා 2010 අංක 934 දරන චක්‍රලේඛයද වැදගත් වේ. උපකුලපතිවරුන්ගේ සභාපතිත්වය යටතේ සහ ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය ප්‍රජාව, සේවායෝජක පක්ෂයේ සහ කර්මාන්ත අංශයේ පාර්ශ්වකරුවන්ගේ නියෝජනයද සහිතව වෘත්තීය මාර්ගෝපදේශන උපදේශක සේවා පිහිටුවීමට එම චක්‍රලේඛනයෙන් තවදුරටත් නිර්දේශ කෙරිණ.

මෙම චක්‍රලේඛයෙන් පසුව, තවත් වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාලවලට තවදුරටත් උපදෙස් දුන්නේය. එම යෝජිත වැඩසටහන්වලට (අ) වෘත්තීය උපදේශනය, (ආ) වෘත්තීය තොරතුරු සේවා (ඇ) ජාලගත කිරීම් (ඈ) කර්මාන්ත අංශයට අනුයුක්ත කිරීම මඟින් වැඩ පුහුණුව (ඉ) වෘත්තීය මාර්ගෝපදේශනය ප්‍රථම උපාධි පාඨමාලා සමඟ ඒකාග්‍ර කිරීම යන මේවා අයත් විය.

සියලු විශ්වවිද්‍යාලවල වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු සම්බන්ධීකරණය සහ අධීක්ෂණය කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි වෘත්තීය මාර්ගෝපදේශන ස්ථාවර කමිටුවක් ද ස්ථාපනය කරන ලදී.

**දැනට පවත්නා තත්ත්වය**

- වෘත්තීමය නැඹුරුතාවක් සහිත පාඨමාලා උගන්වන වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, කෘෂිකර්මය සහ ව්‍යාපාර කළමනාකරණය සහ කළමනාකරණ අධ්‍යයනය වැනි පීඨවල වෘත්තීය උපදේශන සහ මෘදු කුසලතා පාඨමාලා පොදු පාඨමාලාවලට බද්ධ කර තිබේ.

- විද්‍යා සහ මෑත කාලයේදී පිහිටුවා ඇති තාක්ෂණ විද්‍යා පීඨවල, වෘත්තීය මාර්ගෝපදේශනයට ලබා දී තිබෙන්නේ වෛද්‍ය සහ ඉංජිනේරු පීඨවලට වඩා අඩු අවධාරණයකි.

- බොහෝ අධ්‍යයන පීඨවල නිරීක්ෂණය කළ හැකි ප්‍රධානතම දුර්වලතාව නම් වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය මෙන්ම මෘදු කුසලතා පුහුණුව ද අඩුවෙන් ප්‍රයෝජනයට ගැනීම සහ වෘත්තීමය වශයෙන් පුහුණුව ලැබූ කාර්ය මණ්ඩලය සහ ප්‍රමාණවත් තරම් සම්පත් ප්‍රමාණයක් නොමැතිවීම යන කරුණයි. රැකියා ලබා ගත හැකි "කර්මාන්ත අංශය" (Industry) කුමක්දැයි නිශ්චිතව පැහැදිලි නොවීම, බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ යෑම, සහ දේශීය පුද්ගලික අංශයේ රැකියා නිර්මාණය පිළිබඳ ඇති අවිනිශ්චිතතාව යන සාධක ද මෙම තත්ත්වයට තුඩු දී ඇත.

- වෘත්තීය මාර්ගෝපදේශනය සහ කුසලතා පුහුණුව අඩුවෙන් ම වර්ධනය වී සහ පාඨමාලා සමඟ අඩුවෙන්ම බද්ධවී තිබෙන්නේ කලා, මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨවලය. මෙම තත්ත්වයට තුඩු දී ඇති සාධක කිහිපයකි. ඒවා නම්,

    (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2010 වසරේ අංක 934 දරන චක්‍රලේඛය තිබියදීත්, කලා, මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨවල අවශ්‍යතාවන්ට සේවය කිරීම සඳහා පුහුණුව, සම්පත් මෙන්ම පුහුණු කාර්ය මණ්ඩලයක් ද නොමැති නිසා කිසිදු විශ්වවිද්‍යාලයක් තවමත් වෘත්තීය මාර්ගෝපදේශන ඒකක නිසි පරිදි ආයතන ගත කර නැත.

(ආ) මෙම පීඨවල බොහෝ ආචාර්යවරුන්ට වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ කටයුතු පිළිබඳව ඇත්තේ මඳ උනන්දුවකි.

(ඇ) විශ්වවිද්‍යාලවල සිටින විශාල ශිෂ්‍ය ප්‍රජා සංඛ්‍යාවෙන් වෘත්තීය උපදේශන ඒකකයේ වැඩ සටහන්වලට සහභාගි වන්නේ ඉතා අල්ප ප්‍රමාණයකි. එයද සිදු වන්නේ උපාධි පාඨමාලාවේ අවසාන වසරේදීය.

(ඈ) පැහැදිලිව හඳුනා ගත හැකි "කර්මාන්ත අංශයක් (Industry) කලා, මානව ශාස්ත්‍ර සහ සාමාජීය විද්‍යා පීඨවලට නොතිබීම, එම පීඨවල උපාධි අපේක්ෂකයින්ට සිමාවාසික පුහුණුව, කර්මාන්ත පුහුණුව සහ අනාගත සේවාදායකයින් හඳුනා ගැනීම සඳහා ඇති ප්‍රධාන බාධකයකි. මෙම තත්ත්වය තරමක් හෝ වෙනස්ව තිබෙන්නේ ආර්ථික විද්‍යා සහ ජන සන්නිවේදනය වැනි දෙපාර්තමේන්තුවලය.

(ඉ) උපාධි අපේක්ෂක සිසුන්ට වෘත්තීය පුහුණුව ලබා දීමට ප්‍රමාණවත් ලෙස දියුණු වූ කර්මාන්ත අංශයක් නොතිබීම පළාත්බද විශ්වවිද්‍යාලවල සියලු පීඨවල සිසුන් මුහුණ දෙන බැරෑරුම් අභියෝගයකි.

(ඊ) කලා, මානව ශාස්ත්‍ර සහ සාමාජීය විද්‍යා පීඨවල සිටින උපාධි අපේක්ෂකයින්ගේ බහුතරය සහ නාගරික පෞද්ගලික අංශයේ සමාගම් අතර ඇති සමාජීය සහ සංස්කෘතික පරතරය, එම සිසුන් සහ ව්‍යාපාරික ප්‍රජාව අතර හමුවීමකට ඇති ප්‍රධානතම බාධකයකි.

**වෘත්තීය මාර්ගෝපදේශනය සහ බාහිර උපාධිධාරීන්**

කලා, මානව ශාස්ත්‍ර, වාණිජ්‍යය සහ කළමනාකරණ, තොරතුරු තාක්ෂණය, මාධ්‍යය සහ සන්නිවේදනය යන ක්ෂේත්‍රවල බාහිර උපාධි අපේක්ෂකයින් විශාල සංඛ්‍යාවක් බඳවා ගැනීම, ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයෙහි මෑත කාලයේ ඇති වී තිබෙන ව්‍යාප්තියේ එක් පැතිකඩකි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දත්තවලට අනුව, 2017 වසරේදී සිසු සිසුවියෝ 17,553 දෙනෙකු බාහිර උපාධි පාඨමාලාවලට ලියාපදිංචි වී සිටියහ. ඔවුන් අතුරින් 11,659 දෙනෙකු කලා උපාධි සඳහාත්, 2915 දෙනෙකු කළමනාකරණ උපාධි සඳහාත්, 2046ක් තොරතුරු තාක්ෂණය සඳහාත්, 719ක් වාණිජ්‍යය උපාධි සඳහාත්, 106 දෙනෙකු කෘෂිකර්මය සඳහාත්, 108 දෙනෙකු විද්‍යාව සඳහාත් ලියාපදිංචිව සිටියහ.

ප්‍රතිපත්ති සම්පාදකයින් අතර නිරන්තර සාකච්ඡාවට භාජනයවී තිබෙන උපාධිධාරීන්ගේ රැකියා වියුක්තිය පිළිබඳ ගැටලුව බාහිර උපාධිධාරීන්ගේ ප්‍රමාණය වැඩි වීමත් සමඟ අර්ධ වශයෙන් සම්බන්ධවී තිබේ.

උපාධිධාරීන්ට රැකියා ලබාගැනීමට නොහැකි වීමේ අභියෝගයට ආමන්ත්‍රණය කිරීමට දැනට ගනු ලැබෙන ප්‍රතිපත්තිවල ප්‍රධාන අඩු පාඩුවක් වන්නේ, බාහිර උපාධි අපේක්ෂකයන් වෙනුවෙන් කැප වූ වෘත්තීය මාර්ගෝපදේශන සහ කුසලතා පුහුණු වැඩසටහන් නොතිබීමයි.

උපාධිධාරීන්ට රැකියා ලබා ගැනීමට හැකි තත්ත්වයක් ඇති කිරීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශන සේවා බාහිර උපාධි අපේක්ෂකයන්ට ද ලබා දීමට නම්, සම්පූර්ණයෙන්ම අලුත් ප්‍රවේශයක් අවශ්‍ය වේ.

**පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල වෘත්තීය මාර්ගෝපදේශනය**

පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල පවා වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය පවතින්නේ මුලාරම්භක අවධියකය. පුහුණු කාර්ය මණ්ඩල ද, ප්‍රමාණවත් සම්පත් ද සහිතව එම සේවාවන් ආයතනගත කිරීම යන අරමුණ තවමත් පවතින්නේ සංකල්පගත කිරීම හා සැලසුම් කිරීමේ අවධියේය. වෘත්තීය මාර්ගෝපදේශනය ආරම්භ කර ඇති ආයතනවල පවා, එය පොදුවේ පවතින ශිෂ්‍ය සුභසාධන සේවාවේම තවත් එක් කොටසක් පමණි.

පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල වෘත්තීය මාර්ගෝපදේශනය මූලික වශයෙන්ම සකස් වී සහ සීමාවී තිබෙන්නේ, සීමාවාසි පුහුණු අවස්ථා (Internships), කාර්මික සහ සේවාස්ථ පුහුණුව, වෘත්තීය මාර්ග පිළිබඳ කෙටි පාඨමාලා, පෞරුෂ වර්ධනය, ජීව දත්ත සැකසීම පුහුණු කිරීම, සම්මුඛ පරීක්ෂණවලට මුහුණ දීමට පුහුණු කිරීම, සිසුන් සහ පුද්ගලික අංශයේ නියෝජිතයින් අතර මුණ ගැසීම් සහ අන්තර් සම්බන්ධතා සුදානම් කිරීම, සහ රැකියා පොළ සහ සම්බන්ධතා ජාල තුළින් සිසුන් දේශීය මෙන්ම ජාත්‍යන්තර මට්ටමේ අනාගත රැකියා සපයන්නන් හා සම්බන්ධ කිරීම යන සේවා වලටය.

වෘත්තීය උපදේශනය (Career Counselling)

වෘත්තීය උපදේශනය යනු, දැනට විශ්වවිද්‍යාල පිහිටුවා තිබෙන වෘත්තීය මාර්ගෝපදේශන ඒකකවලින් අපේක්ෂා කෙරෙන සුවිශේෂ සේවාවකි. එය වෘත්තීය මාර්ගෝපදේශනයෙන් (Career Guidance) වෙනස් වුවත්, එයට ඌණ පූරක සේවාවක් ද වෙයි. වෘත්තීය මාර්ගෝපදේශනයෙන් සිදු කෙරෙන්නේ රැකියා වෙළෙඳ පොළ පිළිබඳ ලබා ගන්නා තොරතුරු මඟින් තමන්ගේ කුසලතා සහ මනාපය මත රැකියාවක් තෝරා ගැනීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහාය වීම වන අතර, වෘත්තීය උපදේශනය යනු ඊට මඳක් වෙනස්ව, සිසුන් සමඟ පවත්වන දීර්ඝ කාලීන සම්බන්ධතාවකි. වෘත්තීයක් පිළිබඳ තම අපේක්ෂා සහ සිදු කර ඇති තෝරා ගැනීම් පිළිබඳ තොරතුරු පදනම් කර ගත් වෙනස්කම් සිදු කිරීමට ඒ මඟින් සිසුන්ට හැකියාව ලැබේ. වෘත්තීය උපදේශනයට දෙමව්පියන්, ගුරුවරුන් සහ අනෙකුත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද සම්බන්ධ විය හැකි අතර එය වෘත්තීය මාර්ගෝපදේශනයට ද සම්බන්ධය. එබැවින්, වෘත්තීය උපදේශනය යනු, වෘත්තීය මාර්ගෝපදේශනය සහ වෘත්තීය උපදේශනය යන දෙඅංශයෙන්ම පුහුණුව ලැබූ විශේෂඥ වෘත්තිකයන්ගේ සහභාගිත්වය අවශ්‍යවන සේවාවකි.

එසේ වුවත්, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල ඇති වෘත්තීය මාර්ගෝපදේශන ඒකකවල වෘත්තීය මාර්ගෝපදේශනය, වෘත්තීය උපදේශනය සමඟ සම්බන්ධ කර නැත. සමහර අවස්ථාවලදී තමන් සතු කැපවීම නිසාම සහ පැහැර හැරිය නොහැකි අවශ්‍යතාවක් ඉටු කිරීමක් ලෙස, වෘත්තීය මාර්ගෝපදේශන ඒකකවල අධ්‍යක්ෂකවරු, වෘත්තීය උපදේශනයෙහි ද යෙදෙති. ඒ අතර, වෘත්තීය මාර්ගෝපදේශන ක්‍රියාවලියේදී වෘත්තීය උපදේශන සේවයෙහි ඇති අදාළතා ගැන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවත්, විශ්වවිද්‍යාලත් තවමත් බැරෑරුම් සිතා බැලීමක් සිදු කර නැත. ඔවුන්ගේ සාමාන්‍ය ප්‍රවේශය වී තිබෙන්නේ එම සේවාවන් දෙක අවිධිමත් ලෙස සම්බන්ධ කිරීමයි.

**වෘත්තීය මාර්ගෝපදේශනය සහ වෘත්තීය උපදේශනය සඳහා ප්‍රතිපත්ති යෝජනා**

**වෘත්තීය මාර්ගෝපදේශනය සහ වෘත්තීය උපදේශනය**

***ප්‍රතිපත්ති කරුණ 19 :***

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල දැනට වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක වන්නේ, රැකියා සඳහා අවශ්‍ය කුසලතා සහිත උපාධිධරයන්ට රැකියා වෙළෙඳපොළට පහසුවෙන් ඇතුල්වීමට හැකිය යන

උපකල්පනය මතය. ඊට වෙනස්ව ඇති යථාර්ථය නම්, රාජ්‍ය අංශයේ රැකියා අවකාශ ක්‍රමානුකූලව අඩුවීම සහ පුද්ගලික අංශයේ රැකියා සීමා වීමයි. මේ අතර, රැකියා වෙළෙඳ පොළට අලුතෙන් එකතුවන උපාධිධරයන්ගේ සංඛ්‍යාව සීඝ්‍රයෙන් වැඩි වෙමින් තිබේ. එබැවින්, උපාධිධාරීන්ට රැකියා සොයා ගැනීමට උදව් කරනවාට වඩා, තම වෘත්තීය මාර්ග සහ අනාගතය ගැන නිසි තීරණ ගැනීමට උපාධි අපේක්ෂකයින්ට උදව් කරන්නාවූත්, අනාගත වෘත්තියක් සඳහා ඔවුන් සූදානම් කරන්නාවූත් අංග සම්පූර්ණ වෘත්තීය සේවා සැපයීමේ ක්‍රමයක් පරිකල්පනය කිරීම අවශ්‍ය වී තිබේ.

*ප්‍රතිපත්තිය 19:* තම අධ්‍යාපනය, වෘත්තීය සහ ජීවිතය පිළිබඳ තීරණ ගැනීමට හැකිවන පරිදි මිස, උපාධිය ලැබීමෙන් පසු රැකියාවක් ලබා ගැනීමට පමණක් සීමා නොකරන වෘත්තීය මාර්ගෝපදේශනය සහ වෘත්තීය උපදේශනය මාර්ගයෙන් විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සවිබල ගැන්විය යුතුය.

*ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග*

- වෘත්තීය මාර්ගෝපදේශනය සහ වෘත්තීය සැලසුම් කිරීමේ වැඩසටහන් එකට සම්බන්ධව සංකල්පගත කර හඳුන්වා දී ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි විශ්වවිද්‍යාල අචාර්යවරුන්ට වෘත්තීය උපදේශනය සහ වෘත්තීය සැලසුම්කරණය පිළිබඳ පුහුණුවක් ලබා දීම.

- විශ්වවිද්‍යාලවල වෘත්තීය මාර්ගෝපදේශන සහ වෘත්තීය උපදේශන සේවා ආයතනගත කිරීම.

විධික්‍රමවල අදාළබව

*ප්‍රතිපත්ති කරුණ 20 :*

වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ බටහිර ප්‍රවේශ සහ විධි ක්‍රම ලංකාවට යොදා ගැනීම, රටෙහි පවත්නා සුවිශේෂී සංස්කෘතික, සමාජ-ආර්ථික තත්ත්වයන්ගෙන් සමන්විත දේශීය සන්දර්භයට නොගැළපෙන්නට පුළුවන. එමෙන්ම, දැනට යොදා ගන්නා ඇගැයීම් මෙවලම් දේශීය තත්ත්වයන්ට අදාළ නැත. ඒ සමඟම වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පිළිබඳව ඇති ප්‍රවේශය සංශෝධනය කරන්නැයි, සමහර ශ්‍රී ලාංකික විද්වතුන්ගෙන් හඬක් ද මතු වී තිබේ.

*ප්‍රතිපත්තිය 20:* ශ්‍රී ලංකාවේ සංස්කෘතික සහ සමාජ-ආර්ථික සන්දර්භයටත්, සමාජ යථාර්ථයටත් ගැළපෙන වෘත්තීය මාර්ගෝපදේශන සහ වෘත්තීය උපදේශන ක්‍රම හඳුන්වා දිය යුතුය.

*ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග*

- ශිෂ්‍ය ශිෂ්‍යයාවන්ගේ අභිලාෂ, හැකියා සහ නැඹුරුතා දේශීය, අදාළත්වයට අනුකූලවීම පිණිස දේශිය සමාජ, සංස්කෘතික සහ සමාජ-පංති යථාර්ථයන්ට සංවේදී නව මෙවළම් යොදා ගැනීම.

- ශ්‍රී ලංකාවේ සංස්කෘතිය, සමාජ සන්දර්භය සහ රැකියා වෙළෙඳ පොළෙහි වෙස්වන යථාර්ථයන්ට ගැළපෙන වෘත්තීය මාර්ගෝපදේශන සහ වෘත්තීය උපදේශන සඳහා නව මාදිලීන් සකස් කිරීම.

වෘත්තීය මාර්ගෝපදේශනය ආයතනගත කිරීම

***ප්‍රතිපත්ති කරුණ - 21 :***

වෘත්තීය උපදේශනය සහ වෘත්තීය මාර්ගෝපදේශනය කළ යුතු වන්නේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමග සමීප සම්බන්ධතාවක් පවත්වන වෘත්තීය උපදේශකයින් විසිනි. එසේ වුවත් වෘත්තීය උපදේශන ඒකකවල බොහෝ අධ්‍යක්ෂකවරුන් සහ කාර්ය මණ්ඩලය තම සේවය ඉටු කරන්නේ විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන රැකියා කරන අතරය. වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය ආයතනගත කිරීමේ ක්ෂණික වැදගත්කම, තවමත් වගකිව යුතු බලධාරීන්ට ප්‍රත්‍යක්ෂ වී නැත.

*ප්‍රතිපත්තිය 21 :* විශ්වවිද්‍යාලවල දැනට තිබෙන වෘත්තීය මාර්ගෝපදේශන සහ වෘත්තීය උපදේශන සේවය ශක්තිමත් කිරීම සඳහා එය ආයතනගත කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 934 වැනි චක්‍රලේඛය නව සැලැස්මක් ප්‍රකාශයට පත්වන පරිදි සංශෝධනය කරමින්, විශ්වවිද්‍යාලවල දැනට තිබෙන වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන සේවාව නිසි පරිදි ආයතනගත කිරීම.

- දැනට විශ්වවිද්‍යාලවල තිබෙන වෘත්තීය මාර්ගෝපදේශන ඒකක වෙනුවට වෘත්තීය මාර්ගෝපදේශන සහ වෘත්තීය උපදේශන මධ්‍යස්ථාන (Centres for Career Guidacne and Career Counselling) පිහිටුවීම.

- වෘත්තීය මාර්ගෝපදේශන සහ වෘත්තීය උපදේශන මධ්‍යස්ථානවලට (CCGCC) පූර්ණ කාලීන අධ්‍යක්ෂක සහ කාර්ය මණ්ඩල ධූර ඇති කිරීම.

- වෘත්තික උපදේශකයින් පත් කිරීම.

- එම මධ්‍යස්ථාන මූල්‍ය වශයෙන් ස්ථාවර කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සැපයීම.

වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ වෘත්තීක පුහුණුව

***ප්‍රතිපත්ති කරුණ 22 :***

වෘත්තීය මාර්ගෝපදේශන ඒකකවල කාර්ය මණ්ඩලය දැනට වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය කාර්යයට ක්‍රමානුකූලව අනාවරණයවී නැති අතර, ඔවුහු ඒ සඳහා අවශ්‍ය කුසලතා පිළිබඳ ප්‍රමාණවත් වෘත්තික පුහුණුවක් ලැබූ අයද නොවෙති. එබැවින් ශ්‍රී ලංකාවේ වෘත්තීය උපදේශකයින් වෘත්තිකමය වශයෙන් පුහුණු කිරීමේ ක්ෂණික අවශ්‍යතාවක් පවතී.

***ප්‍රතිපත්තිය 22 :*** වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලයට, තම වගකීම් නිසි ලෙස ඉටු කිරීමට ආධාර වන පරිදි වෘත්තීය පුහුණුව (Professional Training) ලබා දිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන කාර්ය මණ්ඩලයට වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව (Professional Education and Training) ලබා දීම සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල පශ්චාද්-උපාධි පාඨමාලා ආරම්භ කිරීම.

- මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලයට, විදේශ විශ්වවිද්‍යාල සමඟ සහයෝගීතාවයෙන් විදේශ වෘත්තික පුහුණුව සඳහා ඉඩ ප්‍රස්ථා ලබා දීම.

**දැනට තිබෙන වැඩසටහන් යාවත්කාලීන කිරීම**

***ප්‍රතිපත්ති කරුණ 23 :***

පසුගිය දශක තුන පුරාම ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල ක්‍රියාත්මක වන වෘත්තීය මාර්ගෝපදේශන වැඩ සටහන් සකස් වී තිබෙන්නේ සීමිත න්‍යාය පත්‍රයක් වටාය. එය නිසි ඇගයීමකට පාත්‍ර කිරීමෙන් පසුව වර්ධනයකට හෝ යාවත්කාලීන කිරීමකට හෝ භාජනය කර නැත.

***ප්‍රතිපත්තිය 23 :*** විශ්වවිද්‍යාල දැනට ඒවායේ තිබෙන වෘත්තීය මාර්ගෝපදේශන සහ වෘත්තීය උපදේශන වැඩසටහන්, වර්තමාන අවශ්‍යතා සහ පැන නැගෙන නව ප්‍රවණතාවලට ආමන්ත්‍රණය කළ හැකි පරිදි යාවත්කාලීන සහ ශක්තිමත් කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල දැනට ක්‍රියාත්මක වන වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් හවුලේ සිදු කරන සමාලෝචනයකට භාජනය කිරීම.

- ඒ සඳහා ප්‍රමාණවත් අරමුදල් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් සැපයීම.

**විද්වතුන් අතර ඇති විවිධ අදහස් ප්‍රතිසන්ධානය කිරීම (සන්ධානගත කිරීම)**

***ප්‍රතිපත්ති කරුණ 24 :***

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල මෙතෙක් කල් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්වලට අත්පත් කර ගැනීමට හැකි වී තිබෙන්නේ සීමිත සාර්ථකත්වයකි. වෘත්තීය මාර්ගෝපදේශනයේ අවශ්‍යතාවට පොදු පිළිගැනීමක් ලැබී ඇතත්, තෝරා ගෙන ඇති කුසලතා සහ ශ්‍රම වෙළෙඳ පොළේ අවශ්‍යතාවන්ට පිටතින් ඒවායේ ඇති යෝග්‍යතාව ගැන මතභේද පවතී. කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහන් නිසා විෂය දැනුමේ වැදගත්කම අඩු විය හැකිය යන සැකය, කලා, මානව ශාස්ත්‍ර සහ සාමාජීය විද්‍යා පීඨවල ආචාර්යවරුන් අතර මතු වී තිබේ. කුසලතා වර්ධනය හා සම්බන්ධ පාඨමාලා තම පීඨවල උපාධි පාඨමාලා සමඟ බද්ධ කිරීමට ද ඔවුහු මැලිකම් දක්වති. කලා, මානව ශාස්ත්‍ර සහ සාමාජීය විද්‍යා පාඨමාලාවල ශාස්ත්‍රීය අන්තර්ගතය, රැකියා වෙළෙඳපොළේ අවශ්‍යතා සමඟ සම්බන්ධ කළ නොහැකි යයි ද ඔවුහු සිතති.

***ප්‍රතිපත්තිය 24 :*** විශ්වවිද්‍යාලවල ක්‍රියාත්මක කෙරෙන වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන වැඩ සටහන් සම්බන්ධව ආචාර්යවරුන් අතර පවතින වෙනස් සහ විසම්මුතික අදහස් සමඟ සන්ධානගතව කටයුතු කිරීමට විශ්වවිද්‍යාල උත්සාහ දැරිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- වෘත්තීය මාර්ගෝපදේශනය සහ කුසලතා පුහුණුව සම්බන්ධව වෙනස් ඉදිරි දර්ශන සහ ප්‍රවේශවල ද නියෝජනය ඇති වන පරිදි සෑම විශ්වවිද්‍යාලයකම වෘත්තීය මාර්ගෝපදේශන උපදේශක සභා (Career Guidance and Counselling Advisory Boards) පිහිටුවීම.

- ක්‍රියාත්මක කරන වැඩසටහන් සහ වැඩ කටයුතු උපදේශක සභාවේ උපදෙස් මත සම්බන්ධීකරණය කිරීම සහ එමඟින් වැඩසටහන්වලට පුළුල් පරාසයක අදහස්, දැනීම් සහ යෝජනාවලින් ශක්තිමත් වීමට ඉඩසැලසීම.

- විශ්වවිද්‍යාල අධිකාරීන් සහ වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ විසම්මුතික අදහස් ඇති ආචාර්යවරුන් අතර සාකච්ඡා සංවිධානය කිරීම.

- වෘත්තීය මාර්ගෝපදේශන සහ වෘත්තීය උපදේශන වැඩසටහන් ශාස්ත්‍රීය පාඨමාලා සමඟ බද්ධ කිරීම.

**පරිපූර්ණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

***ප්‍රතිපත්ති කරුණ 25 :***

පෞද්ගලික අංශයේ වඩා හොඳ රැකියා අවකාශ සහිතව තරුණ උපාධිධාරීන් දේශීය පෞද්ගලික විශ්වවිද්‍යාලවලින් සහ උසස් අධ්‍යාපන ආයතනවලින් පිටවෙන බැවින් රාජ්‍ය විශ්වවිද්‍යාල කළ යුත්තේ වෘත්තීය මාර්ගෝපදේශනය, වෘත්තීය උපදේශනය, මෘදු කුසලතා පුහුණුව සහ උපාධි අපේක්ෂකයින් රාජ්‍ය සහ පෞද්ගලික අංශ යන දෙකෙහිම රැකියාවලට සුදානම් කිරීම යන මේවා අවධාරණය කිරීමයි. එබැවින් දැනට වෘත්තීය මාර්ගෝපදේශන ඒකකවල ක්‍රියාත්මක වන අවම වැඩසටහන් ඉක්මවා ගිය අංගසම්පූර්ණ වැඩසටහන්වල අවශ්‍යතාව මතු කෙරේ. උපාධි අපේක්ෂකයින්ට මෘදු කුසලතා සමඟ වෘත්තීය කුසලතා ගැන පුහුණුව සැපයීම සඳහා රාජ්‍ය සහ පුද්ගලික අංශවල සහයෝගීතා ප්‍රයත්න වැඩි වැඩියෙන් අවශ්‍ය වී තිබේ.

***ප්‍රතිපත්තිය 25 :*** විශ්වවිද්‍යාලවල සිටින සියලුම සිසුන්ට විවෘත වන විවිධ රැකියා ක්ෂේත්‍රවලට අවශ්‍ය වන්නා වූ ඔවුන්ගේ හැකියා වෘත්තීය වර්ධනය (Professional Development) ඉලක්ක කර ගත් වැඩසටහන් හඳුන්වා දිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන සභා පුද්ගලික අංශය, අධ්‍යයන පීඨ සහ අධ්‍යයන දෙපාර්තමේන්තු සමඟ සහයෝගයෙන් වෘත්තීය කුසලතා පුහුණු (Professional Skills Development) වැඩසටහනක් ද ක්‍රියාත්මක කිරීම.

- එම සභා අදාළ වෘත්තීය කුසලතා වර්ධන (Professional Skills Development) අන්තර්ගතය ද වෘත්තීය මාර්ගෝපදේශන පුහුණු වැඩසටහන්වලට බද්ධ කිරීම සම්බන්ධව අදාළ පීඨ සහ දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා ඇරඹීම.

- විශ්වවිද්‍යාලවල අධ්‍යයන දෙපාර්තමේන්තු ද තම උපාධි අපේක්ෂක පාඨමාලාවලට වෘත්තික කුසලතා අංශ හඳුන්වා දීම ගැන වෘත්තීය මාර්ගෝපදේශන සහ වෘත්තීය උපදේශන සභා සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම.

**විශ්වවිද්‍යාල මට්ටමේ ඉගැන්වීමේ විධික්‍රම පරිවර්තනයට ලක් කිරීම**

***ප්‍රතිපත්ති කරුණ 26 :***

කලා, මානව ශාස්ත්‍ර සහ සාමාජීය විද්‍යා පාඨමාලා, ව්‍යාපාරික ලෝකය සමග සම්බන්ධ කළ නොහැකිය යන මිථ්‍යාවක් සමහර දෙනා අතර පවතී. එයට හේතුව පැන නගින්නේ උගන්වන පාඨමාලාවලින් නොව, භාවිත කරන ඉගැන්වීමේ විධික්‍රමය වෙතිනි. දනට විශ්වවිද්‍යාලවල භාවිත වන ඉගැන්වීමේ විධික්‍රමය එක් එක් විෂය දනුම කේන්ද්‍ර කොට ගත් සහ ගුරුවරයා මත රඳා පවතින්නකි. පන්තියේ ක්‍රියාකාරකම් සැලසුම් කෙරෙන්නේ සම්පූර්ණයෙන්ම ගුරුවරයා/වරිය විසිනි. බොහෝ විට සිදුවන දෙය නම් ගුරුවරයා/වරිය සාම්ප්‍රදායික ලෙස ඉගැන්වීමත්, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහභාගී නොවීමත්ය. කථිකාචාර්යවරුන් අනුගමනය කරන්නේ ළමා අධ්‍යාපන මූලධර්ම (Principles of Pedagogy) ය. ඒවා සුදුසු වන්නේ කුඩා දරුවන්ට ඉගැන්විමේදීය.

එහෙත්, විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයෝ වැඩිහිටියෝ වෙති. ඉගෙනීමේ ක්‍රියාවලියේදී ස්වාධීන වීමටත්, තම අත්දැකීම් ඉගෙනීමේ ක්‍රියාවලියට යොදා ගැනීමටත් ඔවුන් කැමතිය. ඔවුහු ක්‍රියාකාරකම්වලට යොමු වුවෝ වෙති. එමෙන්ම ගැටලු විසඳීමේ ක්‍රියාකාරකම්වලට සක්‍රීයව සහභාගි වීමට ද ඔවුන් කැමතිය. තම ජීවිතයට ප්‍රයෝජනවත් දේ ඉගෙන ගැනීමට ද ඔවුහු උනන්දුව දක්වති. එබැවින් විශ්වවිද්‍යාල මට්ටමෙන් ලබා දෙන ශාස්ත්‍රීය අධ්‍යාපනයේදී වැඩිහිටියන්ගේ සුවිශේෂතා ගැන අවධානය යොමු කළ යුතුවේ. වැඩිහිටියන් ඉගෙන ගන්නේ කෙසේද සහ ඉගෙන ගැනීමට වැඩිහිටියන්ට පහසුකම් සලසන්නේ කෙසේ ද යන්න පැහැදිලි කරන්නේ වැඩිහිටි ශික්ෂණ විද්‍යාව (Androgogy) මඟිනි. එබැවින් වැඩිහිටි ශික්ෂණ විද්‍යා විධි ක්‍රමය මාර්ගයෙන් විෂයයන් ඉගැන්වීම මඟින් උපාධි අපේක්ෂකයින්ගේ කුසලතා වර්ධනය වඩා සාර්ථකව කළ හැකි වනු ඇත.

***ප්‍රතිපත්තිය 26 :*** විශ්වවිද්‍යාල මට්ටමේ ඇති ඉගැන්වීමේ විධික්‍රමය ළමා ශික්ෂණ විද්‍යාවේ (Pedagogy) සිට වැඩිහිටි ශික්ෂණ විද්‍යාව (Androgogy) කරා මාරු කළ යුතුය.

**ක්‍රියාත්මක කිරිමේ උපාය මාර්ග**

- කාර්ය මණ්ඩල සංවර්ධන කේන්ද්‍රස්ථාන (Staff Development Centres) මඟින් ආචාර්ය මණ්ඩලයට ප්‍රායෝගික පැත්තට නැඹුරු වූ වැඩිහිටි ශික්ෂණ විද්‍යා පාඨමාලා ඉගැන්වීම. ඒවා වැඩි වශයෙන් ලබා දිය යුත්තේ, කලා, මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨවල ආචාර්යවරුන් සඳහා ය. වැඩිහිටි අධ්‍යාපන ක්‍රම මඟින් තම සිසුන් තුළ කුසලතා වර්ධනය කිරීමේ පාඨමාලා හඳුන්වා දීමට එවිට ඔවුන්ට හැකිවනු ඇත.

- නිරීක්ෂණය, දත්ත රැස් කිරීම, සමාජ ගැටලු හඳුනා ගැනීම, සමාජීය මට්ටමෙන් දත්ත එකතු කර, විශ්ලේෂණය කර ඒ මඟින් සමාජ ප්‍රශ්නවලට විසඳුම් යෝජනා කිරීම වැනි කුසලතා කලා, මානව ශාස්ත්‍ර සහ සාමාජීය විද්‍යා පාඨමාලාව මඟින් සිසුන් තුළ ගොඩ නැඟීම.

**බාහිර උපාධි අපේක්ෂකයින්ගේ කුසලතා ගොඩ නැගීම**

***ප්‍රතිපත්ති කරුණ 27:***

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය ව්‍යාප්ත වීමේ එක් ප්‍රධාන පැතිකඩක් වන්නේ විශාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාවක් බාහිර උපාධි සඳහා බඳවා ගැනීමයි. එහෙත් උපාධිධාරීන්ට රැකියා ලබා ගත නොහැකි වීමේ අභියෝගය ජය ගැනීමට දැනට ගෙන ඇති ප්‍රයත්නවල ප්‍රධාන අඩුපාඩුවක් වන්නේ, වෘත්තීය මාර්ගෝපදේශන සහ පුහුණු වැඩසටහන් බාහිර උපාධි අපේක්ෂකයන්ට විවෘත නොවීමයි.

***ප්‍රතිපත්ති*** *27 :* බාහිර සහ දුරස්ථ අධ්‍යයන උපාධි පාඨමාලාවන් තුළ වෘත්තීය සහ රැකියා ලබා ගැනීමට තුඩු දෙන කුසලතා ලබා දෙන පුහුණුව අන්තර්ගත විය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- වෘත්තීය සහ රැකියා ලබා ගැනීමට තුඩු දෙන කුසලතා ඇතුළත් වන ලෙස බාහිර සහ දුරස්ථ අධ්‍යයනය පාඨමාලා සංශෝධනය කිරීම.

- බාහිර සහ දුරස්ථ උපාධි අපේක්ෂකයින්ට ඉගැන්වීමේදී වැඩිහිටි ශික්ෂණ විද්‍යා ප්‍රවේශ භාවිතා කිරීමට ආචාර්ය මණ්ඩලය පුහුණු කිරීම.

- විශ්වවිද්‍යාල බාහිර සහ දුරස්ථ අධ්‍යාපන පාඨමාලාවල සිසුන්ට සිය වෘත්තීක සංවර්ධනයට (Professional Development) අදාළ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම.

## 5 වැනි පරිච්ඡේදය

### ශිෂ්‍ය සුභසාධනය සහ විනය

ශිෂ්‍ය සුභසාධනය සහ විනය ලංකාවේ විශ්වවිද්‍යාල ජීවිතය සමඟ ළඟින් ම බැඳී තිබෙන තේමා දෙකකි.

**සුභසාධනය**

ශිෂ්‍ය සුභසාධනය පිළිබඳ ගැටලු ලංකාවේ සමාජ සුභසාධනය, නිදහස් අධ්‍යාපනය සහ ඒවායේ බිඳ වැටීම සමඟ පවතින්නේ සමීප සම්බන්ධතාවකි.

ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අධ්‍යයන ගාස්තු වශයෙන් දරන්නට සිදු වන්නේ අවම වියදමකි. අධ්‍යාපනයට ඉහළ වියදමක් ද ඉහළ මූල්‍ය වටිනාකමක් ද ඇති වෛද්‍ය සහ ඉංජිනේරු පීඨවල සිසුන්ට පවා ඇත්තේ අවම පාඨමාලා ගාස්තුය. බොහෝ ශිෂ්‍යයින්ට ශිෂ්‍යාධාර සහ මහපොළ ශිෂ්‍යත්ව වශයෙන් මූල්‍ය ආධාර ලැබේ. සහන මිළ ගණන්වලට ලබා දෙන නේවාසිකාගාර සහ විශ්වවිද්‍යාලවල ආපනශාලා මගින් ආහාරපානද ඔවුන්ට සැපයේ. පොදු වශයෙන් පහළ මට්ටමක පවතින උපාධි අපේක්ෂකයින්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට තරම් සේවයක් එම නේවාසිකාගාර සහ ආපනශාලාවල ඇති දුර්වල පරිසරය, පිරිසිදුභාවය සහ සෞඛ්‍ය සම්පන්න තත්ත්වයෙන් නම් සැපයෙන්නේ නැත. ඒවා සාමාන්‍යයෙන් පවතින්නේ ඉතා පහළ ගුණාත්මක තත්ත්වයකය.

නැගී එන ජීවන වියදම පිළිබඳ පසුබිම තුළ තම මහපොළ ශිෂ්‍යත්ව වාරිකය වැඩි කරන ලෙස ද සිසුන්ගේ ඉල්ලීමක් මතු වී තිබේ. මේ අතර ආපනශාලා සහ නේවාසිකාගාරවල තත්ත්වය දියුණු කිරීම විශ්වවිද්‍යාල සිසුන්ගේ නිරන්තර ඉල්ලීමකි.

දැනට විශ්වවිද්‍යාලවල ක්‍රියාත්මක වන ශිෂ්‍ය සුභසාධන රාමුව වෙනස් කර ශිෂ්‍ය ණය ක්‍රමයක් ඒ වෙනුවට හඳුන්වා දීමේ ප්‍රතිපත්ති යෝජනාවක් ඉඳහිට මතු වුවත්, රාජ්‍ය විශ්වවිද්‍යාලවලට වෙළෙඳ පොළ විසින් මෙහෙයවනු ලබන සුභසාධන ක්‍රමයක් හඳුන්වා දීමට ආණ්ඩු දක්වා ඇත්තේ මැළිකමකි. රාජ්‍ය විශ්වවිද්‍යාලවල පවත්නා එම සාම්ප්‍රදායික සුභසාධන රාමුවෙන් ඉවතට යාමෙන් ආණ්ඩු වැළැක්වීමට ප්‍රධාන හේතුවක් වී තිබෙන්නේ සිසුන්ගෙන්, ආචාර්යවරුන්ගෙන් මෙන්ම දේශපාලන පක්ෂවලින් ද නිරන්තරයෙන් එල්ල වන විරෝධයයි.

දැනට තිබෙන මෙම අවම සුභසාධනවාදී රාමුව ද පවතින්නේ අර්බුදයකය. සෑම විශ්වවිද්‍යාලයකට ම ගුණාත්මක වශයෙන් ප්‍රමාණවත් ජීවන මට්ටමක් සහිත වාතාවරණයක් සපයා දීමට නොහැකි වීම එයට හේතුවයි. ශිෂ්‍යන් බඳවා ගැනීමේත්, අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාවන්ගේත් ඇති වන නිරන්තර සහ සීඝ්‍ර ව්‍යාප්තිය නිසා සිදු වී තිබෙන්නේ, නූතන විශ්වවිද්‍යාලවලින් අපේක්ෂා කරන උසස් ජීවන මට්ටමක් සහතික කිරීමට ප්‍රමාණවත්වන භෞතික සහ සමාජ වාතාවරණයක් පවත්වාගෙන යන ලෙස විශ්වවිද්‍යාලවල දැනට තිබෙන සීමිත හැකියාවට විශාල අභියෝගයක් එල්ල වීමයි. නිවාස, නේවාසිකාගාර, රසායානාගර, ආපනශාලා සහ භෝජනශාලා, සෞඛ්‍යය, පිරිසිදු වටපිටාව සහ ප්‍රවාහනය යනාදී දැනට පවත්නා යටිතල පහසුකම් වෙත ද එල්ල වෙන බලපෑම අතිමහත්ය.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල ශිෂ්‍ය සුභසාධනය පිළිබඳ සමස්ත තත්ත්වයේ දුර්වලවීමට තුඩු දී ඇති තවත් ප්‍රධාන හේතුවක් වන්නේ, ශිෂ්‍ය කණ්ඩායම් අතර පවතින ප්‍රචණ්ඩත්වය සහ නවක වදයයි.

මෙපරිදි, ශිෂ්‍ය නේවාසිකාගාර අලුතෙන් ගොඩ නැගීමටත්, පන්ති කාමර සහ අනෙකුත් භෞතික පහසුකම් වැඩි දියුණු කිරීමටත්, මෑත කාලයේ දී වැඩි වියදමක් දරා තිබියදීත්, ශිෂ්‍ය සුභසාධනය

සම්බන්ධයෙන් කාලයක් තිස්සේ එකතු වී උත්සන්න වූ අර්බුදයකට ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අද මුහුණ පා සිටිති. රාජ්‍ය විශ්වවිද්‍යාල සකස් වී ඇති සාම්ප්‍රදායික මාදිලියට විකල්ප සොයන ලෙස ගෝලීය මෙන්ම දේශීය සාර්ව-ආර්ථික යථාර්ථයන් විසින් ආණ්ඩුවලට බල කෙරෙමින් තිබියදී ශිෂ්‍ය උද්ඝෝෂණවල අරමුණ වී තිබෙන්නේ, දැනට පවත්නා අවම සහ තවදුරටත් පරිහානියට යන සුභසාධන මට්ටම් ආරක්ෂා කර ගැනීමයි.

**අවිනය සහ ප්‍රචණ්ඩත්වය**

ශිෂ්‍ය විනය පිළිබඳ කරුණ, ශ්‍රී ලංකාවේ  උසස් අධ්‍යාපනය සම්බන්ධ ප්‍රතිපත්තිමය විවාදවල නිරන්තවම මතුවන ගැටලුවකි. පෞද්ගලික, සාමාජීය, දේශපාලන සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී ආදී ලෙස උපාධි අපේක්ෂකයින් අතර විවිධ ස්වරූපවලින් ප්‍රකාශ වන ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට සහ නතර කිරීමට අධිකාරීන් ගෙන ඇති පියවර මූලික වශයෙන් සාර්ථක වී නැත. නවක වදය නතර කරන නීති, ඒ පිළිබඳ අවබෝධය වර්ධනය කිරීමේ වැඩසටහන් මෙන්ම ශිෂ්‍යයන්ගේ සමාජ විරෝධී චර්යාව ප්‍රසිද්ධියේ විවේචනයට සහ ලැජ්ජාවට පාත්‍ර කිරීම තුළින් ඇතිකරන මහජන විවේචනය ද එම පියවර අතර තිබේ. නෛතික ක්‍රියාමාර්ග ගැනීමේ සහ ප්‍රසිද්ධියේ ලැජ්ජාවට පත් කිරීමේ ප්‍රවේශ විශ්වවිද්‍යාලවල නවක වදය තුරන් කිරීමට තුඩු දී නැත.

මේ අතර, සංවිධානය වූ ශිෂ්‍ය කණ්ඩායම්වල පුරුද්ද වී තිබෙන්නේ විශ්වවිද්‍යාල යනු රටේ නීතිය ක්‍රියාත්මක විය යුතු නැති හුදෙකලා දූපත් බව කියා පෑමයි. එම ආකල්පය "විශ්වවිද්‍යාල උපසංස්කෘතිය" යයි එම සිසුන්ම හඳුන්වා ගන්නා සංස්කෘතියක කොටසකි.

ප්‍රචණ්ඩ ගැටුම් සහ විශ්වවිද්‍යාල අධිකාරීන්ගේ බලය ගැන කිසිදු හැඟීමක් දක්වන්නේ නැති ප්‍රචණ්ඩ නවක වදය මාධ්‍ය කොටගෙන නිතර සිදුවන ශිෂ්‍ය විනය බිඳ වැටීම නිසා මෙම ප්‍රචණ්ඩත්වයට නව බලපෑම් සිදුකර තිබේ. එහෙත්, ප්‍රචණ්ඩත්වයේ සංස්කෘතිය විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින්ගේ ජීවිතය සමඟ කොතරම් දැඩිව බද්ධ වී ඇත්ද යත්, විශ්වවිද්‍යාල සමාජ සාමයේ සහ සන්සුන් බවේ අවකාශ බවට පරිවර්තනය කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයන් යහපත් සිතින් ගෙන ඇති සියලු පියවර ඒ මඟින් නිශේධ වී තිබේ.

**ප්‍රවණතා**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවල ශිෂ්‍ය විනය සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳව නිරීක්ෂණය කළ හැකි සමකාලීන ප්‍රවණතා කිහිපයක් මෙසේ ය.

- රටේ පොදුවේ ඇති වී තිබෙන ප්‍රචණ්ඩ ක්‍රියාවල අඩු වීමට සමගාමීව, ප්‍රචණ්ඩ දේශපාලන ක්‍රියාවන්ට ශිෂ්‍යයන්ගේ සහභාගීත්වය ද අඩු වී තිබේ.
- විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් අතර ඇති ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රවණතාවයෙහි ධාරා තුනක් පැවත තිබේ. ඉන් පළමුවැන්න ශිෂ්‍ය කණ්ඩායම් සහ සමහර විට මැර කණ්ඩායම් අතර සිදුවන ප්‍රචණ්ඩ ගැටුම් ය. දෙවැන්න නවක වදය සමයේදී නවක සිසුන්ට එරෙහිව ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයින් මුදාහරින ප්‍රචණ්ඩත්වයයි. තුන්වැන්න නවක වදයේ දී මෙන්ම සාමාන්‍ය කාල වලදී ද සිදුවන, එහෙත්  සිදුවෙතැයි පිළිගැනීමට තවමත් ලක් වී නැති, ස්ත්‍රීන්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වයයි.
- සිසුන්ගේ බහුතරය, විශ්වවිද්‍යාලයේ සිදුවන කවර ආකාරයක හෝ ප්‍රචණ්ඩ ක්‍රියා අනුමත කරන්නේ නැත. තර්ජනය, හිංසනය, සමාජමය කොන් කිරීම සහ ආන්තිකකරණය වැනි නරක ප්‍රතිඵල ඇතිවීමට ඇති බිය නිසා බොහෝ සිසුන් එම ප්‍රචණ්ඩත්වය ගැන විවේචන කිරීමට, එරෙහි වීමට හෝ එයට එරෙහිව මතයක් ගොඩ නැඟීමට හෝ ඉදිරිපත් වන්නේ නැත. ශිෂ්‍යයන් නවක වදයට විරුද්ධ වූ හෝ එරෙහිව ක්‍රියා කළ හෝ අවස්ථා සුළු ප්‍රමාණයකදී සිදුව

ඇත්තේ ඔවුන්ට, ශාරීරික හානි සිදුවන තරමටම, ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨ සගයින් විසින් ඔවුන්ට දැඩි දඬුවම් කරනු ලැබීමයි.

- ශිෂ්‍යයන්ගේ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව විශ්වවිද්‍යාල බලධාරීන්ට තිබෙන්නේ ලිහිල් පාලනයකි. ප්‍රචණ්ඩ ක්‍රියාවල යෙදෙන ශිෂ්‍යයෝ සාමාන්‍යයෙන් විශ්වවිද්‍යාල බලධාරීන් නොසලකා හරිති. එමෙන්ම, අවිනය සහ ප්‍රචණ්ඩත්වය පාලනය කිරීම අරමුණු කොටගෙන පනවා ඇති නීති සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, විශ්වවිද්‍යාල බලධාරීන්ට දුෂ්කරය.

- ප්‍රචණ්ඩ ක්‍රියාවලට සම්බන්ධ වන සිසුන්ට එරෙහිව විශ්වවිද්‍යාල බලධාරීන් විනයානුකූලව ගෙන ඇති ක්‍රියාමාර්ග පවා නිෂ්ඵල වී තිබේ. එයට හේතුව, එසේ දඬුවම් කිරීම, තවදුරටත් දේශපාලන වාසි ලබා ගැනීමටත්, විශ්වවිද්‍යාල බලධාරීන්ට විරුද්ධව අනෙකුත් ශිෂ්‍යයින් මෙහෙයවීමටත් සංවිධානය වූ ශිෂ්‍ය කණ්ඩායම් සමත් වීමයි. මනාලෙස සංවිධානය වී සිටින ශිෂ්‍ය කණ්ඩායම් සමඟ විවෘත ගැටුම්වලට යාම වළක්වනු පිණිස ඇති විනය පියවර ගැනීමේදී ද විශ්වවිද්‍යාල බලධාරීහු ප්‍රවේශම් වෙති.

නවක වදය

දැනට රාජ්‍ය විශ්වවිද්‍යාල සිසුන් සම්බන්ධ වන වඩාත් ප්‍රචලිත හා පුළුල්ව ක්‍රියාත්මක වන ප්‍රචණ්ඩ ක්‍රියා මාදිලිය නම් නවක වදයයි. පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල සිසුන් නවක වදයේ යෙදෙන බවට වාර්තා නැත. රාජ්‍ය විශ්වවිද්‍යාලවල නවක වදය පවතින්නේ පශ්චාද්-උපාධි හෝ ඩිප්ලෝමා අපේක්ෂකයින් අතර නොව, ප්‍රථම උපාධි අපේක්ෂකයින් අතර ය.

නවක වදයේ යෙදෙන සිසුන් එය සාධාරණීකරණය කරන්නේ, නවක වදය යනු සමාජීය සහ සංස්කෘතික අවශ්‍යතාවකැයි කියා පාමිනි. විවිධ සමාජ හා සංස්කෘතික පසුබිම්වල සිට විශ්වවිද්‍යාලයට ඇතුළු වන නවක ශිෂ්‍ය ශිෂ්‍යාවන්, "විශ්වවිද්‍යාලවල සමානාත්මතා උප සංස්කෘතියට" හුරු කළ යුතුය යන විශ්වාසයකුත්, මතවාදයකුත් විශ්වවිද්‍යාලවල තිබේ. සමාජ වෙනස්කම් වෙතින් පැන නගින ආකල්ප සහ හැසිරීම් රටාවන් වෙනස් කිරීම අරමුණු කර ගත් මෙම "නැවත හුරු කිරීම" සාමාන්‍යයෙන් සිදු වන්නේ ශාරීරික සහ වාචික හිරිහැර සහ අපහාස කිරීම, තර්ජනයට, නින්දාවට, ලැජ්ජාවට, සහ හිංසනයට ලක් කිරිම වැනි හීලෑ කිරීමේ සහ පාලනය කිරීමේ යාන්ත්‍රණ ජාලයක් තුළිනි. දේශපාලන වශයෙන් මතවාදී ලෙස දිනා ගැනීම ද මෙම ක්‍රියාවලියේ තිබෙන අනිවාර්ය අංගයකි.

නවක වදය ලංකාවේ විශ්වවිද්‍යාලවල ඇරඹී තිබෙන්නේ, ලංකා විශ්වවිද්‍යාලය පිහිටවූ මුල් කාලයේදී ආරම්භන චාරිත්‍රයක් (Initiation Ritual) ලෙස ය. දැනට සිදු වන පරිදි එය කිසිසේත් ආරම්භන චාරිත්‍රයක් නම් නොවේ. නවක වදය, පරිණාමය තුළ සිදු වී තිබෙන්නේ දේශපාලනික, ආයතනික සහ සංස්කෘතික මූලයන් ද ගති ලක්ෂණ ද සහිත ප්‍රචණ්ඩ ස්වරූප අත්පත් කර ගැනීමයි. දේශපාලන කණ්ඩායම් එය යොදා ගන්නේ දේශපාලන වශයෙන් අන්‍යයින් නතුකර ගැනීමේ, පාලනය කිරීමේ සහ ආධිපත්‍යය පවත්වා ගැනීමේ මෙවලමක් ලෙසිනි.

මහජනතාව අවබෝධ කරගෙන සිටින පරිදි, නවක වදය නමැති සංසිද්ධිය පවතින්නේ මන්දැයි පැහැදිලි කිරීමේ ප්‍රධාන උපකල්පන දෙකක් තිබේ. ඉන් පළමු වැන්නෙන් නවක වදය තුළින් ප්‍රකාශ වන ප්‍රචණ්ඩ චර්යාව පැහැදිලි කෙරෙන්නේ, ග්‍රාමීය සහ ආර්ථික වශයෙන් දුගී මෙන්ම වරප්‍රසාද රහිත සමාජ පසුබිම්වලින් එන පිරිමි ශිෂ්‍යයන් අත්විඳින විහීනතා (අහිමිවීම්) සහ අසාධාරණකම් පිළිබඳ කරුණට අවධානය යොමු කරමිනි. දෙවැනි උපකල්පනයට අනුව, කලා සහ මානව ශාස්ත්‍ර පීඨවල සිසුන්, රැකියා සොයා ගැනීමට සහ ඉහළ සමාජ සංචලනයට අවකාශ නොමැති විම නිසා තම අනාගතය පිළිබඳ අවිනිශ්චිතතාව වෙතින් බිහිවෙන අපේක්ෂාභංගත්වය හේතුකොට ගෙන, එම සිසුන් තමන්ගේම සගයන්ට ප්‍රචණ්ඩව සැළකීමේ තත්ත්වයට පත්වී ඇත.

කෙසේ වුවත්, මෙම උපකල්පන නිවැරදි ඒවා ලෙස සැලකිය නොහැකිය. නවක වද සංස්කෘතිය ඇරඹුණේ, නිර්-ප්‍රභූ සමාජ පසුබිම්වලින් එන සිසුන්ට විශ්වවිද්‍යාලවල දොර විවෘත වන්නට බොහෝ කලකට පෙරය. නවක වදය සෑම අධ්‍යයන පීඨයකමත්, සෑම සමාජ පසුබිමකින්ම එන සිසුන් අතරත් සිදුවේ.

එනමුත්, සිසුන්ගේ අනන්‍යතාව සහ සමාජ තත්ත්වය විසින් ඉටු කරනු ලබන වැඩ කොටස වශයෙන් දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයක් නවක වදයේ තිබේ. එනම්, නවක වදය සිදු වන්නේ පන්ති සහ ජනවාර්ගික වශයෙන් පැහැදිලිවම තීරණය කරන ලද සීමාවන් ඇතුළතය. සමාජ-ආර්ථික වශයෙන් ඉහළ තලයේ පවුල් පසුබිම්වලින් එන සිසුන්, දුප්පත් සහ ග්‍රාමීය පසුබිම්වලින් එන සිසුන් නවක වදයට භාජනය කරන්නේ නැත. සමාජ පන්ති-වෙනස්කම් මත පදනම් වූ ප්‍රතිචාර ඇතිවීම වැළැක්වීම එහි අරමුණයි. එමෙන්ම එක් ජනවර්ගයකට අයත් සිසුන් වෙනත් ජනවාර්ගික කණ්ඩායමකට අයත් සිසුන්ව නවක වදයට ලක් කරන්නේ ද නැත. ජනවාර්ගික සීමා ඉක්මවමින් නවක වදය නොපැවැත්වීමේ අප්‍රකාශිත සහ හැසිරීම් රටා පිළිබඳ එකඟතාව එයට හේතුවයි.

ප්‍රභූ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාසල් අධ්‍යාපනය ලැබූ ධනවත් සමාජ සහ පවුල් පසුබිම්වලින් එන ශිෂ්‍ය කණ්ඩායම් අතර නවක වදය සම්බන්ධව ඇති ආකල්පය මිශ්‍ර එකකි. ඔවුන්ගෙන් බොහෝ දෙනා නවක වදය පිළිකුල් ලෙස හෙළා දකින අතර, එයට විරුද්ධව ප්‍රසිද්ධියේම අදහස් දක්වති. එම පසුබිමෙන් එන සිසුන් කිහිප දෙනෙකු පමණක් තම කනිෂ්ඨ සගයින් කෲර නොවූ නවක වදයට ලක් කිරීමට ඉඩ තිබේ. එහෙත් මෙම සිසුන් විශ්වවිද්‍යාලය තුළ හැසිරෙන්නේ ළඟින් එකට බැඳුණු කණ්ඩායමක් ලෙසය. වෙනස් සමාජ පසුබිම්වලින් පැමිණෙන සිසුන් බහුතරයෙන් සංස්කෘතික සහ සමාජමය වශයෙන් තමන් වෙන් වන බව ඒ මඟින් ඔවුහු හඟවා සිටිති.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල වසර ගණනාවක් තිස්සේ පවත්නා නවක වදයේ රටාව දෙස බලන විට පැහැදිලි වන කරුණක් නම් එය පිරිමි උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් අතර පවත්නා පුරුෂ ආධිපත්‍යය සමඟ ළඟින්ම බැඳී පවත්නා භාවිතයක්ය යන්නයි. රීතියක් පරිද්දෙන් නවක වදය සාමාන්‍යයෙන් මාස තුනක් හෝ ඊට දිගු කාලයක් පුරා පවත්නා අභිචාර විධිමය ක්‍රියා ගණනාවකින් සමන්විත වන ක්‍රියාදාමයකි. එය සැලසුම්කර තිබෙන්නේ කනිෂ්ඨ සහ වයසෙන් බාල පිරිමි ශිෂ්‍ය කණ්ඩායම් මත ජ්‍යෙෂ්ඨ පිරිමි ශිෂ්‍යයන්ගේ අධිකාරබලය, ආධිපත්‍යය සහ ධූරාවලිය පිහිටුවීම ඉලක්ක කොට ගෙනය. ශිෂ්‍යාවන් මත පිරිමි සිසුන්ගේ පුරුෂ බලය පිහිටුවීම ද මෙම කණ්ඩායම් ගතිකත්වයේ ප්‍රධාන ප්‍රේරණයක් මෙන්ම ප්‍රතිඵලයක් ලෙසින් ද දැකිය හැකිය.

සමහර විශ්වවිද්‍යාලවල නවක වදය සංවිධානය වී තිබෙන ආකාරය සම්බන්ධයෙන් සිදු වී තිබෙන මෑත කාලීන වර්ධනයක් නම්, විශ්වවිද්‍යාලයෙන් පිටත දේශපාලන ව්‍යාපාර සමඟ කිට්ටු සම්බන්ධතා පවත්නා දේශපාලන ක්‍රියාකාරකයින් ද වන ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන්, නවක වදය සම්බන්ධයෙන් පවත්වාගෙන යන බලපෑමයි. ඒ අනුව නවක වදය මෙම බාහිර දේශපාලන කණ්ඩායම පවත්වාගෙන යන සම්පූර්ණ පාලනය සමඟ ළඟින්ම සම්බන්ධ වී තිබේ. නවක වදය ශිෂ්‍යයන් සහ ශිෂ්‍යයාවන් යන දෙපාර්ශවයම සහිත ශිෂ්‍ය ප්‍රජාව මත මෙම දේශපාලන කණ්ඩායම පවත්වාගෙන යන මතවාදී වශයෙන් හරවා ගැනීමේත්, පාලනය කිරීමේත් යාන්ත්‍රණයකි.

**දේශපාලන බලපෑම සහ පාලනය**

නවක වදය දේශපාලන වශයෙන් පාලනය කරනු ලැබීම විසින් විශ්වවිද්‍යාලවල සිදුවන ප්‍රචණ්ඩත්වය සහ අවිනයට සංකීර්ණ ස්වරූපයක් ලබාදී තිබේ.

නවක වදය දේශපාලනීකරණයට පාත්‍ර කිරීමේ එක් ප්‍රතිඵලයක් වී තිබෙන්නේ, ඉහත සඳහන් කර ඇති ''විශ්වවිද්‍යාල උප සංස්කෘතිය" යන සංකල්පය මඟින්, නවක වදය පිළිබඳව ඉදිරිපත් කර ඇති ව්‍යාජ

සාධාරණීකරණයයි. මෙම "න්‍යාය" ඉදිරිපත් කරන අයගේ තර්කය වන්නේ වෙනස් සමාජ සහ සංස්කෘතික පසුබිම්වලින් පැමිණෙන සිසුන්ට විශ්වවිද්‍යාල උපසංස්කෘතියේ තිබෙන සමානාත්මතාවාදී වටිනාකම්, චර්යා ධර්ම, සහ භාවිතයන් හඳුන්වාදීම අවශ්‍ය වන බවයි. ඇඳුම, හිස කෙස් විලාසය, සහ පාවහන් පැළඳීම යනාදිය සම්බන්ධ නීතිරීති මාලාවක් පැනවීම, පුස්තකාල සහ ක්‍රීඩා පහසුකම් පාවිච්චි කිරීම මෙන්ම ආචාර්යවරුන්, පරිපාලකයින් සහ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය ශිෂ්‍යයාවන් සමඟ සම්බන්ධතා පැවැත්වීම තහනම් කිරීම, එදිනෙදා සන්නිවේදනයේදී භාෂාව භාවිතය පිළිබඳ සීමා පැනවීම සහ පුද්ගලික හැසිරීම මඟින් පුද්ගලික හෝ පවුලේ සමෘද්ධිමත් බව ප්‍රදර්ශනය කිරීම තහනම් කිරීම යන මේවා, ඉහත කී "උප සංස්කෘතියේ" ප්‍රධාන අංගයක් වන ඒකාකාර, සජාතීය සහ "සමානාත්මතා" සංස්කෘතියක් බිහි කිරීමේ මාධ්‍ය ලෙස සැලකේ.

**සිසුන් සහ විශ්වවිද්‍යාල පාලනය**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුව, ශිෂ්‍ය සුභසාධනය සහ විශ්වවිද්‍යාල ජීවිතයට සම්බන්ධ වීම යන කරුණු සම්බන්ධව සහභාගි වීමට සිසුන්ට අවසර දී තිබේ. එසේ වුවත්, විශ්වවිද්‍යාල ශිෂ්‍ය දේශපාලනය අවුරුදු ගණනාවක් තිස්සේ විකාශනය වී ඇති ආකාරයේ පසුබිම තුළ, ශිෂ්‍ය නියෝජනය වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී සහ නියෝජනාත්මක කිරීම සඳහා, පනතේ අදාළ වගන්ති සංශෝධනය කළ යුතුව තිබේ. දැනට පවත්නා "ජයග්‍රාහකයාට සියල්ල ලැබීමේ" ඡන්ද ක්‍රමය නිසා සිදු වන්නේ, දේශපාලන වශයෙන් අධිපති ශිෂ්‍ය කණ්ඩායමට, ශිෂ්‍ය සභා නියෝජනයේ ඒකාධිකාරය හිමි වීමයි. ඒ මඟින් ශිෂ්‍ය නියෝජනය තුළ තිබිය යුතු විවිධත්වයට සහ බහුත්වවාදයට ද ඉඩ නොලැබේ.

ඒ සමඟම, විශ්වවිද්‍යාල පාලන ක්‍රියාවලියේ (University Governance) සෑම අංශයකින්ම සිසුන් බැහැර කර තිබීම යන කරුණ ගැන ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ මෙන් ම විශ්වවිද්‍යාල බලධාරීන්ගේ ද ක්ෂණික අවධානය යොමු විය යුතුව තිබේ. විශ්වවිද්‍යාල පරිපාලනයේ ශිෂ්‍ය සහභාගීත්වය යනු දෙපාර්ශවයේම සහයෝගයෙන් සිදුවිය යුතු දෙයක් බව, සිසුන් මෙන්ම බලධාරීන් ද, අවබෝධ කර ගත යුතු දෙයකි. දැනට සිදු වන්නේ, විශ්වවිද්‍යාල පාලන ක්‍රියාවලියේ පාර්ශ්වකරුවන් ලෙස සිසුන්ට සහභාගිවීමට ඇති තත්ත්වයක් නිර්මාණය කිරීමේ වගකීම පැහැර හැරීමයි.

දැනට පවතින තත්ත්වයට අනුව පීඨ සභා සහ රැස්වීම්වලට පැමිණ තම දුක්ගැනවිලි ප්‍රකාශ කිරීමට පමණක්, ශිෂ්‍ය නියෝජනයේ කාර්ය භාරය සීමා වේ. දැනට තිබෙන රෙගුලාසි සකස් කර තිබෙන්නේ, පීඨ සභාවේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට ශිෂ්‍ය නියෝජිතයින්ගේ සහභාගිත්වයන්ට ඉඩ ලබා දෙනු පිණිස නොවේ. ඇතැම් පීඨ සභාවල සාමාජිකයන්, දැනටමත් ඡන්දය දීමේ පුරවැසි අයිතිය ලබා සිටින විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට සළකන්නේ "ළමයින්" ලෙසිනි. විශ්වවිද්‍යාල පාලනය තුළ ශිෂ්‍ය සහභාගිත්වයට ඔවුන් කැමැත්ත දක්වන්නේ ද නැත. ඒ සමඟම ශිෂ්‍ය නායකයින් ද විශ්වවිද්‍යාල පාලන ක්‍රියාවලියට සහභාගි වීමට අකැමැතිය. ඔවුන් වඩාත් කැමති වන්නේ දේශපාලන බලමුළුගැන්වීමේ යාන්ත්‍රණයක් ලෙස බලපෑම් කිරීමේ සහ උද්ඝෝෂණයේ යෙදීමේ දේශපාලනයට විනා, ප්‍රතිපත්තිමය සහ පරිපාලනමය වශයෙන් දායකත්වයක් සිදු කිරීමට නොවේ.

**ශිෂ්‍ය සුභසාධනය සහ විනය සඳහා ප්‍රතිපත්ති යෝජනා**

**ශිෂ්‍ය සුභසාධනය සහ විනය සම්බන්ධව ඇති නිරන්තර අර්බුදය**

***ප්‍රතිපත්ති කරුණ 28 :***

විශ්වවිද්‍යාලවල ඉඩ පහසුකම්, යටිතල පහසුකම්, සම්පත් සහ ජීවන තත්ත්වයන් පිළිබඳව බරපතල සීමාවන් තිබියදීත්, විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම ව්‍යාප්ත කිරීම නිසා සිදු වී තිබෙන්නේ

ශිෂ්‍ය සුභසාධනය සහ විනය සම්බන්ධයෙන් නිම නොවන අර්බුදයක් නිර්මාණය විමයි. විශ්වවිද්‍යාලවල දැනට සිදු වන ශිෂ්‍ය අසහනයට සහ උද්ඝෝෂණවලට ද මේ තත්ත්වය හේතු වී තිබේ.

*ප්‍රතිපත්තිය 28 :* ශිෂ්‍ය ප්‍රජාවගේ ජීවන වටපිටාව සහ ජීවන තත්ත්වය දියුණු කිරීමට ගෙන ඇති පියවර දිගටම ගෙන යා යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- උපාධි අපේක්ෂක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සුභසාධනයත්, ජීවන වටපිටාව, සහ ජීවන තත්ත්වයත් දියුණු කිරීම සඳහා නිර්දේශ යෝජනා කිරීමේ කමිටුවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කිරීම.

- එම කමිටුවේ නිර්දේශ ශිෂ්‍ය සුභසාධනය සම්බන්ධව දැනට පවත්නා ප්‍රමිතීන් සහ යාන්ත්‍රණ වැඩි දියුණු කිරීමේ නව ක්‍රමයකට සම්බන්ධ කිරීම.

**නවක වදය සහ විනය**

*ප්‍රතිපත්ති කරුණ 29 :*

නවක වදය නිසා විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර බියට පත් වීම, ආතතිය සහ භීතිය යන මේවායින් සමන්විත වන පරිසරයක් ගොඩ නැගෙන අතර එය ඔවුන්ගේ අධ්‍යාපනයට, මානසික සහ චිත්තවේගීමය සෞඛ්‍යයට සහ සුභසාධනයට බලපාන්නේ නිෂේධනීය ලෙසය. 2017 ජූනි මාසයේ සිට 2019 ජූනි මාසය යන දෙවසර තුළ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 1959 දෙනෙකු, නවක වදය නිසා විශ්වවිද්‍යාල හැරගොස් ඇත. මේ වන විට සිසුන් 20 දෙනෙකු නවක වදය හේතු කොට ගෙන සිය දිවි නසා ගෙන ඇතැයි වාර්තා වේ. නවක වදය තුරන් කිරීමට ගෙන ඇති ප්‍රයත්න අසාර්ථකවී ඇති අතර, දැඩි විනය පාලනයක් පවත්වා ගැනීමට ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රතිපත්ති ද ඵලදායී වී නැත.

*ප්‍රතිපත්තිය 29 :* නවක වදය සම්පූර්ණයෙන්ම හෙළා දැකිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- නවක වදයේ හානිකර සහ විනාශකාරී ඵලවිපාක ගැන සිසුන් අතර සවිඥානකත්වයක් සහ අවබෝධයක් ඇති කරනු සඳහා විශ්වවිද්‍යාල බලධාරීන්, ජ්‍යෙෂ්ඨ සිසුන්ගේ ද සහභාගීත්වය ඇතිව තිරසාර වැඩ පිළිවෙලක් දියත් කිරීම.

- විශ්වවිද්‍යාල, ඒවායේ තිබෙන ශිෂ්‍ය උපදේශන සහ සුභසාධන ඒකක කේන්ද්‍ර කොට ගෙන, නවක වදයේ ඇති විනාශකාරී ප්‍රතිඵල පිළිබඳව විශ්වවිද්‍යාල සිසුන් අතර අධ්‍යාපනය, සංවාදය සහ සවිඥානකත්වය දියුණු කරන වැඩසටහනක් දියත් කිරීම.
- විශ්වවිද්‍යාලයන්හි නවක වදය පාලනය කරන ශිෂ්‍ය කණ්ඩායම්වලට සම්බන්ධ බාහිර දේශපාලන ව්‍යාපාරවල නායකයින් සමඟ ආණ්ඩුව දේශපාලන සංවාදයක් ආරම්භ කිරීම. එහි අරමුණ විය යුත්තේ විශ්වවිද්‍යාල සිසුන් අතර පවතින සම්බන්ධතා මානුෂීයකරණය සඳහා එම දේශපාලන කණ්ඩායම්වල සහයෝගය ලබා ගැනීමයි.

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාලයේ සිසුන් තම දේශපාලන බඳවා ගැනීම් සහ ක්‍රියාකාරකම්වල මාධ්‍යයක් ලෙස යොදා ගන්නාවූ දේශපාලන කණ්ඩායම්වල නායකයින් සමඟ සංවාදයක් ආරම්භ කිරීම.

- විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලය, නවක වදය සම්පූර්ණයෙන්ම තුරන් කිරීමට එකහෙළාම කැපවී සිටීම.

වඩාත් හොඳ ප්‍රතිපත්ති ප්‍රතිචාරයක අවශ්‍යතාව

*ප්‍රතිපත්ති කරුණ 30 :*

නවක වදය තුරන් කිරීමට විශ්වවිද්‍යාල සහ ආණ්ඩුව ගෙන ඇති ක්‍රියාමාර්ග බොහෝ දුරට අසාර්ථක වීම නිසා, නව ප්‍රවේශ සහ ප්‍රතිපත්තිමය ප්‍රතිචාර සකස් කිරීම අවශ්‍ය වී තිබේ. ඒ සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල විනය බිඳවැටීමේ ස්වභාවය සහ හේතු පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා ගැනීම අත්‍යවශ්‍යය. එවැනි අවබෝධයක දී නවක වදයෙහි සමාජීය, සංස්කෘතික, දේශපාලන, මනෝ විද්‍යාත්මක සහ ආයතනික ප්‍රතිමාන ගැන අවධානය යොමු කළ යුතු වේ. එවැනි අවබෝධයක්, රාජ්‍ය විශ්වවිද්‍යාලයන්හි සාමකාමී සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර පරිසරයක් නිර්මාණය කිරීමට අවශ්‍ය වඩා හොඳ සහ ඵලදායී ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට අවශ්‍ය නව දැක්මක් ලබා දෙනු ඇත.

*ප්‍රතිපත්තිය 30 :* විශ්වවිද්‍යාලයන්හි නවක වදය තුරන් කිරීම සඳහා පර්යේෂණ අධ්‍යයන මත පදනම් වූ නව ප්‍රවේශ ආරම්භ කළ යුතුය.

ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය

- විශ්වවිද්‍යාලවල නවක වදය සහ ශිෂ්‍ය විනය පිළිබඳ බහුවිෂයීක ප්‍රවේශයක් යොදා ගන්නා අංග සම්පූර්ණ පර්යේෂණාත්මක අධ්‍යයනයක් දියත් කිරීම.

ශිෂ්‍යයන් සහ විශ්වවිද්‍යාල පාලන ක්‍රියාවලිය

*ප්‍රතිපත්ති කරුණ 31 :*

දැනට පවතින ක්‍රමයට අනුව ශිෂ්‍යයන් විශ්වවිද්‍යාල පාලන ක්‍රියාවලියෙන් සම්පූර්ණයෙන්ම බැහැර කර ඇත. පීඨ සභාවලට ශිෂ්‍ය නියෝජිතයින් සහභාගී වුව ද ඒ මඟින් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීමට ඔවුන්ට අවකාශයක් නැත. විශ්වවිද්‍යාල පාලන ක්‍රියාවලියෙන් ශිෂ්‍යයන් බැහැර කිරීමේ ප්‍රතිඵලය වී තිබෙන්නේ, ඔවුන් විශ්වවිද්‍යාල ජීවිතයේ පාර්ශ්වකරුවන් වීමෙන් වැළැක්වීමයි. ඒ මඟින් විශ්වවිද්‍යාල බලධාරීන් කෙරේ පසමිතුරු ආකල්ප ද වර්ධනය කෙරේ.

*ප්‍රතිපත්තිය 31 :* පීඨ සභා, සුභසාධන ආයතන, ආපනශාලා සහ නේවාසිකාගාර ආදී විශ්වවිද්‍යාල පරිපාලනයේ විවිධ මට්ටම්වල ශිෂ්‍ය නියෝජනය සහතික කළ යුතුය.

ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග

- පීඨ සභා සහ විශ්වවිද්‍යාල පරිපාලනයේ අනෙකුත් මට්ටම්වල ආයතනයන්හි ශිෂ්‍ය සහභාගිත්වයට ඉඩ සැලසෙන පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම.

- විශ්වවිද්‍යාල පුස්තකාල, කාර්යාල සහ පර්යේෂණ ව්‍යාපෘති යනාදියට අනුයුක්ත වෙමින් විශ්වවිද්‍යාලය තුළම අර්ධ-කාලීන රැකියා ලබා ගැනීමට සිසුන්ට අවකාශ ලැබෙන යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

- එක් එක් විශ්වවිද්‍යාලවල දුක්ගැනවිලි පරීක්ෂණ කමිටු (Grievance Committees) පිහිටුවීම.

**ශිෂ්‍ය සංගම්වල නියෝජනයේ බහුත්වවාදය**

***ප්‍රතිපත්ති කරුණ 32 :***

ශිෂ්‍ය සංගම්වල දැනට තිබෙන නියෝජනය මඟින් සිදු වන්නේ, බහුතර සහාය ලැබෙන එක කණ්ඩායමක ආධිපත්‍යය ඇතිවීමයි. ඒ මඟින් සිදු වී තිබෙන්නේ ශිෂ්‍ය නියෝජනයේ බහුත්වවාදී ලක්ෂණයට ඉඩ නොලැබීමයි.

***ප්‍රතිපත්තිය 32 :*** ශිෂ්‍ය සංගම් නිලවරණ සඳහා සමානුපාතික නියෝජන ක්‍රමයක් යොදා ගත යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- ශිෂ්‍ය සංගම් නිලවරණවලදී සමානුපාතික නියෝජනය අනිවාර්ය කරන ලෙස 1978 විශ්වවිද්‍යාල පනතේ 6 වැනි වගන්තියට සුදුසු සංශෝධන හඳුන්වා දීම.

**ආචාර්ය මණ්ඩලය සහ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් අතර කිට්ටු සම්බන්ධතා පැවැත්වීමේ අවශ්‍යතාව**

***ප්‍රතිපත්ති කරුණ 33 :***

''ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ බහුතරය තම ආචාර්යවරුන්ට ගරු කරති'' යන කරුණ සැලකිල්ලට ගෙන සමීප ආචාර්ය-ශිෂ්‍ය අන්තර් සම්බන්ධතා මඟින් ශිෂ්‍ය අවිනය අවම කළ හැකිය.

***ප්‍රතිපත්තිය 33 :*** සමාජීය, වෘත්තිකමය සහ ශාස්ත්‍රීය වශයෙන් ශිෂ්‍ය ක්‍රියාකාරකම් සමග පුළුල් ලෙස සහභාගිවීමට ආචාර්ය මණ්ඩලය උනන්දු කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- විෂය නිර්දේශ සහ විෂයමාලා සැලසුම් කිරීමේ දී ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සම්බන්ධ කර ගැනීම.

- ශිෂ්‍ය ප්‍රතිපෝෂණ යෝජනා නිරතුරුව ලබා ගැනීම, සහ ඒවා තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී උපයෝගී කර ගැනීම.

- ආචාර්ය මණ්ඩලයේ ද සහභාගිත්වය ඇතිව, අව්‍යාජ සමාජ සහ දේශපාලන විවාද සහ සාකච්ඡා ප්‍රවර්ධනය කිරීම.

- පාඨමාලාවලින් පරිබාහිර ක්‍රියාකාරකම්වලට සහභාගි වන ලෙස ආචාර්ය මණ්ඩලය උනන්දු කරවීම.

- ප්‍රායෝගික ලෝකයට හඳුන්වා දීම, වෘත්තීය නැඹුරුව සහ වෘත්තිය උපදේශනය යන මේවා මඟින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ප්‍රබෝධමත් ශාස්ත්‍රීය පරිසරයක් සැපයීම.

- ආචාර්යවරුන්ට, ආදර්ශෝපදේශකයින් (Mentors) ලෙස කුඩා ශිෂ්‍ය කණ්ඩායම් භාර දීම.

- විශ්වවිද්‍යාලයෙහි පිටත සමාජයේ ප්‍රජාවට ඵලදායී වන්නා වූත්, ආයතනයේ මහජන ප්‍රතිරූපය වර්ධනය කරන්නා වූත් ක්‍රියාකාරකම්වල සිසුන් සමඟ යෙදීමට ආචාර්ය මණ්ඩලය උනන්දු කරවීම.

# 06 පරිච්ඡේදය

## පශ්චාද්-උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ

පශ්චාද්-උපාධි අධ්‍යාපනය, පසුගිය වසර කිහිපය තුළ දී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල අධ්‍යාපන සහ පුහුණු කිරීම් න්‍යාය පත්‍රයේ අඛණ්ඩ අංගයක් බවට පත් වී තිබේ. 2000 වසරේ දී බිහිවූ රටේ වාර්ෂික පශ්චාද්-උපාධිධාරීන් සංඛ්‍යාව 2500ක් පමණ විය. එතැන් පටන්, පශ්චාද්-උපාධි පාඨමාලා විවිධාංගීකරණය වී, ඒවායේ සංඛ්‍යාව සීඝ්‍රයෙන් ඉහළ ගොස් තිබේ. මෙය විශේෂයෙන් කලා, මානව ශාස්ත්‍ර, කළමනාකරණ සහ වාණිජ්‍යය ක්ෂේත්‍රවල නිරීක්ෂණය කළ හැකිය. 2017 වසරේ දී ලංකාවේ විශ්වවිද්‍යාලවලින් බිහි වූ පශ්චාද්-උපාධිධාරීන්ගේ සංඛ්‍යාව 7336කි.

පාඨමාලා ව්‍යාප්ත වීමත්, ඇතුළු වන ශිෂ්‍ය සංඛ්‍යාවේ සහ උපාධිධාරීන්ගේ සංඛ්‍යාවේ සීඝ්‍ර ඉහළ යෑමත් සිදුවී ඇත. නමුදු, ශ්‍රී ලංකාවේ පශ්චාද්-උපාධි අධ්‍යාපනය තවමත් පවතින්නේ විකාශනය වෙමිනි. සියලුම පශ්චාද්-උපාධි පාඨමාලාවන්ම පාහේ ක්‍රියාත්මක වන්නේ අර්ධ-කාලීන පාඨමාලා පදනමක් මතයි. ප්‍රතිෂ්ඨාපිත අධ්‍යයන පීඨ ප්‍රථම උපාධි පාඨමාලාවලට අමතරව පශ්චාද්-උපාධි පාඨමාලා ද පවත්වන අතර, විවිධ විශ්වවිද්‍යාලවල පිහිටුවා ඇති පශ්චාද්-උපාධි ප්‍රදානය කිරීමේ ආයතන 15ක් පමණ තිබේ.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල මුලදී පශ්චාද්-උපාධි අධ්‍යයනය පැවැත්වූයේ විද්‍යාර්ථියෙකු තනිව උපදේශකයෙකු විසින් පර්යේෂණ කටයුතුවලට පුහුණු කිරීමේ සාම්ප්‍රදායික විධික්‍රමයට අනුවය. විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ද, රාජ්‍ය සහ පෞද්ගලික අංශවල නිලධාරීන් ද අතර පශ්චාද්-උපාධි සුදුසුකම් ලබා ගැනීම සඳහා උනන්දුව වැඩි වීමත් සමඟ පශ්චාද්-උපාධි ආයතන (Post-Graduate Institutes) සහ පශ්චාද්-උපාධිඅධ්‍යයන පීඨ (Faculties of Graduate Studies) පිහිටුවීම ආරම්භ කරන ලදී.

දැනට රාජ්‍ය විශ්වවිද්‍යාල 15 ම සහ පුද්ගලික උසස් අධ්‍යාපන ආයතන 13ක පශ්චාද්-උපාධි පුහුණු පාඨමාලා පවත්වති. මෙම ආයතනවලින් ප්‍රදානය කෙරෙන පශ්චාද්-උපාධි සුදුසුකම්වලට පශ්චාද්-උපාධි සහතික, පශ්චාද්-උපාධි ඩිප්ලෝමා, විද්‍යාපති (MSc) සහ ශාස්ත්‍රපති (MA), ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති, (MBA) වැනි විශේෂ ශාස්ත්‍රපති පාඨමාලා, දර්ශනපති (M.Phil) සහ දර්ශනශූරී (Ph.D) යන පර්යේෂණ උපාධි දෙක ද අයත් වේ. ඊට අමතරව, වෛද්‍ය විද්‍යාව පිළිබඳව ද පශ්චාද්-උපාධි ආයතනය (Post-Graduate Institute of Medicine) සායනික පුහුණුව සහ පර්යේෂණවලින් සමන්විත වන වෛද්‍ය සුදුසුකම් රාශියක් ලබා දෙන පශ්චාද්-උපාධි ප්‍රදානය කරයි.

**රාජ්‍ය විශ්වවිද්‍යාලවල පශ්චාද් - උපාධි අධ්‍යාපනය : සමස්ත චිත්‍රය**

රාජ්‍ය විශ්වවිද්‍යාලවලින් වාර්ෂිකව පිටවන පශ්චාද්-උපාධිධාරීන් සංඛ්‍යාව වර්තමානයේදී 7000 ඉක්මවා ඇත. මෙම සංඛ්‍යාවෙන් 90%කට ආසන්න ප්‍රමාණයක් ප්‍රතිෂ්ඨාපිත විශ්වවිද්‍යාලවලින් උපාධි ලැබූ අයයි. ඒ අතරෙන් තුනෙන් එකක්ම උපාධි ලබා ඇත්තේ කොළඹ විශ්වවිද්‍යාලයෙනි. පශ්චාද්-උපාධි අධ්‍යාපනය දැන් පැහැදිලිවම ප්‍රතිෂ්ඨාපිත විශ්වවිද්‍යාලවල අධ්‍යයන වැඩ සටහන්හි ප්‍රධාන අංගයක් වී තිබේ. නැගෙනහිර, අග්නිදිග, රජරට, වයඹ, සබරගමුව, සහ ඌව වෙල්ලස්ස යන නව විශ්වවිද්‍යාලවල පශ්චාද්-උපාධි පාඨමාලා පටන් ගෙන ඇත්තේ ඉතා මෑතකදීය. ඒවායින් ප්‍රදානය කෙරෙන්නේ MBA සහ පර්යේෂණ උපාධි ස්වල්ප ප්‍රමාණයකි. සීඝ්‍ර ලෙස පශ්චාද්-උපාධි ආයතනවල පශ්චාද්-උපාධි පාඨමාලා ප්‍රමාණය ඉහළ ගොස් ඇතත්, ඒවා ප්‍රධාන වශයෙන් පර්යේෂණ රහිත පාඨමාලා ඉගැන්වීමට සීමාවූ ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ (SLQF) 9 වැනි මට්ටමට ගැනෙන ඒවාය.

**අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන**

රාජ්‍ය විශ්වවිද්‍යාලවලින් බැහැරව තිබෙන උසස් අධ්‍යාපන ආයතන කිහිපයක් විසින් ද පශ්චාද්-උපාධි ගණනාවක් ම ප්‍රදානය කරනු ලැබේ. ඒවා පහත සඳහන් පරිදි වර්ගීකරණය කළ හැකිය.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගෙන ඇති හෝ වෙනත් අමාත්‍යාංශ යටතේ විශේෂ පනත් මඟින් පිහිටුවා ඇති රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන.
- පශ්චාද්-උපාධි පිරිනැමීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ/උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අවසරය ලැබූ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන.
- උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය නොලැබූ, විදේශීය විශ්වවිද්‍යාල සමග හවුලේ පවත්වාගෙන යන රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන.

**පාඨමාලා ඉගෙනුම් සහිත පශ්චාද්-උපාධි වැඩසටහන් පිළිබඳව පවත්නා ගැටලු**

දැනට පවතින පශ්චාද්-උපාධි වැඩසටහන් බොහොමයක්ම ඉගෙනුම් පාඨමාලා (Course Work) සහිත ඒවායි. මෙය, පශ්චාද්-උපාධි අපේක්ෂකයින්ට ඉගෙන ගැනීමේ පාඨමාලාවලට සහභාගි වීමට අවස්ථාවක් ලබා නොදුන් සාම්ප්‍රදායික පශ්චාද්-උපාධි වැඩසටහන් වලින් ඉදිරියට ගිය ප්‍රගතිගාමී වර්ධනයකි. දැනට, ඉගෙනීමේ පාඨමාලා සහිත පශ්චාද්-උපාධි වැඩසටහන් ක්‍රියාත්මක වන්නේ සිකුරාදා දිනවල සන්ධ්‍යා භාගයේ සහ සති අන්ත දිනවලය. එබැවින්, පශ්චාද්-උපාධි අපේක්ෂකයින්, අර්ධ-කාලින ශිෂ්‍යයින්ය. ශ්‍රී ලංකාවේ පශ්චාද්-උපාධි අධ්‍යාපනයේ ඇති මෙම අසතුටුදායක ලක්ෂණය හේතු දෙකක ප්‍රතිඵලයකි. පළමුවැන්න, මෙම පාඨමාලාවලට සහභාගි වන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අතිබහුතරය පූර්ණ කාලීන රැකියාවල යෙදෙන අය වීමයි. ඔවුනට උසස් අධ්‍යාපනය සඳහා අධ්‍යයන නිවාඩු පහසුකම් ලැබෙන්නේ නැත. දෙවැන්න නම්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ ප්‍රධාන කාර්යය වන ප්‍රථම උපාධි අපේක්ෂකයන්ට ඉගැන්වීම, එයට අදාළ විභාග කටයුතුවල යෙදීම සහ එම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට උපදෙස් දීමට සීමා කිරීමයි.

ඉගෙනුම් පාඨමාලා සහිත පශ්චාද්-උපාධි වැඩසටහන් පිළිබඳව මතුවන ගැටළු සමහරක් මෙසේ සාරාංශ කොට දැක්විය හැකිය.

**ප්‍රමිතිකරණය :** දැනට තිබෙන ශාස්ත්‍රපති/විද්‍යාපති පාඨමාලා අයත් වන්නේ ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ මට්ටම් 9 සහ 10 ට ය. එබැවින්, බොහෝ විශ්වවිද්‍යාලවල තවමත් සිදු වන්නේ මෙම මට්ටම් දෙකෙන් කවර මට්ටමකට තම පාඨමාලා අයත් වන්නේ ද යන්න නිරවුල් කර ගැනීමය. නව වැනි මට්ටමේ වැඩසටහන්වලට සුදුසුකම් ලැබීමට උනන්දු වන්නේ රැකියා හෝ රැකියාවේ උසස් වීම් ලබා ගැනීමට අවශ්‍ය දැනුම පමණක් අපේක්ෂා කරන සිසුන්ය. උසස් අධ්‍යාපනය ලැබීමට හෝ විදේශගත වීමට හෝ අපේක්ෂා කරන සිසුන් දස වැනි මට්ටමේ සුදුසුකම් සඳහා කැමැත්ත දක්වති.

**තත්ත්ව සහතිකකරණය :** රැකියාවල නියුතු සිසුන්ට අවකාශ සැළසීම සඳහා බොහෝ විශ්වවිද්‍යාල පවත්වන්නේ අර්ධ-කාලීන පශ්චාද්-උපාධි පාඨමාලාය. පන්ති පවත්වන්නේ සන්ධ්‍යා කාලවල සහ සති අන්තයේ ය. මේ තත්ත්වය නිසා ඉගැන්වීම, ඉගෙනීම, පන්තිවලට සහභාගි වීම, සහ තත්ත්වය සහතික කිරීම පිළිබඳව පහත දැක්වෙන ආකාරයේ ගැටළුකාරී තත්ත්වයන් ඇති වී තිබේ.

- පූර්ණ කාලීන සහ අර්ධ කාලීන ශිෂ්‍යයන් අතර වෙනස නැති වී ගොස් තිබෙන අතර, පූර්ණ-කාලීන ශිෂ්‍යයන්ට පවා පන්තිවලට සහභාගි වීමට සිදු වී තිබෙන්නේ සති අන්තවලය. මේ තත්ත්වය, පශ්චාද්-උපාධි පුහුණුවේ ගුණාත්මකබව, ප්‍රමිතීන්ට අනුකූලබව සහ සාරවත්බව බාදනය වීමට තුඩු දී ඇත යන අදහස මතු වී තිබේ.

- අර්ධ කාලීන පශ්චාද්-උපාධි පාඨමාලාවල, පර්යේෂණ සිදු කිරීම සහ ශාස්ත්‍රීය ලේඛනය වැනි දේ ඉගැන්වීම සහ කුසලතා පුහුණුවට, ජාත්‍යන්තර වශයෙන් පිළිගෙන ඇති පශ්චාද්-උපාධි පාඨමාලාවල ඇති ශාස්ත්‍රීය/විද්‍යාත්මක ගුණාත්මකභාවය නොමැත.

- ප්‍රතීතනය සහ තත්ත්ව සහතිකකරණය සඳහා ඵලදායී යාන්ත්‍රණයක් නොමැති වීමේ පසුබිම තුළ ඉගැන්වීම, ඉගෙන ගැනීම, සහ පර්යේෂණ පිළිබඳව පවත්නා ගුණාත්මකබව සහ ප්‍රමිතීන් විශ්වවිද්‍යාල අතරේ බෙහෙවින් වෙනස් වෙයි.

- සිසුන් අතර පුස්තකාල භාවිතය පවතින්නේ අඩු තත්ත්වයකය. එබැවින් අදාළ ක්ෂේත්‍රවල ශාස්ත්‍රීය සාහිත්‍යයට සිසුන් අනාවරණය වීම ඉතා අවම මට්ටමක පවතී. ඉංග්‍රීසි භාෂාව ශාස්ත්‍රීය කටයුතු සඳහා භාවිතා කිරීමේ දී ඇති අඩු හැකියාව මෙම තත්ත්වයට හේතු වී තිබේ.

- ප්‍රායෝගික පුහුණුව සඳහා නැඹුරුවක් ඇති පශ්චාද්-උපාධි පාඨමාලාවල ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියන්, කුසලතා සංවර්ධනයත් පවත්වා ගෙන යාම දුෂ්කරය. එබැවින් පශ්චාද්-උපාධි පාඨමාලා බෙහෙවින්ම අවධාරණය කරන්නේ දැනුම ලබා දීම පමණි. වෘත්තීය කුසලතා පුහුණුව ගැන ඒවායේ ඇත්තේ අඩු අවධානයකි.

- පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිපෝෂණ, පාඨමාලා සංවර්ධනය, පාඩම් සැලසුම් කිරීම, කාර්ය සාඵල්‍ය නිරීක්ෂණය, සහ සම්භවන ඇගයීම (Formative Assessment) වැනි ගුණාත්මක තත්ත්ව සහතික කිරීමේ විධික්‍රම පවතින්නේ ඌනවර්ධිතවය.

- ගුණාත්මක තත්ත්වය වර්ධනය කිරීම අරමුණු කරගෙන, ඉගැන්වීම, පුහුණුව ලබා දීම සහ ඉගෙනීම යන කාර්යයන් අධික්ෂණය කිරීමක් සිදු වන්නේ නැත.

- පශ්චාද්-උපාධි නිබන්ධන සහ පැවරීම් ලිවීමේදී ද, ඇගැයීමේදී ද දිගු ප්‍රමාදවීම් වාර්තාවී තිබේ. පශ්චාද්-උපාධි නිබන්ධන ඇගයීමේ දී එම කාර්යයේ ඇති බරපතල බව, විවෘතභාවය, ප්‍රමාද නොවීම සහ වගවීම පිළිබඳ අවශ්‍ය වෘත්තික මට්ටම් කරා පරීක්ෂකයින් තවමත් ළඟා වී නැත.

- විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට මූලික වශයෙන්ම අවධානය යොමු කරන්නට සිදු වී තිබෙන්නේ ප්‍රථම උපාධි අපේක්ෂකයින්ට ඉගැන්වීමේ අරමුණ වෙත වන හෙයින්, පශ්චාද්-උපාධි ඉගැන්වීම්, අධීක්ෂණය සහ පුහුණු කිරීම වෙනුවෙන් ඔවුන් වැය කරන කාලය, ශ්‍රමය සහ බුද්ධිමය හැකියාව පවතින්නේ අවශ්‍ය ප්‍රමිතීන්ට වඩා බොහෝ පහළ මට්ටම්වලය.

**පශ්චාද්-උපාධි අධ්‍යයන සහ පර්යේෂණ**

පශ්චාද්-උපාධි වැඩසටහන් සමග පර්යේෂණ කාර්යය බද්ධ කර තිබෙන්නේ, එහි බැරෑරුම්කමේ සහ ගැඹුරේ විවිධ මට්ටම්වලිනි. දර්ශනපති සහ දර්ශනශූරී පාඨමාලාවලින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඉහළ මට්ටමේ පර්යේෂණ සඳහා පුහුණු කෙරේ. ශාස්ත්‍රපති/විද්‍යාපති සහ පශ්චාද්-උපාධි ඩිප්ලෝමා පාඨමාලා වලදී පුහුණු කරන්නේ අඩු මට්ටම් පර්යේෂණ හැකියාවන් ය. දර්ශනපති සහ දර්ශනශූරී උපාධි සඳහා, ස්වාධීන පර්යේෂණ මත පදනම් වෙමින්, හරයාත්මක වශයෙන් ගැඹුරු සහ දිග සහිත, නිර්මාණාත්මක ලෙස නැවුම් ශාස්ත්‍රීය දායකත්වයක් කළ හැකි උපාධි නිබන්ධන ලිවිය යුතු යැයි අපේක්ෂා කෙරේ. ශාස්ත්‍රපති/විද්‍යාපති සහ පශ්චාද්-උපාධි ඩිප්ලෝමා පාඨමාලාවල නිබන්ධන ඊට වඩා අඩු බරපතල

බවකින් යුක්ත වන අතර, ඒවායින් බලාපොරොත්තු වන්නේ අපේක්ෂකයින් සතුටුදායක පර්යේෂණ සහ ශාස්ත්‍රීය ලේඛන කුසලතා පමණක් ප්‍රදර්ශනය කරන බවයි.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පොහොසත් සහ ස්වයංපෝෂණ හැකියාව ඇති පර්යේෂණ සහ ඥාන සම්පාදන සංස්කෘතියක් බිහි කිරීමට සමත් වී නැත යන කණස්සල්ල බහුලව ප්‍රකාශ වේ. ව්‍යුහාත්මක සහ ආයතනික සාධක ගණනාවක්ම මේ තත්ත්වයට දායක වී ඇත. 1942 දී ලංකා විශ්වවිද්‍යාලය පිහිටුවීමේ පටන් ලංකාවේ විශ්වවිද්‍යාල අතර සම්පූර්ණයෙන් පර්යේෂණ සඳහා වූ නැඹුරුවක් සිදු වී නැත. ප්‍රථම උපාධි අධ්‍යාපනය කෙරෙහි අවශ්‍ය ප්‍රමාණයට වඩා ඇති අවධානය නිසා සිදු වී තිබෙන්නේ, පශ්චාද්-උපාධි අධ්‍යපනය පූර්ණ කාලීන පාඨමාලා ලෙස ආරම්භ කිරීම තවමත් නොහැකි වී තිබීමයි. එහි ප්‍රතිඵලය වී තිබෙන්නේ, ආචාර්යවරුන් සහ සිසුන් යන දෙපාර්ශවයටම පූර්ණ කාලීනව පර්යේෂණ කටයුතු වලට යෙදීමට පසුබිමක් ඇති නොවීමයි. දර්ශනපති සහ දර්ශනශූරී උපාධි අපේක්ෂකයින් පවා නිතිපතා පර්යේෂණ හෝ ඥාන සම්පාදන කාර්යයයේ යෙදීමට තරම් කාලයක් නැත, අර්ධ-කාලීන ශිෂ්‍යයන්ය. මෙපරිදි, ශක්තිමත් පර්යේෂණ සංස්කෘතියක් බිහි කර ඇති අන් රටවල මෙන් නොව ශ්‍රී ලංකාවේ තිබෙන අර්ධ කාලීන පශ්චාද්-උපාධි අධ්‍යාපනය දුර්වල සහ නව දැනුම නිර්මාණය කිරීම විශ්වවිද්‍යාලයේ දෛනික ලක්ෂණයක් බවට පත් කිරීමේ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට තරම් කැපවීමක් නොතිබෙන්නා වූ එකක් වශයෙන් දිගටම පවතී.

පර්යේෂණ සඳහා අරමුදල් හිඟ වීම, ජාත්‍යන්තර සහයෝගය සහ සහභාගීත්වය සහිතව නිතිපතා පවත්වන ජාත්‍යන්තර පර්යේෂණ සම්මේලන නොමැති වීම, පර්යේෂණ ශාස්ත්‍රීය සඟරා සහ ග්‍රන්ථ මුද්‍රණයෙන් පළ කර පවත්වා ගැනීමට ඇති දුෂ්කරතාව යන මේවා, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල දුර්වල පර්යේෂණ සංස්කෘතියක් පැවතීමට හේතු වන සාධක මෙන්ම එය පැවතීමේ ප්‍රතිඵල ද වෙති. පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර හවුල්කාරීත්වය තවමත් සීමා වී තිබෙන්නේ වෛද්‍ය සහ විද්‍යා පීඨ කිහිපයකටය. ජාත්‍යන්තර පර්යේෂණ සැසි පැවැත්වීමට රාජ්‍ය විශ්වවිද්‍යාලවල මෑත කාලයේ දී ආරම්භ වී ඇති ප්‍රවණතාවය වුවත්, හරවත් ජාත්‍යන්තර පර්යේෂණ සහභාගීත්වය සහ හවුල්කාරීත්වය සඳහා පදනමක් වැටීමට තුඩු දී නැත. ඒවායින් ප්‍රවර්ධනය කෙරෙන්නේ බොහෝ විට කෙටි සාර සංක්ෂේප (Abstracts) ලියා ඉදිරිපත් කිරීම විනා, ඉහළ මට්ටමේ පර්යේෂණ වාර්තා ඉදිරිපත් කිරීම නොවේ. එයින් බිහිකර ඇත්තේ විශ්වවිද්‍යාල රැකියාවල උසස්වීම් ලබා ගැනීමට අවශ්‍ය ලකුණු ලබා ගැනීමේ අරමුණෙන් සාර සංක්ෂේප ලියා ඉදිරිපත් කිරීමේ පටු සම්මන්ත්‍රණ සංස්කෘතියකි.

ශාස්ත්‍රඥයින්ට තුල්‍ය සමාලෝචනය (Peer Review) වලට භාජනය කරන ලද පර්යේෂණ පත්‍ර පළ කිරීමට ඉඩ ලබා දෙන ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ ශාස්ත්‍රීය සඟරා පවත්වා ගැනීමට ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල බොහෝ අධ්‍යයන පීඨවලට නොහැකි වී තිබේ. පර්යේෂණ සහ ශාස්ත්‍රීය කෘති සම-සමීක්ෂණයට ලක් කිරීම, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල ශාස්ත්‍රීය සංස්කෘතියේ භාවිතයක් බවට තවම පත් වී නැත. ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් ද ඇතුළු බොහෝ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් පුරුදු වී සිටින්නේ තම ශාස්ත්‍රීය ලිපි වාණිජ මට්ටමෙන් පවත්වාගෙන යන, මුදල් සූරා ගැනීම අරමුණු කරගත්, කොල්ලකාරී වෙබ් සඟරාවල (Predatory Web Journals) මුදල් ගෙවා පළ කර ගැනීමටය. ශ්‍රී ලංකාවේ දැනටමත් දුර්වල වී තිබෙන පර්යේෂණ සංස්කෘතිය, මෙම කොල්ලකාරී සඟරාවල ලිපි පළ කර ගැනීමේ පුරුද්ද නිසා තවදුරටත් විනාශ වෙනු ඇත යන ප්‍රබල සැකය ගොඩනැඟී තිබෙන්නේ එබැවිනි.

**පශ්චාද්-උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා ප්‍රතිපත්ති යෝජනා**

**ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව**

***ප්‍රතිපත්ති කරුණ 34 :***

රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල පශ්චාද්-උපාධි අධ්‍යාපනයට මඟ පෙන්වීම සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුවක් දැනට පවතින්නේ නැත. එක් එක් ආයතනය අනුගමනය කරන ප්‍රතිපත්තිවල මෙන්ම, එක් එක් පශ්චාද්-උපාධි වැඩසටහනක ඇති ගුණාත්මක තත්ත්වය, ප්‍රමිතීන්, ඇගයීමේ බැරුරුම් බව, පුහුණුව, කළමනාකරණය, ගාස්තු, සපයන සේවා, ශක්‍යතා, ධාරිතාව සහ පවත්වා ගැනීමේ හැකියාව යන මේවා පිළිබඳව ඇත්තේ සැලකිය යුතු වෙනස්කම්ය.

***ප්‍රතිපත්තිය 34 :*** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල පශ්චාද්-උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා ජාතික රාමුවක් සකස් කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- පාර්ශ්වකරුවන් සමඟ අදහස් හුවමාරු කර ගනිමින්, පශ්චාද්-උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා ජාතික රාමුවක් සකස් කිරීම.

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, පශ්චාද්-උපාධි වැඩ සටහන් සපයන සියලුම උසස් අධ්‍යාපන ආයතන ලියාපදිංචි කිරීම සහ පශ්චාද්-උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා ශ්‍රී ලංකාවේ සියලුම උසස් අධ්‍යාපන ආයතන ඉහත දැක් වූ රාමුව ඇතුළත නියාමනය කිරීම.

- මෙම මඟ පෙන්වීම නියාමනය කිරීම පහත සඳහන් පියවර ද අඩංගු නව ආරම්භයක් සඳහා ඉලක්කගත යුතුය. (අ) රාජ්‍ය විශ්වවිද්‍යාලවල පූර්ණ කාලීන පශ්චාද්-උපාධි පාඨමාලා ආරම්භ කිරීම (ආ) පශ්චාද්-උපාධි පාඨමාලාවල ඉගැන්වීමට සාමාන්‍ය වැඩ දිනය ඇතුළතදී සහභාගි වීමට ආචාර්ය මණ්ඩලයට ඉඩ ලබා දීම, (ඇ) ඉගැන්වීමේ සහ පර්යේෂණ සහකාරවරුන් ලෙස පශ්චාද්-උපාධි අපේක්ෂකයින්ගේ සේවය ලබා ගැනීම, (ඈ) පශ්චාද්-උපාධි ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර ලබා දීම (ඉ) පශ්චාද්-උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා රාජ්‍ය සහ පෞද්ගලික විශ්වවිද්‍යාල අතර සහයෝගිතා සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම.

**පොදු නෛතික රාමුවක්**

***ප්‍රතිපත්ති කරුණ 35 :***

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ සියලු ජාතික විශ්වවිද්‍යාල, පශ්චාද්-උපාධි ආයතන සහ පශ්චාද්-උපාධි අධ්‍යයන පීඨ විසින් පශ්චාද්-උපාධි පාඨමාලා පවත්වනු ලැබේ. මේ අතර අමාත්‍යාංශ කිහිපයක් සහ වෙනස් පනත් යටතේ, නැතහොත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අවසර ලබා පශ්චාද්-උපාධි පාඨමාලා පවත්වන තවත් ආයතන ගණනාවක් ද තිබේ. පිටරට විශ්වවිද්‍යාලවල ශාඛා ද, උපාධි ප්‍රදානය කිරීමේ නෛතික තත්ත්වය නොලබා, පශ්චාද්-උපාධි පාඨමාලා පවත්වාගෙන යති.

*ප්‍රතිපත්තිය 35:* විවිධ පශ්චාද්-උපාධි වැඩසටහන්වලට ආයතනික බලය පැවරීම පාලනය කරන නීති සහ රෙගුලාසි ක්‍රමවත් කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, ශ්‍රී ලංකාවේ පශ්චාද්-උපාධි අධ්‍යාපනය ලබා දෙන සෑම රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනයක්ම, තම උපාධි පාඨමාලාවල සහ පර්යේෂණවල ගුණාත්මක තත්ත්වය සහ ප්‍රමිතීන් සම්බන්ධයෙන් අදාළ භාවය, ගුණාත්මක තත්ත්වය සහ ප්‍රමිතීන් පිළිබඳ ජාතික ප්‍රතිපත්ති අනුගමනය කරන බව සහතික කිරීම.

- අනෙකුත් අමාත්‍යංශ යටතේ පවතින සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන, පශ්චාද්-උපාධි අධ්‍යාපනය ලබා දීමේදී ජාතික ප්‍රතිපත්ති, අරමුණු සහ ප්‍රමිතීන්වලට අනුකූල වන බව සහතික කරන යාන්ත්‍රණයක්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් සකස් කිරීම.

**ගුණාත්මක තත්ත්වය සහ ප්‍රමිතීන්**

***ප්‍රතිපත්ති කරුණ 36:***

එක් එක් රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන නොයෙකුත් පශ්චාද්-උපාධි පාඨමාලාවල ගුණාත්මක තත්ත්වය පිළිබඳ පැහැදිලි බවක් නොමැත.

*ප්‍රතිපත්තිය 36 :* සියලුම පශ්චාද් උපාධි පාඨමාලා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට (SLQF) අනුකූල විය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- උසස් අධ්‍යාපන ආයතන ඉහත 35 වැනි නිර්දේශය යටතේ යෝජනා වන අධීක්ෂණ යාන්ත්‍රණයට අනුකූලවීම සහතික කිරීමට අවශ්‍ය බලය පැවරීම.

- සියලු පශ්චාද්-උපාධි වැඩසටහන් තත්ත්ව සහතික මාර්ගෝපදේශන අනුගමනය කිරීම සහ ඒ මත ඒවා ප්‍රතීතනය සහ ශ්‍රේණි ගත කිරීම.

- පශ්චාද්-උපාධි අධ්‍යාපනය, පුහුණුව සහ පර්යේෂණ පිළිබඳ සෑම අංශයකම ගුණාත්මක තත්ත්වය සහ ප්‍රමිතීන් අධීක්ෂණය කිරීමේ ශක්තිමත් සහ කාර්යක්ෂම යාන්ත්‍රණයක් කොමිෂන් සභාව විසින් සකස් කරනු ලැබීම. ප්‍රතීතනය කිරීම, ප්‍රතීතනය සමාලෝචනය කිරීම සහ ප්‍රතීතනය අත්හිටුවීම සඳහා විධි විධාන ද එහි තිබිය යුතුය.

**පූර්ණ කාලීන පශ්චාද්-උපාධි පුහුණුව සහ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම**

***ප්‍රතිපත්ති කරුණ 37 :***

බොහෝ පාඨමාලා පූර්ණ-කාලීන ඒවා යැයි හැඳින්වෙතත්, ඒවා සැබෑ ලෙසම පූර්ණ-කාලීන පශ්චාද්-උපාධි පාඨමාලා නොවේ. අර්ධ-කාලීන පශ්චාද්-උපාධි පුහුණුව නිසා සිදු වන්නේ ඒවායේ තිබිය යුතු ගුණාත්මක තත්ත්වයට සහ ප්‍රමිතීන්ගේ වර්ධනයට බාධා සිදුවීමයි.

***ප්‍රතිපත්තිය 37 :*** විශ්වවිද්‍යාල පූර්ණ-කාලීන පශ්චාද්-උපාධි ඉගැන්වීම් සහ පර්යේෂණ වැඩසටහන් උනන්දු කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය**

- පශ්චාද්-උපාධි අධ්‍යාපනය සඳහා පුළුල් ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉඩ ලබාදෙන පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම.

***ප්‍රතිපත්ති කරුණ 38:***

දැනට පවතින ක්‍රමය අනුව, පශ්චාද්-උපාධි සිසුන්ට තම පර්යේෂණ ව්‍යාපෘති සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් හෝ විශ්වවිද්‍යාලවලින් හෝ සෘජු මූල්‍ය ආධාර නොලැබේ. එකම ව්‍යතිරේකය වන්නේ දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලවල පශ්චාද්-උපාධි අධ්‍යයනය සඳහා ලියාපදිංචි වී සිටින රාජ්‍ය විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලවල ස්ථිර සේවයේ සිටින ආචාර්යවරුන් පමණි. දර්ශනපති සහ දර්ශනශූරී උපාධි සඳහා ඉගෙන ගන්නා විද්‍යාර්ථීන්ට පර්යේෂණ සඳහා මූල්‍යාධාර නොලැබීම ගුණාත්මක වශයෙන් ඉහළ පර්යේෂණ දිගටම පවත්වා ගැනීමටත්, අනාගත හැකියාව සහිත පර්යේෂක සිසුන් ආකර්ෂණය කර ගැනීමටත් බාධාවක් වී තිබේ.

***ප්‍රතිපත්තිය 38:*** පශ්චාද්-උපාධි පර්යේෂණ ශිෂ්‍යත්ව සහ මූල්‍යාධාර යෝජනා ක්‍රම ආරම්භ කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- දේශීය විශ්වවිද්‍යාලවල සහ උසස් අධ්‍යාපන ආයතනවල පශ්චාද්-උපාධි හදාරන විද්‍යාර්ථීන්ට පශ්චාද්-උපාධි පර්යේෂණ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයක්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිහිටුවනු ලැබීම.

- තම පශ්චාද්-උපාධි විද්‍යාර්ථීන්ට ආධාර කරනු පිණිස, එක් එක් විශ්වවිද්‍යාලයක් සහ උසස් අධ්‍යාපන ආයතනයක් තමන්ගේම පශ්චාද්-උපාධි ශිෂ්‍යත්ව සහ වෙනත් මූල්‍යාධාර ක්‍රම ආරම්භ කිරීම.

- විශ්වවිද්‍යාලය උපයන අරමුදල් යොදා ගනිමින් විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන තම දර්ශනපති සහ දර්ශනශූරී විද්‍යාර්ථීන්ට පර්යේෂණ සහායක සහ ඉගැන්වීමේ සහායක තනතුරු ලබා දීමේ යෝජනා ක්‍රම සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

- විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන, පාඨමාලා ගාස්තු වශයෙන් ලැබෙන ආදායම උපයෝගී කර ගනිමින්, අවශ්‍යතාව සහ දක්ෂතාව පදනම් කරගෙන, පශ්චාද්-උපාධි පර්යේෂණ සඳහා මුල්‍යාධාර ක්‍රමයක් සකස් කර, පර්යේෂණ ආධාර යෝජනා ක්‍රමයක් පවත්වා ගැනීම.

- දත්ත විශ්ලේෂණය, භාෂා සංස්කරණය සහ විද්‍යුත් යතුරු ලියනය වැනි තේමාවන් වාණිජ මට්ටමින් සපයමින් ක්‍රියාත්මක විය හැකි පර්යේෂණ ඒකකයක් (Research Cell) එක් එක් විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාල කිහිපයක එකතුවක් (Consortium) මඟින් ආරම්භ කිරීම.

**පශ්චාද්-උපාධි අධ්‍යාපනය ජාත්‍යන්තර කිරීමේ අවශ්‍යතාව**

***ප්‍රතිපත්ති කරුණ 39 :***

දැනට ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල පශ්චාද්-උපාධි හදාරන විදේශීය සිසුන් සිටින්නේ අතලොස්සකි. විදේශීය පශ්චාද්-උපාධි සිසුන් සුදුසු ප්‍රතිපත්තිමය පියවර මඟින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල පශ්චාද්-උපාධි පාඨමාලා ඉගෙන ගැනීමට උනන්දු කරවීම සහ දිරි දීම, දේශීය විශ්වවිද්‍යාලයන්හි ජාත්‍යන්තර ස්වරූපයක් ගොඩ නැගීමට උපකාරී වනු ඇත.

***ප්‍රතිපත්තිය 39 :*** ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන විසින් පවත්වාගෙන යන පශ්චාද්-උපාධි වැඩසටහන් ජාත්‍යන්තරීකරණය කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, පශ්චාද්-උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ පිළිබඳ මෙම මාර්ගෝපදේශ සංග්‍රහයේ, විදේශ සහයෝගතා මෙන්ම, දේශීය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවලට ශිෂ්‍ය සහභාගිත්වය ජාත්‍යන්තරීකරණය සඳහා අවශ්‍ය මූලධර්ම සහ උපදෙස් දක්වා සිටීම.

- එක් එක් විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන තම පශ්චාද්-උපාධි පාඨමාලා සහ පර්යේෂණ වැඩසටහන් ජාත්‍යන්තර තත්ත්වයට පත් කරන අතරම, විදේශ සිසුන් සඳහා ශිෂ්‍යත්ව සහ මූල්‍යාධාර ක්‍රම ආම්භ කිරීම.

**අන්තර් ආයතනික හවුල් සහයෝගිතාවය**

***ප්‍රතිපත්ති කරුණ 40 :***

වැඩසටහන් සමාලෝචනය, වඩා හොඳ භාවිතයන් ගෙන් පාඩම් ඉගෙනීම, හා හවුල් සහයෝගතාවය (Partnership) වැනි සුදුසු යාන්ත්‍රණ මාර්ගයෙන් පශ්චාද්-උපාධි අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් පවත්වාගෙන දියුණු කිරීම සඳහා වූ අන්තර්-ආයතන හෝ අන්තර්-පීඨ සහයෝගිතා සඳහා වූ විධිමත් යාන්ත්‍රණ දැනට ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන අතර නැත.

***ප්‍රතිපත්තිය 40 :*** අන්තර් ආයතනික සහයෝගිතා සහ හවුල්කාරිත්වය මත සංවිධානය කරන පශ්චාද්-උපාධි වැඩසටහන් සහ පර්යේෂණ සඳහා පහසුකම් සැළසිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- රාජ්‍ය නොවන ආයතන ඇතුළු පශ්චාද්-උපාධි පාඨමාලා පවත්වන සෑම උසස් අධ්‍යාපන ආයතනයක්ම අන්තර්-ආයතනික සහයෝගිතාවය සහ හවුල්කාරිත්වය වෙනුවෙන් කේන්ද්‍රස්ථානයක් එක් එක් ආයතනය තුළ පිහිටුවීම.

**ගෝලීය ප්‍රමිතීන්ට අනුව ලබාගන්නා විශිෂ්ඨත්වය**

***ප්‍රතිපත්ති කරුණ 41 :***

පශ්චාද්-උපාධි අධ්‍යාපනය, පුහුණුව සහ පර්යේෂණ පාඨමාලා පවත්වන සෑම ආයතනයක්ම, විශිෂ්ඨත්වය සහ ගෝලීය සහ කලාපීය ප්‍රමිතීන් අත්පත් කර ගැනීමේ අරමුණු සඳහා නිරන්තරවම කැපවිය යුතුය. පශ්චාද්-උපාධි ක්ෂේත්‍රයේ එවැනි විශිෂ්ඨත්වය සහ ප්‍රමිතීන් අත්පත් කර ගැනීම සඳහා වූ යාන්ත්‍රණ ශ්‍රී ලංකාවේ දැනට නොමැත.

***ප්‍රතිපත්තිය 41:*** සෑම උසස් අධ්‍යාපන ආයතනයක් තුළම ජාතික හෝ ජාත්‍යන්තර වැගත්කමකින් යුත් විශිෂ්ටතා ආයතන සංවර්ධනය කිරීම හඳුනාගෙන දිරිගැන්වීම සහ සහාය ලබාදිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- උසස් අධ්‍යාපන ආයතනවල විශිෂ්ඨත්ව කේන්ද්‍ර (Centres of Excellence) පිළිගෙන ආධාර කිරීම සඳහා අමාත්‍යාංශ සහ කොමිෂන් සභාව පහත දක්වන පියවර ගැනීම:
  - (අ) ජාතික සහ ජාත්‍යන්තර සහයෙන් වැදගත් ක්ෂේත්‍රයක නිශ්චිත කාලපරිච්ඡේදයක් පුරා බලපෑම් ඉලක්ක කරගත් (Impact-Oriented) පර්යේෂණ තිරසාරව සිදු කිරීම.
- එසේ පර්යේෂණ සිදු කරන ක්ෂේත්‍රයට අදාළ විශේෂඥ දැනුම සහ විශේෂඥයින් ගොඩ නැගීම.
- ආර්ථික බලපෑමක් ඇති භාණ්ඩ හෝ සේවා බවට පත් කළ හැකි පර්යේෂණ ප්‍රතිඵල පිළිබඳව සාක්ෂි සැකසීම.
- බෙහෙවින් ඉහළ මට්ටමේ පර්යේෂණ සඳහා අවශ්‍ය නවතම පහසුකම් සහ අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩල ද පවත්වා ගැනීම.

**ගුණාත්මක වශයෙන් ඉහළ ආචාර්ය මණ්ඩලය**

***ප්‍රතිපත්ති කරුණ 42 :***

පශ්චාද්-උපාධි පාඨමාලාවල ඉගැන්වීමට අවශ්‍ය, ආචාර්ය උපාධි සහ පර්යේෂණ පසුබිම් සහිත, මනා සුදුසුකම් ලැබූ ආචාර්ය මණ්ඩල සෑම විශ්වවිද්‍යාලයකම නොමැත. අගනුවරට ඈතින් පිහිටි මෑතදී ආරම්භ කරන ලද විශ්වවිද්‍යාලවල, සුදුසුකම්ලත් ආචාර්යවරුන් හිඟවීම මහත් වූ අභියෝගයකි. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ පශ්චාද්-උපාධි පාඨමාලාවල පවත්නා අසමාන ගුණාත්මක තත්ත්වයයි. ඉහළින් සුදුසුකම් ලැබූ ආචාර්යවරුන් සිටිය ද ඔවුන් සිටින්නේ ප්‍රථම උපාධි පාඨමාලාව ඉගැන්වීම් සහ ඇගයීම්

කිරීමේ වගකීම්වලට සීමා වීමෙන්, පශ්චාද්-උපාධි පාඨමාලා සඳහා ගුණාත්මක වශයෙන් ප්‍රමාණවත් කාලයක් කැප කිරීමට නොහැකිවය.

*ප්‍රතිපත්තිය 42:* පශ්චාද්-උපාධි සුදුසුකම්වලට සහ පර්යේෂණවලට වඩාත් බර දෙමින්, ආධුනික කථිකාචාර්යවරුන් බඳවා ගැනීමේ සුදුසුකම් සංශෝධනය කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලවලට ආචාර්යවරුන් බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම.

- ආචාර්ය උපාධි සුදුසුකම් සහිත ආචාර්යවරුන්, ප්‍රථම උපාධි ඉගැන්වීම් සහ ඇගයීම් වගකීම්වල අධික බරින් නිදහස් කර, ඔවුන්ට පශ්චාද්-උපාධි ඉගැන්වීම් සහ අධීක්ෂණ කටයුතුවල යෙදීමට ඉඩ ප්‍රස්තා ලබා දෙන ලෙස විශ්වවිද්‍යාල කටයුතු යෙදීම.

- ඉහළ සුදුසුකම් ලැබූ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන්ට වැඩි කාලයක් පශ්චාද්-උපාධි අධ්‍යාපනය සහ පුහුණුව සඳහා යෙදවීමට අවකාශ ලැබෙන පියවර විශ්වවිද්‍යාල විසින් ගැනීම.

- පශ්චාද්-උපාධි පාඨමාලා සඳහා දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලවල ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන්ගේ සේවය හුවමාරු කර ගැනීම.

# 07 පරිච්ඡේදය

## රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල ගුණාත්මකභාවය සහතිකකරණය හා ප්‍රතීතනය

උසස් අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය පිළිබඳව විවිධ පාර්ශ්වකරුවන් අතර ඇත්තේ වෙනස් දැකීම්ය. තත්ත්ව සහතික කිරීමේ අරමුණ වන්නේ, නියාමක ආයතනයක් විසින් නිර්ණය කර තිබෙන ප්‍රමිතීන් පද්ධතියකට අනුගත වීමයි. ගුණාත්මක තත්ත්වය ළඟා කරගත හැක්කේ එලෙස තීරණය කර ඇති ප්‍රමිතීන්ට ළඟා වීමෙනි. ප්‍රතීතනය ගුණාත්මක තත්ත්වය සහතිකකරණ එවැනි ක්‍රියාවලියකි. එයින් කෙරෙන්නේ, ආයතනයක පවත්නා සේවාවන් සහ මෙහෙයුම් ද, වැඩසටහන් ද ඒවා අදාළ ප්‍රමිතීන්ට අනුකූල වන්නේදැයි බාහිර අධිකාරයක් විසින් තීරණය කිරීමයි. එම ප්‍රමිතීන්ට ළඟාවී තිබේ නම්, එම බාහිර අධිකාරය විසින් අදාළ ආයතනයට හෝ වැඩසටහනට හෝ ප්‍රතීතනය ප්‍රදානය කෙරේ.

ගුණාත්මක තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාවලිය පදනම් වී තිබෙන්නේ අත්දැකීම් සහ රටක උසස් අධ්‍යාපන අවශ්‍යතා මතය.

ගුණාත්මක තත්ත්වය පිළිබඳ ප්‍රශ්නය, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපන මට්ටම් ගණනාවකින්ම ව්‍යාප්ත වීම සමග සම්බන්ධ වී තිබේ. අතීතයේ දී මෙන් දැන් ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා ඉගැන්වීමට පමණක් සීමා වන්නේ නැත. සෑම අධ්‍යයන ක්ෂේත්‍රයකම උපාධි අපේක්ෂකයින් බඳවා ගැනීම සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති අතර, ඊට අමතරව උපාධි අපේක්ෂක පාඨමාලා ද අලුතින් හඳුන්වා දී තිබේ. ප්‍රථම උපාධි සඳහා බාහිර අපේක්ෂකයින් බඳවා ගැනීම සීඝ්‍රයෙන් ඉහළ යාම ද, විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ මෙම ප්‍රමාණාත්මක ව්‍යාප්තියේ ම අංගයකි. මීට අමතරව, සති අන්ත දිනවල පන්ති පවත්වන පශ්චාද්-උපාධි සහ සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව ද ඉහළ ගොස් තිබේ. ඊට සමානව, නව විශ්වවිද්‍යාල කිහිපයක් ම කොළඹින් පිට පළාත්වල පිහිටුවනු ලැබ ඇති අතර, ඒවායේ යටිතල පහසුකම් සහ මානව සම්පත් හිඟ ය. විශේෂයෙන් සුදුසුකම්ලත් ආචාර්ය මණ්ඩල හිඟ ය. මේ අතර 2013 වසරේ සිට ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන භූ දර්ශනයේ සළකුණක් වී තිබෙන්නේ පුද්ගලික උසස් අධ්‍යාපන ආයතන වේගයෙන් බිහිවීමයි. ගුණාත්මක තත්ත්ව සහතික කිරීම සහ ප්‍රතීතනය සඳහා න්‍යාය පත්‍රයක අවශ්‍යතාව ගැන උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ කොමිෂන් සභාව තදින්ම අවධානය යොමු කිරීමට තුඩු දී තිබෙන්නේ මෙම පසුබිමයි.

**පවත්නා තත්ත්වය**

සමස්ත විශ්වවිද්‍යාල පද්ධතිය තුළම ගුණාත්මක තත්ත්වය සහතික කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින්, ඒවා අධීක්ෂණය කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ආයතනික යාන්ත්‍රණයක් ගොඩ නගා තිබේ. 2004 දී පිහිටුවන ලද තත්ත්ව සහතික ඒකකය (Quality Assurance Unit), 2005 දී තත්ත්ව සහතික කවුන්සිලය (Quality Assurance Council) යනුවෙන් අලුතින් නම් කෙරිණ. කවුන්සිලයට පුළුල් බලතල සහ සම්පත් ද ලැබිණ. ඒකකය මඟින් ලංකාවේ විශ්වවිද්‍යාලවල පළමුවැනි වරට ක්‍රියාත්මක කරන ලද ආයතන සහ විෂය සමාලෝචන (Institutional and Subject Review) ක්‍රියාවලිය ආරම්භ කෙරිණ. එම සමාලෝචන චක්‍රය 2015 දී අවසන් කෙරිණ. කවුන්සිලයට, උසස් අධ්‍යාපනයේ තත්ත්ව සහතික ආයතන ජාත්‍යන්තර ජාලයේ ද, ආසියා - ශාන්තිකර තත්ත්ව සහතික ජාලයේ ද (APQN) සාමාජිකත්වය ලැබිණි.

තත්ත්ව සහතිකකරණ ක්‍රියාවලියේම කොටසක් ලෙසින්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවත්, ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (Sri Lanka Qualification Framework) සකස් කර, මුද්‍රණයෙන් ප්‍රකාශ කිරීමට පියවර ගත්හ. 2015 වසරේදී නිම කරන ලද මෙම සුදුසුකම් රාමුව සියලුම

උසස් අධ්‍යාපන ආයතනවලට තම උපාධි වැඩසටහන් සුදුසු මට්ටම්වල තැබීමට හැකියාව ලබා දෙයි. ඒ මඟින් කෙරෙන්නේ, පාඨමාලාවල එක් එක් මට්ටම්වලට අදාළ සුදුසුකම් නිර්ණායක (Descriptions of Qualifications) සහ ලැබෙන සහතික, ශිෂ්‍යයෙකු එක් එක් සුදුසුකම් වර්ගය වෙතින් ලබා ගැනීමට අපේක්ෂා කරන ඉගෙනීම් මට්ටම සහ ප්‍රමාණය දක්වන පාඨමාලා අයවර මිණුම් (Credit Measures) සමඟ සම්බන්ධ කිරීමයි. සුදුසුකම් නිර්ණායක වලින් කෙරෙන්නේ ශිෂ්‍යයන් එක් එක් සුදුසුකම් මට්ටම වෙතින් ලබා ගන්නා ඉගෙනුම් ඵල (Learning Outcomes) සාරාංශ කිරීමයි.

2015 වසරේදී, අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණය (Internal Quality Assurance) සෑම විශ්වවිද්‍යාලයකටම හඳුන්වා දෙනු ලැබිණ. ඉන් පසුව, විශ්වවිද්‍යාල විසින්, තම ආයතන තුළ තත්ත්ව සහතිකකරණ ඒකක පිහිටවනු ලැබිණ. ඊට අමතරව, එක් එක් පීඨයක සිදුවන තත්ත්ව සහතිකකරණ කටයුතු එම ඒකකය සමඟ සම්බන්ධීකරණය සඳහා අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ ඒකක (Internal Quality Assurance Cells) පිහිටුවන ලදී. 2013 දී තත්ත්ව සහතිකකරණ කවුන්සිලය විසින් අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ ඒකක සඳහා අත්පොතක් (Internal Quality Assurance Unit Manual) පළ කරන ලදී.

අලුතෙන් බිහි කරන ලද විවෘත සහ දුරස්ථ ඉගෙනුම් පද්ධති (Open and Distance Learning Systems) වල දිගු කාලීන පැවැත්ම මෙන්ම විශ්වසනීයත්වය ද ආරක්ෂා කරනු පිණිස, ඒවාට අදාළ තත්ත්ව සහතික ක්‍රමයක් ජාතික මට්ටමෙන් ඇති කරන ලදී. ඒ සඳහා Commonwealth Learning ආයතනය සහ UNESCO සංවිධානය විසින් ආධාර සපයනු ලැබිණ. 'දුරස්ථ උසස් අධ්‍යාපන ආයතන සහ වැඩසටහන් සඳහා වූ තත්ත්ව සහතික අත්පොත' නමින්, දුරස්ථ අධ්‍යාපනයේ ප්‍රමිතීන්, කාර්ය සාධන මිණුම් දඬු සහ ඇගයීම් මිණුම් දඬු වර්ධනය කර, මුද්‍රණයෙන් පළ කෙරිණ.

විශ්වවිද්‍යාලවල කාර්ය සාධනය පදනම් කරගෙන, ඒවා ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක් ආරම්භ කිරීමේ අවශ්‍යතාව ගැන විශ්වවිද්‍යාල සමඟ සාකච්ඡාවක් ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අරඹා ඇත. දැනට සාකච්ඡා සිදු වන්නේ ගුණාත්මක තත්ත්වය සහ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සඳහා දිරි ගැන්වීම් ලබාදීම සඳහා විශ්වවිද්‍යාල, අධ්‍යයන පීඨ සහ දෙපාර්තමේන්තු අතර ශ්‍රේණිගත කිරීමේ නව හා නම්‍යශීලී මාදිලියක් සකස් කිරීම පිළිබඳවය.

ගැටලු

විශ්වවිද්‍යාලවල අධ්‍යාපන වැඩසටහන්වල ගුණාත්මක තත්ත්වය, ප්‍රමිතීන් සහ අදාළභාවය සහතික කිරීම ඉලක්ක කොට ගෙන වැදගත් පියවර ගණනාවක්ම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගනු ලැබ තිබේ. එහෙත්, එසේ නියම කර ගන්නා ලද ප්‍රතිපත්ති සහ අරමුණු ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන සංස්කෘතිය තුළට ප්‍රමාණවත් ලෙස අන්තර්ග්‍රහණය වී නැත. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමත්, නිර්මාණාත්මක ප්‍රතිඵල ඇති කිරීමත්, සමහර අධ්‍යයන පීඨවල සිදු වී තිබෙන්නේ සෙමිනි.

විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨවල ගුණාත්මක තත්ත්වය වේගයෙන් වර්ධනය කරමින් ඉක්මන් ප්‍රගතියක් ලබා ගැනීම විශේෂයෙන්ම අභියෝගකාරීය. එවැනි ප්‍රතිසංස්කරණ මෙවැනි පීඨවල සාර්ථක වීමට නම්, දැනට තිබෙන සම්පත් හිඟයත්, ආචාර්ය මණ්ඩලය පුළුල් කිරීමේ අවශ්‍යතාවයත් ගැන ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය කළ යුතුව තිබේ.

ප්‍රථම උපාධි පාඨමාලා තුළදී ශිෂ්‍යයින්ගේ කුසලතා සහ ආකල්ප දියුණු කිරීම, විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය සහ අදාළතාව දියුණු කිරීමේ වර්තමාන න්‍යාය පත්‍රවල ඇති ප්‍රධාන අවශ්‍යතාවකි. මේ සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව බොහෝ පියවර ගණනාවක් ගෙන ඇති නමුත්, කුසලතා සංවර්ධනය ඉගැන්වීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් සමඟ බද්ධ කිරීම විශ්වවිද්‍යාලවල සිදුවන්නේ සෙමිනි. කුසලතා සංවර්ධන ප්‍රතිපත්ති ගැනත් එම

සංකල්පය ගැනත් පැහැදිලිකමක් නැති වීම නිසා මෙන්ම කුසලතා සංවර්ධන වැඩසටහන් ආයතනගත නොකිරීම නිසා, ඒවා විශ්වවිද්‍යාල තුළ ආන්තිකකරණයට ලක්වීමේ ඉඩ කඩ තිබේ.

ගුණාත්මක තත්ත්වය සහ අදාළතාව වර්ධනය කිරීමට නම්, පවත්නා අධ්‍යාපන වැඩසටහන් සහ පාඨමාලා සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම ද අවශ්‍ය වේ. විෂය සමාලෝචන (Subject Review) යාන්ත්‍රණය එවැන්නක් සඳහා ගෙන ඇති පියවරකි. එහෙත් එයින් ලබා ඇති ප්‍රගතිය, විශ්වවිද්‍යාල සහ පීඨ අතර තිබෙන්නේ සමාන මට්ටම්වලින් නොවේ.

ප්‍රථම උපාධි අධ්‍යාපනයේ දී කුසලතා සහ ආකල්ප සමඟ දැනුම සම්බන්ධ කිරීම, විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය සහ අදාළතාව වැඩි දියුණු කිරීම ඉලක්ක කරගත් වර්තමාන න්‍යාය පත්‍රයේ මූලික අවශ්‍යතාවකි. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මේ සඳහා විවිධ පියවර ගෙන ඇතත්, කුසලතා වර්ධනය ඉගැන්වීමේ පාඨමාලා සමඟ බද්ධ කිරීමට විශ්වවිද්‍යාල තවමත් දක්වන්නේ මැළිකමකි. කුසලතා සංවර්ධන ප්‍රතිපත්ති මෙන්ම එම සංකල්පය පිළිබඳව ද පවත්නා අපැහැදිලි බව නිසා සිදු වන්නට ඉඩ තිබෙන්නේ, දැනටම ගෙන ඇති පියවර විශ්වවිද්‍යාලයන්හි ආන්තිකකරණයට භාජනය වීමයි.

ගුණාත්මකභාවය සහ අදාළතාව වැඩි දියුණු කිරීමට නම්, දැනට පවත්නා අධ්‍යයන වැඩසටහන් සහ පාඨමාලා සමාලෝචනය සහ සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය වේ. විෂය සමාලෝචන (Subject Review) යාන්ත්‍රණය විසින් එවැන්නක් දැනටම ආරම්භ කරනු ලැබ ඇත. එහෙත් විශ්වවිද්‍යාල සහ පීඨ අතර එය ලබා ඇති ප්‍රගතිය පවතින්නේ අසමාන තත්ත්වයකය.

**රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල ගුණාත්මකභාවය සහතිකකරණය සහ ප්‍රතීතනය සඳහා ප්‍රතිපත්ති යෝජනා**

**තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය**

***ප්‍රතිපත්ති කරුණ 43 :***

මෑතකදී ආරම්භ කරන ලද මෙන්ම දැනට පවත්නා රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශවලට අයත් සියලු විශ්වවිද්‍යාලවල සහ ආයතනවල තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතන ක්‍රියාවලිය සඳහා මඟපෙන්වීමත් අධීක්ෂණයත් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පිටත පිහිටුවන ලද ස්වාධීන ආයතනයක අවශ්‍යතාව මතු වී තිබේ.

***ප්‍රතිපත්තිය 43 :*** ස්වාධීන තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන කොමිෂන් සභාවක් පිහිටුවිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග**

- තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන කොමිෂන් සභාව පිහිටුවීම සඳහා දැනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට ඇති පනත් කෙටුම්පත කඩිනමින් සම්මත කිරීම.

- තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන කොමිෂන් සභාවේ සාමාජිකයින්, උසස් අධ්‍යාපන අමාත්‍යවරයාගේ නිර්දේශ මත ජනාධිපතිතුමා විසින් පත් කරනු ලැබීම.

- වෘත්තිකයන්ගේ සංගම්වල තෝරාගත් නියෝජිතයින් කොමිෂන් සභා සාමාජිකයින් ලෙස පත් කිරීම.

- උසස් අධ්‍යාපන ආයතන ප්‍රදානය කරන එක් එක් සුදුසුකම් ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව සමග ගැළපීම මගින්, ආයතන අතර සංචලතාවට ඉඩ සැලසීම.

- ලියාපදිංචි වී නැති සහ / නැතහොත් ප්‍රතීතනය ලැබී නැති උසස් අධ්‍යාපන ආයතන උපාධි සහ සුදුසුකම් පිරිනමන්නේ නම්, ඒවාට නඩු පැවරීමේ විධිවිධාන පනතට ඇතුල් කිරීම.

- සියලු තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන වැඩසටහන් කොමිෂන් සභාව විසින් අධීක්ෂණය සහ නියාමනය කිරීම.

**විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම (Ranking)**

***ප්‍රතිපත්ති කරුණ 44 :***

විශ්වවිද්‍යාලයක් ලෝක මට්ටමෙන් ශ්‍රේණිගත කිරීම, සංසන්දනය සඳහා ප්‍රයෝජනවත්ය. බහුවිධ ශ්‍රේණිගත කිරීම (Multi-Ranking) මිණුම් සළකුණු කිරීම (Bench Marking) වැඩසටහන් සමාලෝචනය (Programme Reviewing) සහ ඇගයීම (Assessing) විශ්වවිද්‍යාල අතර අසමානතා, එක් එක් විශ්වවිද්‍යාලවල සිටින සිසුන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය සහ අසමානතා අහෝසි කිරීමේ මාර්ග හඳුනා ගැනීමට බෙහෙවින් ප්‍රයෝජනවත් ය.

***ප්‍රතිපත්තිය 44 :*** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, තත්ත්ව සහතිකකරණ ප්‍රතීතන කවුන්සිලය සහ තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන ස්ථාවර කමිටුව විසින් රාජ්‍ය සහ රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම සඳහා වූ ජාතික ඇගයීම් මිණුම් දඬු සහිත රාමුවක් ගොඩනැඟිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා රාජ්‍ය සහ රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලවල තත්ත්ව සහතිකකරණ ස්ථාවර කමිටු, තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන කවුන්සිලයේ මඟ පෙන්වීම යටතේ, රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන ශ්‍රේණිගත කිරීම සඳහා ජාතික ඇගයීම් රාමුවක් සකස් කිරීම.

- ක්‍රියාත්මක වී ඇති වසර ගණන, යටිතල පහසුකම්, පර්යේෂණ, අදාළතාව, උපාධි පාඨමාලාවල ගුණාත්මක තත්ත්වය, ප්‍රමිතීන් සහ උපාධිධාරීන්ගේ රැකියා ලැබීමේ හැකියාව වැනි සාධක එම මිණුම් දඬුවලට ඇතුළත් කිරීම.

- ශ්‍රේණිගත කිරීමේ රාමුවක අවශ්‍යතාව පිළිබඳව රාජ්‍ය සහ රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලවල කාර්ය මණ්ඩල දැනුම්වත් කිරීම සඳහා ජාතික මට්ටමේ අවබෝධතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

*විශ්වවිද්‍යාල ඉගැන්වීම් තක්සේරු කිරීම*

*ප්‍රතිපත්ති කරුණ 45 :*

ජනතාව ද, සේවායෝජකයන් ද විශ්වවිද්‍යාලවලින් අපේක්ෂා කරන්නේ උසස් ගුණාත්මක තත්ත්වයක් ඇති උපාධිධාරීන් බිහි කරන ලෙසය. උපාධිධාරීන්ගේ ගුණාත්මභාවය රඳා පවතින්නේ ආචාර්යවරුන්ගේ දායකත්වය සහ කැප කිරීම මත නිසා, එවැනි උපාධිධාරීන් බිහි කිරීමේදී විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට වැදගත් මෙහෙයක් ඉටු කිරීමට සිදුවේ. දැනට තිබෙන ක්‍රමය යටතේ, පන්ති කාමරයේ ඵලදායී ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය නිර්මාණය කර ගැනීමටත්, උපාධි අපේක්ෂකයින් අතර ඉගෙනීම ප්‍රවර්ධනය කිරීම සඳහාත් නිදහස ආචාර්යවරුන්ට තිබේ. එහෙත් ආචාර්ය මණ්ඩලයේ කාර්ය සාධන තක්සේරු කිරීමේ අංග සම්පූර්ණ මාර්ගෝපදේශ සහ ක්‍රියාපටිපාටි දැනට නැත.

*ප්‍රතිපත්තිය 45:* තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන කවුන්සිලය රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල ආචාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය මත පදනම් වූ ඇගයීම් රාමුවක් සකස් කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන කවුන්සිලය රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල ආචාර්ය මණ්ඩලය සඳහා කාර්ය සාධනය මත පදනම් වූ ඇගයීම සඳහා මූලික රාමුවක් (Basic Framework) සකස් කිරීම.

- වැඩ ප්‍රමාණය, පර්යේෂණ දායකත්වය, ජාතික සහ ජාත්‍යන්තර දායකත්වය, තමාගේම පුද්ගලික ප්‍රගති සැලසුම්, ශිෂ්‍ය ප්‍රතිපෝෂණ, නිර්මාණාත්මක ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම, සහ නව තාක්ෂණය භාවිතා කිරීම වැනි සාධක ඇගයීම් රාමුවට ඇතුළත් කිරීම.

- එක් එක් ආයතනයේ සුවිශේෂ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි, ආචාර්ය මණ්ඩලය ඇගයීමේ මූලික රාමුවට වෙනස්කම් ඇති කර සංශෝධනය කර ගැනීමේ විකල්පය, රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවලට ලබා දීම.

- කාර්ය සාධනය මත පදනම් වූ ඇගයීම් පද්ධතියක් යොදා ගනිමින්, තම ආයතනයේ ඇති ප්‍රමුඛතා සහ අවශ්‍යතාවන්ට අනුකූලව, තම ආචාර්යවරුන්ට, ප්‍රසාද ත්‍යාග (Rewards) පිළිගැන්වීමට රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන කටයුතු කිරීම.

ආචාර්යවරුන් බඳවා ගැනීම

*ප්‍රතිපත්ති කරුණ 46 :*

ආචාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සිදු කිරීමේ නිසි විධි ක්‍රමයක් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල දැනට නැත.

*ප්‍රතිපත්තිය 46 :* තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන කොමිෂන් සභාව විසින්, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල ආචාර්ය මණ්ඩලය බඳවා ගැනීම පිළිබඳ ප්‍රමිතීන් නියම කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය**

- තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන කොමිෂන් සභාව, තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන ස්ථාවර කමිටුව සමග එක්ව, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සඳහා ආචාර්ය මණ්ඩලයේ එක් එක් මට්ටමට ගැලපෙන බඳවා ගැනීමේ රාමුවක් සකස් කිරීම.

**උසස් අධ්‍යාපන ආයතන තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන කවුන්සිලය සමග ලියාපදිංචි කිරීම**

***ප්‍රතිපත්ති කරුණ 47 :***

ශාස්ත්‍රාලීය නිදහස (Academic Autonomy) සහ විවිධාංගීකරණය පිළිබඳව උසස් අධ්‍යාපන ප්‍රතිපත්තිය ලිබරල්කරණය යටතේ පුළුල් ලෙස සාකච්ඡා කෙරෙන නමුදු, රාජ්‍ය සහ රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් ශාස්ත්‍රාලීය නිදහස සහ රාජ්‍ය නියාමනය අතර සමබරතාවයක් පවත්වා ගැනීම අවශ්‍ය වේ.

***ප්‍රතිපත්තිය 47 :*** රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල අවම ප්‍රමිතීන් පවත්වාගෙන යනු පිණිස ආයතනික ප්‍රතීතනය සහ පාඨමාලාවලට අනුමැතිය අනිවාර්යෙන් ලබා ගැනීම අවශ්‍ය යැයි තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන කොමිෂන් සභාව විසින් නියම කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- පහත සඳහන් පැතිකඩ, ප්‍රතීතන මිණුම් දඬුවලට එක් කිරීම: මනා පරිපාලනය, කළමනාකරණය, ආචාර්ය මණ්ඩලය, ආචාර්ය-ශිෂ්‍ය අනුපාතය, මූල්‍ය ස්ථායීතාව, ඉඩම් සහ ගොඩනැගිලිවලට ඇති හිමිකම් ඇතුළු භෞතික සම්පත් වල හිමිකම, තත්ත්ව සහතිකකරණ භාවිත, සහ පළ කරන ලද පර්යේෂණ.

- එක් එක් රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයක් තම ආයතනික ප්‍රතීතනය අවුරුදු 5 කට වරක් අලුත් කිරීම සහ පාඨමාලා ප්‍රතීතනය (Programme Accreditation) අවුරුදු 3 සිට 5 දක්වා කාලයක් තුළ අලුත් කිරීම.

**පාඨමාලා සංශෝධනය කිරීම**

***ප්‍රතිපත්ති කරුණ 48 :***

රාජ්‍ය විශ්වවිද්‍යාල බොහොමයකම ඇති ඉගැන්වීමේ වැඩසටහන්වලින් උපාධිධාරීන්ට රැකියා ලබා ගැනීමේ කුසලතා වර්ධනයට වඩා දැනුම ලබා දීමට වැඩි අවධානයක් යොමු කෙරේ.

***ප්‍රතිපත්තිය 48 :*** රාජ්‍ය විශ්වවිද්‍යාල තමන් බිහි කරන උපාධිධාරින්ගේ ආර්ථික සහ සමාජයීය අදාළතාවය ගැන ප්‍රමාණවත් අවධානයක් යොමු කරමින් දැනට තිබෙන පාඨමාලා සංශෝධනය කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක් සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයක්ම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන කවුන්සිලය විසින් සකස් කර තිබෙන, ප්‍රථම උපාධි පාඨමාලා සමාලෝචනය කිරීමේ අත් පොතට අනුව ක්‍රියාත්මක කරමින්, තම පාඨමාලා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට (SLQF) අනුකූලව සමාලෝචනය කිරීම.

- විශ්වවිද්‍යාල අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ ඒකක, අවශ්‍ය අවස්ථාවලදී කර්මාන්ත අංශයේ ද සහභාගිත්වය ඇතිව, ආචාර්යවරුන් පාඨමාලා සකස් කිරීමට පෙර, පාඨමාලා සංශෝධනය පිළිබඳ වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම.

- අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ ඒකක, තම උපාධි අපේක්ෂකයින්ට, කර්මාන්ත අංශයේ දැනට තිබෙන අවශ්‍යතා පිළිබඳව අවබෝධයක් ලැබෙන පරිදි, ආධුනික පුහුණුවක් ලබන බව සහතික කිරීම.

**ඉගැන්වීමේ විධික්‍රමවල පරිවර්තනය**

***ප්‍රතිපත්ති කරුණ 49 :***

විශ්වවිද්‍යාලවල සාම්ප්‍රදායිකව පැවති ඉගැන්වීමේ විධික්‍රම දැන් අවසානයකට පැමිණෙමින් තිබේ. විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව ඉහළ යාම නිසා ඇතිවී තිබෙන විශාල පන්ති, එක් එක් ශිෂ්‍යයකු වෙනුවෙන් වෙන් කෙරෙන සම්පත් ප්‍රමාණය පහළ වැටීම, ඉගැන්වීමේ ගුණාත්මක තත්ත්වය සහ කීර්තිය පිළිබඳව වැඩිවන අවධානය, සන්නිවේදනයට සහ තොරතුරු බෙදා හැරීමට නව තාක්ෂණය බිහිවීම යන මේවා විසින්, විශ්වවිද්‍යාලවල දැනට භාවිත වන ඉගැන්වීමේ විධික්‍රම ප්‍රශ්න කිරීමට භාජනය කරනු ලැබේ. මේ අතර, විශ්වවිද්‍යාල උපාධිධරයන්ට රැකියා වෙළඳපොලට සහ සැබෑ ජීවිතයේ අභියෝගවලට මුහුණදීමට අසමත්වීම ගැන විශ්වවිද්‍යාල නිරන්තර විවේචනයට භාජනය වේ. මේ තත්ත්වයක් බිහිවී තිබෙන්නේ ඉගැන්වීමේ මාධ්‍යයෙන් තම සිසුන් අතර බුද්ධිමය ජීවිතයක් මෙන්ම වෘත්තීය කුසලතා ද ගොඩනැගීමට ආචාර්යවරුන් අසමත් වීමයි. ඉගෙනීමේ අරමුණු වෙනස්වීම සමග ඉගැන්වීමේ විධික්‍රම වෙනස් විය යුතුය.

***ප්‍රතිපත්තිය 49 :*** සිසුන්ට සැබෑ ජීවිතයේ ගැටලු විසඳීමට ඉඩලබා දෙමින්, අව්‍යාජ ඉගෙනීම, ඇගයීම සහ පුද්ගල සංවර්ධනය බද්ධකර ගන්නා සංකීර්ණ ඉගෙනුම් පරිසරයක් සිසුන් සඳහා සැපයිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- සිසුන්ට අදාළ වන සහ ඔවුන් තුළ උනන්දුවක් ඇති කරවන ඉගෙනුම් කාර්යයන් පැවරීම.

- සමාජය සමග ගනුදෙනු කිරීමට අවකාශ සපයන ඉගෙනුම් කාර්යයන් සැපයීම.

- අව්‍යාජ ඉගෙනුම් මෙවලම් සකස් කිරීම සඳහා එක් එක් විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාල එකතුවක හෝ පාඨමාලා සංවර්ධන කේන්ද්‍රයක්/ඉගෙනුම් මෙවලම් සංවර්ධන කේන්ද්‍රයක් පිහිටුවීම.

- පන්ති කාමරයෙන් පිටත ඇති ඉගැන්වීමේ සහ ඉගැනීමේ සම්පත් භාවිත කිරීම.

- තාක්ෂණයේ අධාර ලබන ඉගැන්වීමේ ක්‍රම හඳුන්වා දීම.

- තාක්ෂණය මත පදනම් වූ ඉගැන්වීම, මුද්‍රිත, ශ්‍රව්‍ය සහ දෘශ්‍ය ඉගැන්වීමේ මෙවලම් නිර්මාණය කිරීම, වැඩිහිටි ශික්ෂණ විද්‍යාව සහ නිර්මාණශීලී ඇගයීම් විධික්‍රම වැනි නව විධික්‍රම සඳහා ආචාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව සැපයීම.

**විශ්වවිද්‍යාලවල ඇගයීම**

***ප්‍රතිපත්ති කරුණ 50 :***

විශ්වවිද්‍යාලවල ඇගයීමේ ක්‍රමය, ලංකාවේ අධ්‍යාපනයේ තිබෙන අඩුවෙන් අවධානය යොමුවී ඇති ක්ෂේත්‍රයකි. ඉගැන්වීමේ ක්‍රියාවලියත් සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩා ඉහළ තත්ත්වයට පත්කිරීම සඳහා ඇගයීම වටිනා ආධාරකයකි. අපේක්ෂිත ඉගෙනුම් ඵල අත්පත් කර ගැනීම අරමුණු කරගත් ඵලදායී ඇගයීම් ක්‍රමයක්, උසස් අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය සහතික කිරීමට නිශ්චිත වශයෙන්ම දායක වනු ඇත.

දැනට පවත්නා ඇගයීම් ක්‍රමය අතිශයින්ම විභාගවලට යොමු වූ, සීමිත කාලයක් තුළ සිදු කරන සහ නිශ්චිත ඉගෙනුම් ක්ෂේත්‍රවලට පමණක් සීමා වූවකි. මේ ක්‍රමය නිසා නිර්මාණාත්මක සහ විචාරාත්මක චින්තනයටත්, ජීවිතය පුරා ලබා ගන්නා ඉගෙනුමකටත් පදනම වැටෙන්නේ නැත. ඇගයීම යොදා ගන්නේ, යම්කිසි විෂයයක් සම්බන්ධව සිසුන් ලබාගෙන ඇති දැනුම සහ අවබෝධයත්, එම දැනුම භාවිතා කිරීමේ හැකියාවත් මැන ගැනීම සඳහා පමණි. එය යොදා ගන්නේ සිසුන්ට ලකුණු දීමට විනා සිසුන්ට තමන් නිවැරදි කර ගැනීමට ප්‍රතිපෝෂණ ලබා දීමට නොවේ.

පාඨමාලාවලින් අපේක්ෂා කරන විවිධ ඉගෙනුම් ඵලවල පුළුල් රාමුව සහ ස්වභාවය ග්‍රහණයකර ගැනීමට සම්ප්‍රදායික ඇගයීම් ක්‍රම අසමත්වී තිබේ. එම ක්‍රමය සිසුන් සම්බන්ධකර ගන්නේ ඉගැන්වීමේ සහ ඉගෙනීමේ ක්‍රියාවලිය තුළදී මිස, ඇගයීම් ක්‍රියාවලිය තුළදී නොවේ. මේ අතර අද සමාජය ඉල්ලා සිටින්නේ අනම්‍ය ඇගයීමේ ක්‍රියාවලියක් සම්පූර්ණ කළ, නිෂ්ක්‍රීය උපාධිධරයන් නොවේ. සමාජයට අවශ්‍ය වන්නේ තමන්ගේම ඉගෙනුම් ක්‍රියාවලිය, අන්‍යයින්ගේ බලකිරීමකින් තොරව, තමන්ටම කරගත හැකි උපාධිධරයන්ය. සම්මත විභාගගත ශ්‍රේණි සහ ඉහළ සාමාර්ථ, සේවාදායකයින්ගේ සිත පිනවන දේ නොවේ.

***ප්‍රතිපත්තිය 50*** : සිසුන්ගේ ඉගෙනීම දියුණු කිරීම සඳහා ඔවුන් ඉගෙන ගන්නා දේ අපේක්ෂිත ඉගෙනුම් ඵල සමග බැඳුණු යෝග්‍ය සහ නිර්මාණාත්මක ඇගයීම් ක්‍රමයක් උසස් අධ්‍යාපන ආයතන විසින් ගොඩ නගා ගත යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග**

- ඉගෙනගත් දේ ඇගයීමට ලක් කරනවාට වඩා ඉගෙනීම සඳහා ඇගයීම් සිදු කිරීමට වඩාත් අවධානය යොමු කිරීම.

- ක්‍රමවත් සහ අක්‍රමවත් ප්‍රතිපෝෂණ සඳහා අවකාශ සැපයීම.

- සිසුන් සමග සහයෝගයෙන් අව්‍යාජ ඇගයීම් සකස් කිරීම.

- තාක්ෂණයෙන් ශක්තිමත් වූ ඇගයීම් ක්‍රම යොදා ගැනීම.

- දුරස්තර සිසුන් සඳහා ක්ෂණික ප්‍රතිපෝෂණ ලබා දීම සඳහා අන්තර්ජාල (Online) පහසුකම් සැපයීම.

**උසස් අධ්‍යාපන ආයතනවල සමාජ වගකීම.**

***ප්‍රතිපත්තිය කරුණ 51 :***

විශ්වවිද්‍යාල පවතින්නේ හිස් අවශ්‍යතාවයක නොවේ. ඒවායේ ක්‍රියාකාරකම්, පාර්ශ්වකරුවන්, සහ සමාජය ද ඇතුළු සමස්ත වටපිටාවට ද බලපායි.

පොදුවේ බලන විට, විශ්වවිද්‍යාල, දැනුම නිර්මාණය කරන කේන්ද්‍රස්ථාන ලෙසින්, සමාජ ප්‍රශ්න විසඳීමේ ප්‍රධාන කාර්යයක් ද සිදු කරයි. එහෙත් ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල/රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන තම සමාජ වගකීම පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කරන්නේ නැත.

***ප්‍රතිපත්තිය 51:*** විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන තම ඉගෙනුම්-ඉගැන්වීමේ සහ පර්යේෂණ කටයුතුවලට සමාජ වගකීම සමග සම්බන්ධ වන අන්තර්ගතයන් සහ ප්‍රායෝගික ඉගෙනුම් අත්දැකීම් ඇතුළත් කළයුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ ඒකක, අදාළ පීඨ සහ දෙපාර්තමේන්තු සමඟ අදහස් හුවමාරු කර ගනිමින්, තම පාඨමාලාවලට, සමාජ වගකීම හා සම්බන්ධ වන විෂය අන්තර්ගතය සහ ප්‍රායෝගික ඉගෙනුම් අත්දැකීම් ඇතුල් කිරීම.

- සෑම සිසුවෙකුම තම ප්‍රජා සම්බන්ධතා ක්‍රියාකාරකම් (Community Outreach Activities) වලට සම්බන්ධ ලිපිගොනු කවරයක් (Portfolio) පවත්වා ගැනීම.

- ආචාර්යවරුන් සහ සිසුන් සමාජ සේවා කටයුතුවලට සම්බන්ධ වීමට විශ්වවිද්‍යාල විසින් උනන්දු කරවීම.

- විශ්වවිද්‍යාල, පාඨමාලා සහ පර්යේෂණ පිළිබඳව විශ්වවිද්‍යාලවල ඇති කලාපීය අසමානතා පිළිබඳ ගැටලුවලට ආමන්ත්‍රණය කිරීම.

**සම්පත් හවුලේ බෙදා ගැනීම.**

***ප්‍රතිපත්ති කරුණ 52:***

සම්පත් හිඟකමේ ගැටලුවට මුහුණ දී සිටින විශ්විද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන අතර, සම්පත් හවුලේ බෙදා ගැනීමේ යාන්ත්‍රණවල අවශ්‍යතාවය පවතී.

*ප්‍රතිපත්තිය 52 :* විශ්වවිද්‍යාල මුහුණ දෙන සම්පත් හිඟකමේ ගැටලුවට විසඳුමක් ලෙස සහ විශ්වවිද්‍යාල අතර ඇති අසමානතා අඩු කිරීම අරමුණු කරගෙන, ඒවාට ලැබෙන සම්පත් බෙදා ගැනීමේ ක්‍රම ඇති කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- භූගෝලීය වශයෙන් එකිනෙකට ආසන්නව පිහිටා තිබෙන, සම්පත් අතින් විවිධ මට්ටම්වල සිටින විශ්වවිද්‍යාල තුනක් හෝ හතරක් එකතු වී විශ්වවිද්‍යාල සංසදයක් (Consortium) පිහිටුවා ගැනීම.

- සංසදයේ සාමාජික විශ්වවිද්‍යාල, විශ්වවිද්‍යාල අතර සම්බන්ධීකරණ යාන්ත්‍රණය සකස් කිරීම.

**අධ්‍යාපනය සැපයීමේ සමතාව**

***ප්‍රතිපත්ති කරුණ 53 :***

ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීමේ සංඛ්‍යාව සීඝ්‍ර ලෙස ඉහළ යාමත්, අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල ප්‍රමාණය පුළුල් වීමත් නිසා නූතන විශ්වවිද්‍යාලවලින් අපේක්ෂා කළ යුතු ජීවන තත්ත්වයක් සහ අධ්‍යාපනයේ ගුණාත්මකභාවයත්, විෂමතා රහිතව පවත්වාගෙන යා හැකි භෞතික සහ සමාජීය පරිසරයක් ගොඩ නඟා පවත්වා ගැනීමත් උදෙසා දැනට විශ්වවිද්‍යාල සතු ශක්‍යතාවට විශාල බලපෑමක් එල්ල වෙමින් තිබේ.

*ප්‍රතිපත්තිය 53:* විශ්වවිද්‍යාල අතර ගුණාත්මක තත්ත්වය පිළිබඳ සමතාවක් (Equity) පවත්වා ගැනීම සහතික කිරීම සඳහා තිබිය යුතු අවම ප්‍රමිතීන්, උපමාන සහ භෞතික අවශ්‍යතා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සකස් කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- විශ්වවිද්‍යාල අතර අසමානතා වැළැක්වීම පිණිස ශිෂ්‍ය සංඛ්‍යාවන් මත පදනම්ව, විශ්වවිද්‍යාලවල පවත්වාගෙන යා යුතු භෞතික අවශ්‍යතාවල අවම ප්‍රමිතීන් සහ උපමාන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සකස් කිරීම.

# 08 පරිච්ඡේදය

## අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සංවර්ධනය

අධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සිදු කෙරෙන්නේ, ප්‍රථම උපාධි සුදුසුකම් සහිත අපේක්ෂකයින් තාවකාලික කථිකාචාර්යවරුන් ලෙස බඳවා ගැනීමෙනි. මෙය, ඉහළ මට්ටමේ පශ්චාද්-උපාධි පුහුණුව සහිත ආචාර්යවරුන් බඳවා ගැනීමට ඉඩ නොතබන යල්පැනගිය භාවිතයකි. ප්‍රථම උපාධිය සහිතව බඳවා ගනු ලැබූ බොහෝ ආචාර්යවරු, ආචාර්ය උපාධි සුදුසුකම් ලබා ගැනීමට අවකාශ හෝ කැපවීමක් හෝ නොමැතිව ශාස්ත්‍රපති/විද්‍යාපති උපාධියක් පමණක් ලබාගෙන එකතැන රැඳී සිටිති. පර්යේෂණ සඳහා සීමිත අවකාශ සහිතව මෙන්ම ගුණාත්මක තත්ත්වයෙන් දුර්වල ප්‍රකාශන මත පදනම්ව, සමහරක් දෙනා මහාචාර්ය ධුරයට පවා උසස් වීම් ලබා ගෙන සිටිති. මේ තත්ත්වය රාජ්‍ය විශ්වවිද්‍යාලවල මැද මට්ටම්වල සිටින ආචාර්ය මණ්ඩලයේ බොහෝ දෙනා අතර ගුණාත්මක තත්ත්වය, ප්‍රමිතීන් සහ වෘත්තිකත්වය පිළිබඳ බරපතළ පරිහානියකට තුඩු දී ඇත.

විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට උස්සවීම් ලබා ගැනීම දැන් ඉතා පහසුය.  සහාය මහාචාර්ය සහ මහාචාර්ය ධුරවල උසස්වීම් ලබා දීම පාලනය කරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 916 දරන චක්‍රලේඛනය අවභාවිතා කිරීමට ලක් වී ඇති අතර, එය නැවැත්වීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කිසිදු පියවරක් නොගැනීම නිසා සිදු වී තිබෙන්නේ සුදුසුකම් සපුරා නැති ආචාර්යවරුන් පහසුවෙන් මහාචාර්යවරුන් බවට පත්වීමයි. එම තුල්‍ය සමාලෝචනයට (Peer-Review) භාජනය නොවූ ලේඛන කොල්ලකාරී සඟරා (Predatory Journals) වලත්, එවැනි ග්‍රන්ථ තමන් විසිනුත් මුද්‍රණයෙන් පළකර ගැනීමේ බොහෝ සේ ව්‍යාප්ත වී ඇති පුරුද්ද නිසා මේ තත්ත්වය තවත් උග්‍ර වී ඇත.

විශ්වවිද්‍යාල පද්ධතිය තුළ මානව සම්පත් සංවර්ධනය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නෛතික වගකීම්වලින් එකකි. මෙම අනිවාර්ය වගකීම ඉටු කරනු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, 20/02/2003 දරන අංක 820 චක්‍රලේඛය සහ 10/12/2010 දරන චක්‍රලේඛය මගින් කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන (Staff Development Centers) සෑම විශ්වවිද්‍යාලයකම පිහිටුවා ඇත. අධ්‍යයන සහ අනධ්‍යයන යන සියලු අංශවල කාර්ය මණ්ඩල ආවරණය කරමින්, විශ්වවිද්‍යාලවල මානව සම්පත් වර්ධනය ඉලක්ක කරගත් වැඩසටහනක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා වූ ස්ථාවර කමිටුව විසින් සකස් කරනු ලැබ ඇත. ආචාර්ය මණ්ඩලයේ සේවා ආරම්භ කිරීම සඳහා පුහුණු අත්පොතක් ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සකස් කර දී තිබේ.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන මාර්ගයෙන් ඉටු කිරීමට අපේක්ෂා කෙරෙන්නේ පහත සඳහන් අරමුණුය. (අ) විශ්වවිද්‍යාලයේ අරමුණු සහ අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට සහායවීම (ආ) කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය ශක්තිමත් කිරීම (ඇ) කාර්ය මණ්ඩලය අතර ඇති රැකියාවෙන් ලබන තෘප්තිය පවත්වාගෙන දියුණු කිරීම, (ඈ) නව වෙනස්කම් ආරම්භ කිරීමට සහ ඒවාට සාධනීය ලෙස ප්‍රතිචාර දැක්වීමට හැකි වන පරිදි කාර්ය මණ්ඩලයේ හැකියාවන් වර්ධනය කිරීම, (ඉ) සංවිධානමය ඵලදායීතාව සහ කාර්ය ශූරත්වය පවත්වාගෙන දියුණු කිරීම සහ (ඊ) කාර්ය මණ්ඩලය මානුෂික වටිනාකම්, සාධනීය ආකල්ප, කණ්ඩායම් හැඟීම්, සහ වැඩ කිරීමේ සංස්කෘතිය යනාදියෙන් පොහොසත් කිරීම යන මේවායි.

"උසස් අධ්‍යාපනයේ ඉගැන්වීම් සහතික පාඨමාලාවක්" විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් හඳුන්වා දී ඇත. ආචාර්ය මණ්ඩලයට අලුතෙන් බැඳෙන ගුරුවරුන්ට මෙම සහතික පත්‍ර පාඨමාලාව

සාර්ථකව අවසන් කිරීම ඔවුන්ගේ සේවා ස්ථිරත්වය ලබා ගැනීම සඳහා අනිවාර්ය බව ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ප්‍රකාශ කොට ඇත.

කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්වල වැඩි අවධානය දැනට යොමු වන්නේ අලුතෙන් බඳවා ගනු ලබන කාර්ය මණ්ඩලය සඳහා ය. කොළඹ විශ්වවිද්‍යාලය, සෑම අවුරුදු දෙකකට හෝ තුනකට වරක් උසස් අධ්‍යාපනයේ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් ප්‍රතීතනය කිරීමේ පාඨමාලාවක් පවත්වාගෙන යයි. මෙම පාඨමාලාවේ කාලය දවස් දොළසකි. එය හය මාසයක කාලයක් පුරා වරින් වර පැවැත්වේ.

විශ්වවිද්‍යාල පද්ධතියේ ම ඇති කළමනාකරණයේ සහ සේවා සැපයීමේ කාර්යක්ෂමතාව දියුණු කිරීම, උසස් අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය දියුණු කිරීමට අවශ්‍ය ප්‍රධාන අංගයක් බව දැනට හඳුනාගෙන තිබේ. පරිපාලන කාර්ය මණ්ඩලයට සුදුසු වාතාවරණයක් සපයන වැඩ පරිසරයක් පවත්වාගෙන යාමේ ප්‍රයත්න, සම්පත් වලින් සම්පූර්ණ පරිසරයක් පවත්වා ගැනීමට පමණක් නොව, එම කාර්ය මණ්ඩලයේ පුහුණුව සහ අඛණ්ඩ වෘත්තික වර්ධනය සඳහා ද අත්‍යවශ්‍ය වේ. වැඩ ලෝකයට හුරු කිරීමක් සිදු නොවීම සහ සියලුම විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට නීතිරීති, රෙගුලාසි, ක්‍රියාපටිපාටි යනාදිය ගැන නිසි ආරම්භක පුහුණුවක් (Induction Training) නොලැබීම යන මේවා පරිපාලක, ආධාරක සහ කළමනාකරණ කාර්ය මණ්ඩලය අතර පවත්නා අලස සහ අකාර්යක්ෂම වැඩ කිරීමේ සංස්කෘතියට හේතු සාධක ලෙස ද හඳුනා ගෙන තිබේ.

මාණ්ඩලික මට්ටමේ නිලධාරීන් බොහෝ දෙනා තම මනෝචාලක කුසලතා (Psychomotor Skills) ලබා ගන්නේ තැත් වරද ක්‍රමය (Trial and Error Method) මගින් එදිනෙදා නිල රාජකාරී ඉගෙන ගැනීමෙන් සහ, කලින් සිටි නිලධාරීන්ගේ ආදර්ශය අනුගමනය කිරීමෙනි. මෙයින් සිදු වන්නේ, නරක පුරුදුවලට ඇබ්බැහි වීමයි. දැනුම මඳබව නිසාත්, දුර්වල ආකල්ප නිසාත්, පරිපාලන නිලධාරීන් බොහෝ විට කරන්නේ තමන්ට අදාළ කරුණු වලදී නිවැරදි තීරණ නොගැනීමයි. නව පරිපාලන තනතුරු බිහි කිරීම මගින් පරිපාලනය සහ ආධාරක කාර්ය මණ්ඩලයේ වගකීම් සහ කාර්ය භාරය විමධ්‍යගත කර තිබුණ ද, පරිපාලන කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව සහ ගුණාත්මක තත්ත්වය අපේක්ෂිත මට්ටම්වලට ළඟා වී නැත.

බොහෝ විශ්වවිද්‍යාලවල මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය ද සහිත කළමනාකරණ පීඨ තිබේ. එහෙත් විශ්වවිද්‍යාල බලධාරීන්, තම කාර්ය මණ්ඩල සංවර්ධනයේ මානව සම්පත් අංශ දියුණු කිරීම සඳහා මෙම පීඨවල සේවය ලබාගෙන නැත.

මේ අතර විශ්වවිද්‍යාලවල සේවය කරන අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව සීඝ්‍ර ලෙස ඉහළ ගොස් තිබේ. ඒ හැර බොහෝ සේවාවන් පිටත පුද්ගලික සේවා සපයන්නන්ට කුලියට දී තිබේ. පවත්නා ඇබෑර්තු සංඛ්‍යාව මෙන් ම අවශ්‍ය වන විශේෂඥ හැකියාවන් ද නොතකා, අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිවෙළක් නොමැතිව සේවයට බඳවා ගැනීම පෙරදා සිට පවතින භාවිතයකි. සමහර සේවාවන්ට දැන් නිලධාරීන් බඳවා ගන්නේ අභියෝග්‍යතා පරීක්ෂණවලින් පසුව වුව ද, බඳවා ගන්නා අයට තිබෙන කුසලතා තිබෙන්නේ අවශ්‍ය ප්‍රමාණයට බෙහෙවින් පහළ මට්ටම්වල ය. ඒ සමගම, බොහෝ ශ්‍රේණිවල අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට නිතිපතා වැඩ කරද්දී පුහුණුවීම් ලැබෙන්නේ ඉතා සීමිතව ය. නිර්මාණශීලීත්වය සහ වෘත්තික හා පෞද්ගලික සංවර්ධනයට අවස්ථා නොමැති වීමත්, ඉහළ කාර්ය සාධනය අගය කිරීමට ක්‍රමයක් නොතිබීමත් නිසා, කාර්ය මණ්ඩලයේ ඉහත දැක් වූ ආකාරයේ දුර්වලතා වඩාත් බරපතල වී තිබේ.

උසස් අධ්‍යාපන ආයතනවල සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය තම සගයින්ටත් සිසුන්ටත් "ආදර්ශ චරිත" විය යුතු ය යන්න මහජනතාව අතර පොදුවේ පවත්නා අදහසකි. ආචාර්ය මණ්ඩලයට සුවිශේෂ වෘත්තික ප්‍රජාවක් බවට පත්වන්නට නම් සහ නැතිවම බැරි මෙන්ම ආදේශ කළ නොහැකි වෘත්තීය ප්‍රභේදයක්

වන්නට නම්, චර්යා ධාර්මික හැසිරීමක් සමග ඉහළ මට්ටමේ වෘත්තීය ගුණාත්මක තත්ත්වයක්, කැප කිරීමක්, විශිෂ්ඨත්වයක් සහ ශාස්ත්‍රීය කාර්ය සාධනයක් පවත්වාගෙන යා යුතුව තිබේ. එසේ වුවත්, මෑතදී ලැබී ඇති වාර්තා සහ වාචික තොරතුරු වලින් පෙනී යන්නේ, සේවයට නිතිපතා නොපැමිණීම, කොල්ලකාරී වාර සංග්‍රහවල ලිපි පල කිරීම, ග්‍රන්ථ ස්වයං ප්‍රකාශනයේ යෙදීම, ව්‍යාජ උපාධි සහතික ඉදිරිපත් කිරීම, පර්යේෂණ වලදී අවංක නොවීම, පර්යේෂණ දීමනාව සහ අරමුදල් අවභාවිතා කිරීම, සහ උසස්වීම් ලබා ගැනීමේ දී වංචාකාරී භාවිතාවල යෙදීම යනාදියෙන් සමන්විත නිශේෂධනීය ශාස්ත්‍රාලීය සංස්කෘතියක් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් අතර ගොඩනැඟී තිබෙන බවයි.

මෙම පසුබිම තුළ විශ්වවිද්‍යාල අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල අතර තම වෘත්තීකභාවයේ ඇති සීඝ්‍ර පිරිහීම පිළිගැනීමට ලක් වී නැති ගැටලුවකි. ආචාර්ය මණ්ඩලය අතර සිදු වී ඇති මෙම වෘත්තිකභාවය පරිහානියට පත් වීමේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ ශාස්ත්‍රාලීය සහ බුද්ධිමය අවංකභාවය පිළිබඳ සාම්ප්‍රදායි සංස්කෘතිය බාදනයට ලක් වීමයි. උපකුලපති, පීඨාධිපති, ආයතනවල අධ්‍යක්ෂ ධූර, සහ විශ්වවිද්‍යාල පාලක සභා සාමාජිකත්වය, යන ධූරවලට පත් කිරීම් සිදු කිරීමේදීත්, ආචාර්ය මණ්ඩල තනතුරුවල උසස්වීම් ලබා ගැනීමේදීත් සිදු වන සාතිශය දේශපාලනීකරණය සහ පර්යේෂණ කිරීමේදීත් ශාස්ත්‍රීය ප්‍රකාශන සිදු කිරීමේදීත් සිදුවන වංචනිකභාවය යන දුර්ගුණ දැන් ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රාලීය සංස්කෘතියේ සාමාන්‍ය දෙයක් බවට පත් වී තිබේ.

**අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති යෝජනා**

**බඳවා ගැනීමේ මිණුම් දඬු**

***ප්‍රතිපත්ති කරුණ 54 :***

දැනට උසස් අධ්‍යාපන ආයතනවල බොහෝ පත්වීම්, විශේෂයෙන් අනධ්‍යයන කාර්ය මණ්ඩලවල පත්වීම්, සිදු වන්නේ පැහැදිලි මාර්ගෝපදේශන වලින් තොරවය. තෝරා ගැනීමේ මිණුම් දඬු ලෙස සහතික පත්‍ර සුදුසුකම් කවරේදැයි දක්වා තිබුණ ද, 21 වැනි සියවසේ කුසලතා දැනට සැලකිල්ලට ගැනෙන්නේ නැත. සේවයට බඳවා ගන්නා අවස්ථාවේදී ම, "හොඳම තෝරා ගැනීම්" සිදු කරන්නේ නම්, අලුතෙන් බඳවා ගනු ලැබූ කාර්ය මණ්ඩලවල හැකියාවන් තවත් වර්ධනය කිරීමට උසස් අධ්‍යාපන ආයතනවල කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානවලට හැකි වනු ඇත.

***ප්‍රතිපත්තිය 54 :*** උසස් අධ්‍යාපන ආයතනවල සියලුම කාර්ය මණ්ඩල ප්‍රභේදයකම බඳවා ගැනීමේ නිර්ණායක විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වැඩිදියුණු කිරීම හා ස්ථාපනය කිරීම.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය**

- අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන යන සියලුම කාර්ය මණ්ඩල ප්‍රභේදවලට අදාළ වන දැනට පවත්නා බඳවා ගැනීමේ පටිපාටි වැඩි දියුණු කිරීම සඳහා, එක් එක් අංශයක බඳවා ගැනීමට අවශ්‍ය පැහැදිලි මිණුම් දඬු නියම කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පියවර ගැනීම.

ආරම්භක වැඩසටහන්

*ප්‍රතිපත්ති කරුණ 55 :*

රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල ආධුනික අධ්‍යයන කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා දැනට යොදා ගන්නේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2012 දී නිකුත් කළ "ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආරම්භන වැඩසටහන" යන පුහුණු කිරීමේ අත්පොත යි. මේ අත්පොත කිසිදු සංශෝධනයකට භාජනය වී නොමැත.

*ප්‍රතිපත්තිය 55 :* විශ්වවිද්‍යාල පද්ධතියේ සිටින සියලුම කාර්ය මණ්ඩල සඳහා (පරිවාස සහ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන්, අනධ්‍යයන සහ කළමනාකරණ කාර්ය මණ්ඩලය) සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නව සහ අංග සම්පූර්ණ කාර්ය මණ්ඩල සංවර්ධන වැඩ සටහන් සකස් කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උසස් අධ්‍යාපන ආයතනවල, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානවල පරිපාලකයින් ලෙස කටයුතු කර ඇති හෝ දැනට කටයුතු කරන ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන්ගෙන් සමන්විත වන මඩුල්ලක් නව සහ යාවත්කාලීන කරන ලද ආරම්භක වැඩසටහනක් සංවර්ධනය කිරීම සඳහා නම් කිරීම.

අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ආරම්භක වැඩසටහනක් (Induction Programme)

*ප්‍රතිපත්ති කරුණ 56 :*

"අධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා වූ ආරම්භක වැඩසටහන" සම්පූර්ණ කිරීම දැනට රාජ්‍ය විශ්වවිද්‍යාලවල පරිවාස කාලයේ සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලයට තම තනතුරුවල ස්ථිර පත්වීම් ලබා ගැනීම සඳහා අනිවාර්ය අවශ්‍යතාවයකි. එහෙත්, උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන නොවන කාර්ය මණ්ඩලවලට එවැනි අනිවාර්ය අවශ්‍යතාවක් දැනට නොමැත.

*ප්‍රතිපත්තිය 56 :* අනධ්‍යයන කාර්ය මණ්ඩලයට තම පත්වීම ස්ථිර කර ගැනීම සඳහා ආරම්භක වැඩසටහන් සම්පූර්ණ කිරීම අනිවාර්ය කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය**

- උසස් අධ්‍යාපන ආයතනවල අනධ්‍යයන කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා පුහුණු අත්පොතක් පිළියෙල කිරීම සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානවල අත්දැකීම් ඇති අධ්‍යක්ෂවරුන්ගෙන් ද, විශ්වවිද්‍යාලවල ලේඛකාධිකාරීන් ලෙස සේවය කර ඇති ජ්‍යෙෂ්ඨ අනධ්‍යයන පරිපාලන නිලධාරීන්ගෙන් ද සමන්විත විශේෂඥ මඩුල්ලක්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබීම.

**කාර්ය මණ්ඩල සංවර්ධනය සහ සම්බන්ධීකරණය**

***ප්‍රතිපත්ති කරුණ 57 :***

සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයකම අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවා තිබුණ ද, කාර්ය මණ්ඩල සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා යාන්ත්‍රණයක් නොමැත.

***ප්‍රතිපත්තිය 57 :*** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එහි කාර්ය මණ්ඩල සංවර්ධන ස්ථාවර කමිටුව නැවත ක්‍රියාත්මක කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කාර්ය මණ්ඩල සංවර්ධන ස්ථාවර කමිටුව නැවත ක්‍රියාත්මක වීමට පියවර ගැනීම.

**අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා දිරි ගැන්වීම්**

***ප්‍රතිපත්ති කරුණ 58 :***

ඉගැන්වීම සහ ජාතික/ප්‍රජා සංවර්ධනය සඳහා තමන් කරන දායකත්වය වෙනුවෙන් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට දිරිගැන්වීම් සැපයීමේ සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීමේ අවශ්‍යතාව තිබේ.

***ප්‍රතිපත්තිය 58:*** ඉගැන්වීම සහ ජාතික/ප්‍රජා සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාල ආචාර්යවරුන් කරන දායකත්වය අගය කිරීමට ලක් කළ යුතුය.

ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග

- විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා දැනට පවත්නා උසස්වීම් පටිපාටිය සමාලෝචනය කිරීම සඳහා කමිටුවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබීම, සහ ශිෂ්‍යයින් ද සගයින් ද විසින් කරනු ලබන ආචාර්යවරුන් ඇගයීම ආශ්‍රිතව ඉගැන්වීමේ ගුණාත්මකභාවයට ප්‍රමාණවත් බරක් සපයන ක්‍රමයක් ඒ වෙතට ඇතුළත් කිරීම.

- ප්‍රමාණවත් කුසලතාවයක් දක්වන ආචාර්ය මණ්ඩලයට ශිෂ්‍යත්ව සහ එවැනි ප්‍රතිලාභ සැපයීම.

**කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් ප්‍රතීතනය කිරීම**

***ප්‍රතිපත්ති කරුණ 59:***

ඕනෑම වෘත්තියක් සම්බන්ධව කෙරෙන ප්‍රතීතනය තුළින් නිරතුරුවම වඩා හොඳ ප්‍රතිඵල ලැබේ. දැනට ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන පද්ධතියේ ඇති කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් සඳහා කිසිදු ප්‍රතීතන යාන්ත්‍රණයක් නැත.

*ප්‍රතිපත්තිය 59 :* තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන කොමිෂන් සභාව (QAAC) විසින් කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් ප්‍රතීතනය කිරීමත්, අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සහතික කිරීමත් කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- එක් එක් උසස් අධ්‍යාපන ආයතනයක් තුළ වැඩසටහන් ප්‍රතීතනය කිරීමේ සහ ආචාර්යවරුන් සහතික කිරීමේ ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීම.

- උසස් අධ්‍යාපන ආයතන, ප්‍රතීතන ආයතන පිළිබඳ තම ආචාර්ය මණ්ඩල සාමාජිකයින් දැනුම්වත් කරමින්, තම වැඩසටහන්වලට ප්‍රතීතනයත්, ආචාර්ය මණ්ඩලයට සහතිකකරණයත් ලබා ගැනීමට ඔවුන් උනන්දු කරවීම.

**ආචාර්යවරුන්ගේ උසස්වීම් ක්‍රමානුකූල කිරීම**

*ප්‍රතිපත්ති කරුණ 60 :*

ලෝක මට්ටමෙන් සිදුවන කරුණක් නම් ඉහළ මට්ටමේ කාර්ය සාධනය වෙනුවෙන් කාර්ය මණ්ඩලයට ප්‍රසාද ප්‍රතිලාභ ලබා දීමත්, කාර්ය මණ්ඩලයේ සෑම කෙනෙකුටම පැහැදිළි වෘත්තීය උසස්වීම් මාවත් විවෘත කිරීමත් ය. කාර්ය මණ්ඩලයට උසස්වීම් සඳහා සාධාරණ අවස්ථා තිබෙන විට ඵලදායීතාවට ඔවුන් කරන දායකත්වය තිරසාරව පවත්වා ගැනීමට තුඩු දෙන වැඩ කිරීමට මිත්‍රශීලි වන පරිසරයක් ද නිර්මාණය වේ.

*ප්‍රතිපත්තිය 60 :* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා දැනට තිබෙන උසස්වීම් ක්‍රමය සමාලෝචනය කර ක්‍රමානුකූල කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- එක් එක් ප්‍රභේදයකට අයත් උසස්වීම් අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ඇගයීම සඳහා වෙනම ''ඇගයීම් කමිටු" විශ්වවිද්‍යාල පාලක මණ්ඩලය විසින් පත් කරනු ලැබීම.

- ඇගයීම් කමිටුව, එක් එක් ප්‍රභේදයකට අයත් ආචාර්යවරුන්ගේ ඉල්ලුම්පත්‍රවල ඇති කුසලතා ශක්තිය ඇගයීමට යොදා ගත හැකි නිර්දේශ මාලාවක් උපකුලපතිවරයාට ඉදිරිපත් කිරීම.

- උසස්වීම් සඳහා ලැබී ඇති ඉල්ලුම්පත්‍ර පිළිබඳව "ඇගයීම් කමිටුවේ" ප්‍රතිපෝෂණ ලැබීමෙන් පසුව, ආචාර්ය මණ්ඩල උසස්වීම් තේරීම් මඩුල්ල, එක් එක් අපේක්ෂකයා තමන් උසස්වීම අපේක්ෂා කරන තනතුරේ මට්ටමට ප්‍රමාණවත් වන ශාස්ත්‍රීය කාර්ය සාධනයක් සහ සාධන මට්ටමක් සාක්ෂාත් කරගෙන තිබේදැයි ඇගයීමකට ලක් කිරීම.

- ඉගැන්වීමේ ගුණාත්මක තත්ත්වයටත් ජාතික/ප්‍රජා සංවර්ධනය සඳහා කර ඇති දායකත්වයටත්, උසස්වීම් තීරණය කිරීමේ දී ප්‍රමාණවත් බරක් යෙදීම.

## ආචාර්යවරුන් සහ වැඩ ලෝකය

***ප්‍රතිපත්ති කරුණ 61 :***

කර්මාන්ත අංශයෙන් නිරතුරුවම එල්ලවන ප්‍රතිචාරයක් වන්නේ, උපාධිධාරීන් රැකියා සඳහා සූදානම් නොමැති බව සහ ඔවුනට අත්‍යවශ්‍ය කුසලතා නොමැති වීම, සාධනීය ආකල්ප සහ කණ්ඩායම් හැඟීම් විරහිතභාවය සහ කර්මාන්ත අංශයේ රැකියාවලට සුදුසු නොමැතිවීම යන විවේචනයයි. මේ තත්ත්වයට ප්‍රධාන හේතුවක් වන්නේ, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට කර්මාන්ත අංශ සමඟ පවත්වන අන්තර් ක්‍රියාකාරකම් ඌන වීමත්, කර්මාන්ත අංශවලට අනාවරණය වීමට ඔවුන් තුළ උනන්දුවක් නොවීමත්ය. ආචාර්ය මණ්ඩලය කර්මාන්ත අංශවල වැඩ ලෝකයට අනාවරණය කිරීම සෑම විෂය ක්ෂේත්‍රයක් සඳහාම සුදුසු වේ. කඩිනමින් රැකියාවල නියුක්ත කිරීමට සුදුසු උපාධිධාරීන් බිහි කිරීම සඳහා ජාතික සංවර්ධනයට උපදේශන සේවා සැපයීම සහ අන්‍යෝන්‍ය වශයෙන් ඵලදායීවන ලෙස කර්මාන්ත අංශ සහ විශ්වවිද්‍යාල අතර සමීප සහයෝගතාව ගොඩනැඟීම සමහර විෂය ක්ෂේත්‍රවලට ඉතා වැදගත් වනු ඇත.

***ප්‍රතිපත්තිය 61 :*** වැඩ ලෝකය තුළ තම අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා ආචාර්යවරුන්ට අදාළ කර්මාන්ත අංශවල කෙටි කාලයක් තුළ වැඩ කිරීම සඳහා විශ්වවිද්‍යාල විසින් ආචාර්ය මණ්ඩලය උනන්දු කළ යුතුය.

### ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග

- අදාළ කර්මාන්ත අංශවල සීමිත කාලයකට කෙටි කාලීනව වැඩ කිරීම සඳහා ආචාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් දිරිගැන්වීම් සපයන යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.

- කරන වැඩ ප්‍රමාණය සහ ශාස්ත්‍රීය වගවීම පිළිබඳ ශාස්ත්‍රාලයීය විනය දැඩිව පවත්වා ගනිමින් ජාතික සංවර්ධන වැඩසටහන් සඳහා විශේෂඥ උපදේශන සේවා සැපයීමට ආචාර්ය මණ්ඩලය සහභාගී වීම ප්‍රවර්ධනය කිරීම.

# 09 පරිච්ඡේදය

## පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන හා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය

අධ්‍යයන ශාස්ත්‍ර අය කිරීමේ පදනමක් මත ප්‍රථම උපාධි, පශ්චාද්-උපාධි, ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා පවත්වන පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන බිහිවීම සහ පැතිරීම, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික භූමි දර්ශනය වෙනස් කිරීමට තුඩු දී තිබේ. පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලට දොර විවෘත කිරීමේ බුද්ධිගෝචරතාව පිළිබඳ තියුණු මහජන විවාදයක් පැවැති නමුදු, ''අධ්‍යාපනය සැපයීම සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වයට ඉඩ දියයුතු මෙන් ම සහයෝගය දිය යුතුය'' යන්න ගැන දැන් ප්‍රධාන දේශපාලන පක්ෂ අතර ප්‍රතිපත්තිමය සම්මුතියක් ඇති වී තිබේ.

දේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පෞද්ගලික අංශයේ සහභාගිත්වය ප්‍රවර්ධනය කළ යුතුය යන අදහසට පක්ෂපාත තර්ක සාධාරණය කෙරෙන්නේ පහත සඳහන් කරුණු අවධාරණය කිරීමෙනිː (අ) උසස් අධ්‍යාපනය සඳහා නිරතුරුව ඉහළ යන ඉල්ලුමේ අභියෝගයට මුහුණ දීමට පවත්නා රාජ්‍ය-පාලිත උසස් අධ්‍යාපන පද්ධතිය සතු නොහැකියාව, (ආ) උගත් හා කුසලතා සහිත ශ්‍රම බලකායක් ඇති කිරීම සඳහා ඇති ජාතික අවශ්‍යතාව, (ඇ) උපාධි පාඨමාලා නවීකරණය කිරීම සඳහා කාලාන්තරයක් තිස්සේ ම දැනී තිබෙන අවශ්‍යතාව, සහ (ඈ) අධ්‍යාපනයේ දැනට පවත්නා ගෝලීය ප්‍රවණතාවලට අනුරූප වන පරිදි ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමේ අවශ්‍යතාව.

අතිශයින් තරඟකාරී විභාගයකින් පසුව උසස් අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබන විශාල ශිෂ්‍ය සංඛ්‍යාවකට ඉඩ ලබාදීම සඳහා ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇත්තේ සීමිත ධාරිතාවකි. ආසන්න වශයෙන් 300,000ක් පමණ සිසුන් පිරිසක් 2016 වසරේ දී අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි නමුදු, එම වසරේ දී විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීමට හැකියාව ලැබුණේ 27,600කට පමණි. (UGC, 2016) ඊට අමතරව, විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍රවල සිසුන් ඇතුළත් කර ගැනීමට රාජ්‍ය විශ්වවිද්‍යාල සතු හැකියාව දිගටම පවතින්නේ සීමා සහිතවය. මෙය, ප්‍රතිපත්ති සම්පාදකයින් දශක ගණනාවක් තිස්සේ අවධානය යොමු කර තිබුණ කරුණකි.

තරුණ සාක්ෂරතාව දකුණු ආසියාවේ ඉහළම මට්ටම වූ 98.77%ක් ද, සාපේක්ෂ වශයෙන් ඉහළ මානව සංවර්ධන ජයග්‍රහණයක් ද හිමි නමුදු, ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයට ඇති තරුණ සහභාගිත්වය, මධ්‍යම ආදායම් ඇති රටක් වශයෙන් පවතින්නේ අතිශයින්ම අවම මට්ටමකය. රටේ උසස් අධ්‍යාපනයට බඳවා ගන්නා සංඛ්‍යාව, මධ්‍යම ආදායම් ලබන රටවල අනුපාතයෙන් අඩකි. එය ඉන්දුනීසියාව, කොරියාව, මැලේසියාව සහ තායිලන්තය යන රටවලට වඩා බෙහෙවින් අඩුය. (World Bank Group, 2007)

උසස් අධ්‍යාපනයට ඇතුලුවීමේදී ඇති වන මෙම අහිතකර තත්ත්වයේ ප්‍රතිඵල දෙකක් තිබේ. පළමුවැන්න, උසස් අධ්‍යාපන අපේක්ෂාවෙන් සිසුන් විදේශ රටවලට සංක්‍රමණය වීමයි. දෙවැන්න පෞද්ගලික අංශය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට ඇතුල් වීමයි. 2013 වසරේදී සිසුහු 12,000ක් උසස් අධ්‍යාපනය ලබා ගැනීමට විදේශ රටවලට ගියහ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කියා සිටින පරිදි, ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය ජනගහනයෙන් 8%ක් අධ්‍යාපනය සඳහා වාර්ෂිකව විදේශගත වෙති. මේ අතර, දේශීය වශයෙන් ලබාගත හැකි පෞද්ගලික අංශයේ අධ්‍යාපනය ලබා ගන්නා ශිෂ්‍ය පිරිස වසරකට 100,000ක් පමණ වෙයි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දත්තවලට අනුව, උපාධි ප්‍රදානය කරන පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ලෙසින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ/විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ,

ආයතන 21ක් ද වැඩසටහන් 135ක් ද ලියාපදිංචි වී ඇත. ඉහළම වැඩසටහන් සංඛ්‍යාව ලියාපදිංචි කරන ලද්දේ 2016 වසරේ දීය. එම සංඛ්‍යාව 33 කි.

උසස් අධ්‍යාපනයට පෞද්ගලික අංශයේ සහභාගිවීම සම්බන්ධයෙන් වර්තමාන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ඇති ලිහිල් බව සහ 2013 වසරේදී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට පෙරදී තිබූ බලය අමාත්‍යාංශයට පැවරීමෙන් පසු, ලියාපදිංචි වීමේ සංඛ්‍යාව සීඝ්‍ර ලෙස ඉහළ ගොස් තිබේ.

**දැනට පවත්නා තත්ත්වය**

පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ප්‍රතීතනය කිරීමේ බලය තිබෙන්නේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයටය. එසේ වුවත්, ශ්‍රී ලංකාවේ තිබෙන පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය සාර්ථක යාන්ත්‍රණයක් තවමත් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙහි ගොඩ නගා නැත.

පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල ඇති අධ්‍යාපන වැඩසටහන් වැඩිපුරම කේන්ද්‍රගත වී තිබෙන්නේ ප්‍රථම උපාධි, ඩිප්ලෝමා සහ සහතික පත්‍ර වැඩසටහන් සඳහා වන අතර, වැඩියෙන් ම සිසුන් ඇතුළත් වී ඇත්තේ ප්‍රථම උපාධි පාඨමාලාවලටය. ඒ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 26%කි. ඊට පසුව ඇතුළත් වී ඇත්තේ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 17%ක් වන පශ්චාද්-උපාධි පාඨමාලාවලටය. උසස් ජාතික ඩිප්ලෝමාව වැනි ඉහළ ජාතික ඩිප්ලෝමා පාඨමාලාවල සිටින ශිෂ්‍ය ප්‍රතිශතය 14%කි. ඩිප්ලෝමා පාඨමාලාවල 16%කි. සහතික පත්‍ර මට්ටමේ පාඨමාලාවල සිටින සංඛ්‍යාව මුළු සංඛ්‍යාවෙන් 15%කි. ජාතික වෘත්තීය සුදුසුකම් පාඨමාලාවල ශිෂ්‍ය සංඛ්‍යාව 6%කි. පදනම් සහ පූර්ව පදනම් මට්ටම්වලින් ශිෂ්‍යයන් පුහුණු කිරීමට ද පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන උනන්දුව දක්වන අතර, ඒවාට සම්බන්ධ ශිෂ්‍ය ප්‍රමාණය 3%කි. පහළම සංඛ්‍යාව වන 2%ක් සිටින්නේ ආචාර්ය උපාධි වැඩසටහන්වලයි.

ශිෂ්‍ය සංඛ්‍යාවෙන් වැඩිම ප්‍රමාණය වූ 59%ක් සිටින්නේ ආගන්තුක සත්කාර කළමනාකරණ සහ ව්‍යාපාර පීඨවලය. මෙම ප්‍රමාණයෙන් 36%ක් අයත් වන්නේ කළමනාකරණ සහ ව්‍යාපාර අධ්‍යයනටය. තොරතුරු තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව, රසායන විද්‍යාව, මෘදුකාංග සහ තාක්ෂණ යන විෂයයන්ට සිටින්නේ 27%ක් පමණි.

වැඩිම ශිෂ්‍ය ප්‍රමාණයක් වන 59%ක් අධ්‍යාපනය ලබන්නේ ප්‍රථම උපාධියටයි. උසස් ජාතික ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා සහ ඩිප්ලෝමා සිසුන්ගේ ප්‍රමාණය 30%කි. පශ්චාද්-උපාධි ශිෂ්‍ය සංඛ්‍යාව තවමත් 3%ක් වැනි සුළු ප්‍රමාණයකි. වෘත්තික පාඨමාලාවලට සිටින්නේ ඊටත් අඩු සංඛ්‍යාවක් වූ 1%කි. මේ අතර 8%ක ශිෂ්‍ය සංඛ්‍යාවක් ඉගෙන ගන්නේ සහතික පත්‍ර පාඨමාලාවලය.

පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන තවමත් තමන්ගේම මානව සම්පත් පදනම් සකසා ගෙන නැත. ඒවායේ ආචාර්ය මණ්ඩලයේ වැඩි දෙනා රාජ්‍ය විශ්වවිද්‍යාලවල ආචාර්යවරුන් ය. ඔවුහු සන්ධ්‍යා කාලවල සහ සති අන්තවලත්, නිවාඩු දිනවලත්, අර්ධ කාලීන සේවයේ යෙදෙති. ආචාර්ය මණ්ඩලයෙන් බහුතරය අයත් වන්නේ තාවකාලික, උපදේශක, පරිවාස, බාහිර, සහ අර්ධ-කාලීන යන ප්‍රභේදවලට ය. ස්ථිර ආචාර්යවරුන් ලෙස සේවය කරන්නේ ඉතා කුඩා සංඛ්‍යාවකි.

පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ලාභය ඉලක්ක කරගත් වාණිජ ව්‍යාපාර නිසා, විදේශීය ආචාර්යවරුන් ස්ථිර පදනමක් මත බඳවා ගැනීමට ඒවා අකැමැතිය.

ආචාර්ය-ශිෂ්‍ය අනුපාතය දෙස බලන විට, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලින් අඩක් පමණ එක් ආචාර්යවරයෙකුට සිසුන් 20ක් හෝ අඩු ප්‍රමාණයක් පවත්වාගෙන යති. එහෙත් සමහර අවස්ථාවල මෙම අනුපාතය 20 සිට 30 දක්වා ද ඉහළ යයි.

පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල අනධ්‍යයන කාර්ය මණ්ඩලවල අඩුවක් නැත. එක් එක් ආයතනවල සිටින අනධ්‍යයන කාර්ය මණ්ඩල ප්‍රභේදවලට ප්‍රධාන විධායක නිලධාරි, අධ්‍යක්ෂකවරුන්, මූල්‍ය අධිකාරි, මූල්‍ය පාලන කාර්ය මණ්ඩලය සහ අනෙක් කළමනාකරුවෝ අයත් වෙති. සෑම පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනයක ම, සිසුන් බඳවා ගැනීම සඳහා අලෙවි කාර්ය මණ්ඩලයක් ද සිටිති.

ගැටලු

පෞද්ගලික විශ්වවිද්‍යාල සහ පෞද්ගලික වෘත්තීය පුහුණු ආයතන ආරම්භ කිරීම, ඒවා විසින් සිසුන්ට කර්මාන්ත අංශයට ඇතුල් වීමට විවිධ දොරටු විවෘත කර දෙනු ඇතැයි ද, ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් වඩා හොඳ රැකියා ලබා ගැනීමට අවකාශ දෙනු ලැබෙනු ඇතැයි ද යන කරුණු මත සාධාරණය කරනු ලැබුවද, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලින් විවෘත කර ඇති අලුත් ඉඩ ප්‍රස්තා තවමත් පවතින්නේ සීමිතවය. එයට ප්‍රධාන හේතුව ඒවා ලාභ අපේක්ෂාවෙන් ක්‍රියා කරන වාණිජ ව්‍යාපාර වීමයි.

එබැවින්, පෞද්ගලික අංශය මාර්ගයෙන් උසස් අධ්‍යාපනය සැපයීම නිසා අධ්‍යාපනයේ සමාන අවකාශ පිළිබඳ සාමාජීය අරමුණට හානි සිදු කරමින්, එය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සමාජ අසමානතා ඇති කිරීමේ නව සාධකයක් බවට පත් වීමේ අනතුර පවතින්නේය, යන තර්කය මහජන විවාදය තුළ මතු වී තිබේ.

මේ අතර පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ලබා දෙන අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය පිළිබඳ සැකයක් ද මතු වී තිබේ. පුද්ගලික අංශයේ උපාධි ලබාදෙන ආයතනවල ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලාවල ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණෙන්, තත්ත්ව සහතිකකරණය, සමානකරණය, සහ සුදුසුකම් රාමුව පිළිබඳ පනත් කෙටුම්පත මගින් නව නීති හඳුන්වාදීමට රජය උත්සාහ ගත්තේ ය. මෙම යෝජිත රාමුව තුළ, රාජ්‍ය නොවන අංශය ලබාදෙන උපාධි සහ ඩිප්ලෝමා වැඩසටහන්වල ගුණාත්මක තත්ත්වය සහතික කිරීම අරමුණු කරගෙන ඒවා නියාමනය කිරීමට අදහස් කෙරිණ. කෙසේ වුවත්, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලට විරුද්ධ ශිෂ්‍ය සහ ආචාර්ය කණ්ඩායම්වල විරෝධතා මැද්දේ මෙම පනත් කෙටුම්පත ඉල්ලා අස් කර ගන්නා ලදී.

උසස් අධ්‍යාපනය තුළ ගුණාත්මක තත්ත්ව සහතිකකරණය, සමානකරණය සහ සුදුසුකම් රාමුව හඳුන්වා දීමේ පියවර සම්බන්ධයෙන් රජයේ ඇති මෙම නොපැහැදිලි ප්‍රතිපත්තිය, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යාපන වැඩසටහන්වල ඇති ගුණාත්මක තත්ත්වය සහ ප්‍රමිතීන් පිළිබඳ අවිනිශ්චිතතාවයක් ඇති කිරීමට හේතු වී තිබේ.

පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ආරම්භ කිරීමත්, පවත්වාගෙන යාමත් පිළිබඳ පැහැදිලි, වාස්තවික සහ ක්‍රමානුකූල මිණුම් දඬු සහ ක්‍රියාවලින් නියම කර තිබීම වැදගත් වේ. පෞද්ගලික ආයෝජනයට දිරි ගැන්වීම් සැපැයීම සහ පෞද්ගලික සහ රාජ්‍ය අංශ දෙකෙහි ම උසස් අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය සහතික කිරීමේ ස්වාධීන යාන්ත්‍රණ ඒවාට ඇතුළත් කළ යුතුය.

පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ලියාපදිංචි කිරීම පිළිබඳ නෛතික රාමුවේ ඇති අපැහැදිලිතාව දිගටම පවත්නා ගැටලුවකි. එහි ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ලියාපදිංචි කර ඇති නෛතික ක්‍රම එකිනෙකට වෙනස්ය. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය/විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ප්‍රතීතනය ලැබූ උපාධි ආයතනවලින් 60%ක් ම ලියාපදිංචි වී ඇත්තේ 2007 අංක 07 දරන වෙළෙඳ සමාගම් පනත යටතේ ය. වාර්ෂිකව වාර්තා කිරීමේ ක්‍රියාවලිය ද දුර්වලය. වාර්තා කිරීමේ වාර ගණන පිළිබඳ ඒකමිතියක් ද නැත.

පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලින් 88%ක් ම පිහිටුවා ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයේය. 5%ක් ගම්පහ දිස්ත්‍රික්කයේය. ඉතිරි ඒවා පිහිටුවා තිබෙන්නේ මහනුවර, කලුතර සහ මීගමුව යන ප්‍රදේශ තුළය. මෙයින් පෙනෙන්නේ ශ්‍රී ලංකාවේ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ප්‍රාදේශීය වශයෙන් කුඩා ප්‍රදේශයක පවත්නා නගරවලට කේන්ද්‍රගත වී තිබෙන බවයි.

පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලට විදේශීය සිසුන් ඇතුළත් වී සිටින්නේ ඉතා සීමිතව බව නිරීක්ෂණය කළ හැකිය. ඒවාට ලැබෙන විදේශීය ඉල්ලුම්කරුවන් ගේ සංඛ්‍යාව සීමිත වන අතර, එයිනුත් බහුතරය මාලදිවයිනෙන් එන සිසුන්ය. මෙලෙස විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වීමට හේතුව වීසා ලබා ගැනීමේ දුෂ්කරතාව බව පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ප්‍රකාශ කරති.

පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය කළමනාකරණය කිරීම, මනා පරිපාලනය සහ පාලනයේ පාරදෘශ්‍යතාව පිළිබඳව ඇත්තේ අඩු පැහැදිලිකමකි. ඉගැන්වීම සම්බන්ධ සංවර්ධනය, පර්යේෂණ දියුණු කිරීමේ උපාය මාර්ග, සිසුන්ගේ පර්යේෂණ සම්පත් සංවර්ධනය, අධ්‍යයන ව්‍යුහය, පාඨමාලා සහ විෂය නිර්දේශ සංවර්ධනය, කළමනාකරණය සහ සංවිධාන ක්‍රමය යන මේවා සඳහා බාහිර මූලාශ්‍ර වලින් ලැබෙන්නේ අඩු සහයෝගයකි. මේ ක්ෂේත්‍ර සම්බන්ධව, පරිපාලනය සහ ගුණාත්මක තත්ත්ව සහතිකය පිළිබඳ දැඩි නීතිරීති ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල සමග සැසඳීම වැලැක්විය නොහැකිය. විදේශීය සහයෝගතාව සඳහා අවකාශ තිබුණ ද, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල එවැන්නක් බහුලව නැත.

පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන අතර පවත්නා පොදු ප්‍රවණතාවයක් නම් තමන්ගේ වැඩසටහන්, තිබෙන පහසුකම් සහ ශිෂ්‍යයන්ගේ ජයග්‍රහණ ගැන අතිශෝක්තියෙන් ප්‍රකාශ සිදුකිරීමයි. ශිෂ්‍යයන් බඳවා ගැනීම සඳහා කරන දැන්වීම් සහ අලෙවි ප්‍රචාරණයේ දී එවැනි අතිශෝක්ති ප්‍රකාශ සිදු කිරීම බහුලව සිදුවේ. එම දැන්වීම් ප්‍රචාරණයේ දී සිදුවන තවත් දෙයක් නම්, උසස් අධ්‍යාපනය යනු මිළදී ගැනීමට තිබෙන වෙළෙඳ භාණ්ඩයක් ලෙසට හුවා දැක්වීමයි.

**රාජ්‍ය සහ පෞද්ගලික ආයතන අතර සම්බන්ධය**

උසස් අධ්‍යාපනයේ රාජ්‍ය-පෞද්ගලික ආයතන අතර සම්බන්ධතාවේ පැති දෙකක් තිබේ. පළමුවැන්න, රාජ්‍ය විශ්වවිද්‍යාල, විශේෂයෙන් පර්යේෂණ, කර්මාන්ත අංශයේ පුහුණුව, වෘත්තීය මාර්ගෝපදේශනය සහ රැකියා සම්බන්ධයෙන් පුද්ගලික කර්මාන්ත අංශය සමග පවත්වන සම්බන්ධතායි. හවුල්කාරීත්ව ව්‍යාපෘති සඳහා පෞද්ගලික කර්මාන්ත අංශය සමඟ සම්බන්ධතා පැවැත්වීම මූලික වශයෙන් ම විද්‍යා, වෛද්‍ය විද්‍යා, ඉංජිනේරු, වාණිජ සහ කළමනාකරණ පීඨවලට සීමාවී තිබේ. දෙවැනි සම්බන්ධතාව තිබෙන්නේ රාජ්‍ය විශ්වවිද්‍යාල සහ මෑතදී ආරම්භ කරන ලද පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන අතරය. එහෙත් මෙය තවමත් ගොඩනැගී නැත. එය රජයේ ප්‍රතිපත්තිමය මැදිහත්වීමක් අවශ්‍ය වන ආයතනික හවුල්කාරිත්වයකි.

ප්‍රථම මට්ටමේ රාජ්‍ය-පෞද්ගලික ආයතන අතර සම්බන්ධතාව සම්බන්ධයෙන් බලන විට පෙනෙන්නේ රාජ්‍ය විශ්වවිද්‍යාල විවෘතභාවයේ ප්‍රතිපත්තියක් තමන් සතුව ඇතැයි පෙන්වා දී තිබෙන බවයි. එය රාජ්‍ය විශ්වවිද්‍යාලවලට නොයෙකුත් ආකාරයෙන් ඵලදායී වන බවට ප්‍රතිපත්ති සම්පාදක ප්‍රජාව අතර ද පොදු එකඟතාවක් තිබේ. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සමස්තයක් වශයෙනුත්, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල විශේෂයෙන්ම අධ්‍යාපනයේ අදාළතාවය වර්ධනය කිරීමට පුද්ගලික අංශයට විශාල දායකත්වයක් ලබා දීමට හැකිය යන කරුණ දැන් අවධාරණය වේ. (Aturupana et al, 2017) එලෙස අවධාරණය කෙරෙන ප්‍රතිලාභ අතර, පහත සඳහන් ඒවා අවධාරණය කෙරේ.

- වේගයෙන් වෙනස් වන ආර්ථිකයේ අවශ්‍යතාවන්ට අදාළ වන ලෙස අධ්‍යයන පාඨමාලා අදාළ කරවමින් ඒවා යාවත්කාලීන කිරීම සඳහා උදව් කිරීමට, කර්මාන්ත අංශයේ නියෝජිතයන්ට හැකිය.

- අනුබද්ධ මහාචාර්යවරුන් (Adjunct Professors) කර්මාන්ත අංශයෙන් බඳවා ගැනීමෙන් විශ්වවිද්‍යාලවලට වාසි ලබාගත හැකිය.

- පෞද්ගලික ව්‍යාපාරික ආයතන සමග හවුල්කාරීත්වය තුළින් පර්යේෂණත්, පර්යේෂණ වාණිජකරණය කිරීමත් දියුණු කළ හැකිය.

- සිසුන්ට පෞද්ගලික ව්‍යාපාරික සමාගම්වල ආධුනික පුහුණු අවස්ථා (Internships) ලබා දීම මගින් ඔවුන් වැඩ ලෝකයට හඳුන්වා දිය හැකි වන අතර, ඒවා බොහෝ විට රැකියා ලබා ගැනීමේ පළමු පියවර ද වෙයි.

ශ්‍රී ලංකාවේ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ව්‍යාප්ත වෙමින් තිබුණ ද, ඒවා සහ රාජ්‍ය විශ්වවිද්‍යාල අතර හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කිරීමට කිසිදු පියවරක් තවමත් ගෙන නැත. අධ්‍යාපන ක්ෂේත්‍රයේ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය යන අදහස පවා තවමත් නිසිලෙස ප්‍රකාශයට පත් වී නැත. මේ සම්බන්ධව රජය මුලික පියවර නොගෙන තිබීමෙන් පෙන්නුම් කෙරෙන්නේ උසස් අධ්‍යාපනය සපයන පෞද්ගලික අංශය පිළිබඳ රජයේ ඇත්තේ නොපැහැදිලි ප්‍රතිපත්තියක් බව සහ ඒවා පිහිටුවීම සහ ක්‍රියාත්මක විය යුත්තේ කවර කොන්දේසි යටතේ දැයි යන්න ගැන නොපැහැදිලි බවක් පවතින්නේය යන්නත්ය. එහි ප්‍රතිඵලයක් ලෙස, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ශ්‍රී ලංකාවේ විකාශනය වෙමින් පවතින්නේ රජය සමග කිසිදු ආයතනික සම්බන්ධතා නොමැතිව සහ තාක්ෂණික හෝ මුල්‍යමය වශයෙන් රජයෙන් කිසිදු සහයෝගයක් ද නොමැතිවය. මේ තත්ත්වය, ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයක් නොමැත්තේ මන්ද යන්නට පසුබිම සපයයි.

එසේ වුවත්, රජයේ මග පෙන්වීම යටතේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන අතර, ආංශික (Sectoral) සහ ආයතනික හවුල්කාරිත්වය සඳහා යෝජනා ක්‍රමයක් ඇති කිරීමට ප්‍රමාණවත් හේතු තිබේ. දැනටමත්, එවැනි හවුල්කාරිත්වයක් නැතිව පවා, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන, තම ආචාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල මත තදින් ම යැපෙති. මෙම සම්බන්ධතාව එම අංශ දෙක අතර හවුල්කාරිත්වය ගොඩනැගීමට පදනමක්සේ යොදාගත හැකිය.

රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය ගොඩනැගිය හැකි එක් වැදගත් ක්ෂේත්‍රයක් වන්නේ, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල සේවය බස්නාහිර පළාතෙන් පිටත දිස්ත්‍රික්කවලට ද ලබා දීමයි. එය කළ යුත්තේ රජයේ සහයෝගයත්, පිටපළාත්වල දැනටමත් පිහිටුවා තිබෙන රාජ්‍ය විශ්වවිද්‍යාලවල ආචාර්ය මණ්ඩලයේ සහභාගිත්වයත් ඇතිවයි. එම ආයතනවල ප්‍රාදේශීය සිසුන් අතර සිටින අඩු ආදායම්ලාභී සහ වරප්‍රසාද රහිත පවුල්වල සිසුන්ට ශිෂ්‍යත්ව සහ මූල්‍යාධාර සැපයීමට ද රජයේ සහයෝගය ඵලදායි ලෙස ලබා ගත හැකි වනු ඇත.

එමෙන් ම, බාහිර උපාධි පාඨමාලා සඳහා රාජ්‍ය-නොවන පුහුණු ආයතනවල සහයෝගය ලබා ගැනීමත් සිදු නොවන තරම්ය. දැනට වාර්තා වී තිබෙන්නේ එවැනි හවුල්කාරිත්ව අතලොස්සක් පමණි.
ඉගැන්වීම, පර්යේෂණ සහ පාඨමාලා සංවර්ධනය සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයේ රාමුවක් ඇතුළත සිදු වන සම්පත් බෙදා ගැනීමක් තවමත් ආරම්භ වී නැත. රජයේ ප්‍රතිපත්තිමය මග පෙන්වීම ලැබෙන තුරු එය බලා සිටී.

**පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන හා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා**

**පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන සඳහා නියාමන රාමුවක්**

***ප්‍රතිපත්ති කරුණ 62 :***

දැනට පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන රජය විසින් නියාමනය කරනු ලැබෙන්නේ නැත. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රමිතියෙන් බාල පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ක්‍රියාත්මක වීමට පටන්ගෙන ඇත.

*ප්‍රතිපත්තිය 62-* : අන්තර්ජාතික (International) සහ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය**

- පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන සමාගම් පනත යටතේ ලියාපදිංචි කිරීමට පෙර, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශය සහ කැමැත්ත ලබා ගැනීම.

**පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන පිට පළාත්වලට ව්‍යාප්ත කිරීම**

***ප්‍රතිපත්ති කරුණ 63:***

පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන දැනට වැඩියෙන් ම කේන්ද්‍රගතවී තිබෙන්නේ බස්නාහිර පළාතේ වන අතර, ඒවායේ සේවය වැඩියෙන්ම ලැබෙන්නේ නාගරික සිසුන්ටය. මෙමගින්, රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුල් වීමට සුදුසුකම් ලැබුව ද ඒවාට ඇතුල් වීමට අවකාශ නොලැබෙන ග්‍රාමීය මධ්‍යම පන්තියේ දරුවන්ට වෙනස්කම් සිදු කෙරේ.

*ප්‍රතිපත්තිය 63:* බස්නාහිර පළාතෙන් පිට ග්‍රාමීය සිසුන්ට උසස් අධ්‍යාපනය ලබා ගැනීමට වඩාත් ඉඩ ප්‍රස්තා ලැබෙන පරිදි, ඔවුන්ට පහසු අධ්‍යාපන ණය පහසුකම් ද ලබා දෙමින්, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලට ප්‍රවේශවීමේ පහසුකම ලබා දිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ග්‍රාමීය පළාත්වල පිහිටුවීමට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සුදුසු මුලෝපායයක් සැකසීම.

- එවැනි ක්‍රමයක් තුළ, ආර්ථික ආධාර අවශ්‍ය සිසුන්ට අධ්‍යාපන ගාස්තු, සහනාධාර, සහ ශිෂ්‍යත්ව ලබාදීම පිණිස පියවර ගන්නා බවට, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සහතික කරනු ලැබීම.

**දත්ත එකතු කිරීම සඳහා (Single Window Intergrated Platform) ඒකකයක් පිහිටුවීම**

***ප්‍රතිපත්ති කරුණ 64 :***

පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන පිළිබඳ තොරතුරු එකතු කිරීම සඳහා දැනට ස්ථාන ගණනාවක්ම තිබේ. එම තත්ත්වය නිසා පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන අධීක්ෂණය කිරීමේ, නියාමනය කිරීමේ සහ වාර්තා කිරීමේ රජයේ කාර්යය මහත් දුෂ්කර වී තිබේ.

***ප්‍රතිපත්තිය 64:*** පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලින් ලැබෙන සියලුම දත්ත සඳහා දත්ත එකතු කිරීමේ ඒකකයක් (Single Window Intergrated platform) (SWIP) ස්ථාපිත කිරීම තුළින් මධ්‍යගත තොරතුරු ගබඩා කිරීමේ පද්ධතියක් හඳුන්වා දිය යුතුයි.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- SWIP දත්ත එකතු කිරීමේ මධ්‍යස්ථානය උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පිහිටුවීම සහ ඒ සඳහා අවශ්‍ය නීති උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පනවනු ලැබීම.

- පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල සියලුම සිසුන් පිළිබඳ තොරතුරු මෙම මධ්‍යගත තොරතුරු පද්ධතියෙහි ඇතුළත් කිරීම.

- උසස් අධ්‍යාපනයට විදේශ ගතවන දේශීය සිසුන් ද, ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශ සිසුන් ද මෙම මධ්‍යගත තොරතුරු පද්ධතියෙහි ලියාපදිංචි වීම.

**තත්ත්ව සහතිකකරණය**

***ප්‍රතිපත්ති කරුණ 65 :***

තත්ත්ව සහතිකකරණය රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යයන වැඩසටහන් සමග දැන් ඒකාබද්ධ කර තිබෙන නමුදු, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන සහ විද්‍යුත් මාර්ගගත (Online) උසස් අධ්‍යාපන සේවා සපයන්නන් අතර ද එය අනිවාර්ය කළ යුතුය.

***ප්‍රතිපත්තිය 65 :*** -පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල තත්ත්ව සහතිකකරණය, නියාමනය සහ වැඩසටහන් සමාලෝචනය, රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ද නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූලව, එම පුද්ගලික ආයතනවලට මෙන්ම විද්‍යුත් මාර්ගගත සේවා (Online Service) සපයන්නන්ට ද අනිවාර්ය කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය**

- පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) ඇතුළට ගෙන ඒම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශ/තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන කවුන්සිලය (QAAC) විසින් පියවර ගනු ලැබීම.

- පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන තමන්ගේ අධ්‍යයන වැඩසටහන් පිළිබඳ සියලු තොරතුරු තොරතුරු කේන්ද්‍රස්ථානයට (SWIP) සැපයීම.

- සියලු අන්තර්ජාතික උසස් අධ්‍යාපන ආයතන, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කළ යුතුයැයි නියම කිරීම.

- සමාගම් රෙජිස්ට්‍රාර්වරයා, පෞද්ගලික අධ්‍යාපන ආයතන 2000 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කිරීමට පෙර ඒවා පිළිබඳව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශ සහ අනුමැතිය ලබා ගැනීම.

**හවුල්කාරිත්වය**

***ප්‍රතිපත්ති කරුණ 66 :***

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල සහ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන අතර සහයෝගිතාවක් හෝ හවුල්කාරිත්වයක් හෝ නොමැතිවීමේ ප්‍රතිඵලය වී තිබෙන්නේ, එම පෞද්ගලික ආයතන ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයට සම්බන්ධ කීර්තිමත් විශ්වවිද්‍යාලවලින් හුදෙකලාව විකාශනය වීමයි. ඒ නිසා, අධ්‍යාපනයේ දී සිසුන්ට වාසි ගෙන දෙන, අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභදායී හවුල්කාර සම්බන්ධතාවන්ට එළඹීමේ අවස්ථාව ද ඔවුන්ගෙන් ගිලිහී ඇත.

***ප්‍රතිපත්තිය 66 :-*** පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන, ඉගැන්වීම, පර්යේෂණ සහ පුහුණු කිරීම යන ක්ෂේත්‍රවල අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස රාජ්‍ය අංශයේ විශ්වවිද්‍යාල සමග හවුල්කාරිත්වයට ඉඩ සළස්වන අන්‍යෝන්‍ය සහයෝගතා ව්‍යාපෘති, සහ ක්‍රියාකාරකම් ආරම්භ කළ යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, රාජ්‍ය සහ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන අතර ඇති වන සම්බන්ධතා සහ සහයෝගතා වැඩසටහන්වලට ඉඩ සළසන සහ ඒවා නියාමනය කිරීම සඳහා රාමුවක් සැකසීම.

- ආදායම් බදු අරමුණු සඳහා ආචාර්යවරුන්ගේ ආදායම් කොටස් වශයෙන් ගෙවීමට ඉඩ සැළසෙන ක්‍රමයක් සකස් කිරීම.

- රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයෙන් ලැබෙන ජයග්‍රහණ පෙන්වා දීමට සහ අන්‍යෝන්‍ය වශයෙන් වාසි ලැබෙන වඩා යෝග්‍ය භාවිතයන් පිළිබඳ අත්දැකීම් හුවමාරු කර ගැනීමට, වාර්ෂික උත්සව සංවිධානය කිරීම.

**ගුණාත්මක තත්ත්වය නැංවීමට බාහිර ආධාර**

**ප්‍රතිපත්ති කරුණ 67 :**

විදේශ රටවල විශ්වවිද්‍යාලවල ශාඛා ලෙස මෙරට පිහිටුවා තිබෙන උසස් අධ්‍යාපන ආයතනවලට, එම මව් විශ්වවිද්‍යාලවලට සමාන ලෙස ගුණාත්මක තත්ත්වය සහ ප්‍රමිතීන් පවත්වාගෙන යනු පිණිස බාහිර ආධාර ලැබෙන්නේ ද නැද්ද යන්න පිළිබඳව පැහැදිලිතාවක් දැනට නැත.

**ප්‍රතිපත්තිය 67 :-** විදේශ විශ්වවිද්‍යාලවලට සම්බන්ධව, මෙරට රාජ්‍ය නියාමකයින් වෙතින් ප්‍රතීතනය අපේක්ෂා කරන සෑම ආයතනයක්ම, තම ගුණාත්මක තත්ත්වය පවත්වා ගැනීම සඳහා විදේශීය මව් ආයතනවලින් ආධාර ලබා ගැනීම අනිවාර්ය කළ යුතුය.

**ක්‍රියාත්මක කිරිමේ උපාය මාර්ග**

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන වලට තම ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම සඳහා ලැබෙන බාහිර ආධාර පිළිබඳ කරුණ යෝජිත ජාතික ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් කිරීම.

- සෑම පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනයක්ම, ගුණාත්මක තත්ත්ව සහතිකකරණය සඳහා ලැබෙන බාහිර දායකත්වයන් සහ ඒ පිළිබඳ ස්වයං-ඇගයීම් ඉදිරිපත් කිරීම.

- උපාධි ප්‍රදානය කරනු ලබන ආයතන තම වාර්තාකරණයේදී එවැනි බාහිර දායකත්ව පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීම.

**විද්‍යාව සහ තාක්ෂණ ක්ෂේත්‍රයේ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය**

***ප්‍රතිපත්ති කරුණ 68 :***

විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ ගණිතය (STEM) ක්ෂේත්‍රවල, උසස් අධ්‍යාපනයේ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා ක්ෂණික අවශ්‍යතාවක් තිබේ. රටෙහි දැනට කර්මාන්ත උද්‍යාන සහ සුළු වශයෙන් තාක්ෂණ සහ නව නිර්මාණ උද්‍යාන තිබේ. වෙනත් රටවල්වලින් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා හවුල්කරුවන් ආකර්ෂණය කර ගැනීමට, වඩාත් බලවත් පරිශ්‍රමයක් අවශ්‍ය වී තිබේ.

***ප්‍රතිපත්තිය 68 :*** උසස් අධ්‍යාපනයට සම්බන්ධ කර්මාන්ත, තාක්ෂණ සහ නව නිර්මාණ උද්‍යාන පිහිටුවීම වෙනුවෙන් විදේශීය මෙන් ම දේශීය පිළිගත් ආයතන වලින් පෙළඹ වූ සහ ස්වේච්ඡා හවුල්කාරිත්ව යෝජනා ලබා ගත යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය**

- ශ්‍රී ලංකා රජය උසස් අධ්‍යාපන, සහ විද්‍යා තාක්ෂණ වැනි අදාළ අමාත්‍යාංශවල සහභාගිත්වය ඇතිව, විද්‍යා සහ තාක්ෂණ සේවාවල පර්යේෂණ සහ නව නිර්මාණ ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා සුදුසු ප්‍රතිපත්තිමය පියවර ගනියි.

**විදේශීය සිසුන්ට වීසා බලපත්‍ර**

***ප්‍රතිපත්ති කරුණ 69 :***

විදේශීය සිසුන්ට වීසා බලපත්‍ර ලබා ගැනීමේදීත්, දීර්ඝකර ගැනීමේදීත් දුෂ්කරතාවලට මුහුණ දෙන බවට පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන පැමිණිලි කරති. මෙය විදේශීය සිසුන් බඳවා ගැනීමට බාධාවකි.

***ප්‍රතිපත්තිය 69 :*** ගාස්තු ගෙවා සහ ශිෂ්‍යත්ව ලබා පැමිණෙන විදේශීය සිසුන්ට ප්‍රමාද නොවී වීසා බලපත්‍ර ලබා ගැනීමට, ආගමන විගමන ප්‍රතිපත්තිය මගින් ඉඩ සැපයිය යුතුයි.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- පුහුණු කාල සීමාවේදීත්, ආධුනික පුහුණු කාලයේදීත් වැඩ කිරීමේ අවසර පත්‍ර (Work Permits) ලබා දීම සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය/වෘත්තීය මණ්ඩල යටතේ පවත්වා ගැනීම.

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ආගමන විගමන බලධාරීන් අතර අදහස් හුවමාරු කර ගැනීම තුළින්, විදේශීය සිසුන්ට වීසා බලපත්‍ර ලබා ගැනීමේ පහසු ක්‍රමයක් සකස් කිරීම.

- අධ්‍යාපනය අවසන් කිරීමෙන් පසු කර්මාන්ත පුහුණුව සඳහා අවකාශ ලබා ගන්නා සිසුන්ට වැඩ කිරීමේ තාවකාලික බලපත්‍ර/ ආධුනික පුහුණු බලපත්‍ර (Internships) ක්‍රමයක් සකස් කිරීම.

**සදාචාරාත්මක අලෙවිකරණයේ අවශ්‍යතාවය**

***ප්‍රතිපත්ති කරුණ 70 :***

සිසුන් බඳවා ගැනීම සඳහා පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ගෙන යන අලෙවිකරණ ව්‍යාපාරයේ ඇති සදාචාරාත්මක බවේ ඌණතාවක් තිබේ. ඔවුන්ගේ ප්‍රචාරක දැන්වීම් ව්‍යාපාරවල බොහෝ විට දෙමව්පියන් සහ සිසුන් නොමග යවන අතිශෝක්ති සහගත සහ සාක්ෂි මත පදනම් නොවන ප්‍රකාශ ගැබ් වේ.

***ප්‍රතිපත්තිය 70 :*** පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන, සිසුන් බඳවා ගැනීම සඳහා යොදා ගන්නා දැන්වීම් ප්‍රචාරණය තුළ ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව/ජාතික වෘත්තීය සුදුසුකම්වල (SLQF/NVQ) මට්ටම්වලට සමාන්තර වන ආකාරය නැතහොත් ජාත්‍යන්තර ප්‍රමිතීන් සමග එකඟ වන ආකාරය, තම දැන්වීම්වලත්, රජයට ඉදිරිපත් කරන ප්‍රකාශවලත් දක්වා සිටිය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ශිෂ්‍යයන් බඳවා ගැනීමේ ප්‍රචාරණය සඳහා චර්යාධර්ම මාර්ගෝපදේශන සකස් කිරීම.

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන වල ප්‍රචාරණ වෙළෙඳ දැන්වීම් සහ අලෙවිකරණ ව්‍යාපාර සඳහා චර්යාධර්ම මාර්ගෝපදේශන පිළියෙල කර සහ ඒවාට එකඟවීම සහතික කිරීම.

**රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය**

***ප්‍රතිපත්ති කරුණ 71 :***

රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන සහ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන දැනට පවතින්නේ එකිනෙකින් හුදෙකලාව සහ ආයතනික සම්බන්ධතා නැතිවය. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා රජයේ ප්‍රතිපත්තියක් ද නැත.

***ප්‍රතිපත්තිය*** *71 :* -පිළිගත් විදේශීය උසස් අධ්‍යාපන ආයතනවලින් හෝ විද්‍යාත්මක සහ තාක්ෂණ විද්‍යාත්මක සංවර්ධනයට දායකත්වයක් සැපයීමට සමත් වන දේශීය ආයතනවලින් හෝ ආයතන අතර සම්බන්ධතාව සඳහා වූ යෝජනාවලට රජය විවෘත විය යුතුය.

**ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග**

- අවශ්‍ය නීති හඳුන්වාදීම මගින් පෞද්ගලික විශ්වවිද්‍යාල පිහිටුවීමේ නව ප්‍රතිපත්තියක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කිරීම.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා වූ ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීම.

## උසස් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීමේ ක්‍රියාවලිය

1. 2017.10.11 : ප්‍රධාන වශයෙන් පහත සඳහන් තේමා මත උසස් අධ්‍යාපනය පිළිබඳ අදහස් ලිඛිතව ඉදිරිපත් කරන ලෙස, භාෂා තුනෙන් ම ජාතික පුවත්පත්වල දැන්වීම් පළ කරනු ලැබිණ.:

   (1) පරිපාලන සහ මූල්‍ය සම්පත් කළමනාකරණය, (2) උසස් අධ්‍යාපනයට පිවිසුම, සිසුන් ඇතුළත් කර ගැනීම සහ නව විෂයයන්ට/ශික්ෂණවලට ඇති ඉල්ලුම, (3) වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය, (4) ශිෂ්‍ය සුභසාධනය සහ විනය, (5) පශ්චාද්-උපාධි අධ්‍යයනය සහ පර්යේෂණය, (6) රාජ්‍ය සහ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය, (7) අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සංවර්ධනය, සහ (8) පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වය.

2. 2017.11.01 - පහත දැක්වෙන දේශපාලන පක්ෂවල ලේකම්වරුන්ට ඉහත සඳහන් මාතෘකාව යටතේ අදහස් හා යෝජනා එවන මෙන් දන්වා ලියුම් යවන ලදී. - සමස්ත ලංකා ද්‍රවිඩ එක්සත් පෙරමුණ, සමස්ත ලංකා මුස්ලිම් කොංග්‍රසය, ප්‍රජාතන්ත්‍රවාදී දෙමළ සන්ධානය, ඊළාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය, ඊළාම් ජනතා විප්ලවවාදී විමුක්ති පෙරමුණ, පෙඩරල් පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, ජාතික හෙළ උරුමය, ලංකා සමසමාජ පක්ෂය, ජාතික සංගමය, නව සමසමාජ පක්ෂය, පොදුජන එක්සත් පෙරමුණ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ද්‍රවිඩ ඊළාම් විමුක්ති සංවිධානය, ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ, ද්‍රවිඩ ජනතා විමුක්ති කොටි සංවිධානය, සහ එක්සත් ජාතික පක්ෂය.

3. 2017.11.02 : උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවකට යෝජනා ඉදිරිපත් කරන ලෙස ආරාධනය කරමින්, සියලු රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන්ට සංදේශ යැවීම.

   2017.11.07 :- අධ්‍යයන පීඨවල පීඨාධිපතිවරුන්, පශ්චාද්-උපාධි ආයතනවල අධ්‍යක්ෂකවරුන් සහ තුන්දහසක් පමණ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට උසස් අධ්‍යාපනය පිළිබඳ තම ප්‍රතිපත්ති යෝජනා විද්‍යුත් තැපෑලෙන් එවන ලෙස දන්වා සිටීම.

   2017.11.18 : උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා ඉදිරිපත් කළ හැකි බවට රූපවාහිනි ප්‍රවෘත්ති දැන්වීම් පටියේ නැවත වරක් මතක් කිරීම.

4. 2017 නොවැම්බර්, දෙසැම්බර්, පර්යේෂණ අධ්‍යයන සඳහා (මාර්ගෝපදේශ – ToR ) සකස් කරන ලදී. 2018 ජනවාරි 25 දින, උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව විසින් එම මාර්ගෝපදේශ අනුමත කෙරිණ. පර්යේෂණ කණ්ඩායම්වල නායකයින් සහ සාමාජික ලැයිස්තු ද අනුමත කෙරිණ.

   2018.03.14 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව එහි 278 වැනි රැස්වීමේ දී උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුවේ ඉහත සඳහන් තීරණ අනුමත කරන ලදී. ඒ සමගම, උසස් අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ අධ්‍යයන ඇගයීමේ මඩුල්ලක් ද පත් කරන ලදී.

5. 2017 දෙසැම්බර් සිට 2018 ජුනි දක්වා : සභාපති සහ උපසභාපති (ප්‍රතිපත්ති) නායකත්වයෙන් යුත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභා නියෝජිත කණ්ඩායමක් රුහුණු විශ්වවිද්‍යාලය වෙත ගොස්, එහි උපකුලපති, පීඨාධිපතිවරුන්, අංශ ප්‍රධානීන්, ආදී විද්‍යාර්ථීන්, ශිෂ්‍ය සංගමයේ සාමාජිකයින් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නියෝජිතයින් හමු වී ඔවුන්ගේ යෝජනා ලබා ගත්හ. ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමග වෙනම රැස්වීමක් පවත්වන ලදී.

   සබරගමුව සහ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේදී, කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යායතනයේ දී, වයඹ විශ්වවිද්‍යාලයේ දී සහ රජරට විශ්වවිද්‍යාලයේ දී ද එවැනි ම රැස්වීම් පවත්වන ලදී.

6. 2018.04.27 දින පර්යේෂණ කණ්ඩායම්වල මූලික වාර්තා සමාලෝචන මඩුල්ල විසින් සමාලෝචනය කරන ලදී.

   – පර්යේෂණ කණ්ඩායම්වල අතුරු වාර්තා, සමාලෝචන මඩුල්ල විසින් 2018.08.03 දින සහ 2018.08.13 දින සමාලෝචනය කරන ලදී.

   – සමාලෝචන මඩුල්ල 2018.11.02, 2018.11.26 සහ 2018.12.17 යන දිනවල අවසාන පර්යේෂණ වාර්තා සමාලෝචනය කළහ.

7. 2019.01.07 ඃ ප්‍රතිපත්ති යෝජනා පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් සකස් කරනු සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් මහාචාර්ය ජයදේව උයන්ගොඩ සහ මහාචාර්ය හුසේන් ඉස්මායිල් යන මහත්වරුන්ගෙන් සමන්විත සංස්කරණ මණ්ඩලයක් පත් කරන ලදී.

8. 2019.03.27 ඃ 2019.04.19, 2019.04.26 ඃ සංස්කාරක මණ්ඩලය විසින් සකස් කරන ලද වාර්තා කෙටුම්පත අනුමැතිය සඳහා උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

9. 2019.06.10 ඃ එම ස්ථාවර කමිටුවේ ද යෝජනාවලට අනුව සංශෝධනය කරන ලද කෙටුම්පත් වාර්තාව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති, රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන්, පීඨාධිපතිවරුන් සහ පශ්චාද්-උපාධි ආයතනවල අධ්‍යක්ෂකවරුන් ද සහභාගි වූ රැස්වීමක සාකච්ඡා කරන ලදී.

10. 2019.07.01 ඃ සංශෝධනය කරන ලද කෙටුම්පත් වාර්තාව, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රධානීන්, විශ්වවිද්‍යාල ආචාර්ය සමිති සම්මේලනයේ කමිටු නියෝජිතයින්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ පෞද්ගලික සමාගම්වල නියෝජිතයින් සහභාගි වූ වැඩ මුළුවකදී සාකච්ඡා කරන ලදී.

11. 2019.07.29 ඃ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සහ අනෙකුත් නිලධාරීන් සමඟ පැවැත් වූ රැස්වීමේදී ඔවුන්ගේ අදහස් ලබා ගන්නා ලදී. පසුව, අමාත්‍යාංශ ලේකම් විසින් යෝජනා කිහිපයක් ලිඛිතව ඉදිරිපත් කරන ලදී.

12. 2019.08.20 ඃ කෙටුම්පත් කරන ලද වාර්තාවේ සංස්කරණය කරන ලද පිටපත්, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ අදහස් ලබා ගනු පිණිස ඒ වෙනුවෙන්ම පවත්වන ලද කොමිෂන් සභාවේ විශේෂ රැස්වීමකදී සභාගත කෙරිණ.

13. 2019.09.12 ඃ කොමිෂන් සභාව විසින් කෙටුම්පත් කරන ලද වාර්තාව නැවතත් සාකච්ඡා කරන ලද අතර, ප්‍රතිපත්ති ලේඛනය සිංහල සහ දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීමට අනුමත කරන ලදී.

## පර්යේෂණ කණ්ඩායම් සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| 1. | **ආචාර්ය ටී.බී. අන්දරවැව**<br>**(කණ්ඩායම් නායක)**<br>ඩී. ගාමිණි ජයසූරිය මහතා<br>එස්.ජී. ධර්මප්‍රිය සේනානායක මහතා | - | පාලනය, මූල්‍ය, සම්පත් කළමනාකරණය |
| 2. | **මහාචාර්ය. එස්. අමරසේන**<br>**(කණ්ඩායම් නායක)**<br>ආචාර්ය හිමාන් කේ. ජී. පුංචිහේවා<br>මහාචාර්ය බිලේශ පෙරේරා | - | උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය, සිසුන් ඇතුළත්වීම හා නව විෂයයන් හා විෂය ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම. |
| 3. | **මහාචාර්ය ජේ. උයන්ගොඩ**<br>**(කණ්ඩායම් නායක)**<br>මාර්ක් ෂූබර්ට් මහතා<br>රෙබෙකා සුරෙන්තිරාරාජ් මෙනෙවිය | - | වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය |
| 4. | **මහාචාර්ය ජී. ටී. එෆ්. ද සිල්වා**<br>**(කණ්ඩායම් නායක)**<br>මහාචාර්ය සුභාංගි එම්.කේ. හේරත්<br>ධනසිරි කන්දඋඩහේවා මහතා | - | ශිෂ්‍ය සුභසාධනය සහ විනය<br><br>(සීමිත කාලයක් සඳහා) |
| 5. | **මහාචාර්ය එච්. පී. එම්. ගුණසේන**<br>**(කණ්ඩායම් නායක)**<br>මහාචාර්ය සීවලී රණවන<br>ඒ.එස්. සිරිවර්ධන මහතා<br>වී.වයි. වයිසුන්දර මෙනෙවිය | - | පශ්චාද්-උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ |
| 6. | **මහාචාර්ය කොලින් එන්. පිරිස්**<br>**(කණ්ඩායම් නායක)**<br>ආචාර්ය ජයත් පීටර් කිර්තිසිංහ<br>මහාචාර්ය නිමල් කේ. දංගල්ල | - | රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල ගුණාත්මකභාවය සහතිකකරණය හා ප්‍රතීතනය |
| 7. | **මහාචාර්ය යූ.කේ.ජේ. මුදලිගේ**<br>**(කණ්ඩායම් නායක)**<br>මහාචාර්ය බී.පී. අජිත් ජයවීර<br>ආචාර්ය චාලින්ද කේ. බෙනරගම | - | අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යමණ්ඩල සංවර්ධනය |
| 8. | **ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙනිය**<br>**(කණ්ඩායම් නායක)**<br>සචිනි පන්නිලගේ මෙනෙවිය<br>ආර්.ඩී.පී.ඩී. රණසිංහ මෙනෙවිය<br>ක්‍රිෂාන්ති සිවසුබ්‍රමනියම් මෙනෙවිය<br>අමාලි සුපුන් දේශානි මෙනෙවිය<br>එච්.එම්.ජී.වයි.ජේ. හෙන්නායක මෙනෙවිය | - | පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය |

**පර්යේෂණ ඇගයීම් මඩුල්ල**

1. **ආචාර්ය උපාලි එම්. සේදර මහතා**
   මණ්ඩපාධිපති - ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන පීඨය

2. **ආචාර්ය එච්.එස්. රඹුක්වැල්ල මහතා**
   අධ්‍යක්ෂ - ඉංග්‍රීසි අධ්‍යයන පශ්චාද් උපාධි ආයතනය

3. **ආචාර්ය හරිනි අමරසූරිය මහත්මිය**
   ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

4. **මහාචාර්ය නාරද වර්ණසූරිය මහතා**
   වෛද්‍ය විද්‍යා මහාචාර්ය - කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය,
   හිටපු උපකුලපති - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, සාමාජික - ශ්‍රී ලංකා වෛද්‍ය සභාව.

5. **මහාචාර්ය උමා කුමාරස්වාමි මහත්මිය**
   අධ්‍යක්ෂ - ස්ත්‍රී-පුරුෂ සමාජභාවී මධ්‍යස්ථානය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,
   හිටපු උපකුලපති - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

6. **මහාචාර්ය ජේ.සී.එන්. රාජේන්ද්‍ර මහතා**
   භෞතික විද්‍යා මහාචාර්ය සහ අධ්‍යක්ෂ-(ජාත්‍යන්තර සම්බන්ධතා), ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

**සංස්කාරකවරු**

1. **මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතා**
   දේශපාලන විද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්ය - කොළඹ විශ්වවිද්‍යාලය.

2. **මහාචාර්ය ඒ. ජී. හුසේන් ඉස්මායිල් මහතා**
   හිටපු උපකුලපති - අග්නිදිග විශ්වවිද්‍යාලය, ගෞරව සාමාජික - මලයා විශ්වවිද්‍යාලය, මැලේසියාව.

**සිංහල පරිවර්තනය**

**මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතා**

**සම්බන්ධීකරණය**

1. **එස්. ඒ. ඩී. ද සිල්වා මහතා**
   ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරි

2. **රසික කරුණාරත්න මහතා**
   ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරි

3. **හිරන්ති කත්‍රිආරච්චි මහත්මිය**
   කළමනාකරණ සහකාර

## ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සාමාජිකයින්

1 සම්මානිත මහාචාර්ය ඩබ්ලිව්. අයි. සිරිවීර මහතා - සභාපති

2 ආචාර්ය ජී. බී. ගුණවර්ධන මහතා - උපසභාපති (ප්‍රතිපත්ති)

3 ආචාර්ය ටී. ඒ. පියසිරි මහතා - උපසභාපති (සැලසුම්)

4 පූජ්‍ය ආචාර්ය අකුරැටියේ නන්ද නායක ස්වාමීන් වහන්සේ

5 මහාචාර්ය මොහාන් ද සිල්වා මහතා

6 මහාචාර්ය දයන්ත විජේසේකර මහතා

7 මහාචාර්ය ආර්. යූ. හල්වතුර මහතා

8 ඒ. එන්. හපුගල මහතා

9 නයනා නාතවිතාරණ මහත්මිය

10 ආචාර්ය එස්. බී. ඒකනායක මහතා

11 මහාචාර්ය කේ. කන්දසාමි මහතා

12 මහාචාර්ය එම්. ඒ. නුහ්මාන් මහතා

13 මහාචාර්ය ඩී. ඒ. තන්ත්‍රිගොඩ මහතා

14 ආචාර්ය මල්ලිකා කරුණාරත්න මහත්මිය

15 වී. බී. පී. කේ. වීරසිංහ මහත්මිය

16 එච්. ජී. අප්සරා කල්දේරා මහත්මිය - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ලේකම්

## උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටු සාමාජිකයින්

1 සම්මානිත මහාචාර්ය ඩබ්ලිව්. අයි. සිරිවීර මහතා - සභාපති - උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව සභාපති - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

2 ආචාර්ය ජී. බී. ගුණවර්ධන මහතා -උපසභාපති (ප්‍රතිපත්ති) - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

3 ආචාර්ය ටී. ඒ. පියසිරි මහතා -උපසභාපති (සැලසුම්) - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

4 මහාචාර්ය මොහාන් ද සිල්වා මහතා - සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

5 මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතා - දේශපාලන විද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්ය - කොළඹ විශ්වවිද්‍යාලය.

6 මහාචාර්ය ඒ. ජී. හුසේන් ස්මයිල් මහතා - හිටපු උපකුලපති - නැගෙනහිර විශ්වවිද්‍යාලය

7 විද්‍යාජෝති මහාචාර්ය ආර්. ෂෙරීෆ් මහතා - වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

8 මහාචාර්ය ජේ. ජයවර්ධන මහතා - ප්‍රසව හා නාරිවේදය පිළිබඳ සම්මානිත මහාචාර්ය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, අධ්‍යක්ෂක-දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි අධ්‍යාපන ආයතනය

9 මහාචාර්ය සුජීව අමරසේන මහතා - උපකුලපති - රුහුණු විශ්වවිද්‍යාලය

10 මහාචාර්ය එම්. ඒ. කරීම් මහතා - භෞතික විද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්ය

11 මහාචාර්ය මාරි පෙරේරා මහතා - අධ්‍යක්ෂ - ජාතික අධ්‍යාපන පර්යේෂණ හා ඇගයීම් මධ්‍යස්ථානය

12 මහාචර්ය ජී. බණ්ඩාරගේ මහතා - රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

13 මහාචාර්ය එස්. සන්දරසේගරම් මහතා - සභාපති - ජාතික භාෂා කොමිෂන් සභාව

14 මහාචාර්ය කොලින් එන්. පීරිස් මහතා - අධ්‍යක්ෂ - අධ්‍යාපන සංවර්ධන සහ ගුණාත්මක සහතිකකරණය, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය

15 මහාචාර්ය එස්. කරුණානායක මහතා - පීඨාධිපති - අධ්‍යාපන පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

16 මහාචාර්ය කපිල පෙරේරා මහතා - උපකුලපති - මොරටුව විශ්වවිද්‍යාලය

17 මහාචාර්ය ඩී. ඒ. තන්ත්‍රිගොඩ මහතා - හිටපු සභාපති - ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය මොරටුව

18 මහාචාර්ය එස්. ආර්. ඩී. රෝසා මහතා - භෞතික විද්‍යාව පිළිබඳ මහාචාර්ය-භෞතික විද්‍යාව අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යලය

19 ආචාර්ය එල්. ඩී. ජේ. එෆ්. නානායක්කාර මහතා - ශිෂ්‍ය උපදේශක - මොරටුව විශ්වවිද්‍යාලය

20 ආචාර්ය උපාලි මාම්පිටිය මහතා-ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය-ගණිත අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

21 ආචාර්ය නිෂා අරුණාතිලක මහත්මිය -අධ්‍යක්ෂ (පර්යේෂණ) - ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

22 ආචාර්ය මුදිත ලියනගෙදර මහතා - අධ්‍යක්ෂ - ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

23 ආචාර්ය ජයන්ත එල් රත්නසේකර මහතා - උපකුලපති - ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

24 ආචාර්ය සුනිල් ත්‍රිකාවල මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය- කෘෂිකාර්මික හා වැව්ලි ඉන්ජිනේරු අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය